# සරල පාලි ප්‍රවේශය

පූජ්‍ය බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය
මහනාහිමිපාණන් වහන්සේ
විසින් සම්පාදිත යි

# සරල පාලි ප්‍රවේශය

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය
මහා නාහිමිපාණන් වහන්සේ
විසින් සම්පාදිතයි.

## සංපාදපනය
### (දෙවෙනි සංස්කරණයේ)

මෙය අවුරුදු ගණනකට පෙර මා එංගලන්තයේ ඉන්දෑ දී **සරල පාලි ශික්‍ෂක ප්‍රවේශය** නමින් පළ කැරුණු පොතේ ම දෙවෙනි සැකසුම යි.

මෙහි ඇතැම් පද සිද්ධි පැරැණි ඇදුරන් ගිය මගට ද වඩා ලෙහෙසි මගෙකින් දැක්වූමු. සිසුවන් ගේ පහසුව පිණිස ය. මෙහි එන ක්‍රමය අනුව පාලිභාෂාවට බැස ගත් පසු බාලාවතාර රූපසිද්ධි ආදි පැරැණි පාලිව්‍යාකරණ පොත් හැදෑරීමෙන් පැරැණි ආචාර්‍ය්‍ය සම්ප්‍රදයය ද වියරණෙහි ගැඹුරු දැනුමක් ද ලබන හැක්ක. මෙය පාලියේ දැනුමක් නැති තරමක් දුර සිංහල උගත් ආධුනිකයන් සඳහා සැකසුණෙකි.

හෙළ වියරණ තරමක් උගත් කෙනෙකුට මෙහි පාඩම්වැල බොහෝ ලෙහෙසි වේ. හෙළු වියරණ ද නො උගත් ලාබාලයනට මෙය ඉගැන්වීමේ දී හැම පාඩමක් ම මැනැවින් උගන්වා අවබෝධ කරවා මිස යම්තමින් කියා දී එහා පාඩම්වලට නො බැස්විය යුතු ය. හැම පාඩමෙක ම හැම පාලි වචන ම හැම වියරණ විදියක් ම මැනැවින් සිතට ගන්වා ම එහා එහා පාඩම්වලට යැවිය යුතු ය. එසේ පාඩම් දහයක් ඉගැන්වූ පසු එයින් ඉදිරියේ එන පාඩම් ලෙහෙසි වනු ඇත.

මෙය මැනවින් ඉගෙන ගත් පසු පාලිභාෂාවතරණය හෝ සරල පාලි ශික්‍ෂකය සපුරා ඉගැන්විය යුතු ය. එවිට පාලියෙහි පද යෙදුම් ගැන සෑහෙන දැනුමක් සිසුවනට ලැබෙයි. එයට පසු බාලාවතාරාදි වියරණ පොතුත් ධම්මපදට්ඨකථා ජාතකට්ඨකථා අංගුත්තරනිකායාදි කවර පාලි ග්‍රන්ථයක් වුව ද ඉගැන්වීම පහසු වෙයි.

මෙයට - ශාසනාභිවෘද්ධිකාමී

**බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය සථවිර**

1993. 01. 05
බත්තරමුල්ලේ චිත්ත විවේකාශ්‍රමය.

## ප්‍රථම මුද්‍රණයේ සංඥාපනය

ශිෂ්‍යයන් නො වෙහෙසවා, ලෙහෙසියෙන් පාලිභාෂාවට බැස්වීමට මඟක් ගැන නොයෙක් විට කල්පනා කෙළෙමි. එක් ක්‍රමයෙක් සිතට නැඟිණි. එය අනුව පාඩම් වැලක් තනා ඉගැන්වීමි. අදහස සාර්ථක විය. ඒ මේ පොතේ එන පාඩම් වැල ය. මෙය ම ඉංගිලිසියට ද නඟා, මෙහි එංගලන්තයේ අමරාවතී විහාරයේ වස්වැස හුන් ගිය මාස සතර තුළ සතළිසකට පමණ යුරෝපීය භික්ෂු උපාසක උපාසිකා පිරිසට පාලි ඉගැන්වීමි. සාරමස අවසන් වන විට පාලි ශබ්දකෝශයෙක උදව්ව හෝ ගුරුවරයකුගේ ඇසුර හෝ ලබා පාලි ත්‍රිපිටකයේ මොන ම පොතක් වුව ද ඉගැන්මට, තේරුම් ගන්නට හැකියාව ඔවුනට ලැබිණ.

පාලිභාෂාවට කිට්ටු ම නෑකමක් ඇති සිංහල භාෂාව දන්නා හෙළදිව් වැසි සිසුනට යුරෝපීයයනටත් වඩා ඉක්මනිනුත් ලෙහෙසියෙනුත් පාලිභාෂාවට බැස ගැන්මට මේ පොතින් හැකියාව ලැබේ යනු මගේ හැඟීම යි. මේ පොත දෙතුන් විටක් හොඳට හදළ පසු, මා විසින් ලියන ලද **පාලි ශික්‍ෂකය** හෝ වෙන මොන ම පාලිභාෂා ප්‍රවේශක පොතක් හෝ අමාරුවක් නැති ව හදරන්නට ද, බාලාවතාර ආදි පාලියෙන් ම ඇති වියරණ පොතක් ගුරු ඇසුර ලබමින් ලෙහෙසියෙන් ඉගැන්මට ද හැකියාව ලැබෙනු ඇත.

මෙයට – හිතකාමී

**බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර**

එංගලන්තයේ,

ලන්ඩන් විහාරයේ දී යැ.

1986. 02. 03.

# අනුක්‍රමණිකාව


**ප්‍රාරම්භය** පාලිහෝඩිය, පදවිභාගය /1

1. ආඛ්‍යාතික ක්‍රියා /3
2. ක්‍රියාපද /5
3. කාල තුන /7
4. උක්ත වීම /9
5. නාම බෙදීම /11
6. පුංලිඞ්ගික නාම, පඨමා විභත්ති /13
7. ආලපනෙ පඨමා /17
8. කර්මය (දුතියා විභත්ති) /21
9. අනාගතකාලික ක්‍රියා /25
10. තතියා විභත්තිය /29
11. අතීතකාලික ආඛ්‍යාත /33
12. පූර්ව ක්‍රියා /37
13. චතුර්ථී විභත්ති /41
14. පඤ්චමී විභත්ති /45
15. තුමන්ත /49
16. ඡට්ඨී විභත්ති /53
17. සත්තමී විභත්ති /57
    ආඛ්‍යාත පංචමිය
18. ඉකාරන්ත පුංලිඞ්ගික ශබ්ද /63
    **ච** නිපාත යෝගය
19. ඉකාරන්ත පුංලිඞ්ගිකයන් ගේ වරනැඟීම /67
20. ඉකාරන්ත පුංලිඞ්ගිකයන් ගේ වරනැඟීම /71
21. ආඛ්‍යාත සත්තමී විභත්තිය /75
    ං + සවර සන්ධි, පරසවර ලෝපය

22. උකාරන්ත පුංලිඞ්ගික ශබ්ද වරනැඟීම /79
ද්විත්ව සන්ධි විධිය

23. ඊකාරන්ත ඌකාරන්ත පුංලිඞ්ගික ශබ්ද වරනැඟීම /83

24. ඔකාරන්ත පුංලිඞ්ගික ශබ්ද /87
විශේෂණ විශේෂ්‍ය, **අත්ථාය** යන පදයේ යෙදීම

25. වන්තු, මන්තු, ඊ යන ප්‍රත්‍යයයන් එක්ව හැදෙන ශබ්ද,
ගුණවන්තු ශබ්දයේ වරනැඟීම /93

26. වර්තමානකාලික කෘදන්ත (කිතකන්ත) /99
ගච්ඡන්ත ශබ්දයේ වරනැඟීම, මානප්‍රත්‍යයාන්තයෝ,
භාව සත්තමී යෝගය, අනාදරයෙහි ඡට්ඨී යෝගය

27. තුප්‍රත්‍යන්ත ශබ්ද, නෙත්තු පිතු ශබ්ද /105

28. ස්ත්‍රීලිංගික ශබ්ද /111
වනිතා ශබ්දය (පඨම, ආලපන, දුතියා)

29. වනිතා ශබ්දය (සම්පූර්ණ වරනැඟීම) /113

30. ස්ත්‍රීලිංගික ශබ්ද /117
ඉකාරන්ත, ඊකාරන්ත, උකාරන්ත, ඌකාරන්ත,
තුප්‍රත්‍යයාන්ත ස්ත්‍රීලිංගික ශබ්ද, විශේෂණයන් ගේ
යෙදීම්, භාව සත්තමී අනාදරයේ ඡට්ඨී යෝග, ඉනී
ප්‍රත්‍යයාන්ත, ස්ත්‍රීලිංගික විශේෂණ රූප

31. නපුංසක ලිංගික ශබ්ද, සමානස්වර දීර්ඝ සන්ධිය /125

32. මනෝගණික ශබ්ද /131

33. විශේෂ ශබ්ද /135
අන්ත, රාජ, බ්‍රහ්ම ශබ්ද, තො - ප්‍රත්‍යයාන්ත,
පරස්වරලෝප සන්ධිය

34. සර්වනාම /141
අම්හ තුම්හ ශබ්ද, වො නො තෙ මෙ පදයන් ගේ යෙදීම,
වා - නිපාතය, ච - නිපාතය, සමානස්වර දීර්ඝ සන්ධිය,
ආදේශය, යකාරාගමය, ං + ය = ඤ්ඤ වීම,
ආමන්ත්‍රණයෙහි යෙදෙන පද

35. සර්වනාම - ත, එත, ය, කිං ශබ්ද /149

36. සර්වනාම ශබ්ද /163
නිර්ධාරණය, තර - තමප්‍රත්‍යයාන්තයෝ
37. සර්වනාම - ඉදං, අසු, උභ ශබ්ද - යාව නිපාතය /171
38. සංඛ්‍යාවාචී ශබ්ද /179
සංඛ්‍යාවාචකයන් ගෙන් හැදෙන ක්‍රියා විශෙෂණ
39. ආඛ්‍යාතික ක්‍රියා /187
වත්තමානාදි විභත්තිවල උභය පද
40. කර්මවාචක ක්‍රියා හැදීම /191
චිවාදි ආදෙශ, කර්මකාරකක්‍රියා හැදීම, ක්‍රියා විශෙෂණ
41. කර්මවාචක වර්තමානකාලික කෘදන්ත /201
42. කාරිත ක්‍රියා /207
43. අතීතකාලික කිතකන්ත /213
භාවසත්තමී යෝගය (කර්තෘ කර්ම සාධන දෙක්හි),
හු ආදි විශෙෂ ක්‍රියාපද
44. කිච්චප්පච්චයන්ත පද /231
උක්තාර්ථ පූරක පද, සන්ධි - නිග්ගහීතයෙන් පර වූ
ස්වරය ලොප් වීම, ව්‍යඤ්ජනාගමය
45. කාලාතිපත්ති විභත්තිය /239
46. සමාස /245

**47 පරිශිෂ්ටය /249**
පරොක්ඛාවිභත්තිය /253
ධාතුගණ සත, භුවාදිගණය /258
රුධාදිගණය /260
දිවාදිගණය /261
සවාදිගණය, කියාදිගණය /262
තනාදිගණය, චුරාදිගණය /263

**48 ශබ්දවලිය /265**

නමෝ බුද්ධාය

# සරල පාලි ප්‍රවේශය

## පාලි හෝඩිය

**සවර අට**

අ ආ ඉ ඊ උ ඌ එ ඔ

**ව්‍යඤ්ජන තෙතිස**

**ක** වර්ගය: ක් ඛ් ග් ඝ් ඞ්

**ච** වර්ගය: ච් ඡ් ජ් ඣ් ඤ්

**ට** වර්ගය: ට් ඨ් ඩ් ඪ් ණ්

**ත** වර්ගය: ත් ථ් ද් ධ් න්

**ප** වර්ගය: ප් ඵ් බ් භ් ම්

අවර්ගය: ය් ර් ල් ව් ස් හ් ළ් (අ)ං

**රස්ස දීඝ**

1. නො ඇදී කියැවෙන අකුරු **රස්ස**(හ්‍රස්ව) නම්. **අ ඉ උ** යන තුන ය.

ඇදී කියැවෙන්නෝ **දීඝ**(දීර්ඝ) නම්හ. **ආ ඊ ඌ** තුන ය.

නො බැඳි අකුරුවලට මුලින් සිටි **එ ඔ** දෙක හැම තැනම ඇදී(දීර්ඝව) කියැවේ.

බැඳි අකුරුවලට මුලින් සිටි විට බොහෝ සෙයින් හ්‍රස්ව වී කියැවේ. එත්ථ සෙය්‍යො ඔට්ඨො සොත්ථි යන තන්හි මෙනි.

**සිථිල ධනිත**

2. **ක** වර්ග, **ච** වර්ග, **ට** වර්ග, **ත** වර්ග, **ප** වර්ග පසේ දෙවෙනි සතර වන අකුරු **ධනිත** නම් හ. සාමාන්‍ය ව්‍යවහාරයෙහි මොහු **මහාප්‍රාණ** නම් හ. සෙස්සෝ **සිථිල** නම් හ. සාමාන්‍ය ව්‍යවහාර-යෙහි **අල්ප ප්‍රාණයෝ** යි කියනු ලැබෙත්.

**ඝොෂ - අඝොෂ**

3. වර්ගාක්‍ෂරයන්ගේ පළමුවන දෙවෙනි අකුරු ද, **ස** යන්න ද **අඝොස**(අඝොෂ) නම් වෙත්. සෙස්සෝ **ඝෝෂයෝ** ය.

**වගගනත(වර්ගාන්ත)**

4. **ඞ් ඤ් ණ් න් ම්** යන පස **වර්ගාන්ත** අකුරු ය. බින්දුව **නිග්ගහීත** නම් වේ.

## පද විභාගය

5. පද සතර වගයෙකි. නාම ආඛ්‍යාත උපසග්ග(උපසර්ග) නිපාත වශයෙනි. පුරිස(පුරුෂයා), රුක්ඛ(ගස) යන ආදීන් සතකුට හෝ දෑයකට බැවහර කැරෙන නම් **නාම** නම් වේ.

6. ගච්ඡති(යයි), ගච්ඡි(ගියේ ය) යන ආදීන් **ති** ආදි විභක්ති-ප්‍රත්‍යයයන් එක් වැ **අතීත, වර්තමාන, අනාගත** යන කාල තුනෙහි **පඨම, මජ්ඣිම, උත්තම** යන තුන් පුරුෂයෙහි ලිංග භෙදයෙකින් තොර වැ හැදෙන ක්‍රියා පද **ආඛ්‍යාත** නම් වේ. ගච්ඡති(යයි), ගච්ඡි(ගියේ ය) යනු නිදසුනි.

7. **උපසග්ග**(උපසර්ග) යනු පදයෙක අර්ථය දැඩි කිරීමට හෝ වෙනස් කිරීමට ඒ පදයට මුලින් යොදන පද විශෙෂයෙකි. සියලු ම උපසර්ග විස්සෙකි. **ප, පරා, නි, නී. උ, දු, සං, වි, අව, අනු, පරි, අධි, අභි, පති, සු, ආ, අති, අපි, අප, උප** යන මොහුය.

මොවුන් යෙදෙන සැටි මතු පාඩම්වල දී ඉගැන්වෙයි.

**නිපාත පද**

8. වාක්‍යයෙක පදයකට මුලින් හෝ පද අතරැ හෝ පදයට අගින් හෝ නොයෙක් අරුත් පැවැසීමෙහි යෙදෙන **ච, න, වා, මා, හි, ධී** ආදීහු නිපාත පදයෝ ය. මොහු නාමයන් මෙන් පඨමා ආදී විභක්තීන්හි නො වරනැඟෙති. මතු පාඩම්වලදී ඒ ඒ නිපාතයන් යෙදෙන සැටි ඉගැන්වේ.

* * *

# පාඩම 1

## ආඛ්‍යාතික ක්‍රියා

### පුරුෂ තුන

9. ක්‍රියාවක් කරන්නෝ පුරිස(පුරුෂ) යන නමින් කොටස් තුනකට බෙදෙති. **හේ, ඔහු** යනු එක් කොටසෙකි. **තෝ(නුඹ), තෙපි** යනු තව කොටසෙකි. **මම්, අපි** යනු අනිත් කොටස ය. හේ, ඔහු යනු **පඨම පුරිස(ප්‍රථම පුරුෂ)** නමින් හැඳින්වෙන කොටස ය. තෝ, තෙපි යනු **මජ්ඣිම පුරිස(මධ්‍යම පුරුෂ)** නම් කොටස ය. මම්, අපි යනු **උත්තම පුරිස(උත්තම පුරුෂ)** නම් කොටස ය. පහත දැක්වෙන සටහන සිතේ තබාගන්න.

| | **ඒක වචන** | **බහු වචන** |
|---|---|---|
| පඨම පුරිස(ප්‍රථම පුරුෂ) | හේ | ඔහු |
| මජ්ඣිම පුරිස(මධ්‍යම පුරුෂ) | තෝ | තෙපි |
| උත්තම පුරිස(උත්තම පුරුෂ) | මම් | අපි |

10. **ඒක වචන** යනු එක් කෙනකු අඟවන වචන යි. **බහු වචන** යනු වැඩි දෙනකුන් හඟවන වචන යි.

උඩ දැක්වුණු පුරුෂ තුන අඟවන **හේ, ඔහු** ආදීන් පාලි භාෂායෙහි දී සිටිනුයේ මෙසේ ය.

| | **ඒක වචන** | **බහු වචන** |
|---|---|---|
| පඨම පුරිස | සො | තෙ |
| මජ්ඣිම පුරිස | ත්වං | තුම්හෙ |
| උත්තම පුරිස | අහං | මයං, අම්හෙ |

අථ

| | | |
|---|---|---|
| පඨම | සො(හෙතෙම) | තෙ(ඔහු තුමු) |
| මජ්ඣිම | ත්වං(තෝ, නුඹ) | තුම්හෙ(තෙපි, ඔබ හැම) |
| උත්තම | අහං(මම) | මයං, අම්හෙ(අපි) |

* * *

පාඩම **2**

---

## ක්‍රියාපද

11. පළමු පාඩමෙන් ඔබ පුරිස(පුරුෂ) තුන ඉගෙන ගත්හ. මේ පාඩමෙන් ඒවා එක්ක යෙදෙන ක්‍රියා දැක්වේ.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| **පඨම පුරිස(ප්‍රථම)** | හේ දුවයි | ඔහු දුවත් |
| **මජ්ඣිම පුරිස(මධ්‍යම)** | තෝ දුවහි | තෙපි දුවහු |
| **උත්තම පුරිස(උත්තම)** | මම් දුවමි | අපි දුවමු |

මෙය ම පාලි භාෂාවට පෙරළූ විට සිටින අන්දම පහත දැක්වේ.

| | | |
|---|---|---|
| **පඨම පුරිස** | සො ධාවති | තෙ ධාවන්ති |
| **මජ්ඣිම පුරිස** | ත්වං ධාවසි | තුම්හෙ ධාවථ |
| **උත්තම පුරිස** | අහං ධාවාමි | මයං ධාවාම |

දැන් මෙය ම තේරුම් සමඟ කට පාඩම් කැරගන්න.

| | | |
|---|---|---|
| ප: | සො ධාවති(හේ දුවයි) | තෙ ධාවන්ති(ඔහු දුවත්) |
| ම: | ත්වං ධාවසි(තෝ දුවහි) | තුම්හෙ ධාවථ(තෙපි දුවහු) |
| උ: | අහං ධාවාමි(මම් දුවමි) | මයං ධාවාම(අපි දුවමු) |
| ප: | සො කිණාති (හේ මිලයට ගනී) | තෙ කිණන්ති (ඔහුමිලයටගනිත්) |
| ප: | සො දෙසෙති(හේ දෙසයි) | තෙ දෙසෙන්ති(ඔහු දෙසත්) |
| ප: | සො කරොති(හේ කරයි) | තෙ කරොන්ති(ඔහු කරත්) |

මේවායේ ඉතිරි කොටස් උඩ දී ඇති ධාවති යන ක්‍රියාව අනුව සකස් කර ගත යුතු.

මෙ බඳු ම තවත් ක්‍රියා පද කිහිපයෙක් අර්ථ සමඟ පහත දැක්වෙත්. ඒවා කට පාඩම් කැරැගන්න.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| **ප:** | සො ගච්ඡති(හේ යයි) | තෙ ගච්ඡන්ති(ඔහු යත්) |
| **ම:** | ත්වං ගච්ඡසි(තෝ යෙහි) | තුම්හෙ ගච්ඡථ(තෙපි යවු) |
| **උ:** | අහං ගච්ඡාමි(මම් යමි) | මයං ගච්ඡාම(අපි යමු) |

| | | |
|---|---|---|
| **ප:** | සො වදති(හේ කියයි) | තෙ වදන්ති(ඔහු කියත්) |
| **ම:** | ත්වං වදසි(තෝ කියහි) | තුම්හෙ වදථ(තෙපි කියහු) |
| **උ:** | අහං වදාමි(මම් කියමි) | මයං වදාම(අපි කියමු) |

*   *   *

පාඩම 3

## කාල තුන

**12.** **වත්තමාන(වර්තමාන) කාල, අතීත කාල, අනාගත කාල** යැ යි කාල තුනෙකි. **වත්තමාන කාල** යනු දැන් පවත්නා කාලය යි. **අතීත කාල** යනු ගත වූ, පසු වූ කාලය යි. **අනාගත කාල** යනු තව ම නො ආ, මත්තට එන කාලය යි.

වර්තමාන කාලයට හෙවත් දැන් පවත්නා කාලයට අයත් ක්‍රියා **වර්තමාන කාලික ක්‍රියා** නම්. එය පාලි ව්‍යාකරණයෙහි **වත්තමානා විභත්ති** නමින් හැඳින්වේ.

### වත්තමානා විභත්ති

| | **ඒක වචන** | **බහු වචන** |
|---|---|---|
| **පඨම පුරිස** | ධාවති | ධාවන්ති |
| **මජ්ඣිම පුරිස** | ධාවසි | ධාවථ |
| **උත්තම පුරිස** | ධාවාමි | ධාවාම |

**13.** මේ උඩ දැක්වුණේ වත්තමානා විභත්තියේ පුරුෂ තුනෙහි ඒක වචන, බහු වචන දෙක්හි ක්‍රියාවක් යෙදෙන(වරනැගෙන) අන්දම යි. මෙසේ සැදෙන ක්‍රියා **ආඛ්‍යාතික ක්‍රියා** නම් වේ. මෙහි උඩ අංක 6 බලනු. මේ ක්‍රියා පදවල අග බලන්න. **ති, (අ)න්ති, සි, ථ, මි, ම** යන රූප හයෙක් දක්නා ලැබේ. මොහු **ආඛ්‍යාත ප්‍රත්‍යයයෝ** යි. උඩ දැක්වුණු ක්‍රියා පදවලින් මේ විභක්ති ප්‍රත්‍යයයන් ඉවත් කළොත් **ධාව** යන්න ඉතිරි වේ. මෙය ධාවති ධාවන්ති ආදී ආඛ්‍යාත ක්‍රියාවන් ගේ **අංගය** ය. **ධාතුවිකෘතිය** නමින් ද මෙය හැඳින්වේ.

## ඇබෑසිය

**(අ) පහත දැක්වෙන ක්‍රියාපද තේරුම් සමඟ පාඩම් කරන්න. ඒවායේ අංගයන් ද දක්වන්න.**

| | |
|---|---|
| පචති(පිසයි) | තිට්ඨති(සිටී) |
| ගච්ඡති(යයි) | ආගච්ඡති(එයි) |
| සයති(වැද හෙයි, සැතපෙයි) | රොදති(හඬයි) |
| හසති(සිනාසෙයි) | නිසීදති(හිඳී) |
| ආගච්ඡති(එයි) | වදති(කියයි) |

**(ආ) සිංහලයට නඟන්න.**

1. අහං පචාමි.
2. තුම්හෙ නිසීදථ.
3. තෙ රොදන්ති.
4. මයං ගච්ඡාම.
5. තුම්හෙ ආගච්ඡථ.
6. තෙ හසන්ති.
7. ත්වං සයසි.
8. තුම්හෙ රොදථ.
9. මයං තිට්ඨාම.
10. තුම්හෙ වදථ.

**(ඉ) පාලියට නඟන්න.**

1. තෙපි දුවහු.
2. ඔහු අඬති.
3. අපි සිටිමු.
4. මම් ඉඳිමි.
5. තෝ පිසහි.
6. ඔහු සිනාසෙති.
7. හේ වැද හෙයි.
8. අපි ඉඳිමු.
9. තෙපි එවු.
10. මම් කියමි.

* * *

# පාඩම 4

## උක්ත වීම

14. **යමි** කී කල කාගේ යෑමෙක් හැඟේ ද? ඔහු යන බවෙක් හෝ තොප යන බවෙක් හැඟේ ද? **හේ යමි** යි කියා හෝ **තෙපි යමි** යි කියා ශිෂ්ට ව්‍යවහාරයෙහි ඇත් ද? නැත. **මම් යමි** යි යනු ශිෂ්ට ව්‍යවහාරය යි. **මම්** යන පදය නො යොද **යමි** යී කී පමණින් ම **යන්නා මම්** යැ යි හැඟේ. **යමු** යි කීවොත් **යන්නෝ අපි** යි හැඟේ. **අපි යමු** යන්න ම ශිෂ්ට ව්‍යවහාරය බැවිනි. මෙසේ ම **යෙහි** යි කීවොත් යන්නා **යුෂමතා ය, තෝ** යැ යි හැඟේ. **යුෂමතා යෙහි, තෝ යෙහි** යනු ම ශිෂ්ට සමමත බැවිනි. **යෙයි, යයි** කී විට යන්නා හේ යැ යි හැඟේ. **මම යයි, අපි යයි, ඔහු යයි** කියා ශිෂ්ට සමමතයක් නැති බැවිනි. **යෙත්** කී විට යෑම කරන්නෝ **ඔහු** යැ යි හැඟේ. **ඔහු යෙත්** යන්න ම ශිෂ්ට සමමත බැවිනි.

මෙසේ ක්‍රියාව කරන්නා ගේ නම සඳහන් නූණත් ක්‍රියාවෙන් ම ඔහු මම ද? අපි ද? තෝ ද? තෙපි ද? තොප අප දෙපසින් පිටත් එක් කෙනෙක් ද? නැත හොත් බොහෝ දෙනෙක් ද? යි ඇඟවේ නම් එය ක්‍රියාවෙන් උක්ත වීම(පවසන ලද්දක්, අඟවන ලද්දක් වීම) නමි. මෙසේ ක්‍රියායෙන් උක්ත වූ නාමපදය හැම විට ම පඨමා විභත්තියෙන්(ප්‍රථමා විභක්තියෙන්) තැබිය යුතු.

**අහං ගච්ඡාමි(මම් යමි).** මෙහි **අහං** යනු උත්තම පුරිස පඨමා විභත්ති එකවචන යි. **ගච්ඡාමි** යනු එයට ගැළපෙන සේ උත්තම පුරිස එකවචනයෙන් ම සිටී. **මයං ගච්ඡාම(අපි යමු).** මෙ තැන ක්‍රියාව වූ **ගච්ඡාම** යන්න උත්තම පුරිස බහුවචන යි. එහි කර්තෘ වූ **මයං(අපි)** යන්න ද උත්තම පුරිස බහුවචනයෙන් සිටී. මයං යනු පඨමා විභත්ති(බහුවචන) යි.

**සො ගච්ඡති(හේ යයි).** මෙහි **ගච්ඡති** යනු පඨම පුරිස එක-වචන යි. එහි කර්තෘ වූ **සො** යන්න ද පඨම පුරිස එකවචන යි. පඨමා විභත්ති ගෙන සිටී. මෙ තැන **සො** යන්න වෙනුවට කවර නාමපදයක් වුවත් පඨමා විභත්ති එකවචනයෙන් තැබිය හැකි යි. සියලු නාම පඨම පුරිස කොටසට අයත් බව මතක තබා ගත යුතු. **සො ගච්ඡති** යන්න වෙනුවට **පුරිසො ගච්ඡති(මිනිසා යයි), බාලකො ගච්ඡති(ළමයා යයි)** ආදි වශයෙන් යොදත හැකියි.

## ඇබෑසිය

**(අ) වැරැදි හරිගස්සා ලියනු.**

**(සිංහල)**

1. ඔහු දුවයි.
2. මම යති.
3. තෙපි යති.
4. මම ලියහි.
5. අපි වසති.
6. තෝ යවු.
7. හේ ලියති.
8. තෙපි වසති.

**(ආ)**

**(පාලි)**

1. අහං ගච්ඡාම.
2. සො ගච්ඡසි.
3. ත්වං ධාවථ.
4. තුම්හෙ ආගච්ඡන්ති.
5. මයං වසාමි.
6. තෙ ගච්ඡථ.
7. සො ධාවසි.
8. තුම්හෙ ගච්ඡන්ති.

* * *

පාඩම 5

---

## නාම බෙදීම

15. පාලි භාෂාවේ නාම ශබ්ද ලිඞ්ග වශයෙන් තුනකට බෙදෙයි. **පුංලිඞ්ගික නාම, ඉත්ථිලිඞ්ගික නාම, නපුංසක ලිඞ්ගික නාම** වශයෙනි. සාමාන්‍යයෙන් පිරිමියකු අඟවන නාම **පුංලිඞ්ගික** යි. ස්ත්‍රියක අඟවන නාම **ඉත්ථිලිඞ්ගික** යි. ස්ත්‍රී පුරුෂ දෙකොටසටම අයත් නැතියකු පවසන නාම **නපුංසක ලිඞ්ගික** යි. දාරක(දරුවා) යනු පුංලිඞ්ගික නාමයකි. දාරිකා(දැරිය) යනු ඉත්ථිලිඞ්ගික නාමයෙකි. ඵල(ගෙඩිය) යනු නපුංසක ලිඞ්ගික නාමයෙකි. නාමයන් ගේ ලිඞ්ගභේදය පොත් කියවීමෙන් ම උගත යුතු.

16. සමහර නාම **අ** කාරයෙන් අන්ත වේ. පුරිස යැ යි කී විට එහි අගට ඇති **ස** යන්නේ අන්තිමට ඇහෙන්නේ **අ** ශබ්දය යි. එය **අ**කාරයෙන් අන්තවන ශබ්දයෙකි. **අ**කාරාන්ත නාමයෙකි. මුනි යි කී විට අගට ඇහෙන්නේ **ඉ**ශබ්දය යි. **ඉ**කාරාන්ත නාමයෙකි. මෙසේ **අ**කාරාන්ත, **ආ**කාරාන්ත, **ඉ**කාරාන්ත, **ඊ**කාරාන්ත, **උ**කාරාන්ත, **ඌ**කාරාන්ත, **ඔ**කාරාන්ත වශයෙන් ද ශබ්දයෝ කොටස්වලට බෙදෙත්. බුද්ධ, කඤ්ඤා, කපි, සෙනානී, ගරු, විඤ්ඤූ, ගො යනු පිළිවෙළින් උදාහරණ යි.

17. මේ හැම ශබ්දයෙක් වාක්‍යවල යෙදෙන සැටිය අනුව හත් අතකට බෙදෙයි. ඒ බෙදුම් හතට **විභත්ති හත** යැ යි ව්‍යවහාර යි.

පාලියෙහි විභත්ති හතට දෙන නම් පහත දැක්වේ. වරහන් ඇතුළත ඇත්තේ ඒවායේ සිංහල අර්ථ යි.

පඨමා විභත්ති (පෙර විබත)
දුතියා විභත්ති (දෙවෙනි විබත)
තතියා විභත්ති (තෙවෙනි විබත)
චතුත්ථී විභත්ති (සතරවන විබත)
පඤ්චමී විභත්ති (පස්වන විබත)
ඡට්ඨී විභත්ති (සවන විබත)
සත්තමී විභත්ති (සත්වන විබත)

## ඇබෑසිය

1. නාමයෝ ලිඞ්ග වශයෙන් කොටස් කීයකට බෙදෙත් ද? ඒ මොනවා ද? ලිඞ්ග තුනට නිදර්ශන තුනක් දෙන්න.

2. අන්තයේ ඇසෙන සවර අනුව නාම කී වගයට බෙදේ ද? ඒ මොනවා ද? නිදර්ශනය බැගින් දෙනු.

3. විභත්ති නම් කිමෙක් ද? නාම විභත්ති නම් කරනු.

* * *

# පාඩම 6

## පුංලිඞ්ගික නාම

18. නාමයක් විභත්ති අනුව සකස් වීමේ දී ඒකවචන, බහුවචන වශයෙන් ද දෙ කොටසකට බෙදෙත්. ඒකවචන නම් එක්කෙනකු හෝ එක් දෑයක් අඟවන වචන යි. බහුවචන නම් එක්කෙනකුට, එක් දෑයකට වැඩි දෙනකු, වැඩි දෑ පවසන වචන යි. **අශ්වයා, ගස** කී විට එක් අශ්වයෙක්, එක් ගසෙක් පැවැසේ. මේ සිංහලයේ යි. පාලියේත් මෙසේ ම ය. පහත දැක්වෙන නිදර්ශන වලින් මෙය වඩාත් හොඳට තේරුම් ගන්න.

**අස්ස ශබ්දය**

| | **ඒකවචන** | **බහුවචන** |
|---|---|---|
| **පඨමා විභත්ති** | අස්සො | අස්සා |
| සිංහල තේරුම | (අශ්වයා) | (අශ්වයෝ) |

**රුක්ඛ(ගස) ශබ්දය**

| | **ඒකවචන** | **බහුවචන** |
|---|---|---|
| **පඨමා විභත්ති** | රුක්ඛො | රුක්ඛා |
| සිංහල තේරුම | (ගස) | (ගස්හු, ගස්) |

තවත් නාම කිහිපයෙක පඨමා විභත්ති ඒකවචන බහුවචන රූප තේරුම් සමඟ ඊළඟ පිටුවේ දැක්වේ.

| ශබ්දය | පඨමා එකවචන | පඨමා බහුවචන |
|---|---|---|
| බාලක | බාලකො<br>(ළමයා) | බාලකා<br>(ළමෝ) |
| ගොන | ගොනො<br>(ගොනා) | ගොනා<br>(ගොන්නු) |
| චොර | චොරො<br>(සොරා) | චොරා<br>(සොරු) |
| රථ | රථො<br>(රථය, රිය) | රථා<br>(රථ, බොහෝ රිය) |

දැන් **ක්‍රියාපද** කිහිපයෙක් දැක්වෙත්

| | |
|---|---|
| කීළති | (සෙල්ලම් කරයි) |
| තිට්ඨති | (සිටී) |
| නිසීදති | (ඉඳී, ඉඳගනී) |
| උට්ඨහති | (නැඟී සිටී, නැගිට) |
| පලායති | (පලායයි, පැන දුවයි) |
| චලති | (සෙලවෙයි, සෙමින් යයි) |
| ආගච්ඡති | (එයි) |
| ධාවති | (දුවයි) |
| ගණ්හාති | (ගනී, ඩැහැගනී, අල්ලා ගනී) |
| පතති | (වැටෙයි) |
| රොදති | (හඬයි) |
| සයති | (වැදහෙයි, සැතපෙයි, නිදයි) |
| පචති | (පිසයි) |
| වසති | (වෙසෙයි) |

## නාම ශබ්ද

| | |
|---|---|
| ව්‍යග්ඝ | (ව්‍යාඝ්‍රයා) |
| රුක්ඛ | (ගස) |
| ථෙර | (ස්ථවිර තුමා, තෙර) |
| පුත්ත | (පුතා) |
| ආචරිය | (ඇදුරු තුමා) |
| උපාසක | (උපාසකයා, උවසුවා) |
| සෙවක | (සේවකයා, මෙහෙකරුවා) |
| සූද | (අරක්කැමියා) |
| මිග | (මුවා) |
| ගජ | (ඇතා) |
| බිළාල | (බළලා) |
| බාලක | (ළමයා) |

**මේවා වාක්‍යයේ යෙදෙන සැටි:**

| | |
|---|---|
| බාලකො කීළති. | (ළමයා සෙල්ලම් කරයි.) |
| බාලකා කීළන්ති. | (ළමෝ සෙල්ලම් කරත්.) |
| රුක්ඛො පතති. | (ගස වැටෙයි.) |
| රුක්ඛා පතන්ති. | (ගස්හු වැටෙත්, ගස් වැටේ.) |

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. ව්‍යග්ඝා ධාවති.
2. ථෙරා නිසීදන්ති.
3. ආචරියො ආගච්ඡති.
4. සෙවකො තිට්ඨති.
5. මිගා පලායන්ති.
6. බිළාලො ගණ්හාති
7. රුක්ඛා පතන්ති.
8. රථො චලති.
9. බාලකා රොදන්ති.
10. අස්සා පතන්ති.

**(අ) පාලියට නඟන්න.**

1. ඇදුරුතුමා ඉඳගනී.
2. ගස්හු සැලෙත්.
3. ව්‍යාඝ්‍රයා ඩැහැගනී.
4. මුවා වැටෙයි.
5. සෙවකයෝ එත්.
6. රථයෝ දුවත්.(රථ දුවයි)
7. ළමයි සෙල්ලම් කරත්
8. ගොන්නු නැගිටිත්.
9. මෙහෙකරුවා එයි.
10. ළමෝ සිනා සෙත්.

* * *

## පාඩම 7

### ආලපනෙ පඨමා
### (ආලපනාර්ථයෙහි ප්‍රථමා විභක්තිය)

19. පඨමා විභත්තිය **උක්තාර්ථයෙහි ප්‍රථමා**, **ආලපනාර්ථයෙහි ප්‍රථමා** යැ යි දෙකකට බෙදේ. මෙයට මුලින් ඉගැන්වුණේ උක්තාර්ථයෙහි ප්‍රථමා විභක්තිය යි. දැන් ආලපනෙ පඨමා විභත්ති(ආලපනාර්ථයෙහි ප්‍රථමා විභක්තිය) ඉගැන්වේ.

20. ආලපන නම් ඇමැතීම යි, නම කියා කැඳවීම යි.

දරුව, තෝ කොහි සිට එහි ද?
දරුවනි, තෙපි දැන් මෙහෙන් පිටත් වහු ද?
දරුව, මෙහි එන්න.
දරුවනි, එහි යන්න.

මේ සිංහල වාක්‍යවල පෙනෙන **දරුව** යන්න ආලපනාර්ථයෙහි ප්‍රථමා විභක්ති ඒක වචන යි. **දරුවනි** යන්න ආලපන ප්‍රථමා විභක්ති බහු වචන යි. **දරුව** යන්න පාලියට නැඟූ විට **දරක** යැ යි සිටී. **දරුවනි** යන්න **දරකා** යි සිටී. ආලපනාර්ථය වඩාත් පැහැදිලි කිරීමට ඒ පදවලට මුලින් **හෙ** යන නිපාතය යොදනු ලැබේ.

හෙ දරක(එම්බා දරුව)
හෙ දරකා(එම්බා දරුවනි)

බහුවචනයේ දී **භවනෙතා දරකා** යැ යි **හෙ** යන්න වෙනුවට **භවනෙතා** යන්න යෙදිය හැකිය.

හෙ දරක(පින්වත් දරුව)
භවනෙතා දරකා(පින්වත් දරුවනි)

## ප්‍රශ්න ඇසීම

**21.** ප්‍රශ්න ඇසීමේ දී වාක්‍යයේ මුලට **අපි, අපි නු** යන නිපාත පද යොදනු ලැබේ.

අපි ත්වං ගච්ඡසි?(තෝ යෙහි ද?)

අපි නු තෙ ආගච්ඡන්ති?(ඔහු එත් ද?)

**කිං** යන්න ද වාක්‍යයේ මුලට හෝ මැදට හෝ අගට යොදත හැක්ක. **කිං** යන්න **කවර හෙයින්** යන අර්ථයේ ද යෙදේ.

කිං ගච්ඡසි?
(කවර හෙයින් යෙහි ද?)

කිං සො ගච්ඡති?
(හේ යයි ද? හේ කවර හෙයින් යයි ද?)

සො කිං ගච්ඡති?
(හේ යයි ද? හේ කවර හෙයින් යයි ද?)

සො ගච්ඡති කිං?
(හේ යයි ද? හේ කවර හෙයින් යයි ද?)

**කිං** යන්න ළඟට **නු** හෝ **පන** යන නිපාතයක් ද සමහර තැනක එක් වෙයි.

කිනනු(කිං නු) සො ගච්ඡති?
(හේ යයි ද? හේ කවර හෙයින් යයි ද?)

කිම්පන(කිං පන) සො ගච්ඡති?
(හේ යයි ද? හේ කවර හෙයින් යයි ද?)

**22.** ප්‍රශ්නාර්ථය පවසන **කථං, කදා, කත්‍ථ, කුත්‍ර, කුහිං, කුතො** යන පද ද ප්‍රශ්න ඇසීමෙහි යොදනු ලැබේ.

කථං?
(කෙසේ ද?)

කදා?
(කවර දා ද?)

කුතො?
(කොහෙන් ද? කොයිබින් ද?)

කත්‍ථ?
(කොහි ද? කොහාට ද?)

කුත්‍ර?
(කොහි ද? කොහාට ද?)

කුහිං?
(කොහි ද? කොහාට ද?)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. හෙ පුත්‍ත, කිං ත්‍වං ගච්ඡසි?
2. හෙ දරකා, තුම්හෙ කුහිං කීළථ?
3. හෙ පුරිස, ත්‍වං කුතො ආගච්ඡසි?
4. හෙ කුමාරා, තුම්හෙ කිං රොදථ?
5. භවන්‍තො සෙවකා, තුම්හෙ කුහිං වසථ?
6. භවන්‍තො උපාසකා, ථෙරො කත්‍ථ වසති?
7. හෙ සූද, අපි නු ත්‍වං පචසි?
8. හෙ සෙවක, අපි නු රුක්‍ඛා පතන්‍ති.
9. කුමාරා, කිං තුම්හෙ සයථ?

(අ) පාලියට නඟන්න.

1. දරුව, සේවකයා කොහි නිදයි ද?
2. සේවකයිනි, සොරු කොහි සිටිත් ද?
3. උවසුවනි(උපාසකයිනි), තෙපි කොහි යෙවු ද?
4. පුත, ළමෝ කොහි සෙල්ලම් කෙරෙත් ද?
5. සේවකය, ඇතා කොහාට දුවයි ද?
6. දරුවනි, තෙපි කොහි වසවු ද?
7. පින්වත් ආචාය්‍ර්‍යය, අපි කොහි ඉඳගනුමෝ ද?
8. සේවකය, ඔහු කොයිබින් එත් ද?
9. අරක්කැමියනි, තෙපි කොහි පිසවු ද?
10. අපි යමු ද?

* * *

## පාඩම 8

### කර්මය

**23.** ක්‍රියාවට හසුවන්නේ **කර්මය** යි. **මිනිසා ගස කපයි** කී තැන **කපයි** යනු **ක්‍රියාව** යි. ඒ ක්‍රියාව කරන්නා(එහි කර්තෘ) මිනිසා ය. ඔහුගේ ඒ ක්‍රියාවට හසු වන, යටත් වන දෑය(හෙවත් එහි කර්මය) ගස යි. කර්තෘ පඨමා විභත්තියෙන් සිටී. එවිට කර්මය දුතියා විභත්තියෙන් තැබිය යුතු යි. උඩ දැක්වුණු සිංහල වැකිය පාලියට නැඟූ විට **පුරිසො රුක්ඛං ඡින්දති** යි සිටී. මෙහි **රුක්ඛං** යනු දුතියා විභත්ති ඒක වචන යි.

දැන් නාමයක් දුතියා විභත්ති ඒක වචන, බහු වචන දෙකෝ යෙදෙන හැටි දක් වේ.

**දුතියා විභත්ති**

| | **ඒක වචනය** | **බහු වචනය** |
|---|---|---|
| **පුරිස ශබ්දය** | පුරිසං(පුරුෂයා) | පුරිසෙ(පුරුෂයන්) |
| **බාලක ශබ්දය** | බාලකං(ළමයා) | බාලකෙ(ළමුන්) |
| **රුක්ඛ ශබ්දය** | රුක්ඛ(ගස) | රුක්ඛෙ(ගස්) |

පුරිසො ගොණං පහරති. (මිනිසා ගොනාට ගසයි.)

පුරිසා චොරෙ පහරන්ති. (මිනිස්සු සොරුනට ගසත්.)

ගොණො ඝටං භින්දති. (ගොනා කළය බිඳියි.)

මනුස්සා ථෙරෙ වන්දන්ති. (මිනිස්සු තෙරුන් වඳිත්.)

**24.** යම් තැනකට යයි නම්, බසී නම්, නඟී නම්, ඇතුළු වෙයි නම්, ඒ තැන පවසන පදය ද දුතියා විභත්තියෙන් සිටී.

| | |
|---|---|
| සො ගාමං ගච්ඡති. | (හේ ගමට යයි.) |
| සො කාසරං ඔතරති. | (හේ වැවට බසී.) |
| සො පබ්බතං අභිරුහති. | (හේ කන්ද නඟී.) |
| සො ගාමං පවිසති. | (හේ ගමට වදී.) |

## නාම ශබ්ද

විහාර(වෙහෙර)
මජ්ජාර(බළලා)
ඔදන(බත)
ගාම(ගම)
සොන(බල්ලා)
කාසාර(වැව)
බිළාල(බළලා)
ඝට(කළය)
පබ්බත(කන්ද)
ධම්ම(ධර්මය, දහම)

## ක්‍රියා පද

බන්ධති(බඳී)
දෙසෙති(දෙසයි)
මාරෙති(මරයි)
අභිරුහති(නඟී)
වන්දති(වඳී)
උපසඞ්කමති(වෙත යයි, වෙත එළඹෙයි)
පචති(පිසයි)
ඡින්දති(සිඳියි, කපයි)

පවිසති(පිවිසෙයි, ඇතුල් වෙයි)
අනුබන්ධති(ලුහු බඳී)
පස්සති(දකී)
ඔරුහති(බසී)
ඔතරති(බසී)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟනු.(මේ වාක්‍යවල කර්තෘ කර්ම ද දක්වනු).**

1. පුරිසො ගොනං බන්ධති.
2. සොනා මිගං අනුබන්ධන්ති.
3. බුදධො ධමමං දෙසෙති.
4. මයං විහාරං පස්සාම.
5. ව්‍යගඝො මිගං මාරෙති.
6. ගජා කාසාරං ඔරුහන්ති.
7. උපාසකා පබබතං අභිරුහන්ති.
8. සොනා චොරෙ අනුබන්ධන්ති.
9. මයං බුදධං වන්දම.
10. කිං තුමහෙ ථෙරෙ උපසංකමථ?

**(ආ) පාලියට නඟනු.**

1. බල්ලා බළලා ලුහුබඳී.
2. අපි ගස කපමු ද?
3. දරුව, අරක්කැමියා බත පිසයි ද?
4. අපි වැවට බසිමු ද?

5. තෙරවරු කන්ද නඟිත්.
6. බුදුරජ ගමට පිවිසෙයි.
7. උපාසකවරු විහාරයට යත්.
8. මිනිස්සු බුදුරජුනු වඳිත්.
9. ඇත්තු කන්ද නඟිත්.
10. සථවිර තෙම දහම් දෙසයි.

* * *

# පාඩම 9

## අනාගත කාලික ක්‍රියා

**25.** තව ම පටන් නො ගත්තු, මේ මොහොතින් පසු අද ම හෝ පසු දවසෙක හෝ කැරෙන ක්‍රියාව **අනාගත කාලික ක්‍රියා** නමි. පාලියෙහි මෙය **භවිස්සන්ති විභත්ති** නමින් හැඳින්වේ.

වත්මාන කාලික පචති යන ක්‍රියාව අනාගත කාලික ව මෙසේ මඳක් වෙනස් ව සෑදේ.

| | ඒක වචනය | බහු වචනය |
|---|---|---|
| **පඨම පුරිස** | (සො) පචිස්සති | (තෙ) පචිස්සන්ති |
| **මජ්ඣිම පුරිස** | (ත්වං) පචිස්සසි | (තුම්හෙ) පචිස්සථ |
| **උත්තම පුරිස** | (අහං) පචිස්සාමි | (මයං) පචිස්සාම |

### අථ

සො පචිස්සති. (හේ - මතු - පිසන්නේ ය.)

තෙ පචිස්සන්ති. (ඔහු - මතු - පිසන්නාහ.)

ත්වං පචිස්සසි. (තෝ(නුඹ) - මතු - පිසන්නෙහි.)

තුම්හෙ පචිස්සථ.(තොපි - මතු - පිසන්නහු.)

අහං පචිස්සාමි. (මම - මතු - පිසන්නෙමි.)

මයං පචිස්සාම. (අපි - මතු - පිසන්නමු.)

## අනාගත කාලික රූප

**කිණාසි(මිලයට ගනී)**

| | | |
|---|---|---|
| **පඨම පුරිස** | සො කිණිස්සති | තෙ කිණිස්සන්ති |
| **මජ්ඣිම පුරිස** | ත්වං කිණිස්සසි | තුම්හෙ කිණිස්සථ |
| **උත්තම පුරිස** | අහං කිණිස්සාමි | මයං කිණිස්සාම |

**දෙසෙති(දෙසයි)**

| | | |
|---|---|---|
| **පඨම පුරිස** | සො දෙසෙස්සති | තෙ දෙසෙස්සන්ති |
| **මජ්ඣිම පුරිස** | ත්වං දෙසෙස්සසි | තුම්හෙ දෙසෙස්සථ |
| **උත්තම පුරිස** | අහං දෙසෙස්සාමි | මයං දෙසෙස්සාම |

**කරොති(කරයි)**

| | | |
|---|---|---|
| **පඨම පුරිස** | සො කරිස්සති | තෙ කරිස්සන්ති |
| **මජ්ඣිම පුරිස** | ත්වං කරිස්සසි | තුම්හෙ කරිස්සථ |
| **උත්තම පුරිස** | අහං කරිස්සාමි | මයං කරිස්සාම |

### අර්ථ

සො කිණිස්සති (හේ - මතු - මිලයට ගන්නේ ය).

සො දෙසෙස්සති (හේ - මතු - දෙසන්නේ ය).

සො කරිස්සති (හේ - මතු - කරන්නේ ය).

### ක්‍රියා පද

උපසඞ්කමති(වෙත එළැඹෙයි)
බන්ධති(බඳී)
නෙති(ගෙන යයි, පමුණුවයි)

## නිපාත පද

අජ්ජ(අද)

සුවෙ(හෙට)

ඉදනි(දැන්)

පරසුවෙ(අනිද්ද)

සායං(සවස)

පාතො(උදසන)

ඉධ, අත්‍ර, එත්ථ(මෙහි, මෙහාට)

තහිං, තත්‍ර, තත්ථ(එහි, එහාට)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟනු.**

1. අහං සුවෙ ගාමං ගච්ඡිස්සාමි.
2. පරසුවෙ පුත්තා ආගච්ඡිස්සන්ති.
3. මයං අජ්ජ ථෙරං උපසඞ්කමිස්සාම.
4. කිං ත්වං සුවෙ ධම්මං දෙසෙස්සසි?
5. භවන්තො පුරිසා, තුම්හෙ ගජං කුහිං නෙස්සථ?
6. හෙ පුත්ත, සෙවකො කදා ආගච්ඡිස්සති.
7. මයං පරසුවෙ පබ්බතං අභිරුහිස්සාම.
8. කින්නු සො සුවෙ අස්සං කිණිස්සති?
9. කුතො චොරා ආගච්ඡිස්සන්ති?
10. කථං තුම්හෙ සුවෙ තහිං ගච්ඡිස්සථ?

**(ආ) පාලියට නඟනු.**

1. තෙපි හෙට කොහි යන්නහු ද?
2. මම අද සවස ගොනා බඳින්නෙමි.
3. හෙට උදේ ළමෝ මෙහි එන්නාහ.
4. මිනිස්සු හෙට ගස කපන්නාහ.
5. සේවකය, පුතා එහාට කෙසේ යන්නේ ද?
6. එම්බා දරුවනි, තෙපි අද වෙහෙරට යන්නහු ද?
7. උපාසකයෝ අද කොහි යන්නාහු ද?
8. හෙට අපි ගමට යන්නමු.
9. තෙපි හෙට මෙහෙන් යන්නහු ද?
10. අපි අනිද්ද එහි යන්නමු.

* * *

පාඩම 10

## තතියා විභත්තිය

**26.** කිසි ක්‍රියාවක් කිරීමට උපකාරී වන දෑය **කරණ** නම්. **දංඩෙන් ගසයි** කී තැන දංඩෙන් යන්නෙන් දංඩේ උපකාරයෙන් යන අර්ථය පැවැසෙයි.

**හේ දංඩෙන් ගොනාට ගසයි** යන්න පාලියට නැගූ විට **සො දණ්ඩෙන ගොනං පහරති** යි කියා සිටී.

මෙහි **දණ්ඩෙන** යනු කරණාර්ථයේ තතියා විභත්ති එක-වචනය යි.

නාමශබ්ද කිහිපයක් තතියා විභත්තියෙන් සිටින හැටි(වර නැඟෙන හැටි) පහත දැක්වේ.

| නාමශබ්දය | තතියා එකවචන | තතියා බහුවචන |
|---|---|---|
| **බුද්ධ** | බුද්ධෙන (බුදු රජු කරණ කොට ගෙන) | බුද්ධෙහි(බුද්ධෙභි) (බුදුවරුන් කරණ කොට ගෙන) |
| **ධම්ම** | ධම්මෙන (ධර්මයෙන්, ධර්මය කරණ කොට) | ධම්මෙහි(ධම්මෙභි) (ධර්මයන්ගෙන්, ධර්මයන් කරණ කොට ගෙන) |
| **හත්ථ** | හත්ථෙන (අතින්) | හත්ථෙහි(හත්ථෙභි) (අත්වලින්) |
| **පොත** | පොතෙන (නැවින්) | පොතෙහි(පොතෙභි) (නැව්වලින්) |
| **වාත** | වාතෙන (සුළඟින්) | වාතෙහි(වාතෙභි) (සුළංවලින්) |

## නාම ශබ්ද

දණ්ඩ(දංඩ)
ලගුළ(පොල්ල)
ව්‍යාධ(වැද්ද)
නබ(නිය)
අකොකාධ(ක්‍රෝධ නො කිරීම)
සමුද්ද(මුහුද)
නාග(නයා)
ඛන්ධ(උරහිස)
කුටුම්බික(කෙළෙඹියා)
යොධ(සෙබළා)
සප්ප(සර්පයා)
ඛග්ග(කඩුව)
වෙජ්ජ(වෙද)
සාමණෙර(හෙරණ)
වාත(සුළඟ)
ගෙණ්ඩුක(පන්දුව)
රථ(රිය)
මජ්ජාර(බළලා)
දන්ත(දත)
කොධ(ක්‍රෝධය)
ගිජ්ඣ(ගිජුලිහිණියා)
දාස(දාසයා)
භාර(බර)
කුමාර(කුමරුවා, ළමයා)
පච්චාමිත්ත(සතුරා)
හත්ථ(අත)
ඔසධ(බෙහෙත)
රොග(ලෙඩ)
උස්සාහ(උත්සාහය)
භට(සෙබළා)

## ක්‍රියා පද

ගණ්හාති(ගනී, අල්ලාගනී)

ජිනාති(දිනයි)

තරති(තරණය කරයි, එගොඩ යයි, ඉක්ම යයි)

වහති(උසුලයි, උසුලාගෙන යයි)

වූපසමෙති(සංසිඳුවයි, සුව කරයි)

උග්ගණ්හාති(උගනී)

පහරති(ගසයි)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟනු.**

1. සෙවකො දණ්ඩෙන චොරං පහරති.
2. කුටුම්බිකො සුවෙ රථෙන ගාමං ගච්ඡිස්සති.
3. කුමාරා ඉදානි ගෙණ්ඩුකෙහි කීළන්ති.
4. ව්‍යාධො ලගුළෙන මිගං පහරති.
5. මජ්ජාරො දන්තෙහි මූසිකං ගණ්හාති.
6. මයං අඞ්කුසෙන කොධං ජිනාම.
7. මනුස්සා පොතෙහි සමුද්දං තරන්ති.
8. ගිජ්ඣා නඛෙහි නාගං ගණ්හාති.
9. දාසො ඛන්ධෙන භාරං වහති.
10. යොධො ඛග්ගෙන පච්චාමිත්තං පහරති.

(ආ) පාලියට නඟනු.

1. සොරා පොල්ලෙන් ගොනාට ගසයි.
2. මෙහෙකරුවා උරහිසින් බර උසුලාගෙන යයි.
3. බළලා නියවලින් සජීයාට ගසයි.
4. හෙතෙම අතින් කඩුව ගනී.
5. අපි රථයෙන් ගමට යමු.
6. වෙද්දු බෙහෙත්වලින් ලෙඩ සුව කෙරෙත්.
7. හෙරණහු උත්සාහයෙන් දහම් උගනිත්.
8. ගස්හු සුළඟින් සැලෙත්.
9. කෙළෙඹියා අතින් මෙහෙකරුවාට ගසයි.
10. කුමරුවෝ රියෙන් ගමට යෙත්.

* * *

පාඩම 11

## අතීත කාලික ආඛ්‍යාතික ක්‍රියා

**27.** ගච්ඡති(යයි) යනු වර්තමාන කාලික ආඛ්‍යාතික ක්‍රියා පදයෙකි. මෙහි අග ඇති **ති** යන්න ඉවත් කළ විට **ගච්ඡ** යන්න ඉතිරි වේ. එය ඒ ක්‍රියා රූපයේ අඩගය යි. එයට අතීත කාලික ආඛ්‍යාතික ප්‍රත්‍යයයන් එකතු වීමෙන් කැරැ නිමවූ(අතීත) ක්‍රියා අඟවන පද සෑදේ. මේ ක්‍රියාරූප වර්ගයට පැරැණි ඇදුරෝ **අජ්ජතනී විභත්ති** යැ යි නම් කළහ.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| **පඨම පු.** | (සො) ආගච්ඡි<br>(හේ ගියේ ය) | (තෙ) ආගච්ඡිංසු<br>(ඔහු ගියාහ) |
| **මජ්ඣිම පු.** | (ත්වං) ආගච්ඡො,ආගච්ඡි<br>(තෝ(නුඹ) ගියෙහි) | (තුම්හෙ) ආගච්ඡිත්ථ<br>(තෙපි ගියහු) |
| **උත්තම පු.** | (අහං) ආගච්ඡිං<br>(මම් ගියෙමි) | (මයං) ආගච්ඡිම්හා<br>(අපි ගියමු) |

මෙහි ක්‍රියා පදයේ මුලට **අ**යන්න නැති ව ද ක්‍රියා පදය සිටී. **ගච්ඡි, ගච්ඡිංසු** ආදි වශයෙනි.

**ගච්ඡ** යන්නේ අඩගය **අ**යන්නෙන් අන්ත ව සිටී. **දෙසෙ** ආදී සමහර ක්‍රියාඩග **එ**කාරයෙන් අන්ත වේ. ඒවායේ ක්‍රියාරූප සෑදෙනුයේ මඳක් වෙනස ව ය. මෙසේ යි.

දෙසෙති: දෙසෙ(අඩගය)

## අතීත කාලික ක්‍රියා රූප

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| **පඨම පු.** | (සො) දෙසෙසි<br>(හේ දෙසීය) | (තෙ) දෙසෙසුං<br>(ඔහු දෙසූහ) |
| **මජ්ඣිම පු.** | (ත්වං) දෙසෙසි<br>(තෝ දෙසීහි) | (තුම්හෙ) දෙසයිත්ථ<br>(තෙපි දෙසූහු) |
| **උත්තම පු.** | (අහං) දෙසෙසිං<br>(මම් දෙසීම්) | (මයං) දෙසයිම්හා<br>(අපි දෙසූමු) |

ක්‍රියා පද කිහිපයෙක වත්තමාන අතීත කාලික පඨම පුරිස ඒකවචන රූප කිහිපයෙක් පහත දැක්වෙත්. ඒවා අනුව ඒවායේ ඉතිරි රූප ද තනන්නට පුහුණු විය යුතු.

| **වත්තමාන**<br>**(පඨම පුරිස) ඒක වචන** | **අතීත**<br>**(පඨම පුරිස) ඒක වචන** |
|---|---|
| පහරති(ගසයි) | පහරී(ගැසී ය) |
| කීළති(සෙල්ලම් කරයි) | කීළි, අකීළි(සෙල්ලම් කෙළේ ය) |
| ගණ්හාති(ගනී) | ගණ්හී, අගණ්හී(ගත්තේ ය) |
| ජිනාති(දිනයි) | ජිනී, අජිනී(දිනුවේ ය) |
| මාරෙති(මරයි) | මාරෙසි, අමාරෙසි(මැරී ය) |
| වූපසමෙති(සංසිඳුවයි) | වූපසමෙසි(සංසිඳුවී ය) |
| උඩ්ඩෙති(ඉගිලෙයි) | උඩ්ඩෙසි(ඉගිළුණේ ය) |
| පවිසති(පිවිසෙයි) | පාවිසි(පිවිසුණේ ය) |
| වහති(උසුලා ගෙන යයි) | වහී(උසුලා ගෙන ගියේ ය) |

ක්‍රියා පදයට මුලින් උපසර්ගයක් සිටියොත් එයට මුලින් අකාරය එක් නො වේ. අ කාරය එක්වන්නේ ධාතුවට මුලිනි. මතු පාඩමක දී මෙය විස්තර කැරෙයි.

උඩෙඩසි(උ + ඩී)

පහරි(ප + හර)

**ඇබෑසිය**

**(අ) සිංහලයට නඟනු.**

1. සෙවකො දණ්ඩෙන චොරෙ පහරි.
2. කුටුම්බිකො රථෙන ගාමං ගච්ඡි.
3. බාලකා ගෙණ්ඩුකෙහි කීළිංසු.
4. ව්‍යාධො ලගුළෙන මිගං පහරි.
5. මජ්ජාරො දන්තෙහි මූසිකං ගණ්හි.
6. දාසො ඛන්ධෙන භාරං වහී.
7. මනුස්සා පොතෙන සමුද්දං තරිංසු.
8. ගිජ්ඣා නඛෙහි නාගං ගණ්හි.
9. ව්‍යග්ඝො ගොණං මාරෙසි.
10. වාතෙන රුක්ඛා චලිංසු.

(ආ) පාලියට නඟනු.

1. මිනිසා දංඩෙන් සොරාට ගැසී ය.
2. බළලා නියවලින් සපීයාට ගැසී ය.
3. සෙබලා අතින් කඩුව ගත්තේ ය.
4. අපි රථයෙන් ගමට ගියමු.
5. වෙද බෙහෙතින් ලෙඩ සුව කෙළේ ය.
6. හෙරණ උත්සාහයෙන්(බණ) දහම් උගත්තේ ය.
7. ගස සුළඟින් සැලිණි.
8. අපි පයින් ගමට ගියමු.
9. වඳුරා ගස් නැංගහ.
10. ළමෝ රිය නැඟුණහ.

* * *

## පාඩම 12

### පූර්වක්‍රියාව

28. හෙ තෙම **අවුත් ඉඳගනී.** මේ වාක්‍යයේ **ඉඳගනී** යනු අවසාන ක්‍රියා පදය යි. **අවුත්** යන්නෙන් ඉඳගැන්මට පළමුවෙන් කළ ක්‍රියාව පැවැසෙයි. **අවුත්** යනු **පූර්වක්‍රියාව** යි.

උඩ සඳහන් වාක්‍යය පාලියට නැගූ විට, **සො ආගන්ත්වා නිසීදති** යි සිටී. මෙහි **ආගන්ත්වා** යනු **පූර්වක්‍රියාව(පුබ්බක්‍රියා)** යි. මෙසේ **ත්වා**යන්න එක්වී හැදෙන ක්‍රියා **පූර්වක්‍රියා** යි දත යුතු.

පහත වර්තමානකාලික ක්‍රියාපද කිහිපයක් හා ඒවායින් හැදෙන පූර්වක්‍රියාව පද දැක්වේ.

| **වර්තමානකාලික ක්‍රියාව** | **පූර්වක්‍රියාව** |
|---|---|
| ගච්ඡති(යයි) | ගන්ත්වා(ගොස්, ගොසින්) |
| කීළති(සෙල්ලම් කරයි) | කීළිත්වා(සෙල්ලම් කොට) |
| පහරති(පහරී, ගසයි) | පහරිත්වා(පැහැර, ගසා) |
| මාරෙති(මරයි) | මාරෙත්වා(මරා) |
| ගණ්හාති(ගනී, අල්ලාගනී) | ගණ්හිත්වා, ගහෙත්වා (ගෙන, අල්ලාගෙන) |
| උඩ්ඩෙති(ඉගිළෙයි) | උඩ්ඩෙත්වා(ඉගිළ) |
| පචති(පිසයි) | පචිත්වා(පිස) |
| සයති(නිදයි) | සයිත්වා(නිදා, හෙව) |
| ධාවති(දුවයි) | ධාවිත්වා(දුව ගොස්) |

| වත්මානකාලික ක්‍රියාව | පූර්වක්‍රියාව |
| --- | --- |
| තරති(ඉක්ම යයි, එගොඩ යයි) | තරිත්වා(ඉක්මැ ගොස්) |
| භුඤ්ජති(වළඳයි) | භුඤ්ජිත්වා(වළඳවා) |
| පස්සති(දකී) | පස්සිත්වා(දැක) |
| පාපුනාති(පැමිණෙයි) | පාපුනිත්වා(පැමිණ) |
| පවිසති(පිවිසෙයි) | පවිසිත්වා(පිවිස) |
| නික්ඛමති(නික්මෙයි) | නික්ඛමිත්වා(නික්ම) |
| බන්ධති(බඳී) | බන්ධිත්වා(බැඳ) |
| ආනෙති(ගෙනෙයි) | ආනෙත්වා(ගෙනවුත්) |
| වූපසමෙති(සංසිඳුවයි, සුවකරයි) | වූපසමෙත්වා(සංසිඳුවා, සුවකොට) |
| උග්ගණ්හාති(උගනී) | උග්ගණ්හිත්වා, උග්ගහෙත්වා (ඉගෙන) |
| චලති(සැලෙයි, සෙලවෙයි) | චලිත්වා(සැලී) |
| පලායති(පලායයි) | පලායිත්වා(පලාගොස්) |
| පච්චාගච්ඡති(පෙරළා එයි) | පච්චාගන්ත්වා(පෙරළා අවුත්) |

**නාම ශබ්ද**

| | |
| --- | --- |
| ආරාම(වත්ත) | ව්‍යාධ(වැද්ද) |
| අච්ඡ(වලසා) | ආකාස(අහස) |
| ඔදන(බත්) | මූසික(මීයා) |
| පොත(නැව) | ජම්බුදීප(දඹදිව) |
| පත්ත(පාත්‍රය) | හත්ථ(අත) |
| ගොපාල(ගොපල්ලා) | |

## නිපාත

හියෝ(ඊයේ)

අජ්ජ(අද)

දිවා(දවල්)

බහි(පිටත)

සායං(සවසැ)

ඉධ(මෙහි, මෙහි දී)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟනු.

1. කුමාරා හියෝ ආරාමං ගන්ත්වා ගෙණ්ඩුකෙහි කීළිංසු.
2. ව්‍යාධා ලගුළෙහි පහරිත්වා අචඡං මාරෙසුං.
3. ගිජ්ඣො නඛෙහි නාගං ගහෙත්වා ආකාසං උඩ්ඩෙසි.
4. සූදෙ ඔදනං පචිත්වා තත්ථ ගන්ත්වා සයති.
5. මජ්ජාරො දනෙතහි මූසිකං ගහෙත්වා තහිං ධාවි.
6. මනුස්සා පොතෙන සමුද්දං තරිත්වා ජම්බුදීපං පාපුනිංසු.
7. ථෙරො හත්ථෙන පත්තං ගහෙත්වා ගාමං පාවිසි.
8. බාලකා ගෙණ්ඩුකෙ ගහෙත්වා ආරාමං පවිසිංසු.
9. සෙවකො බන්ධෙන භාරං ගහෙත්වා අජ්ජ ඉතො නික්ඛමි.
10. ගොපාලො ගොනං බන්ධිත්වා ඉධ ආනෙසි.

(ආ) පාලියට නඟනු.

1. සොරා වත්තට පිවිස ගස් කැපී ය.
2. බළලා නියවලින් ගසා නයා මැරීය.
3. මම සොරා දැක කඩුව ගෙන නික්මුණෙමි.
4. මම රියෙන් එහි ගොස් වෙද මහතා(කැඳවා) ගෙනෙන්නෙමි.
5. වෙද්දු බෙහෙත්වලින් රෝග සුව කරත්(සංසිඳුවත්).
6. ඔහු අද දවල් මෙහි දී වළඳ සවස ගමට යන්නාහ.
7. සෙබළු කඩුවලින් පැහැර සතුරන් මැරූහ.
8. හෙරණහු උත්සාහයෙන් දහම් ඉගෙන ගත්හ.
9. සුළඟින් ගස්හු සැලුණහ.
10. හොරු සෙබළුන් දැක පලා ගියාහ.

* * *

පාඩම 13

## චතුර්ථි විභත්තිය

| නාමශබ්ද | ඒකවචන | බහුවචන |
|---|---|---|
| බුද්ධ | බුද්ධාය, බුද්ධස්ස (බුදුරජුට, බුදුරජු පිණිස) | බුද්ධානං (බුදුරජුනට, බුදුරජුන් පිණිස) |
| ධම්ම | ධම්මාය, ධම්මස්ස (දහමට, දහම පිණිස) | ධම්මානං (දහමුනට, දහම් පිණිස) |
| හත්ථ | හත්ථාය, හත්ථස්ස (අතට, අත පිණිස) | හත්ථානං (අත්වලට, අත් පිණිස) |

29. යමකුට කිසිවක් දෙයි නම් ඒ දෙන දෑ ලබන්නා **චතුර්ථි විභත්තියෙන්** සිටී.

පුරිසො යාචකස්ස ආහාරං දෙති.
(මිනිසා සිඟන්නාට අහර දෙයි.)

මෙහි යාචකස්ස(සිඟන්නාට) යනුවෙන් ආහාර ලබන්නා දැක්වේ.

සූදො සාමිකස්ස ඔදනං පචති.
(අරක්කැමියා සවාමියාට බත් පිසයි.)
(සවාමියා සඳහා, සවාමියා පිණිස)

30. යමකුට සතුටු වේ නම්, කිපේ නම්, ඊර්ෂ්‍යා කෙරේ නම් ඔහු ද චතුර්ථී විභක්තියෙන් දැක්විය යුතුය.

සාමිකො සෙවකස්ස තුස්සති.
(ස්වාමියා සේවකයාට සතුටු වෙයි.)

සාමිකො සෙවකස්ස කුජ්ඣති.
(ස්වාමියා සේවකයාට කිපෙයි.)

අමච්චො කුමාරස්ස උසූයති.
(ඇමැතියා කුමරුවාට ඊර්ෂ්‍යා කරයි.)

31. න(නො)
න ගච්ඡති(නො යයි)

### නාම ශබ්ද

භූප(රජ)
ආගන්තුක(අමුත්තා)
පිණ්ඩ(පිඬු, ආහාර)
සංගාම(සටන)
පාසාද(ප්‍රසාදය, මාලිගාව)
ගෙහ(ගෙය)
උපහාර(තුටු පඬුරු)
පහාර(පහර)
වාස(වාසය, විසීම)
මාස(මාසය)
අමච්ච(ඇමැතියා)
නිවාස(නිවෙස, නවාතන)
භාතික(සොහොයුරා)
තච්ඡක(වඩුවා)
යාචක(සිඟන්නා)
සංඝ(භික්ෂු සංඝයා)
සිස්ස(ශිෂ්‍යයා)
වාණිජ(වෙළෙන්ද)
සක්කාර(සත්කාරය)

## ක්‍රියාපද

| | |
|---|---|
| නියාාදෙති(පාවාදෙයි, පවරයි, බාරදෙයි) | නියාාදෙත්වා(පාවා දී, පවරා, බාර දී) |
| දෙති(දෙයි) | දත්වා(දී) |
| අදාසි(දුන්නේ ය) | |
| පටියාදෙති(පිළියෙල කරයි) | පටියාදෙත්වා(පිළියෙල කොට) |
| කුජ්ඣති(කිපෙයි) | කුජ්ඣිත්වා(කිපී) |
| කරොති(කරයි, තනයි) | කත්වා(කොට) |
| අකාසි(කෙළේය, තැනීය) | |
| උසූයති(ඊෂ්‍යා කරයි) | උසූයිත්වා(ඊෂ්‍යා කොට) |
| උපනාමෙති(පිරිනමයි, දෙයි) | උපනාමෙත්වා(පිරිනමා) |
| විකකිණාති(විකුණයි) | විකකිණිත්වා(විකුණා) |
| විකකිණි, විකෙකසි(වික්කේය) | විකෙකත්වා(විකුණා) |
| දෙසෙති(දෙසයි) | දෙසෙත්වා(දෙසා) |
| මාපෙති(මවයි, තනයි) | මාපෙත්වා(මවා, තනා) |

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟනු.**

1. භූපො අමච්චසස ගාමං අදාසි.
2. සූද ආගනතුකානං ආහාරං පටියාදෙසුං.
3. හෙ පුරිස, කිං ත්වං දරකසස කුජ්ඣසි?
4. මයං පරසුවෙ ආගනතුකානං නිවාසෙ පටියාදෙසසාම.
5. උපාසකා ථෙරානං විහාරං කරිසසනති.
6. ඉදනි සාමණෙරො පතතං ගහෙත්වා පිණ්ඩාය ගාමං පවිසසති.

7. අමච්චො පුත්තං භාතිකස්ස නිය්‍යාදෙත්වා ඉතො නික්ඛමි.

8. කුමාරො ඛග්ගං ගහෙත්වා සංගාමාය නික්ඛමි.

9. තච්ඡකා භූපස්ස පාසාදං මාපෙසුං.

10. තෙ යාචකානං ආහාරං න දෙන්ති.

(ආ) පාලියට නඟනු.

1. අපි කෙළෙඹියාට ඊෂ්‍යා නො කරමු.

2. සෝයුරා දසයාට නො කිපුණේ ය.

3. වඩුවා පුතුනට මෙහි ගෙයක් තනන්නේ ය.

4. අපි ආරාමය සංඝයාට පිරිනැමුයෙමු.

5. ඇදුරා සිසුනට ඊයේ තුටුපඬුරු පිරිනැමී ය.

6. සවාමියා කිපී දසයාට පහරක් දුන්නේ ය.

7. වැද්දා ගමට අවුත් වෙළෙන්දට මුවකු වික්කේ ය.

8. අපි එහෙන් නික්ම වාසය පිණිස මෙහි ආමු.

9. කෙළෙඹියා රුකට සත්කාර කෙළේ ය.

10. බුදුරජාණන් වහන්සේ උපාසකයනට දහම් දෙසූ සේක.

* * *

# පාඩම 14

## පඤ්චමී විභත්තිය

| නාමය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| බුද්ධ | බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා (බුදුරජු කෙරෙන්, බුදුරජු ගෙන්) | බුද්ධෙහි, බුද්ධෙභි (බුදුරජුන් කෙරෙන්, බුදුරජුන් ගෙන්) |
| හත්ථ | හත්ථා, හත්ථම්හා, හත්ථස්මා (අතෙන්) | හත්ථෙහි, හත්ථෙභි (අත් කෙරෙන්, අත්වලින්) |

32.(අ)

සො ගාමම්හා නික්ඛමති.
(හේ ගමෙන් නික්මෙයි.)

හත්ථම්හා ඛග්ගො පතති.
(අතෙන් කඩුව වැටෙයි.)

මෙසේ යමෙකින් කිසිවෙක් ඉවත් වේ නම් එය(ඒ ඉවත්වීමේ සීමාව) **පඤ්චමී විභත්තියෙන්** සිටී.

32.(ආ) යමකුගෙන් බිය ගනී නම් හේ ද **පඤ්චමී විභත්තියෙන්** සිටී.

මිගො ව්‍යග්ඝම්හා භායති.
(මුවා ව්‍යාඝ්‍රයාගෙන් බිය ගනී.)

## නාම ශබ්ද

| | |
|---|---|
| වානර(වඳුරා) | සකුණ(පක්ෂියා) |
| මගගික(මගියා) | මගග(මාර්ගය) |
| කසසක(ගොවියා) | මහිස(මියුවා, මීගොනා) |
| පාඨාලය(පාසල) | සංගාම(සටන) |
| වෙග(වේගය) | සීහල දීප(හෙළදිව) |
| විජය(විජය කුමර) | මාස(මාසය) |
| සමනතකූට(සමන්කුළ) | යොධ(සෙබළා) |

## ක්‍රියාපද

| | |
|---|---|
| පසසති(දකී) | පසසිතවා, දිසවා(දැක) |
| අපෙති(ඉවත්වෙයි) | අපෙචච(ඉවත් වැ)* |
| අපෙසි(ඉවත් විය) | |
| භායති(බිය ගනී) | භායිතවා(බිය ගෙන) |
| නිලීයති(සැඟවෙයි) | නිලීයිතවා(සැඟෙවී) |
| කිණාති(මිල දී ගනී) | කිණිතවා(මිල දී ගෙන) |
| විකකිණාති(විකුණයි) | විකකිණිතවා(විකුණා) |
| මීයති(මැරෙයි) | මීයිතවා, මරිතවා(මැරී) |
| වනදති(වඳී) | වනදිතවා(වැඳ) |
| ආරුහති(නඟී) | ආරුහිතවා(නැඟ) |
| පූජෙති(පුදයි) | පූජෙතවා(පුදා) |
| පූජෙසි(පිදීය) | |
| ඔරුහති(බසී) | ඔරුහිතවා(බැස) |
| අතිකකමති(ඉක්මෙයි) | අතිකකමිතවා(ඉක්ම) |
| පචචාගචඡති(පෙරළා එයි) | පචචාගනතවා(පෙරළා අවුත්) |

---

* මෙය **ය** ප්‍රත්‍යයය එක්ව හැදුණු පූර්වක්‍රියාවෙකි. මේවා හදන හැටි මතු විස්තර වේ.

## නිපාත

තත්‍ර(එහි)

බහි(පිටතට, පිටත්හි)

තත්‍ර තත්‍ර(ඒ ඒ තැනට, ඒ ඒ අත)

## ඇබෑසිය

(අ) සිංහලයට නඟනු.

1. හෙ පුරිසා, කිං තුමෙහ ඉදනි ගෙහමහා නිකඛමථ?
2. තත්‍ර රුකඛසමා වානරො පති.
3. රුකඛමහා සකුණා උඩෙඩසුං.
4. චොරා යොධෙ දිසවා ගාමමහා පලායිංසු.
5. මගගිකා රථං දිසවා මගගමහා අපෙසුං.
6. දරකා යොධෙහි භායිතවා ගෙහං පවිසිතවා නිලීයිංසු.
7. මිගා ව්‍යගඝමහා භායිතවා තත්‍ර ධාවිංසු.
8. කසසකො කුටුමබිකමහා මහිසං කිණී.
9. සාමණෙරා ථෙරමහා ධමමං උගගණහිංසු.
10. ගජො පබබතමහා පතිතවා මීයි.

(ආ) පාලියට නඟනු.

1. ළමෝ ගෙයින් නික්ම පාසලට ගියහ.
2. ගොන්නු ව්‍යාඝ්‍රයා ගෙන් බිය ගෙන වත්තෙන් පිටතට වේගයෙන් දිවූහ.
3. ශිෂ්‍යයෝ ඇදුරුතුමාගෙන් ධර්මය උගත්හ.
4. උපාසකයෝ බුදුරජුනු වැඳ විහාරයෙන් නික්ම ගියහ.

5. භවත් සොහොයුර, දැන් ගෙයින් පිටත් ව කොහි යන්නෙහි ද?

6. රජ මාලිගාවෙන් බැස අසකු අරා සටන් පිණිස නික්මුණෝ ය.

7. විජයතෙම දඹදිවින් නික්ම නැවින් හෙළදිවට ආයේ ය.

8. අපි සමන්කුළ නැඟ වැඳ පුද ඊයේ එහෙන් බැස්සමු.

9. මිනිස්සු නැව් නැඟ දඹදිව ගොස් මාසයක් ඉක්ම පෙරේද මෙහාට පෙරළා ආහ.

* * *

# පාඩම 15

## තුමනත

33. **මම යන්නට කැමැත්තෙමි.** මේ වාක්‍යය පාලියට නැඟූ විට **අහං ගනතුං ඉච්ඡාමි** යි සිටී. **යන්නට** යන සිංහල පදය පාලියෙහි දී **ගනතුං** යී සිටී.

34. **ශිෂ්‍යයා ඇදුරුතුමා සමඟ නික්මෙයි** මෙය පාලියෙන් කියන විට **සිසෙසා ආචරියෙන සහ - ආචරියෙන සදධිං නිකඛමති** කියා සිටී. **ඇදුරුතුමා සමඟ(කැටුව)** යන්න **ආචරියෙන සහ** කියා හෝ **ආචරියෙන සදධිං** කියා හෝ යෙදෙයි. මෙහි **සමඟ, කැටුව** යන අර්ථය **සහ** හෝ **සදධිං** යන නිපාතයෙන් පැවැසෙයි. එය යෙදෙන්නේ තතියා විභතතියෙන් සිටින පද සමඟ ය. **ආචරියෙන** යනු තතියා විභතති ඒකවචන යි. **අපි සහෝදරයන් සමඟ ගමට යමු.** මෙය පාලියට නැඟූ විට **මයං භාතිකෙහි සදධිං(සහ) ගාමං ගච්ඡාම** යි සිටී.

35. **නැති ව, වෙන් ව, තොර ව** යන අර්ථ පැවැසීමට **විනා** යන නිපාතය යෙදේ. එය දුතියා විභතතියෙන් හෝ තතියා විභතතියෙන් හෝ පඤචමී විභතතියෙන් සිටින පදයක් සමඟ යෙදෙයි.

භාතිකං විනා, භාතිකෙන විනා, භාතිකමහා විනා
(සහෝදරයා නැති ව, සහෝදරයා ගෙන් වෙන් ව,
සහෝදරයා ගෙන් තොර ව)

## නාම ශබ්ද

මිත්ත(මිතුරා)
අන්තෙවාසික(අතැවැස්සා, ශිෂ්‍යයා)
සාවක(ශ්‍රාවකයා)
පරිබ්බාජක(පිරිවැජියා)
මග්ග(මාර්ගය)
මණ්ඩව(ඇඳ)
උස්සව, ඡණ(උත්සවය)
තාපස(තවුසා)

## ක්‍රියාපද

ඉච්ඡති(කැමති වෙයි)
වසති(වසයි, වෙසෙයි)
සක්කොති(හැකි වෙයි)
සක්ඛිස්සති(හැකි වන්නේ ය)
පටිපජ්ජති(පිළිපදී, බසී)
ආරභති(පටන් ගනී)
ලභති(ලබයි)
අසක්ඛි(හැකි විය)
සුණාති(අසයි)

## තුමන්ත

වසිතුං(වසන්නට)
උග්ගහෙතුං(ඉගෙන ගන්නට)
රොදිතුං(අඬන්නට)
ගන්තුං(යන්නට)
ලභිතුං(ලබා ගන්නට)
පස්සිතුං, දට්ඨුං(දකින්නට)
කීළිතුං(සෙල්ලම් කරන්නට)
වූපසමෙතුං(සංසිඳුවන්නට)
සොතුං(අසන්නට)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟනු.

1. දරකො භාතිකෙන විනා ඉධ වසිතුං න ඉච්ඡති.
2. මයං ඡණං පස්සිතුං මිත්තෙහි සද්ධිං තත්‍ර ගච්ඡිමහ.
3. කුටුම්බිකො සෙවකෙහි විනා ගෙහා න නික්ඛමිස්සති.
4. භූපො කුමාරෙහි සද්ධිං පාසාද ඔරුහිත්වා රථං අභිරුහිත්වා නික්ඛමි.
5. හෙ සිස්සා, කිං තුම්හෙ ආචරියෙහි විනා උග්ගහෙතුං සක්කොථ?
6. ථෙරො අන්තෙවාසිකෙහි සද්ධිං විහාරා නික්ඛමිත්වා මග්ගං පටිපජ්ජි.
7. දරකො මඤ්චම්හා ඔරුහිත්වා රොදිතුං ආරභි.
8. භවන්තො කුමාරා, කිං තුම්හෙ කීළිතුං ආරාමං පවිසථ?
9. අහං භාතිකෙන විනා තත්‍ර ගන්තුං න ඉච්ඡාමි.
10. වෙජ්ජො ඔසධෙහි විනා රොගං වූපසමෙතුං කිං සක්කොති?

### (ආ) පාලියට නඟනු.

1. පුත්‍රයා සොහොයුරා නැති ව එහි යන්නට නො කැමති යි.
2. අපි සෙට ඇදුරුතුමා දකින්නට මිතුරන් කැටුව යන්නමු.
3. අපි ඊයේ තවුසා දකින්නට කන්ද නැඟ අසපුවට ගියමු.
4. ගොවියා මීමකු ලබා ගන්නට කෙළෙඹියා වෙත එළැඹියේ ය.

5. මිනිස්සු බණ අසන්නට විහාරයට යෙති.

6. අද කවර හෙයින් තෙපි පාසලට යන්නට නො හැකි වූහු ද?

7. රිය නැතිව එහි යන්නට නො හැක්කමු.

8. කෙළෙඹියා බුදුරජුන් දැක වැඳ බණ අසන්නට විහාරය වෙත ගියේ ය.

9. බුදුරජ තෙම ශ්‍රාවකයනට දහම් දෙසී ය.

10. පිරිවැජියා අතවැස්සන් කැටුව මඟට පිළිපන්නේ ය.

* * *

# පාඩම 16

## ඡට්ඨී විභත්තිය

| නාමය | ඒකවචන | බහුවචන |
| --- | --- | --- |
| බුද්ධ | බුද්ධස්ස<br>(බුදුරජු ගේ) | බුද්ධානං<br>(බුදුරජුන් ගේ) |
| හත්ථ | හත්ථස්ස<br>(අතේ, අතට අයත්) | හත්ථානං<br>(අත්වල, අත්වලට අයත්) |

### නාම ශබ්ද

භූපාල(රජ) පොතක(පැටියා)

වඩ්ඪක(වැද්ද) ගුණ(ගුණය)

තච්ඡක(ලී වඩුවා) පථික, මග්ගික(මගියා)

උපහාර(පඬුර, තෑග්ග) ඝට(කළය)

වජ(ගාල) දණ්ඩ(ලීය)

සුනඛ(බල්ලා) කුලාවක(කැදැල්ල)

කලහ(කලහය, ආරාවුල)

පච්චන්ත(පසල් දනව්ව, පිටිසර පළාත)

## ක්‍රියා පද

දෙති(දෙයි)

අදසි(දුන්නේ ය)

හරති(හැර ගෙන යයි)

පටියාදෙති(පිළියෙල කරයි)

කනතති(කපයි, සිඳියි)

ඔරුහති, ඔරොහති, ඔතරති(බසියි)

වණ්ණෙති(වණයි, වණ්නා කරයි)

වූපසමෙති(සංසිඳුවයි)

වූපසමමති(සංසිඳෙයි)

අභිරුහති(නඟී)

පචචාගචඡති(පෙරළා එයි)

පාතෙති(හෙලයි)

## නිපාත

ආසු(වහා)

පාතො(උදෑසන)

පාතො'ව[පාතො එව](උදෑසන ම)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. ළුද්දකස්ස සුනඛා මිගං අනුබන්ධිංසු.
2. තච්ඡකස්ස භාතිකො ආරාමං ගන්ත්වා රුක්ඛෙ ඡින්දිත්වා පාතෙසි.
3. ව්‍යග්ඝො වජං පවිසිත්වා කස්සකස්ස ගොණෙ මාරෙති.
4. චොරා සායණ්හෙ ආගන්ත්වා කුටුම්බිකස්ස ගෙහං පවිසිංසු.
5. හියෙය්‍යා භූපාලො අමච්චස්ස පුත්තානං උපහාරෙ අදාසි.
6. දාසස්ස හත්ථෙහි ඝටො පති.
7. කිං තුම්හෙ සුවෙ පාතො කුටුම්බිකස්ස ආරාමං ගච්ඡිස්සථ?
8. කුටුම්බිකස්ස පුත්තා ජම්බුදීපං ගන්තුං පොතං අභිරුහිංසු.
9. භූපස්ස කුමාරා පච්චන්තං ගන්ත්වා මනුස්සානං කලහං වූපසමෙත්වා පච්චාගච්ඡිංසු.
10. තත්‍ර වානරානං පොතකා මිගානං පොතකෙහි සහ කීළන්ති.

### (ආ) පාලියට නඟන්න.

1. මුවන් ගේ පැටවු වත්තේ ඒ ඒ තැන දිවූහ.
2. සොරු උදේ ම අවුත් ගාලට වැද ගොවියා ගේ ගොනා හැරගෙන ගියහ.
3. කෙළෙඹියා ගේ සොහොයුරා වෙළෙන්ද ගේ පුතාට ලියෙකික් ගැසී ය.

4. ඇමැතියා ගේ සේවකයා සොරා දැක අතින් කඩුවක් ගෙන ගෙයින් නික්මුණේ ය.

5. වෙද ගේ බෙහෙත් වලින් ඇමතියා ගේ ලෙඩ සංසිඳුණේ ය.

6. ඇදුරා වහා ම එහි ගොස් ශිෂ්‍යයන් ගේ ආරාවුල සංසිඳුවූයේ ය.

7. පිරිවැජියා ගේ අතැවැසියෝ බුදුරජු ගේ ගුණ වැණූහ.

8. මගියා ගේ පුතා වඳුරා ගෙන් බිය පත් විය.

9. අරක්කැමියෝ මිතුරන් සමඟ කෙළෙඹියා ගේ අමුත්තනට ආහාර පළියෙළ කළහ.

10. රජු ගේ සෙබළා කඩුවෙන් සොරා ගේ අත කැපී ය.

* * *

පාඩම 17

## සත්තමී විභත්තිය

| නාමය | ඒකවචන | බහුවචනය |
|---|---|---|
| බුද්ධ | බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං (බුදුරජු කෙරෙහි) | බුද්ධෙසු (බුදුරජුන් කෙරෙහි, බුදුවරුන් කෙරෙහි) |
| හත්ථ | හත්ථෙ, හත්ථම්හි, හත්ථස්මිං(අතෙහි) | හත්ථෙසු (අත්හි) |

36. **අපි ගමෙහි වසමු** කී විට **ගමෙහි** යන්නෙන් අපේ විසීමට ආධාර වූ තැන දැක්වෙයි.

**අපි සවස් වේලෙහි පිටත් වමු.** යි කී තැන **සවස් වේලෙහි** යන්නෙන් පිටත් වන කාලය පැවැසේ.

උඩ දැක්වූ වාක්‍ය පාලියට නැඟූ විට,

**මයං ගාමෙ වසාම,**

**මයං සායණ්හෙ නික්ඛමාම** යැ යි සිටී.

මේ වාක්‍ය දෙකේ ම **ගාමෙ, සායණ්හෙ** යන පද දෙක **සත්තමී විභත්තියෙන්** සිටී. මෙසේ ක්‍රියාවකට ආධාර වූ තැන ද ක්‍රියාවක් සිදුවන කාලය ද සත්තමී විභත්තියෙන් දක්වන බව සිතට ගත යුතු. යමකු කෙරෙහි පැහැදෙත් නම් ඒ තැනැත්තා ද සත්තමී විභත්තියෙන් පැවැසේ.

මයං බුද්ධෙ පසීදම(අපි බුදුරජු කෙරෙහි පැහැදෙමු.)

පුරුෂ ශබ්දය ද මෙතෙක් ඉගෙනගත් බුද්ධ, හත්ථ ශබ්ද මෙන් වරනැඟෙයි. දැන් පහත සඳහන් වරනැඟිල්ල අර්ථ සහිතව පාඩම් කර ගන්න.

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | පුරිසො(පුරුෂයා) | පුරිසා(පුරුෂයෝ) |
| ආ: | වි: | හෙ පුරිස(පුරුෂය) | හෙ පුරිසා(පුරුෂයිනි) |
| දු: | වි: | පුරිසං(පුරුෂයා) | පුරිසෙ(පරුෂයන්) |
| ත: | වි: | පුරිසෙන(පුරුෂයා කරණ කොට) | පුරිසෙහි(පුරුෂයන් කරණ කොට) |
| ච: | වි: | පුරිසාය, පුරිසස්ස (පුරුෂයාට) | පුරිසානං (පුරුෂයනට) |
| පං: | වි: | පුරිසා, පුරිසම්හා, පුරිසස්සමා(පුරුෂයා ගෙන්) | පුරිසෙහි(පුරුෂයන් ගෙන්) |
| ඡ: | වි: | පුරිසස්ස (පුරුෂයා ගේ) | පුරිසානං (පුරුෂයන් ගේ) |
| ස: | වි: | පුරිසෙ, පුරිසම්හි පුරිසස්සමිං (පුරුෂයා කෙරෙහි) | පුරිසෙසු (පුරුෂයන් කෙරෙහි) |

## පඤ්චමී විභත්ති, ආසිකිරිය
## (ආශීර්වාද ක්‍රියාව)*

**37. හෙ තෙම බොහෝ කල් ජීවත් වේ වා.** මේ වාක්‍යයේ **ජීවත් වේ වා** යනු ආශීර්වාදයෙකි. එසේ ම ප්‍රාර්ථනාවෙකි. **හේ නැසේ වා** යන තැන **නැසේ වා** යනු ශාපයෙකි. **තෝ යව** යන තැන **යව** යනු විධානයෙකි. උඩ දැක්වුණු වාක්‍ය පාලියට නැඟූ විට **සො චිරං ජීවතු, සො නස්සතු, ත්වං ගච්ඡ/ගච්ඡාහි** යී පිළිවෙලින් සිටිත්.

මෙසේ ආශීර්වාද, ප්‍රාර්ථනා, ශාප, විධාන කිරීම්හි යෙදෙන ක්‍රියා වර්ගයට පාලියෙහි **පඤ්චමී විභත්තික ආඛ්‍යාත** යැ යි කියනු ලැබේ. පඤ්චමී විභත්තික ක්‍රියා පුරුෂ තුනෙහි වරනැඟෙන සැටි දැන් දක්වනු ලැබේ.

### ආඛ්‍යාත පඤ්චමී විභත්ති

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **ප: පු:** | සො ධාවතු | තෙ ධාවන්තු |
| **ම: පු:** | ත්වං ධාව, ධාවාහි | තුම්හෙ ධාවථ |
| **උ: පු:** | අහං ධාවාමි | මයං ධාවාම |

### අර්ථ

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **ප: පු:** | සො ධාවතු<br>(හේ දුවා වා) | තෙ ධාවන්තු<br>(ඔහු දුවත් වා) |
| **ම: පු:** | ත්වං ධාව, ධාවාහි<br>(තෝ දුවව, දුවහි වා) | තුම්හෙ ධාවථ<br>(තෙපි දුවවු, දුවහු වා) |
| **උ: පු:** | අහං ධාවාමි<br>(මම් දුවම් වා) | මයං ධාවාම<br>(අපි දුවමෝ වා) |

---

* මෙය නාම පඤ්චමී විභත්තිය නො වන බවත් එක්තරා ක්‍රියාපද විශේෂයක් බවත් ගුරුවරයා විසින් සිසුනට පැහැදිලි කළ යුතුයි.

### නාම ශබ්ද

අනාථපිණ්ඩික(අනේපිඬු සිටු)
සන්නිපාත(රැස්වීම)
සප්පුරිස(සත්පුරුෂයා)
පොතක(පැටියා)
මච්ඡ(මත්ස්‍යයා)
පාණවධ(ප්‍රාණවධය)

### ක්‍රියාපද

විහරති(වෙසෙයි)
ධාරෙති(දරයි)
පාතෙති(හෙලයි, කඩා දමයි)
පසීදති(පහදී)
විචරති(ගැවසෙයි, ඇවිදී)
පලාපෙති(පලවා හරී)
සන්නිපතති(රැස්වෙයි)

### නිපාත

පුන(නැවත, යලි)
ආසු(වහා ම)

### මා - යොගය

**මා** යන නිපාතය අතීත(අජ්ජතනී විභත්ති) ක්‍රියාවක් හා යෙදුණ විට **නො කරව, කරන්නට එපා** යන විධානය පහළ කෙරෙයි. විධික්‍රියා(පංචමී ආඛ්‍යාත) සමඟ යෙදීමෙන් ද ඒ අර්ථය ම ලැබේ.

මා ඡින්දි(නො කපව), මා පාතෙසි(නො හෙලව)
මා ඡින්ද(නො කපව), මා පාතෙහි(නො හෙලව)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. බුද්ධස්ස සාවකා ගන්ත්වා අනාථපිණ්ඩිකස්ස ආරාමෙ විහරිංසු.
2. හෙ පුත්ත, ත්වං විහාරං ගච්ඡ, බුද්ධං දිස්වා වන්දිත්වා ධම්මං සුත්වා ආගච්ඡ.
3. භවන්තො කුමාරා, ඉධ මා තිට්ඨථ, ආරාමෙ කීළථ.
4. අජ්ජ ථෙරො ධම්මං දෙසෙතු.
5. අජ්ජ විහාරෙ සාවකානං සන්නිපාතො භවිස්සති.
6. භවන්තො උපාසකා, මයං ධම්මං සොතුං විහාරං ගච්ඡාම.
7. ආරාමෙ රුක්ඛෙසු සකුණා කුලාවකෙ කත්වා වසන්තු, මා කුලාවකෙ පාතෙථ.
8. පබ්බතෙ අස්සමං තාපසා ආගච්ඡන්තු, තත්ථ වාසං කරොන්තු.
9. සාමණෙරා ගාමෙ පිණ්ඩාය චරන්තු.
10. කස්සකස්ස පුත්තා කාසාරෙ නහායිත්වා ගෙහං පච්චාගන්ත්වා කාටෙ නිසීදිත්වා භුඤ්ජිංසු.

### (ආ) පාලියට නඟන්න.

1. බුදුරජාණන් වහන්සේ අනේපිඬු සිටුහු ගේ අරමෙහි වුසූ සේක.
2. සත්පුරුෂයෝ බුදුරජු කෙරෙහි පැහැදුණාහ.
3. මුවෝ වත්තෙහි ගැවසෙත් වා.

4. මුවන් ගේ පැටවුන් පලවා නො හරිමු.

5. මිනිස්සු සෙබළුන් දැක බිය නො ගනිත් වා.

6. මුහුදෙහි මත්‍ස්‍යයෝ වසත්.

7. ගස්හි පක්ෂිහු රැස්වෙත් වා.

8. දරුවනි, ප්‍රාණවධය නො කරවු.

9. අද අපි මෙහෙන් පිටත් වමෝ වා, යලි මෙහි නො එමෝ වා.

10. සේවකයිනි, වහා ම කඩු දරවු, සොරුන් ලුහුබඳිවු.

* * *

# පාඩම 18

## ඉකාරාන්ත පුංලිඞ්ගික ශබ්ද

38. **පුරිස** යැ යි කී විට අගට ඇහෙන්නේ **ස**යන්න තුළ වූ අයන්න ය. (**ස** යනු **ස් අ** යන අකුරු දෙකේ එකතුවයි.) මෙසේ **පුරිස** ශබ්දය අයන්නෙන් අන්ත වන එකක් බැවින් **අකාරාන්ත ශබ්දයෙකැ** යි කියනු ලැබේ. **බුද්ධ, ධම්ම, සංඝ, රුක්ඛ** ආදි ශබ්දයෝ ද එසේ ම අකාරාන්තයෝ ය.

**අග්ගි, මුනි, කවි, කපි** යන ශබ්දවල අගට ඇහෙන්නේ ඉකාරය යි. ඔහු **ඉකාරාන්තයෝ** ය. **ගරු, භික්ඛු, සෙතු** ආදිහු **උකාරාන්තයෝ** ය. **සෙනානී** ආදීහු **ඊකාරාන්තයෝ** ය. **විඤ්ඤූ, සබ්බඤ්ඤූ, වෙදගූ** ආදිහු **ඌකාරාන්තයෝ** ය. **ගො** ශබ්දය **ඔකාරාන්ත** ය.

පුංලිඞ්ග කොටසට අයත් ඉකාරාන්තයන් ගේ වරනැඟිල්ල දැන් දෙනු ලැබේ.

### කපි(වඳුරා)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | කපි(වඳුරා) | කපී, කපයො(වඳුරෝ) |
| ආ: වි: | හෙ කපි(වඳුර) | හෙ කපී,කපයො(වඳුරනි) |
| දු: වි: | කපිං(වඳුරා) | කපී, කපයො(වඳුරන්) |
| ත: වි: | කපිනා(වඳුරා කාරණකොට) | කපීහි*(වඳුරන් කාරණකොට) |

---

* තතියා පංචමී විභත්තිවල බහුවචනයන්හි අග **හි** යන්න වෙනුවට **භි** යන්න ද ලැබේ. **කපීභි** මෙනි.

### අසි(කඩුව)

| | | |
|---|---|---|
| පඃ විඃ | අසි(කඩුව) | අසී, අසයො(කඩු) |
| ආඃ විඃ | හෙ අසි(එම්බා කඩුව) | හෙ අසී, අසයො(එම්බා කඩු) |
| දුඃ විඃ | අසිං(කඩුව) | අසී, අසයො(කඩු) |
| තඃ විඃ | අසිනා(කඩුවෙන්) | අසීහි(කඩුවලින්) |

39. ච(ද, ත්) මෙය යෙදෙන සැටිඃ

අස්සො ච ගජො ච, අස්සො ගජො ච
(අශ්වයා ද ඇතා ද)

අස්සස්ස ච ගජස්ස ච, අස්සස්ස ගජස්ස ච
(අශ්වයා ගේ ද ඇතා ගේ ද)

### ශබ්දමාලාව

#### නාම

| | |
|---|---|
| සෙනාපති(සෙනෙවිය) | අතිථි(ආගන්තුකයා) |
| භූපති(රජ) | අධිපති(අධිපතියා) |
| මුනි(බුදුරජ, තවුසා, පැවිද්ද) | අහි(සර්පයා) |
| ගහපති(ගෘහපතියා, ගැහැවියා) | අග්ගි(ගින්න) |
| යති(යතිවරයා, භික්ෂූනම) | රවි(හිරු) |
| අනාථපිණ්ඩික(අනේපිඩු සිටු) | නිධි(නිධානය) |
| ඤාති(නෑයා) | ආවාට(වළ) |
| මණි(මිණ, මැණික) | වලය(වළල්ල) |
| ඉසි(ඍෂිවරයා) | ධජ(ධවජය, කොඩිය) |
| ගිරි(පර්වතය, කන්ද) | අන්ධකාර(අඳුර) |
| අන්තරාමග්ග(අතර මග) | අරි(සතුරා) |
| වනස්පති(වනස්පති රුක) | සඞ්ගාම(රණබිම) |

### ක්‍රියා

පස්සති(දකී) දිස්වා(දැක)
දට්ඨුං(දකින්නට) විභාති(බබලයි)
ජෙති(දිනයි) ඉච්ඡති(කැමති වෙයි)
ඩසති(සපයි, දෂ්ට කරයි) මරති, මීයති(මැරෙයි)
මාරෙති(මරයි) අලංකාරොති(සරසයි)
වන්දති(වඳී) පූජයති, පූජෙති(පුදයි)
නස්සති(නැසෙයි) නාසෙති(නසයි)
ජෙති, ජයති, ජිනාති(දිනයි)
සොභති(හොබියි, ශෝභන වේ.)
උපසංකමති(වෙත එළැඹෙයි, වෙතට යයි)
නෙති, නයති(පමුණුවයි, ගෙන යයි)
නික්කඩ්ඪති, නික්ඛාමෙති(නික්මවයි, පිටමංකරයි, බැහැර කෙරෙයි)

### ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. සෙනාපති යොධෙහි සද්ධිං සඞ්ගාමාය නික්ඛමි.
2. භූපති ගහපතිනා සද්ධිං මුනි දට්ඨුං අනාථපිණ්ඩිකස්ස ආරාමං ගච්ඡි.
3. සූදෙ අග්ගිනා ඔදනං පචති.
4. මයං නිධිං දට්ඨුං ඤාතීහි සද්ධිං ආවාටං ඔතරිම්හ.
5. මණිනා වලයො ච වලයෙන මණි ච විභාති.
6. ඉසයො ගාමා නික්ඛමිත්වා ගිරිං අභිරුහිත්වා අස්සමං උපසංකමිංසු.
7. සෙනාපති අසිනා පහරිත්වා පච්චාමිත්තස්ස හත්ථෙ ඡින්දි.

8. ගහපති අනතරාමගෙග වනසපතිං දිසවා ධජෙහි අලංකරිතවා වනදිතවා පූජෙතවා ගෙහං පචචාගචඡි.

9. සෙනාපති සඞගාමෙ අරයො ජෙතවා පචචාගනතවා භූපතිං දට්ඨුං පාසාදං අභිරුහි.

10. මයං අතිථයො ගෙහං නෙතවා ආහාරෙන පූජයිමහ.

11. භූපති සෙනාපතිනා සහ පාසාදමහා ඔරුහි.

12. යොධා සෙනාපතිනා විනා සඞගාමං න පවිසනති.

**(ආ) පාලියට නඟන්න.**

1. ඍෂීහු කන්ද නැඟ අසපුවලට ගියාහ.
2. අපි අධිපතීන් සමඟ වසන්නට නො කැමැත්තමු.
3. මැණික නැතිව වළල්ල නො හොබී.
4. සජියා දෂටකොට වඳුරා මැරීය.
5. සෙනෙවියා භටයන් සමඟ රණබිමට වැද සතුරන් දිනා පෙරළා ආයේ ය.
6. යතිවරුන් ගෙන් ආරාමය බැබැලුණේ ය.
7. වඳුරා සජියා දැක බියගෙන පලාගොස් ගසට නැංගේ ය.
8. අධිපතියා දසයාට අතින් පැහැර ගෙයින් පිටමං කෙළේ ය.
9. හිරු කරණ කොටගෙන ලොවැ අඳුර නැසේ.
10. අනිද්ද අපි කන්ද නැඟ තවුසා දක්නට යන්නමු.

* * *

# පාඩම 19

## ඉකාරාන්ත පුංලිඞ්ගික ශබ්ද

### කපි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **චතුත්ථි වි:** | කපිනො, කපිස්ස<br>(වඳුරාට) | කපීනං<br>(වඳුරනට) |
| **පඤ්චමී වි:** | කපිනා, කපිම්හා, කපිස්මා<br>(වඳුරා ගෙන්) | කපීහි<br>(වඳුරන් ගෙන්) |

### අසි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **චතුත්ථි වි:** | අසිනො, අසිස්ස<br>(කඩුවට) | අසීනං<br>(කඩුවලට) |
| **පඤ්චමී වි:** | අසිනා, අසිම්හා, අසිස්මා<br>(කඩුවෙන්, කඩුව කෙරෙන්) | අසීහි<br>(කඩුවලින්,<br>කඩු කෙරෙන්) |

### ශබ්දමාලාව

#### නාම

| | |
|---|---|
| පාණි(අත) | කවි(පණ්ඩිතයා) |
| සක්කාර(සත්කාරය) | දීපි(දිවියා) |
| කුමාර(කුඩා දරුවා) | උපද්දව(උවදුර) |
| පාතරාස(හීල් කෑම, උදේ බොජුන) | වීහි(වී) |

## නිපාත

පාතො'ව [පාතො එව](උදේ ම)

## ක්‍රියා

ඔරුහති(බසී)

අකාසි(කෙළේ ය)

අකංසු(කළාහ)

උට්ඨහති, උට්ඨාති(නැඟී සිටී)

ධොවති(සෝදයි)

එසති, ගවෙසති(සොයයි)

එසිතුං, ගවෙසිතුං(සොයන්නට)

පච්චාගච්ඡි, පච්චාගමි(පෙරළා ආයේ ය)

භවති(වෙයි)

මිණාති(මණියි)

පකොසති(කැඳවයි)

පාපුනාති(පැමිණෙයි)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. ගජා ගිරිමහා ඔරුහිංසු.
2. භූපස්ස පාණිනා අසි පති.
3. ගහපතයො ආරාමං ගන්ත්වා යතීනං සක්කාරං අකංසු.
4. භූපති සෙනාපතිනො කුජ්ඣිත්වා පාණිනා අසිං ගහෙත්වා උට්ඨාසි.
5. සෙනාපති ගහපතීහි සද්ධිං අනාථපිණ්ඩිකස්ස ආරාමං ගන්ත්වා බුද්ධං ච යතයො ච දිස්වා වන්දිත්වා පූජෙත්වා පච්චාගමි.
6. ඉසීහි විනා අස්සමො න විභාති.
7. කුමාරකා කපිමහා භායිත්වා ගෙහං පවිසිත්වා නිලීයිංසු.
8. වාණිජස්ස පාණිමහා මණි පති.
9. මයං සුවෙ ඉසිං දට්ඨුං ගිරිං අභිරුහිත්වා අස්සමං උපසංකමිස්සාම.
10. ගහපති වීහිං මිණිත්වා කස්සකානං අදසි.

### (ආ) පාලියට නඟන්න.

1. අපි යතීනට නො කිපෙමෝ වා.
2. සොරා කඩුවෙන් ගැහැවියාට ගැසී ය.
3. සෙනෙවියා උදේ ම නැඟිට අත් ද පා ද සෝද උදේ බොජුන වළඳ අතින් කඩුව ගෙන ගෙයින් නික්මුණේ ය.
4. වඳුරෝ දිවියා ගෙන් බිය ගෙන ඒ ඒ තැන දිවූහ.

5. සතුරෝ සෙනෙවියා කෙරෙන් පලාගියාහ.

6. ධනපතීහු සෙනෙවියාගෙන් තොර ව මඟට නො බැස්සහ.

7. සොරු ධනපතියා සොයන්නට සවස් වේලෙහි ගමේ ඒ ඒ තැන ඇවිද්දහ.

8. සෙනෙවියාගෙන් ගැහැවියාට උවදුරක් නො වන්නේ ය.

9. ධනපතියා නිධානය දක්නට කිවියා සමඟ එහි ගියේ ය.

10. රජ තෙම කිවියාට නො කිපුණේ ය.

* * *

පාඩම 20

## ඉකාරාන්ත පුංලිඞ්ගික ශබ්ද

### කපි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | කපි(වඳුරා) | කපී, කපයො (වඳුරෝ) |
| ආ: වි: | කපි(වඳුර) | කපී, කපයො (වඳුරනි) |
| දු: වි: | කපිං(වඳුරා) | කපී, කපයො (වඳුරන්) |
| ත: වි: | කපිනා (වඳුරා කරණකොට) | කපීහි(වඳුරන් කරණකොට) |
| ච: වි: | කපිනො, කපිස්ස (වඳුරාට) | කපීනං(වඳුරනට) |
| පං: වි: | කපිනා, කපිම්හා කපිස්මා(වඳුරාගෙන්) | කපීහි(වඳුරන්ගෙන්) |
| ඡ: වි: | කපිනො, කපිස්ස (වඳුරා ගේ) | කපීනං(වඳුරන් ගේ) |
| ස: වි: | කපිම්හි, කපිස්මිං (වඳුරා කෙරෙහි) | කපීසු(වඳුරන් කෙරෙහි) |

### අසි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | අසි(කඩුව) | අසී, අසයො(කඩු) |
| ආ: වි: | හෙ අසි(කඩුව) | හෙ අසි,අසයො(කඩු) |
| දු: වි: | අසිං(කඩුව) | අසී, අසයො (කඩු) |
| ත: වි: | අසිනා (කඩුවෙන්) | අසීහි(කඩුවලින්) |
|ච: වි: | අසිනො, අසිස්ස (කඩුවට) | අසීනං(කඩුවලට) |
| පං: වි: | අසිනා, අසිම්හා අසිස්මා(කඩුවෙන්) | අසීහි(කඩුවලින්, කඩුවකෙරෙන්) |
| ඡ: වි: | අසිනො, අසිස්ස (කඩුවේ) | අසීනං(කඩුවල) |
| ස: වි: | අසිම්හි, අසිස්මිං (කඩුවෙහි) | අසීසු(කඩුවලැ) |

### ශබ්දමාලාව

#### නාම

පාණි(අත) ඔභාස(ආලෝකය, දීප්තිය)

ව්‍යාධි(රෝගය, ලෙඩ) ගබ්භ, ඔවරක(ගබ, කාමරය)

මුට්ඨි(මිට) ජන(ජනයා, මිනිසා)

## ක්‍රියා

| | |
|---|---|
| ආහිණ්ඩති(ඇවිදී) | විගච්ඡති(පහ වෙයි, දුරු වෙයි) |
| මුච්චති(මිදෙයි) | විනොදෙති(දුරු කරයි) |
| මුඤ්චති(මුදයි) | පීළෙති, පීළයති(පෙළයි) |
| පරොදති(අඬයි) | පිවති(බොයි) |
| පලාපෙති(පලවාහරී) | වඩ්ඪති(වැඩෙයි) |
| විභාති(බබලයි) | විභාසි(බැබැලුණේ ය.) |
| පිහයති(කැමැති වෙයි, ඇලෙයි) | |

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. ජනා මුනිම්හි පසීදිංසු.
2. ගහපතිනො පුත්තා ආරාමං පවිසිත්වා තත්‍ර තත්‍ර ධාවිංසු.
3. ධනපතිනො පාණිම්හා මණයො පතිංසු.
4. භූපති වෙජ්ජස්ස අගදෙහි ව්‍යාධිම්හා මුච්චි.
5. අතිථිනො පුතෙතා කපිම්හා භායිත්වා පරොදි
6. ගහපතීනං පුත්තා යතීසු පසීදිත්වා සබ්බද සායණ්හෙ ගිරිං අභිරුහිත්වා අස්සමං ගනත්වා වන්දිත්වා පච්චාගච්ඡනති.
7. සෙනාපති මුට්ඨිනා පහරිත්වා චොරං පලාපෙසි.
8. ගහපතිනො පාණිම්හි මණි විභාසි.
9. ධනපතයො මණීනං පිහයනති.
10. මණිනො ඔභාසෙන අන්ධකාරො විගච්ඡි.

(ආ) පාලියට නඟන්න.

1. රජු ගේ මැණික කාමරයේ අඳුර දුරු කෙළේ ය.
2. රෝගයෝ ගෘහපතියා පෙළූහ.
3. ධනපතියාගේ පුතා වෙදකු ගෙනෙන්නට රියෙන් ගමට ගියේ ය.
4. වෙද ගේ බෙහෙතින් සෙනෙවියා ගේ ලෙඩ සුව විය
5. බලවු, අර කන්දේ දිවියකු ගේ ද වලසකු ගේ ද කලහයෙක් වේ.
6. හැම ද ම ගෘහපතියා ගේ බල්ලෝ ගාලට වැද ගොවියා ගේ ගොනුන් පෙළූහ.
7. බෙහෙත් නො බොන්නේ නම් රජු ගේ රෝගය වැඩෙන්නේ ය.
8. සොරා ගේ කඩුවේ පහරින් ගැහැවියා මැරී වැටුණේ ය.
9. අපි අද ම සෙනෙවියා සමඟ පිටත් වන්නමු.
10. වඳුරෝ පැටවුන් සමඟ ගැහැවියා ගේ වත්තෙන් පලාගියහ.

*   *   *

## ආඛ්‍යාත සත්තමී විභත්තිය

40. **හේ යනු කැමැත්තේ ය. ඔහුට යන්නට අවසර දෙන්නේ නම් මැනවි.** මෙසේ යමක් කරන්නට අවසර දීම, කැමැත්ත පැවසීම **අනුමති** නමි. **හේ යන්නේ නම් මමත් යන්නෙමි.** මෙහි ඔහු නො යතොත් මා නො යන බව හැඟේ. ඒ වාක්‍යයෙහි **යන්නේ නම්(යතොත්)** යන පදයෙන් තමා ගේ ගමන නියම නැති බව පැවැසෙයි. මෙ අනියමය, අනිශ්චය **පරිකල්ප** නමි. මෙහි දැක්වුණු අනුමති අර්ථය ද පරිකල්ප අර්ථය ද පැවැසීමෙහි පාලියෙහි සත්තමී විභත්තිය යෙදේ. මෙය **ආඛ්‍යාත සත්තමී** නමි. මෙය විධාන කිරීම් ආදි අර්ථවලැ ද යෙදේ.

### ආඛ්‍යාත සත්තමී විභත්ති*

| | **ඒකවචන** | **බහුවචන** |
|---|---|---|
| **පඨම පුරිස** | සො ධාවෙය්‍ය | තෙ ධාවෙය්‍යුං |
| **මජ්ඣිම පුරිස** | ත්වං ධාවෙය්‍යාසි | තුම්හෙ ධාවෙය්‍යාථ |
| **උත්තම පුරිස** | අහං ධාවෙය්‍යාමි | මයං ධාවෙය්‍යාම |

### අර්ථ

| | | |
|---|---|---|
| **පඨම පුරිස** | සො ධාවෙය්‍ය<br>(හේ දුවන්නේ ය) | තෙ ධාවෙය්‍යුං<br>(ඔහු දුවන්නාහ) |
| **මජ්ඣිම පුරිස** | ත්වං ධාවෙය්‍යාසි<br>(තෝ දුවන්නෙහි) | තුම්හෙ ධාවෙය්‍යාථ<br>(තෙපි දුවන්නහු) |
| **උත්තම පුරිස** | අහං ධාවෙය්‍යාමි<br>(මම් දුවන්නෙමි) | මයං ධාවෙය්‍යාම<br>(අපි දුවන්නමු) |

---

* මෙය නාමයන් ගේ සත්තමී විභත්තිය නො වන බව ගුරුවරයා විසින් සිසුනට පැහැදිලි කර දිය යුතු.

**41.** මෙහි **දුවන්නේ ය** යනු **දුවා වා**(දුවන්නට ඔහුට අවසර ඇත) යන අනුමතිය පවසයි. **දුවනවා ඇත** යන අර්ථය දෙතොත් එවිට ඒ අනියමින් කීමයි. සමහර විට **දිවිය යුතුය** යන අරුතෙහි ද යෙදේ. එවිට ඒ විධානාර්ථයෙහි යෙදුණා නම් වේ. අනියමාර්ථය පැවැසීමේ දී ක්‍රියාවට මුලින් **සචෙ, යදි** යන දෙකින් එකෙක් යෙදේ. සමහර විට පදයට පසුව **චෙ** යන නිපාතය ද යෙදේ.

සචෙ සො ධාවෙය්‍ය අහං අපි ධාවෙය්‍යාමි.
යදි සො ධාවෙය්‍ය අහං අපි ධාවෙය්‍යාමි.
සො ධාවෙය්‍ය චෙ අහං අපි ධාවෙය්‍යාමි.
(හේ දුවන්නේ නම්(ඔහු දුවතොත්) මමත් දුවන්නෙමි).

මෙහි ප්‍රධාන වාක්‍යය වූ දෙවැන්නෙහි ක්‍රියාව තැනට සුදුසු සේ වෙන ආඛ්‍යාතික ක්‍රියාවෙකින් ද තබත හැක්ක. යදි සො ගවෙෂය්‍ය අහං ඉධ ඔහීයිස්සාමි(හේ යන්නේ නම් මම මෙහි රැඳෙන්නෙමි.)

**හේ මෙහි එන්නේ නම් මැනවි.(ඔහු එතොත් යහපති)** මේ වාක්‍යය පාලියට නැඟූ විට **යනනූන සො ඉධ ආගචෙඡය්‍ය** කියා හෝ **අපෙපව නාම සො ඉධ ආගචෙඡය්‍ය** යී සිටී. මෙ තැන **මැනැවි, යහපති** යන අර්ථය පාලියෙන් දීමේ දී සත්තමී විභත්තික ක්‍රියාව සමඟ එයට මුලින් **යනනූන, අපෙපවනාම** යන නිපාත යෙදී ඇති සැටි සිතට ගත යුතු.

## සන්ධි විධියක්

**42.(අ). තචං – අපි** යන පද දෙක **තචමපි** කියා හෝ **තචමපි** කියා සන්දි වෙයි. **තචමපි** යී සිද්ධ වූ තැන **තචං – අපි** යන්නෙහි අයන්න මැකී **තචංපි** වී එයට පසු බින්දුව **ම්**යන්න බවට පෙරැළී ඇත.

තචං අපි – තචං පි – තචමපි

**එවමපි** යන්න හැදී ඇත්තේ **එවං** යන තැන බින්දුව **ම්** බවට පෙරළී එය ඊළඟට තිබෙන **අ**යන්න හා හන්දි වීමෙනි.

එවං අපි - එවම් අපි - එවමපි

**අහං අපි, අහමපි අහමපි** කියා හැදෙන්නේ ද මේ නයින් ම ය.

42.(ආ). පරසවර ලෝපය

**ආ, එ, ඔ** යන අකුරකට පසු වැ සිටි අයන්න මැකෙයි(ලොප් වෙයි). එසේ මැකී හිස් වූ තැන( ' ) මේ අවග්‍රාහ ලකුණ යොදනු ලැබේ.

සා අපි = සා'පි, තෙ අපි = තෙ'පි, සො අපි = සො'පි

**පද මාලාව**

**ක්‍රියා පද**

ඔහීයති(නවතී, රැඳේ)
භුඤ්ජති(වළඳයි)
නස්සති(නැසෙයි)

**නිපාත පද**

න(නො) න ගච්ඡති(නො යයි)

**ඇබෑසිය**

**(අ) සිංහලයට නඟන්න.**

1. යදි සො ගච්ඡෙය්‍ය එවමපි ගච්ඡෙය්‍යාසි.
2. අප්පෙපවනාම තෙ ඉධ වසෙය්‍යුං.
3. සචෙ සො පචෙය්‍ය මයං භුඤ්ජෙය්‍යාම.
4. තෙ චෙ න ආගච්ඡෙය්‍යුං මයං ඉධ න වසෙය්‍යාම.

5. අප්පෙවනාම සො ආගච්ඡෙය්‍ය ඉධ නිසීදෙය්‍ය.

6. යදි තුම්හෙ හසෙය්‍යාථ න තෙ අත්‍ර ආගච්ඡෙය්‍යුං.

7. සචෙ ත්වං රොදෙය්‍යාසි න අහං කථෙය්‍යාමි.

8. යදි තුම්හෙ ධාවෙය්‍යාථ තෙ'පි ධාවෙය්‍යුං.

9. යන්නූන සො ඉතො ගච්ඡෙය්‍ය, ත්වම්පි ඉධ වසෙය්‍යාසි.

10. සචෙ තෙ ආගච්ඡෙය්‍යුං තුම්හෙ පචෙය්‍යාථ.

**(ආ) පාලියට නඟන්න.**

1. ඔහු මෙහි සිටින්නාහු නම් අපි ද සිටින්නමු.
2. තෙපි මෙතැනින් යන්නහු නම් කියවු, අපිත් යන්නමු.
3. අපි මෙහි වසන්නමෝ නම් ඔහුත් එන්නාහ.
4. මම් සිටින්නෙම් නම් හේ නො ඉඳගන්නේ ය.
5. තෙපි අඬන්නහු නම් අපි මෙහි නො සිටින්නමු.
6. ඔහු එහෙන් එන්නාහු නම් අපි මෙහෙන් යන්නමු.
7. තෙපි මෙහි සිටින්නහු නම් ඉතා යෙහෙකි.
8. තොප වළඳතොත් මම් පිසන්නෙම්.
9. හේ පිසන්නේ නම් මම් නො වළඳන්නෙම්.
10. ඔහු මෙහෙන් යන්නාහු නම් ඉතා යෙහෙකි.

* * *

## පාඩම 22

# උකාරාන්ත පුංලිඞ්ගික ශබ්ද

### ගරු (ගුරුවරයා)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | ගරු<br>(ගුරුවරයා) | ගරූ, ගරවො<br>(ගුරුවරු) |
| ආ: වි: | (හෙ) ගරු<br>(පින්වත් ගුරුවරය) | (භවන්තො) ගරූ, ගරවො<br>(පින්වත් ගුරුවරුනි) |
| දු: වි: | ගරුං<br>(ගුරුවරයා) | ගරූ, ගරවො<br>(ගුරුවරුන්) |
| ත: වි: | ගරුනා<br>(ගුරුවරයා කරණකොට) | ගරූහි, ගරූභි<br>(ගුරුවරුන් කරණකොට) |
| ච: වි: | ගරුනො, ගරුස්ස<br>(ගුරුවරයාට, ගුරුවරයා පිණිස) | ගරූනං<br>(ගුරුවරුනට, ගුරුවරුන් පිණිස) |
| පං: වි: | ගරුනා, ගරුම්හා<br>ගරුස්මා<br>(ගුරුවරයා ගෙන්) | ගරූහි,ගරූභි<br>(ගුරුවරුන් ගෙන්) |
| ඡ: වි: | ගරුනො, ගරුස්ස<br>(ගුරුවරයා ගේ) | ගරූනං<br>(ගුරුවරුන් ගේ) |
| ස: වි: | ගරුම්හි, ගරුස්මිං<br>(ගුරුවරයා කෙරෙහි) | ගරූසු, ගරුසු<br>(ගුරුවරුන් කෙරෙහි) |

### නාම ශබ්ද

එරසු(පොරොව) | කෙතු(කොඩිය)
ගරු(ගුරුවරයා) | සඞ්කු(උල)
උච්ඡු(උක්ගස) | කොධ(ක්‍රොධය)
භික්ඛු(භික්ෂු නම) | ලොක(ලෝවැස්සා)
මච්චු(මරු, මරණය) | අකෙකාධ(අක්‍රෝධය)
සෙතු(හේ දංඩ, පාලම) | ඡණ(උත්සවය)

### ක්‍රියාපද

ජිනාති(දිනයි) | උත්තිට්ඨති(නැඟී සිටී)
පමජ්ජති(පමා වෙයි) | කථෙති(කියයි)
ඛාදති(කයි, කා දමයි) | චරති(හැසිරෙයි)
උස්සාපෙති(ඔසොවයි) | තුදති(අනී)
හසති(සිනාසෙයි)

### නිපාත

භියොයාසො මත්තාය(බොහෝ සෙයින්)
සමන්තා(හාත්පස, අවට, වටා)
සමන්තා පාසාදං(පහය හාත්පස)

මෙය සමාස නො වූ තැන ඡට්ඨී විභත්තිය සමඟ යෙදේ.
ගජස්ස සමන්තා(ඇතු වටා)

### සන්ධි

න + පමජ්ජති = නප්පමජ්ජති

මෙ තැන **න** යන්නට පසු ව සිටි **ප** යන්න දෙකක් විය. මේ ද්විත්ව(දෙකක්වීම) නමි.

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. අක්කොධෙන ජිනෙ කොධං.
2. උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය.
3. සෙවකා එරසුහි ඡින්දිත්වා රුක්ඛං පාතෙය්‍යුං.
4. සචෙ ආචරියො ඡණ්ණං පසසිතුං ගවෙෂය්‍ය තුමෙහ'පි ගවෙෂයාථ.
5. අපෙපව නාම අජ්ජ ථෙරො ඉතො බහි න ගවෙෂය්‍ය.
6. හෙ පුත්ත, යදි ත්වං හසෙය්‍යාසි න තෙ ඉධ ආගවෙෂය්‍යුං.
7. හෙ පුරිස, යදි ත්වං රොදය්‍යාසි න අහං කථෙය්‍යාමි.
8. යදි ආගන්තුකා අජ්ජ ඉධ ඔහීයෙය්‍යුං සූද ආහාරං පටියාදෙය්‍යුං.
9. යනනූන මයං බුද්ධං දට්ඨුං විහාරං ගවෙෂය්‍යාම.
10. සචෙ චොරා අජ්ජ ගාමං පවිසෙය්‍යුං මනුසසා තතො පලායෙය්‍යුං.

### (ආ) පාලියට නඟන්න.

1. සෙබළු මෙහි රැඳෙන්නාහු නම් අද ම අපි මෙයින් නික්ම යන්නමු.
2. ඇමැතියා එන්නේ නම්, මිනිස්සු මෙහි රැස්වන්නාහ.
3. ගුරුහු සමඟ අතවැස්සෝ අද එන්නාහු නම් තෙපි නවාතන් පිළියෙල කරවු.
4. ඇත්තු උක්ගස් කා දැමූහ.

5. ලොවැසි තෙම මරුහුගෙන් තැති ගනී.

6. භික්ෂූහු ගමේ පිඬු පිණිස හැසිරෙන්නාහු නම්, මිනිස්සු බොහෝ සෙයින් පහදින්නාහුය.

7. දැන් මිනිස්සු මෙහි පාලමක් තනත්.

8. සේවකයෝ ප්‍රාසාදය වටා කොඩි එසැවූහ.

9. ළමයි ඇතා වටේ සිට උග්ගස් කන්නට දුන්හ.

10. වැද්ද වලසා දැක උලින් ඇන්නේ ය.

* * *

## පාඩම 23

### ඊකාරාන්ත, ඌකාරාන්ත පුංලිඞ්ගික ශබ්ද

**හත්ථී(ඇතා)**

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **ප: වි:** | හත්ථී<br>(ඇතා) | හත්ථී, හත්ථිනො<br>(ඇත්තු) |
| **ආ: වි:** | හෙ හත්ථි<br>(ඇතා) | හෙ හත්ථී, හත්ථිනො<br>(ඇතුනි) |
| **දු: වි:** | හත්ථිං, හත්ථිනං<br>(ඇතා) | හත්ථී, හත්ථිනො<br>(ඇතුන්) |
| **තෘ: වි:** | හත්ථිනා<br>(ඇතු කරණකොට) | හත්ථීහි<br>(ඇතුන් කරණකොට) |
| **ච: වි:** | හත්ථිනො, හත්ථිස්ස<br>(ඇතුට) | හත්ථීනං<br>(ඇතුනට) |
| **පං: වි:** | හත්ථිනා, හත්ථිම්හා<br>හත්ථිස්මා(ඇතු ගෙන්) | හත්ථීහි<br>(ඇතුන් ගෙන්) |
| **ෂ: වි:** | හත්ථිනො, හත්ථිස්ස<br>(ඇතු ගේ) | හත්ථීනං<br>(ඇතුන් ගේ) |
| **ස: වි:** | හත්ථිනි, හත්ථිම්හි,<br>හත්ථිස්මිං(ඇතු කෙරෙහි) | හත්ථීසු<br>(ඇතුන් කෙරෙහි) |

## ඌකාරාන්ත ශබ්ද

### විඤ්ඤූ (පණ්ඩිතයා)

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | විඤ්ඤූ<br>(පණ්ඩිතයා) | විඤ්ඤූ, විඤ්ඤුනො<br>(පණ්ඩිතයෝ) |
| ආ: | වි: | හෙ විඤ්ඤු<br>(පණ්ඩිතය) | හෙ විඤ්ඤූ, විඤ්ඤුනො<br>(පණ්ඩිතයනි) |
| දු: | වි: | විඤ්ඤුං, විඤ්ඤුනං<br>(පණ්ඩිතයා) | විඤ්ඤූ, විඤ්ඤුනො<br>(පණ්ඩිතයන්) |
| ත: | වි: | විඤ්ඤුනා<br>(පණ්ඩිතයා<br>කරණකොට) | විඤ්ඤූහි<br>(පණ්ඩිතයන්<br>කරණකොට) |
| ච: | වි: | විඤ්ඤුනො, විඤ්ඤුස්ස<br>(පණ්ඩිතයාට) | විඤ්ඤූනං<br>(පණ්ඩිතයනට) |
| පං: | වි: | විඤ්ඤුනා, විඤ්ඤුම්හා, විඤ්ඤුස්මා<br>(පණ්ඩිතයා ගෙන්) | විඤ්ඤූහි<br>(පණ්ඩිතයන් ගෙන්) |
| ඡ: | වි: | විඤ්ඤුනො, විඤ්ඤුස්ස<br>(පණ්ඩිතයා ගේ) | විඤ්ඤූනං<br>(පණ්ඩිතයන් ගේ) |
| ස: | වි: | විඤ්ඤුම්හි, විඤ්ඤුස්මිං<br>(පණ්ඩිතයා කෙරෙහි) | විඤ්ඤූසු<br>(පණ්ඩිතයන් කෙරෙහි) |

43.(අ). **කපි, ගරු, හත්ථී, විඤ්ඤූ** යන ශබ්දවල චතුර්ථී ඒක වචනයෙහි පිළිවෙළින් **කපි, ගරු, හත්ථී, විඤ්ඤු** කියා රූප ද ඇත. එහෙත් ඒවා බහුල වශයෙන් යෙදී නැත.

43.(ආ). ඊකාරාන්ත දණ්ඩී ශබ්දයේ සත්තමී ඒකවචනයේ **දණ්ඩිනි** යි රූපයක් ඇතත් සමහර ඊකාරාන්තවල එය නො ලැබේ.

මේ **ඉ, ඊ, උ, ඌ** යන අකුරුවලින් අන්ත වන ශබ්දයෝ, පඨමා ආලපන දුතියා යන විභත්තීන්හි ඔවුනොවුනට මඳක් වෙනස් ව වරනැඟෙතත්, තතියා ආදි ඉතිරි සියලු විභත්තීන්හි සමාන ව වරනැඟෙත්. එහෙයින් මේවා සිත තබා ගැන්ම පහසු වේ.

## ශබ්ද මාලාව

### නාම

| | |
|---|---|
| සූනු(පුත්‍රයා) | සෙනානී(සෙනෙවියා) |
| ජනතු(සත්ත්වයා) | ගාමිනී(ගම්දෙටුවා) |
| චාගී(ත්‍යාගවතා) | තිරච්ඡාන(තිරිසනා) |
| මච්ඡරී(මසුරා) | මනතී(මනත්‍රීවරයා) |
| කුටඨී(කුෂට ඇත්තා) | වඩ්ඪකී(වඩුවා) |
| සුඛී(සැප ඇත්තා) | කුලාවක(කැදැල්ල) |
| පාපකාරී(පව්කරන්නා) | චාග(ත්‍යාගය) |
| පාපී(පාපියා) | සමාගම, සංසගග(එක් වීම) |
| කතඤ්ඤු(කළ ගුණ දන්නා) | පාතරාස(හීල් බොජුන) |
| සබ්බඤ්ඤු(සර්වඥයන් වහන්සේ) | |

### ක්‍රියා

| | |
|---|---|
| කම්පති, චලති(සැලෙයි) | තසති(තැති ගනී) |
| හොති(වෙයි) | පරාජෙති(පරදවයි) |
| තුදති(අනී) | භවති(වෙයි) |
| පිහයති(කැමති වෙයි) | සෙවති(ඇසුරු කරයි) |
| පාතුභවති(පහළ වෙයි) | නිබ්බත්තති(උපදී) |
| රමති(ඇලෙයි) | |
| උපනාමෙති(පිරිනමයි, පිළිගන්නයි) | |
| පරිවාරෙති(පිරිවරයි, වටකර ගනී) | |
| උපටඨාති, උපටඨහති(උවටන් කරයි) | |

### නිපාත

උපරි(මත්තෙහි). මෙය ඡට්ඨීවිභත්තික පද සමඟ යෙදෙයි.

පබ්බතස්ස උපරි(කන්ද මත්තේ)

අපි(ද).

අතීතෙ අපි = අතීතෙ'පි(අතීතයෙහි ද, පෙර ද)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. භූපතිනො පාසාදස්ස උපරි කෙතවො වාතෙන කම්පන්ති.
2. වඩ්ඪකිනො ඵරසූහි රුක්ඛෙ ඡින්දිත්වා පාතෙසුං.
3. ලුද්දකා ව්‍යග්ඝං පරිවාරෙත්වා සංකූහි තුදිත්වා මාරෙසුං.
4. සෙනානිනො භික්ඛූනං පාතරාසං උපනාමෙත්වා විහාරම්හා නික්ඛමිංසු.
5. න සබ්බදා සබ්බඤ්ඤූනො ලොකෙ පාතුභවන්ති.
6. ගාමිනිනො සූනවො සෙනානිනා සද්ධිං රථං ආරුහිත්වා ගන්ත්වා තතො ඔරුහිත්වා මන්තිනං උපසංකමිංසු.
7. ගාමනිනො සූනූහි සහ සබ්බඤ්ඤුං දට්ඨුං අනාථපිණ්ඩිකස්ස ආරාමං උපසංකමිංසු.
8. ජන්තවො අතීතෙ'පි මරිංසු. ඉදනි'පි මීයන්ති අනාගතෙ'පි මරිස්සන්ති.
9. විදූනො සබ්බඤ්ඤූනො ධම්මස්මිං රමන්ති.
10. හත්ථී කුජ්ඣිත්වා දණ්ඩිනං අනුබන්ධි.

### (ආ) පාලියට නඟන්න.

1. ත්‍යාගවත්හු ත්‍යාගයෙන් මසුරන් පරදවත්.
2. වෙද කුෂට ඇත්තහු ගේ රෝගය බෙහෙතින් සංසිඳුවී ය.
3. සත්ත්වයෝ සුව ඇත්තෝ වෙත් වා!
4. ශිල්පීහු මෙහි වසන්නාහු නම් ඉතා යෙහෙකි.
5. පණ්ඩිතයෝ සර්වඥයන් වහන්සේ කෙරෙහි පැහැදුණාහ.
6. පව් කරන්නන් හා එක්වීමෙන් මිනිස්සු පාපීහු වන්නාහ.
7. ඇත්තු උක් ගස්වලට කැමති වෙත්.
8. මිනිස්සු ද තිරිසන්නු ද දෙවියෝ ද මරණයෙන් තැති ගනිත්.
9. දරුවනි, තෙපි කළගුණ දන්නෝ වවු.
10. කඳු මත්තෙහි ගිජු ලිහිණියන් ගේ කූඩු ඇත.

*     *     *

පාඩම 24

# ඔකාරාන්ත පුංලිඞ්ගික ශබ්ද

## ඔකාරාන්ත ගො ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | ගො | ගාවො |
| ආ: වි: | හෙ ගො | හෙ ගාවො |
| දු: වි: | ගාවුං, ගාවං, ගවං | භවනෙතා ගාවො, ගවො |
| ත: වි: | ගාවෙන, ගවෙන | ගාවෙහි, ගවෙහි, ගොහි |
| ච: වි: | ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| පං: වි: | ගාවම්හා, ගවම්හා<br>ගාවස්මා, ගවස්මා<br>ගාවා, ගවා | ගාවෙහි, ගවෙහි, ගොහි |
| ඡ: වි: | ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| ස: වි: | ගාවම්හි, ගවම්හි<br>ගාවස්මිං, ගවස්මිං<br>ගාවෙ, ගවෙ | ගාවෙසු, ගවෙසු, ගොසු |

අර්ථ – ගො(ගොනා), ගාවො(ගොන්නු) යනාදි වශයෙන් අර්ථ ගත යුතු.

## විශේෂණ විශේෂ්‍ය

44. **සුදු ගෙනා** යැ යි කී විට **ඒ ගොනා රතු පැහැති එකෙකුත් නො ව, කළු පැහැති එකෙකුත් නො ව සුදු පැහැති එකෙක් ම යැ** යි ඇඟේ. වෙන පැහැ ඇති ගොනුන් ගෙන් ඌ වෙන් කොට දැක්වුණේ **සුදු** යන වචනයෙනි. **කළු ගොනා** යි කීවොත් **කළු** යන වචනයෙන් ඌ අන් පැහැ ඇති ගොනුන් ගෙන් වෙන් කැරෙයි. මෙසේ සතකු හෝ දැයක් අන් සතුන් ගෙන් හෝ අන් දෑ කෙරෙන් වෙන් කැරැ දැක්වීමට යොදන පද **විශේෂණ** නම්. මෙසේ වූ විශේෂණ පදවලින් වෙන් කරනු ලබන්නහු අඟවන පද **විශේෂ්‍ය** නම්. **සුදු ගොනා** කී තැන **සුදු** යනු විශේෂණ යි. **ගොනා** යනු විශේෂ්‍ය යි. **සුදු ගොනා** යන්න පාළියට නැඟූ විට **ධවලො ගො** යි සිටී. ගො යනු විශේෂ්‍ය පදය යි. එය පුංලිඞගික පඨමා විභත්ති ඒක වචනයෙන් සිටී. එහි විශේෂණය වූ **ධවලො** යන්න ද පුංලිඞගික ව පඨමා විභත්ති ඒකවචනයෙන් ම සිටී. මෙසේ විශේෂණ පදය විශේෂ්‍ය පදයට ලිඞගයෙන් සඞඛ්‍යායෙන් විභත්තියෙන් සමාන වැ සිටිය යුතු යි. එහි **ගුනනං** යැ යි චතුත්ථී විභත්ති බහුවචනයෙන් ඒ විශේෂ්‍ය පදය සිටියේ වී නම් එහි විශේෂණ පදය ද **ධවලානං** යැ යි ලිඞග සඞඛ්‍යා විභත්ති යන තුනින් ම සමාන වැ සිටී.

මෙසේ විශේෂ්‍ය පදයට ලිඞග විභත්ති සඞඛ්‍යා යන තුනින් සමාන ව(තුල්‍ය ව) සිටිනා විශේෂණය **තුල්‍යාධිකරණ විශේෂණ** නම් වේ. පහත දැක්වෙන නිදසුන්වලින් මෙය වඩාත් පැහැදිලි වනු ඇත.

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | ධවලො ගො<br>(සුදු ගොනා) | ධවලා ගාවො<br>(සුදු ගොන්නු) |
| ආ: වි: | හෙ ධවල ගො<br>(එම්බා සුදු ගොනෝ) | හෙ ධවලා ගාවො<br>(එම්බා සුදු ගොනුනි) |
| දු: වි: | ධවලං ගාවං<br>(සුදු ගොනා) | ධවලෙ ගාවො<br>(සුදු ගොනුන්) |
| තා: වි: | ධවලෙන ගාවෙන<br>(සුදු ගොනා කරණ කොට) | ධවලෙහි ගොහි<br>(සුදු ගොනුන් කරණ කොට) |
| ච: වි: | ධවලස්ස ගාවස්ස<br>(සුදු ගොනාට) | ධවලානං ගුන්නං<br>(සුදු ගොනුනට) |
| පං: වි: | ධවලම්හා, ගාවම්හා<br>(සුදු ගොනා ගෙන්) | ධවලෙහි ගොහි<br>(සුදු ගොනුන් ගෙන්) |
| ඡ: වි: | ධවලස්ස ගාවස්ස<br>(සුදු ගොනා ගෙන්) | ධවලානං ගුන්නං<br>(සුදු ගොනුන් ගේ) |
| ස: වි: | ධවලස්මිං ගාවස්මිං<br>(සුදු ගොනා කෙරෙහි) | ධවලෙසු ගොසු<br>(සුදු ගොනුන් කෙරෙහි) |

## ශබ්ද මාලාව

### විශෙෂණ ශබ්ද

මහද්ධන(මහ ධනයක් ඇති)
සොභන(හොබනා, ලස්සන)
දුග්ගත(දුගී, දුප්පත්)
චාගී(ත්‍යාගවත්)
ථූල, ථුල්ල(ස්ථූල, තරබාරු)
සන්තක(සතු, අයත්)
අත්තනො සන්තක(තමා අයත්)
දීඝ(දික්)
රස්ස(නො දික්, කොට)
මහල්ලක(මහළු)
තරුණ(තරුණ වයස්ක)
ගිලාන(ගිලන්, ලෙඩින් පෙළෙන)
නිපක(තැනට සුදුසු නුවණ ඇති)
ඛුද්දක(කුඩා)
අප්පක(සවල්ප, මඳ)
චණ්ඩ(නපුරු)
සාධු විහාරී(හොඳ පැවතුම් ඇති)
සමත්ථ, දක්ඛ(දක්ෂ)
අවිදූර(නොදුරු, ඇත් නොවූ)

බහු(බොහෝ වූ)
සෙත(සුදු)
ජෙට්ඨ(වැඩිමාළු)
කණිට්ඨ(වයසින් බාල)
දුබ්බිනීත(නො හික්මුණු)
කිස(කෘශ, කෙට්ටු)
සකල(සියලු)
උච්ච(උස්)
නීච(මිටි)
අධම්මික(නො දැහැමි)
අසද්ධ(සැදැහැ නැති)
සද්ධ(සැදැහැ ඇති)
දුස්සීල(සිල් නැති)
සුසීල(සිල්වත්)
මෙධාවී(නුවණ ඇති)
බාල(ලාමක)
රත්ත(රතු)
විනීත(හික්මුණු)

### නාම

සාමික(සවාමියා)
සහාය(යහළුවා)
පදෙස(පෙදෙස, පළාත)
ඔකාස(අවසරය)
විභව(වස්තු, සම්පත)
සන්නිපාත(රැස්වීම)
කුලාවක(කැදැල්ල)

**විශෙෂ යෙදුම්:**

අත්‍ථ(ප්‍රයොජනය, අභිවෘද්ධිය, වැඩ).

මෙහි චතුත්‍ථී ඒකවචනය **අත්‍ථාය** කියා වේ. මෙය ඡට්ඨී විභත්තික පද සමඟ **ප්‍රයෝජනය පිණිස, යහපත පිණිස, වැඩ පිණිස** යන අර්ථ දීමට යෙදෙයි. අත්තනො අත්‍ථාය(තමා ගේ ප්‍රයෝජනය පිණිස, තමා පිණිස).

පාදෙසු(පාමුලැ)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. මහද්ධනො කුටුම්බිකො සෙතං ගවං කිණිත්වා වජං ආනෙසි.
2. දුග්ගතා පුරිසා චාගිං ගහපතිං උපසංකමිංසු.
3. ගෙහස්ස සාමිකො දුබ්බිනීතෙ සෙවකෙ ගෙහම්හා නික්කඩ්ඪී.
4. ථූලො සුනඛො කිසං සුනඛං අනුබන්ධි.
5. චණ්ඩො දසො දීඝෙන දණ්ඩෙන පහරිත්වා අහිං මාරෙසි.
6. සද්ධො උපාසකො විහාරං ගන්ත්වා ගිලානං මහල්ලකං ථෙරං උපට්ඨාසි.
7. වඩ්ඪකිනො ගාමස්ස අවිදූරෙ පදෙසෙ බහුන්නං භික්ඛූනං අත්‍ථාය සොභනං විහාරං මාපෙසුං.
8. ජෙට්ඨො භාතිකො කණිට්ඨස්ස භාතිකස්ස අත්තනො සන්තකං සකලං විභවං නිය්‍යාදෙත්වා විහාරං ගන්ත්වා පබ්බජී.
9. බහවො සකුණා තත්‍ර ආරාමෙ උච්චෙසු තරුසු බහු බුද්දකෙ කුලාවකෙ කත්වා වසිංසු.
10. අප්පකා ජනා ධම්මං චරිත්වා සග්ගෙ නිබ්බත්තිස්සන්ති.

(ආ) පාලියට නඟන්න.

1. බලවු, අතැනැ උස් ගසෙහි බොහෝ පක්ෂීන් ගේ රැස්වීමෙක් වේ.
2. අද සවස මනත්‍රී අවුත් මෙහි සමර්‍ථ ශිෂ්‍යයනට තෑගි පිරිනමන්නේ ය.
3. නපුරු සොරා ගාලට වැද රතු ගොනා හැරගෙන ගියේ ය.
4. දරුවනි, කෙට්ටු බල්ලාට නො ගසවු.
5. නො හික්මුණු ළමෝ දිළිඳු මිනිසාට අත්වලින් ගසා පලවා හැරියෝ ය.
6. දිවියා දික් නියවලින් පැහැර තරබාරු ගොනා මැරීය.
7. හිකමුණු ශිෂ්‍යයා ගුරුහු ගේ පාමුලැ වැටී ගමට යන්නට අවසර ඉල්ලී ය.
8. සැදැහැ නැති සිල් නැති මිනිස්සු විහාරයට ගොස් භික්ෂූනට බැණවැදුණාහ.
9. නුවණැති දැහැමි මිනිස්සු නො දැහැමි ලාමක ජනයන් සෙවුනට කැමැති නො වෙත්.
10. තැනට සුදුසු නුවණ ඇති, හොඳ පැවැතුම් ඇති යහලුවකු ලබන්නෙම් නම් ඉතා යෙහෙක.

* * *

පාඩම 25

## වනතු මනතු ඊ යන ප්‍රත්‍යයයන් එක්වැ හැදෙන ශබ්ද

45. අයන්න හෝ ආයන්න අගට ඇති නාමවලට **වනතු ප්‍රත්‍යය** ය ද, ඉකාර, ඊකාර, උකාර, ඌකාර, ඔකාර යන මේ අකුරෙකින් අනත වන නාමයකට **මනතු ප්‍රත්‍යය** ය ද එක්වැ **ඇත්තා** යන අර්ථය ඇති විශෙෂණ ශබ්ද සැදෙයි. අකාරානතයට **ඊ ප්‍රත්‍යය** ය ද, ආකාරානතයට **ආවී ප්‍රත්‍යය** ය ද එක්වීමෙන් ද **ඇත්තා** යන අර්ථය ඇති විශෙෂණයෝ සැදෙත්. පාප චන්ද ආදි ශබ්ද කිහිපයකට **ඉමනතු ප්‍රත්‍යය** ය ද එක්වැ පාපිමනතු චන්දිමනතු ආදිහු ද තැනෙත්.

| **නාම** | **විශෙෂණ** |
|---|---|
| ගුණ(ගුණය) | ගුණවනතු(ගුණවත්, මනා ගුණ ඇති) |
| ධන(ධනය) | ධනවනතු(ධනවත්, ධනය ඇති) |
| පඤ්ඤා(ප්‍රඥාව) | පඤ්ඤවනතු, පඤ්ඤවී(ප්‍රඥාවත්, නුවණැති) |
| සති(සිහිය) | සතිමනතු(සිහි ඇති) |
| ධී(නුවණ) | ධීමනතු(නුවණ ඇති) |
| චක්ඛු(ඇස) | චක්ඛුමනතු(ඇස් ඇති) |
| ගො(ගවයා) | ගොමනතු(ගවයන් ඇති) |
| ධන(ධනය) | ධනී(ධනය ඇති) |
| මෙධා(නුවණ) | මෙධාවී(නුවණ ඇති) |

මේ ශබ්දයෝ අන් නාමයකට විශෙෂණ නො වී තනි නාමයන් ම හැටියට ද බැවහර වෙත්. ගුණවනතු(ගුණවතා), ධනවනතු (ධනවතා), ධනී(ධනවතා), මෙධාවී(නුවණැත්තා) යන ආදි වශයෙනි.

**වනතු - මනතු ප්‍රත්‍යයානතයන් වරනැගෙන සැටි :**
මේ ශබ්ද සාමාන්‍යයෙන් පුරිස ශබ්දය සේ වරනැගෙත්. සමහර විභත්තීන්හි වැඩිපුර පදරූප කෙනෙක් ද ලැබෙත්. ඔහු වෙන වෙන ම පහත දැක්වෙත්.

**ගුණවනතු**

| | | එකවචන | බහුවචන |
|---|---|---|---|
| **පඨමා** | **වි:** | ගුණවනෙතා | ගුණවනතා |
| **ආලපන** | **වි:** | - - | ගුණවනතා |
| **දුතියා** | **වි:** | ගුණවනතං | ගුණවනෙත |
| **තතියා** | **වි:** | ගුණවනෙතන | ගුණවනෙතහි |
| **චතුත්ථී** | **වි:** | ගුණවනතසස | ගුණවනතානං |
| **පංචමී** | **වි:** | ගුණවනතමහා, ගුණවනතසමා | ගුණවනෙතහි |
| **ඡට්ඨී** | **වි:** | ගුණවනතසස | ගුණවනතානං |
| **සත්තමී** | **වි:** | ගුණවනෙත, ගුණවනතමහි ගුණවනතසමිං | ගුණවනෙතසු |

**විශෙෂ රූප**

| | | එකවචන | බහුවචන |
|---|---|---|---|
| **පඨමා** | **වි:** | ගුණවා | ගුණවනෙතා |
| **ආලපන** | **වි:** | ගුණවං, ගුණව, ගුණවා | ගුණවනෙතා |
| **දුතියා** | **වි:** | - - | - - |
| **තතියා** | **වි:** | ගුණවතා | - - |
| **චතුත්ථී** | **වි:** | ගුණවතො | ගුණවතං |
| **පංචමී** | **වි:** | ගුණවතා | - - |
| **ඡට්ඨී** | **වි:** | ගුණවතො | ගුණවතං |
| **සත්තමී** | **වි:** | ගුණවති | - - |

මේ දෙවගේ ම රූප එක් කොට ගත් කල පහත දැක්වෙන පරිද්දෙන් සම්පූර්ණ වරනැඟිල්ල තැනෙයි.

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **ප: වි:** | ගුණවා, ගුණවන්තො | ගුණවන්තො, ගුණවන්තා |
| **ආ: වි:** | හෙ ගුණවා, ගුණව, ගුණවං | හෙ ගුණවන්තො ගුණවන්තා |
| **දු: වි:** | ගුණවන්තං | ගුණවන්තෙ |
| **ත: වි:** | ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි |
| **ච: වි:** | ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| **පං: වි:** | ගුණවතා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා | ගුණවන්තෙහි |
| **ඡ: වි:** | ගුණවතො,ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| **ස: වි:** | ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං | ගුණවන්තෙසු |

**46.** ධනී, මේධාවී ආදිහු ඊකාරාන්තයෝ ය. ඒවා මෙහි 22 වන පාඩමේ දැක්වුණු හත්ථී ශබ්දය මෙන් වරනැඟෙත්.

**47.** උඩ දැක්වුණු වන්තු ප්‍රත්‍යයාන්තයන් තනි වැ නාමයන් සේ ද අන් නාමයකට විශෙෂණව ද යෙදෙන සැටි පහත සඳහන් වන නිදසුන් වලින් දැනගත යුතු.

**තනි නාමයන් සේ යෙදෙන සැටි :**

ගුණවා ගුණවන්තෙ සෙවති.
(ගුණවතා ගුණවතුන් ඇසුරු කරයි.)

නමො ගුණවන්තානං.
(ගුණවතුනට නමස්කාර වේ වා)

ගුණවතො පුත්තො'පි ගුණවා භවති.
(ගුණවතා ගේ පුතා ද ගුණවතෙක් වෙයි.)

ගුණවන්තෙසු මෙධාවිනො පසීදන්ති.
(ගුණවතුන් කෙරෙහි නුවණැත්තෝ පහදිත්.)

**මේවා විශෙෂණ ව යෙදෙන සැටි:**

ගුණවා පුරිසො ගුණවනෙත පුරිසෙ සෙවති.

(ගුණවත් පුරුෂයා ගුණවත් පුරුෂයන් ඇසුරු කරයි.)

නමො ගුණවනතානං පුරිසානං.

(ගුණවත් පුරුෂයනට නමස්කාර වේ වා)

ගුණවතො පුරිසසස පුතෙතා'පි ගුණවා පුරිසො භවති.

(ගුණවත් පුරුෂයා ගේ පුතා ද ගුණවත් පුරුෂයෙක් වෙයි.)

ගුණවනෙතසු පුරිසෙසු මෙධාවිනො පුරිසා පසීදනති.

(ගුණවත් පුරුෂයන් කෙරෙහි නුවණැති පුරුෂයෝ පහදිත්.)

## ශබ්ද මාලාව

### විශෙෂණ

| | |
|---|---|
| පාපිමනතු(පවිටු) | බුදධිමනතු(බුදධිමත්) |
| බලවනතු(බලවත්) | ධිතිමනතු(ධෛර්‍ය්‍යවත්) |
| ඵලවනතු(ඵල ඇති) | උසසාහවනතු(උත්සාහය ඇති) |
| ථාමවනතු(ශකතිමත්) | ජුතිමනතු(දීප්තිමත්, බබලන) |
| භගවනතු(භාග්‍යවත්) | යසවනතු(යසස් ඇති) |
| සීලවනතු(සිල්වත්) | චනදිමනතු(සඳට අරක්ගත් දෙව්පුත්, සඳදෙව්පුත්) |

### නාම

| | |
|---|---|
| සාවක(ශ්‍රාවකයා) | අජාතසතතු(අජාසත් රජ) |
| ධුතත(ධූර්තයා) | සමාගම(එකතුව, එක්රැස් වීම) |
| විනාස(විනාශය) | බිමබිසාර(බිම්බිසාර නම් රජ) |
| තචඡක(වඩුවා) | දෙවදතත(දෙව්දත් මහණ) |
| ලුදදක(වැද්ද) | ගාමික(ගැමියා, ගම්වැසියා) |
| කලහ(කලහය) | ඔවාද(අවවාදය) |

### ක්‍රියා

| | |
|---|---|
| ඡිනදති (සිඳියි) | ඡිනදිතවා, ඡෙතවා(සිඳ) |
| ජානාති(දනී) | තිට්ඨති(සිටී) |
| ඨතවා (සිට) | |

## නිපාත පද

| | |
|---|---|
| නිස්සාය(නිසා) | න චිරස්සං(නොබෝ කලෙකින්) |
| අපි(ද, පවා) | නමො(නමස්කාර වේ වා!) |

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. පාපිමන්තො ළුද්දකස්ස චණ්ඩා සුනඛා දුබ්බලං මිගං අනුබන්ධිත්වා ගණ්හිංසු.
2. බලවන්තො තච්ඡකස්ස ධනවා භාතිකො සොභනං ආරාමං පවිසිත්වා ඵලවන්තං රුක්ඛං ඵරසුනා ඡෙත්වා පාතෙසි.
3. බලවන්තා චොරා හිය්‍යො සායං ධනවන්තො කුටුම්බිකස්ස ගෙහං පවිසිත්වා ථාමවන්තෙ'පි සෙවකෙ පහරිත්වා පලායිංසු.
4. භගවන්තො බුද්ධස්ස සීලවන්තෙසු සාවකෙසු ධනවන්තා ච බුද්ධිමන්තා ච මනුස්සා පසීදිංසු.
5. යසවන්තො භූපතිනො බුද්ධිමන්තා කුමාරා බලවන්තො සෙනාපතිනො ධිතිමන්තෙහි පුත්තෙහි සද්ධිං පාසාදම්හා ඔරුහිත්වා ථාමවන්තෙ අස්සෙ ආරුහිත්වා සඞ්ගාමාය නික්ඛමිංසු.
6. ධනවන්තො ගහපතිනො දුබ්බිනීතො පුත්තො ගුණවන්තො බුද්ධිමන්තො ච ආචරියස්ස ඔවාදෙ අඨත්වා පාපිමන්තෙ සහායෙ සෙවිත්වා විනාසං පාපුනිස්සති.
7. යන්නූන මයං භගවන්තං උපසංකමිත්වා පබ්බජෙය්‍යාම.
8. බුද්ධිමන්තා උස්සාහවන්තා ච පුරිසා න චිරස්සමෙව ධනවන්තා භවිස්සන්ති.
9. පාපිමා ගාමනී ධිතිමන්තො ධනිනො ගහපතිස්ස උසූයති.
10. ධනවන්තො වාණිජස්ස හත්ථම්හා ජුතිමා මණි පති.

(ආ) පාලියට නඟන්න.

1. ගුණවත් මිනිසා ගේ දරුවෝ ධූර්තයන් හා සමාගමය කොට නොබෝ කලකින් පව්ටෝ වූහ.
2. බිම්බිසාර රජු ගේ පුත් අජාතසත්තු කුමාරයා පව්ටු දෙව්දත් නිසා පව්ටෙක් ම විය.
3. සිල්වත් තෙරහු ගේ අවවාදය පිළිගෙන බොහෝ ජනයෝ ගුණවත් ද සිල්වත් ද වූහ.
4. ඉදින් තෙපි ධෛර්‍ය්‍යය ඇත්තෝ වන්නහු නම් නොබෝ කාලෙකින් ධනය ඇත්තෝ වන්නහු ය.
5. සිල්වත් තෙරුන් නිසා බොහෝ ජනයෝ සිල්වත් වූහ.
6. යශස් ඇති සෙනෙවියා ගේ ශක්තිමත් පුත්‍රයෝ ගමට පිවිස ගම්වැස්සන් ගේ කලහය සංසිඳුවූහ.
7. ගුණ ඇත්තෝ ම ගුණවතුන් ගේ ගුණ දනිත්.
8. මිනිස්සු සිල්වත් ඇසිරැ සිල්වත්තු ද දුසිලුන් ඇසිරැ දුසිල්හු ද වෙත්.
9. භාග්‍යවත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේ වා!
10. සිල්වත් ගැහැවි තෙම භාග්‍යවතුන් වහන්සේ ගේ පාමුලැ වැටී වැන්දේ ය.

* * *

පාඩම 26

## වත්තමානකාලික කිතකනත(කෘදනත)

48. **සෙ තෙම ගමට යන්නේ මිතුරා දැක ඔහු කැටු ව ඔහු ගේ ගෘහයට ගියේ ය.** මේ වැකියෙහි **යන්නේ** යන පදය හෙළ වියරණෙහි **අපීක්‍රියා** නමින් හැඳින්වේ.

**දරුවා හඬමින් ගෙයින් නික්මුණේ ය.** මෙහි **හඬමින්** යනු හෙළ වියරණෙහි **මුසුක්‍රියා(මිශ්‍රක්‍රියා)** නමින් හැඳින්වේ. මේ ක්‍රියා දෙවගය ම වෙනුවට පාලියෙහි ඇත්තේ **වත්මාන කාලික කෘදනත පදයෝ** ය.

උඩ සඳහන් වැකිය පාලියට නැඟූ විට **සො ගාමං ගච්ඡනෙතා මිත්තං දිසවා තෙන සහ තසස ගෙහං අගමාසි** යි සිටී. අනිත් වැකිය පාලියට නැගූ විට **දරකො රොදනෙතා ගෙහා නිකබමී** යි සිටී. මේ වාක්‍ය දෙකේ පැණෙන **ගච්ඡනෙතා, රොදනෙතා** යන පද දෙක ම **අනත**-ප්‍රත්‍යය එක් වැ හැදුණු පදයෝ ය. පාලි ව්‍යාකරණයෙහි මොවුනට **වත්තමානකාලික කිතකනත** යන නම වැහැරැ වේ.

**ගච්ඡනෙතා** යන්නෙහි ප්‍රකෘති(මුල් රූපය) **ගච්ඡනත** යනු ය. **රොදනෙතා** යන්නෙහි ප්‍රකෘතිය **රොදනත** යනු ය. මේවා හැදුණේ කෙසේ ද?

ගච්ඡති යනු වත්තමානා විභත්තික ආඛ්‍යාත පදයෙකි. එහි අඞගය **ගච්ඡ** යනු ය. රොදති යනු ද වත්තමානා විභත්තික ආඛ්‍යාතයෙකි. එහි අඞගය **රොද** යනු ය. මේ අඞග දෙකට **(අ)නත** ප්‍රත්‍යය එක් කළ විට **ගච්ඡනත, රොදනත** යි පද දෙක සැදේ. මෙසේ හැදෙන මේ කිතකනත පද ඒවායින් පැවැසෙන ක්‍රියාව කරන කත්‍ෘ අභවන පදය හා ලිඞග සඞඛ්‍යා විභත්ති යන මෙයින් සමාන වැ සිටී.

උඩ දැක්වුණු වාක්‍යවලැ **සො ගච්ඡනෙතා** යැ යි **සො** යන පදයට සමානව ම **ගච්ඡනෙතා** යන්න ද ලිඞග සංඛ්‍යා විභත්ති යන තුනින් ම සමාන වැ ම සිටී. **දාරකො රොදනෙතා** යන තැන ද දාරකො යන්නට රොදනෙතා යන්න ද සමාන වැ ම සිටී. මේ අනත ප්‍රත්‍යයය එක් වැ හැදෙන ශබ්දයන් වරනැගෙන සැටි පහත දැක්වේ.

**ගච්ඡනත**

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | ගච්ඡං, ගච්ඡනෙතා | ගච්ඡනෙතා, ගච්ඡනතා |
| ආ: | වි: | හෙ ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | හෙ ගච්ඡනෙතා, ගච්ඡනතා |
| දු: | වි: | ගච්ඡනතං | ගච්ඡනෙත |
| ත: | වි: | ගච්ඡතා, ගච්ඡනෙතන | ගච්ඡනෙතහි |
| ච: | වි: | ගච්ඡතො, ගච්ඡනතසස | ගච්ඡතං, ගච්ඡනතානං |
| පං: | වි: | ගච්ඡතා, ගච්ඡනතමහා ගච්ඡනතසමා | ගච්ඡනෙතහි |
| ඡ: | වි: | ගච්ඡතො, ගච්ඡනතසස | ගච්ඡතං, ගච්ඡනතානං |
| ස: | වි: | ගච්ඡති, ගච්ඡනෙත ගච්ඡනතමහි, ගච්ඡනතසමිං | ගච්ඡනෙතසු |

**49.** මේ පදවල පඨමා විභත්ති ඒකවචනය හැර අනිත් හැම තැන ම පදරූප මෙයට මුලින් ඇති පාඩමේ දැක්වුණු වනතු ප්‍රත්‍යයානත නාමයට සමාන ය.

පුරිසො ගච්ඡනෙතා (පුරුෂයා යන්නේ, පුරුෂයා යමින්)
පුරිසා ගච්ඡනතා (පුරුෂයෝ යන්නාහු, පුරුෂයෝ යමින්)

**නාමයට විශෙෂණව ද මේ කිතකනත පදයෝ යෙදෙත්.**

ගච්ඡං(ගච්ඡනෙතා) පුරිසො (යන්නාවූ පුරුෂයා)
ගච්ඡනෙතා(ගච්ඡනතා) පුරිසා (යන්නාවූ පුරුෂයෝ)
හෙ ගච්ඡං(ගච්ඡ, ගච්ඡා) පුරිස (එම්බා යන්නාවූ පුරුෂය)
හෙ ගච්ඡනෙතා(ගච්ඡනතා) පුරිසා (එම්බා යන පුරුෂයිනි)
ගච්ඡනෙතසු පුරිසෙසු (යන පුරුෂයන් කෙරෙහි)

50. **අනත**-ප්‍රත්‍යයය මෙන් ම **මාන**-ප්‍රත්‍යය ද ක්‍රියාංගයට එක්ව වත්තමානකාලික කිතකන්ත සෑදේ. ගච්ඡමාන, රුදමාන ආදි වශයෙනි. මේවා පුලලිඞගයේ වරනැගෙනුයේ අකාරානත පුලලිඞග ශබදයන් මෙනි.

පුරිසො ගච්ඡමානො (පුරුෂයා යන්නේ, පුරුෂයා යමින්)
දරකො රුදමානො (දරුවා අඬන්නේ, දරුවා අඬමින්)
ගච්ඡමානො පුරිසො (යන්නාවූ පුරුෂයා)
ගච්ඡමානසස පුරිසසස (යන පුරුෂයාට)

51. සමහරවිට **ආන**-ප්‍රත්‍යය ය එක්වීමෙන් ද වත්තමානකාලික කිතකන්ත සෑදේ. **කරාන, වදන** ආදි වශයෙනි.

කමමං කරානො
(වැඩකරන්නේ, වැඩ කරමින්, වැඩ කරන)

**භාවසත්තමී යෝගය**

52. **පුරුෂයා යන කල්හි** මේ අදහස පාලියෙන් පවසන විට **පුරිසෙ ගච්ඡනෙත, පුරිසෙ ගච්ඡමානෙ** යි සිටී. එය බහු-වචනයට හැරවූ විට **පුරිසෙසු ගච්ඡනෙතසු, පුරිසෙසු ගච්ඡමානෙසු**(පුරුෂයන් යන කල්හි). කත්‍රෘත් ක්‍රියාව පවසන කිතකනත පදයත්(අනත-ප්‍රත්‍යයානත හෝ මාන-ප්‍රත්‍යයානත පදයත්) යන දෙක ම සත්තමී විභත්තියෙන් මෙහි සිටිනු පෙනේ. මේ **භාවසත්තමී යෝගය** යි.

53. **දැන් හෝ මතු විය හැකි දැයක් ගැන තැකීමක් නොකොට(එය ගණනකට නොගෙන)** යන අදහස පැවැසීමට කත්‍රෘත් කිතකනත(අනත මානාදියත් එක්ව හැදුණ) පදයත් දෙක ම **ඡට්ඨී විභත්තියෙන්** තබනු.

දරකසස රුදනතසස, දරකසස රුදමානසස පිතා නිකඛමි.
(දරුවා ගේ හැඬීම ගැන තැකීමක් නො කොට පියා නික්මිණි. දරුවා හඬද්දී එය නො තකා පියා නික්මිණි.)

**අනාදරාර්ථයෙහි ඡට්ඨී යෝගය** යැ යි මෙයට බැවහර යි.

## ශබ්ද මාලාව

### වර්තමානකාලික කිතකනතය

| ක්‍රියා | කිතකනත |
|---|---|
| කීළති(ක්‍රීඩා කරයි) | කීළනත, කීළමාන |
| තිකිච්ඡති(පිළියම් කරයි) | තිකිච්ඡනත, තිකිච්ඡමාන |
| ඛාදති(කයි) | ඛාදනත, ඛාදමාන |
| හසති(සිනාසෙයි) | හසනත, හසමාන |
| තරති(තරණය කරයි) | තරනත, තරමාන |
| මාපයති, මාපෙති(මවයි, තනයි) | මාපෙනත, මාපයමාන |
| දෙසයති, දෙසෙති(දෙසයි) | දෙසෙනත, දෙසයමාන |
| සෙති, සයති(වැදහෙයි) | සෙනත, සෙමාන, සයනත, සයමාන |
| පලායති(පලායයි) | පලායනත, පලායමාන |
| ගායති(ගයයි, ගායනා කරයි) | ගායනත, ගායමාන |
| පබොධෙති(පුබුදුවයි) | පබොධෙනත, පබොධයමාන |
| උගගචඡති(නඟී) | උගගචඡනත, උගගචඡමාන |
| අසසාසෙති(සනසයි) | අසසාසෙනත, අසසාසයමාන |
| හංසයති, හංසෙති(පුප්පයි) | හංසෙනත, හංසයමාන |
| මරති, මීයති(මැරෙයි) | මරනත, මියමාන |
| පසසති(දකී) | පසසනත, පසසමාන |
| කමපති(සැළෙයි, කම්පිත වෙයි) | කමපනත, කමපමාන |
| චවති(චුත වෙයි) | චවනත, චවමාන |
| අපගචඡති(ඉවත යයි) | අපගචඡනත, අපගචඡමාන |

### නාම

| | |
|---|---|
| බොධිසතත(බෝසත්) | පරිබබාජකාරාම(පිරිවැජි අරම) |
| මොදක(රස කැවිලි) | මනුසසලොක(මිනිස් ලොව) |
| දීප(දවීපය) | පසස(පාශර්වය, පැත්ත) |
| අජඣාසය(අදහස) | නය(නය, ක්‍රමය) |
| පාසාද(ප්‍රාසාදය, පාය) | ලොම(ලොම්) |
| පරිවාර(පිරිවර) | සොක(ශෝකය) |
| දෙවලොක(දෙව්ලොව) | ගිජඣ (ගිජුලිහිණියා) |

### විශෙෂණ

සක(සවකීය) අනුරූප(සුදුසු)
මහනත(මහත්) මහෙසකඛ(මහා යශස්ක)
දයාලු(දයා බහුල) අපෙපසකඛ(අල්ප යශස්ක)

### විශෙෂ පද

නිපතති(වැටෙයි) අද්දකඛී(දුටුයේ ය)
රොදති(හඬයි, කෑගායි) අතතනො සනතිකං(තමා ළඟට)

### ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. ආරාමං ගනත්වා ගෙණ්ඩුකෙහි කීළනතානං කුමාරානං කලහො උපපජ්ජි.
2. ගුණවා වෙජෙජා දුගගතෙ රොගිනො තිකිච්ඡනෙතා ගාමෙසු විචරි.
3. බහවො මනුසසා පොතෙහි සමුද්දං තරනතා බුද්දකං දීපං පාපුනිංසු.
4. තච්ඡකෙ පාසාදං මාපෙනෙත භූපති සහ පරිවාරෙන උපසංකමි.
5. කොලිතො ච උපතිසෙසා ච ආගනත්වා භගවතො ධමමං දෙසෙනතසස පාදෙසු නිපතිත්වා වන්දිංසු.
6. උපතිසෙසා පරිබබාජකො මොකඛසස මගගං දෙසෙනතං ගවෙසමානො ජමබුදීපෙ තත්ථ තත්ථ විචරිත්වා රජගහෙ සකං පරිබබාජකාරාමං පච්චාගච්ඡි.
7. කුමාරො රථෙන ගච්ඡනෙතා මගගසස පසෙස සෙමානං ගිලානං පුරිසං අද්දකඛි.
8. අනුබනධනෙතහි සුනඛෙහි භායිත්වා පලායනෙතා පුරිසො රුකඛං අභිරුහි.
9. බාලකා තත්ථ ගායමානා ච වාදයමානා ච නච්චමානා ච කීළිංසු.
10. සිසෙසසු කලහං කරොනෙතසු ආචරියො තත්ථ ආගච්ඡි.
11. භාතිකසස රුදමානසස එව සො ගෙහා නිකඛමිත්වා පබබජි.

**(ආ) පාලියට නඟන්න.**

1. එන්නාවූ බල්ලා දැක බළලා ලොම් පුප්පමින් කෑගැයේ ය.
2. දුසිලුන් සෙවුනා ජනයෝ කල් යැමෙන් දුසිල්හු වන්නාහ.
3. මැරෙන බාල සොහොයුරා දැක වැඩිමාලු සෝයුරා මහත් ශෝකයෙන් කම්පිත වෙමින් හැඬුවේ ය.
4. අතැනැ සජීයකු නියවලින් ගෙන අහසට නඟින ගිජුලිහිණියා බලවු.
5. සමීප මාර්ගයෙහි කලහ කරන මිනිසුන් දැක අපි එ තැනින් පෙරළා ගෙට ම ආවමු.
6. භාග්‍යවත් බුදුරජහු දක්නට යන මිනිසුන් දැක අපිදු එහි ගියමු.
7. දයා බහුල ඇදුරු තෙම අඩන සිසුවා තමා ළඟට කැඳවා සනසන්නට තැත් කෙළේ ය.
8. හිරු අහසැ නැගෙන්නේ ලොව පුබුදුවයි.
9. භාග්‍යවත් බුදුවරු අසන්නවුන් ගේ අදහස් බලා ම සුදුසු නයින් දහම් දෙසන්නාහු වෙත්.
10. බෝසතු දෙව්ලොවින් චුත වන්නහු දැක බොහෝ මහායශස්ක දෙවියෝ ද දෙව්ලොවින් චුතවැ මිනිස් ලොවැ උපන්හ.
11. මහායශස්ක දෙවියන් එන කල්හි අල්පයශස්ක දෙවියෝ එතැනින් ඉවත් වූහ.
12. සෙනෙවියා බලාසිටිද්දී ම(එය නො තකා) භටයෝ රණබිමින් ඉවත් ව ගියහ.

* * *

## තුප්‍රත්‍යයාන්ත ශබ්ද

54. ක්‍රියාවක මුල **ධාතු** නම්. වදති යන ක්‍රියාවේ මුල වද් ධාතුව ය. පචති යන ක්‍රියාවේ මුල පච් ධාතුව ය.(මේවා ඉදිරි පාඩමෙක දී විස්තර කරනු ලැබේ.) ධාතුවෙන් අඟවන ක්‍රියාව කරන්නා යන අර්ථය අනුව ඒ ධාතුවට **තු-ප්‍රත්‍යය** එක්කරනු ලැබේ. එය මෙසේ එක් කිරීමේ දී සමහර තැන ධාතුවේ සවරූපය මඳක් වෙනස් වේ. කිසි තැනෙක ප්‍රත්‍යය වූ **තු**යන්න **ථු** වේ. කිසි තැනෙක **ධු** වේ. බොහෝ තැන **තු**යන්නට මුලින් ඉකාරයෙක් අමුතුවෙන් පැමිණේ.

| ක්‍රියාව | ධාතුව |
|---|---|
| ගච්ඡති(යයි) | ගම් |
| සුණාති(අසයි) | සු |
| ජිනාති(දිනයි) | ජි |
| දෙති(දෙයි) | ද |
| භවති, ජුහොති(ගිනි පුදයි) | හු |
| නෙති(පමුණුවයි, මගපෙන්වයි) | නී |
| හනති(නසයි) | හන් |
| සාසති(අනුශාසනා කරයි) | සාස් |
| ඡින්දති(සිඳී, කපයි) | ඡිද් |
| භින්දති(බිඳී) | භිද් |
| ඡාදෙති(වසාලයි) | ඡද්(ඡාදෙ) |
| සික්ඛති(උගනී) | සික්ඛ් |
| දෙසෙති(දෙසයි) | දිස්(දෙසෙ) |
| බුජ්ඣති(අවබෝධ කරයි) | බුධ්(බුජ්ඣ) |

**තුප්‍රත්‍යයාන්තයා**

ගන්තු(යන්නා) (ම්කාරයට වර්ගාන්තදේශය විය)

සොතු(අසන්නා) ධාතුවේ උකාරය ගුණ විය.(ඔකාරයෙක් විය)

ජෙතු(දිනන්නා) ධාතුවේ ඉකාරය ගුණ විය.(එකාරයෙක් විය)

දතු(දෙන තැනැත්තා)

හොතු(හෝම කරන්නා)(ධාතුස්වරය ගුණ විය)

නෙතු(නායකයා) (ධාතුස්වරය ගුණ විය)

හන්තු(නසන්නා)

සත්‍ථු(ශාස්තෘන් වහන්සේ)(සතු යන්නට ත්‍ථු විය)

ඡෙත්තු(සිඳින්නා, කපන්නා)(ධාතුස්වරයට ගුණ විය.
ධාත්වන්ත ද්කාරය පරරූප ගත්තේ ය)

භෙත්තු(බිඳින්නා, බින්ද තැනැත්තා)(ධාතුස්වරය ගුණ විය.
ධාත්වන්ත ද්කාරය පරරූප ගත්තේ ය)

ඣාදෙතු(වසාලන්නා)(ධාතුස්වරයට වෘද්ධි විය. අයන්න
ආයන්න විය)

සික්ඛිතු(ඉගෙන ගන්නා, හික්මෙන්නා)(ඉකාරාගමය විය)

දෙසෙතු(දෙසන්නා)

බුජ්ඣිතු(අවබෝධ කරන්නා)

## තුප්‍රත්‍යයානතයන් ගේ වරනැඟීම

### නෙතු(නායකයා)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **ප: වි:** | නෙතා<br>(නායකයා) | නෙතාරො<br>(නායකයෝ) |
| **ආ: වි:** | හෙ නෙත, නෙතා<br>(නායකය) | හෙ නෙතාරො<br>(නායකයිනි) |
| **දු: වි:** | නෙතාරං<br>(නායකයා) | නෙතාරෙ, නෙතාරො<br>(නායකයන්) |
| **ත: වි:** | නෙතාරා<br>(නායකයා කරණ කොට) | නෙතාරෙහි, නෙතූහි<br>(නායකයන් කරණ කොට) |
| **ච: වි:** | නෙතු, නෙතුනො, නෙතුස්ස<br>(නායකයාට) | නෙතරොනං, නෙතූනං නෙතානං<br>(නායකයනට) |
| **පං: වි:** | නෙතාරා<br>(නායකයා ගෙන්) | නෙතාරෙහි, නෙතූහි<br>(නායකයන් ගෙන්) |
| **ඡ: වි:** | නෙතු, නෙතුනො, නෙතුස්ස<br>(නායකයා ගේ) | නෙතාරානං, නෙතූනං නෙතානං<br>(නායකයන් ගේ) |
| **ස: වි:** | නෙතරි<br>(නායකයා කෙරෙහි) | නෙතාරෙසු නෙතූසු<br>(නායකයන් කෙරෙහි) |

**55.** පිතු(පියා) ශබ්දය නෙතු ශබ්දයට මදක් වෙනස් වැ වර නැගේ.

## පිතු(පියා)

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| **ප:** | **වි:** | පිතා | පිතරො |
| **ආ:** | **වි:** | හෙ පිත, පිතා | හෙ පිතරො |
| **දු:** | **වි:** | පිතරං | පිතරෙ, පිතරො |
| **ත:** | **වි:** | පිතරා | පිතරෙහි, පිතූහි |
| **ච:** | **වි:** | පිතු, පිතුනො, පිතුස්ස | පිතරානං, පිතානං, පිතූනං |
| **පං:** | **වි:** | පිතරා | පිතූහි |
| **ඡ:** | **වි:** | පිතු, පිතුනො, පිතුස්ස | පිතරානං, පිතානං, පිතූනං |
| **ස:** | **වි:** | පිතරි | පිතරෙසු පිතූසු |

භාතු(සහෝදරයා) ශබ්දය ද පිතු ශබ්දය මෙනි. පිතු, භාතු ශබ්ද දෙක හැර අනිත් සියලු පුංලිඞ්ගික තුප්‍රත්‍යයාන්තයෝ නෙතු ශබ්දය මෙන් වර නැඟෙත්.

**56.** තුප්‍රත්‍යයාන්තයෙන් දැක්වෙන ක්‍රියාවේ කර්‍මය දුතියා විභත්තියෙන් හෝ ඡට්ඨි විභත්තියෙන් සිටී. ධම්මං දෙසෙතා, ධම්මස්ස දෙසෙතා(දහම් දෙසන්නා).

## ශබ්ද මාලාව

### නාම

මොක්ඛ(මෝක්ෂය, නිවන)
හොම(හෝමය, ගිනි පිදීම)
ධම්මඤ්ඤු(දහම් දන්නා)
තරු(ගස)
සාවක(ශ්‍රාවකයා)
පාණී(ප්‍රාණියා)
නිරය, නරක(නිරය)
නත්තු(මුනුපුරා)
මන්ත(මන්ත්‍රය)

## ක්‍රියා

පහිණාති(යවයි) පීළෙති(පෙළයි)

ජාලෙති(දල්වයි) පටිපජ්ජති(පිළිපදියි)

ජපෙපති(දපයි, මතුරයි) සච්ඡිකරොති(සාක්ෂාත් කරයි)

අධිගච්ඡති(පැමිණෙයි, ලබයි, අවබෝධ කරයි)

පටිගණ්හාති, පටිග්ගහෙති(පිළිගනී)

## නිපාත

සම්මා(මනා කොට) ඉව, විය(මෙන්)

## විශෙෂණ

දුල්ලභ(දුර්ලභ)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. ධම්මං සොතාරො මොක්ඛං අධිගච්ඡිංසු.
2. භූපති අරීනං ජෙතාරං යොධං පසංසති.
3. යාචකා සබ්බද දතාරෙ වණ්ණෙන්ති.
4. සෙට්ඨිනො පුත්තා ගෙහස්ස මාපෙතාරං ආනෙතුං සෙවකං ගාමං පහිණි.
5. පුත්තා පිතරං උපසංකමිත්වා පිතුනො භාතරා සද්ධිං ඉසිනො අස්සමං ගන්තුං ඔකාසං යාචිංසු.
6. හොතා හොමං කාතුං ගෙහම්හා නික්ඛමි.
7. ගාමස්ස නෙතා මිගානං හන්තාරං දිස්වා කුජ්ඣිත්වා මුට්ඨිනා පහාරං දත්වා නික්කඩ්ඪි.
8. කුමාරා ධම්මක්ඛාදුනො ඔවාදං සුත්වා මහල්ලකෙ පිතරි සම්මා පටිපජ්ජිංසු.
9. සෙට්ඨි සකෙන භාතරා සද්ධිං විහාරං ගන්ත්වා සත්ථාරං දිස්වා වන්දිත්වා පූජෙත්වා ධම්මං ච සුත්වා ගෙහං පච්චාගමි.
10. තරුනො ජෙතතා ච ඝටස්ස භෙත්තා ච නෙතාරා භායිත්වා ගෙහම්හා පලායිංසු.

(ආ) පාලියට නඟන්න.

1. ශ්‍රාවකයෝ ශාස්තෘහු ගේ ධර්මය අසා පිළිපැද මොක්ෂය සාක්ෂාත් කළාහ.
2. සහෝදරයා ගේ පුත්‍රයෝ ධර්මය අසන්නෝ ද ඉගෙනගන්නෝ ද වූහ.
3. සංඝයා භෙද කරන්නෝ(බිඳින්නෝ) ස්වර්ගයට මඟ ද මොක්ෂයට මඟ ද වසාලන්නෝ වන්නාහ.
4. ධර්මය මනා කොට දෙසන්නන් කෙරෙහි අසන්නෝ පැහැදුණාහ.
5. සතුරන් දිනන්නෝ රජුහු ගේ අතින් බොහෝ පඬුරු ලබන්නාහ.
6. ප්‍රාණීන් නසන්නෝ නිරයට යන්නෝ වන්නාහ.
7. භික්ෂූන් අතුරෙහි ද දැන් ධර්මය අවබෝධ කරන්නෝ දුර්ලභ වෙත්.
8. සොරු ඒ ඒ තැන සැඟෙවී සිටින්නාහු මාර්ගයෙහි යන්නවුන් අල්ලාගෙන පෙළූහ.
9. ගමේ නායකයා සහෝදරයන් ද මුනුපුරන් ද කැටුව ශාස්තෘන් වහන්සේ කරා එළැඹුණේ ය.
10. හෝම කරන්නා ගිනිදල්වා වඳිමින් මන්ත්‍රයක් මතුලේ ය.

* * *

# පාඩම 28

## ස්ත්‍රීලිඞ්ගික ශබ්ද

### වනිතා(ස්ත්‍රී)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | වනිතා(ස්ත්‍රී) | වනිතා, වනිතායො(ස්ත්‍රීහු) |
| ආ: වි: | හෙ වනිතෙ(ස්ත්‍රිය) | හෙ වනිතා,වනිතායො(ස්ත්‍රීනි) |
| දු: වි: | වනිතං(ස්ත්‍රිය) | වනිතා, වනිතායො(ස්ත්‍රීන්) |

### ශබ්ද මාලාව

### ස්ත්‍රීලිංගික නාම

| | |
|---|---|
| වනිතා (ස්ත්‍රී) | ඡායා (සෙවණැල්ල) |
| විපස්සනා(විදර්ශනාව) | පරිසා (පිරිස) |
| වීණා (වීණාව) | පාඨසාලා(පාසල) |
| කඤ්ඤා (කන්‍යාව) | සෙනා (සේනාව) |
| විජ්ජා (විද්‍යාව, දැනීම) | ගාථා (ගාථාව) |
| තණ්හා (තෘෂ්ණාව) | සාඛා (අත්ත) |
| මෙත්තා (මෛත්‍රිය) | ගඞ්ගා (ගංගා නදිය) |
| මාලුවා (මාලුවා වැල) | |

### පුල්ලිංගික නාම

| | |
|---|---|
| විනය(හික්මීම) | භව(භවය, සසර) |
| සත්ත(සත්ත්වයා) | බ්‍රහ්මලොක(බඹලොව) |

### ක්‍රියා

| | |
|---|---|
| භාවෙති (වඩයි, භාවනා කරයි) | වාදෙති(වාදනය කරයි) |
| ඔගච්ඡති(බසී) | ආණාපෙති(අණ කරයි) |
| දදාති(දෙයි) | බන්ධති(බඳී) |
| සන්දති(ගලාබසී) චාලෙති | (සොලවයි) |

ඛෙපෙති(ගෙවයි) වෙඨෙති(වෙළයි)

උප්පජ්ජති(උත්පත්ති වශයෙන් පැමිණෙයි)

සජ්ඣායති(සජ්ඣායනා කරයි, පාඩම් කළ දෑ කියයි)

නික්කඩ්ඪති(පිටතට දමයි, පිටමං කරයි)

## විශේෂණ

පමතත(පමා වූ)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. වනිතායො ථෙරස්ස ඔවාදෙ ඨත්වා විපස්සනං භාවෙසුං.
2. කඤ්ඤා වීණං වාදෙසි.
3. විජ්ජා විනයං දදති.
4. තණ්හා ජනතාවො භවස්මිං බන්ධති.
5. බහවො ජනා මෙත්තං භාවෙත්වා බ්‍රහ්මලොකං උපපජ්ජිංසු.
6. ඉදානි සූරියො ඔගච්ඡති, තරුනො ඡායා ච වඩ්ඪති.
7. බහූ මනුස්සා ජම්බුදීපා පොතෙහි ලඞ්කං ආගච්ඡිංසු.
8. චොරස්ස පරිසා භූපතිනො සෙනං දිස්වා භායිත්වා පලාය.
9. බහූ භික්ඛූ විහාරෙ සන්නිපතිත්වා ගාථායො සජ්ඣායිංසු.
10. මයං ගඞ්ගා ඔතරිත්වා නහායමහ.

**(ආ) පාලියට නඟන්න.**

1. කන්‍යාවෝ ශාලාවට පිවිස වීණාවන් වැයූහ.
2. කන්‍යාවනි, අවුත් මෙහි හිඳ ගාථාවන් කියවු.
3. රජු ගේ සේනාව දැක සතුරා ගේ සේනාව පලාගියා ය.
4. පමා වූ පුරුෂයා ගේ තෘෂ්ණාව මාළුවා වැලක් මෙන් වැඩෙයි.
5. කන්‍යාවනි, ගසේ යට කොටස ශුද්ධ කොට මෙ තැන වැලි ඉසිවු.
6. ගංගා නදිය ද යමුනා නදිය ද හිමාලය පර්වතයෙන් ගලා බසිත්.
7. දසයෝ අවුත් ගසේ අතු කපන්නාහු නම් ඉතා යෙහෙක.
8. වඳුරා ගස නැඟ අත්තක් සෙලැවී ය.
9. යුවතිය උදේ ආහාර වළඳ රිය නැඟ පාසලට ගියා ය.
10. වැල සර්පයකු මෙන් ගස වෙළා ගෙන ම වැඩිණ.

* * *

# පාඩම 29

## ස්ත්‍රීලිඞ්ගික නාම

### වනිතා ශබ්දය

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | වනිතා(ස්ත්‍රී) | වනිතා, වනිතායො(ස්ත්‍රීහු) |
| ආ: වි: | භොති වනිතෙ (භවත් ස්ත්‍රිය) | භොතියො වනිතා, වනිතායො(භවත් ස්ත්‍රීනි) |
| දු: වි: | වනිතං(ස්ත්‍රිය) | වනිතා, වනිතායො(ස්ත්‍රීන්) |
| ත: වි: | වනිතාය (ස්ත්‍රිය කරණ කොට) | වනිතාහි (ස්ත්‍රීන් කරණ කොට) |
|ච: වි: | වනිතාය(ස්ත්‍රියට) | වනිතානං(ස්ත්‍රීනට) |
| පං: වි: | වනිතාය(ස්ත්‍රිය ගෙන්) | වනිතාහි(ස්ත්‍රීන් ගෙන්) |
| ඡ: වි: | වනිතාය(ස්ත්‍රිය ගේ) | වනිතානං(ස්ත්‍රීන් ගේ) |
| ස: වි: | වනිතාය, වනිතායං (ස්ත්‍රිය කෙරෙහි) | වනිතාසු (ස්ත්‍රීන් කෙරෙහි) |

## ශබ්ද මාලාව

කුමාරිකා(කුමරිය, දැරිය)

ජිව්හා(දිව)

නාසා(නාසිකාව)

කීළා, ඛිඩ්ඩා(ක්‍රීඩාව)

සිඞ්ඝාණිකා (සොටු)

විහෙසා(වෙහෙස)

සෙවිකා(සේවක ස්ත්‍රී)

පෙටිකා(පෙට්ටිය)

භරියා(භාර්‍යාව)

ගුහා(ගුහාව)

ගීවා(බෙල්ල)

දඨා(දළ)

මාලා(මල්දම)

සොණ්ඩා (සොඬය)

උපාසිකා(උවැසි)

සද්ධා(ශ්‍රද්ධාව)

ධම්මකථා(ධර්මකථාව, බණ)

නාවා(නැව)

දරිකා(දැරිය)

සක්ඛරා(ගල්කැට)

ජඞ්ඝා(කෙංඩය)

ගොධා(ගොයා)

රුජා(රුජාව, රිදුම, කැක්කුම)

නිසා(රාත්‍රිය)

පසංසා(ප්‍රශංසාව)

විසිඛා, රථිකා(වීදිය)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. කුමාරිකාය නාසාය සිඞ්ඝාණිකා පග්ඝරති.
2. භූපතිනො කුමාරා ච කුමාරියො ච ගඞ්ගායං නහායිත්වා උත්තරිත්වා සෙවිකාහි සද්ධිං පච්චාගච්ඡිංසු.
3. ගහපතිනො භරියාය කුච්ඡිස්මිං ගබ්භො පතිට්ඨාසි.
4. චණ්ඩො පුරිසො භරියං ගෙහා නික්කඩ්ඪි.
5. කුමාරිකායො ගීවාසු මාලායො ධාරෙසුං.
6. උපාසිකායො විහාරං ගන්ත්වා ථෙරස්ස ධම්මකථං සුණිංසු.
7. අජ්ජ පාඨසාලායං බහවො සිස්සා සන්නිපතිංසු.
8. දුබ්බිනීතස්ස දාරකස්ස පහාරෙන දාරිකාය ජඞ්ඝායං රුජා උප්පජ්ජි.
9. හෙ කුමාරිකායො, තුම්හෙ පඤ්ඤං භාවෙථ.
10. තුම්හෙ පඤ්ඤාය විනා මොක්ඛං අධිගන්තුං මා චින්තයිත්ථ.
11. මයං ජිව්හාය රසං සායාම.
12. කුමාරා ච කුමාරිකායො ච සාලං මාලාහි අලඞ්කරිංසු.

### (ආ) පාලියට නඟන්න.

1. බොහෝ දරුවෝ වත්තට ගොස් ක්‍රීඩායෙන් කාලය ගෙවූහ.
2. දහවල් මගීහු ගසේ සෙවණෙහි හිඳ වෙහෙස නිවාගත්හ.
3. දක්ෂ කිවියා ගාථාවලින් බුදුරජුගේ ද ධර්මයේ ද සංඝයාගේ ද ගුණ වැණීය.

4. කන්‍යාවෝ පෙට්ටිය ගුහාවේ තැබූහ.

5. නපුරු හූරා දළවලින් පැහැර වලසා පලවාහැරියේ ය.

6. ඇතා සොඬින් ගස්වල අතු අදිමින් කෑයේ ය.

7. ලංකාවට අධිපති වූ රජු ගේ සේනාවෝ නැව්වලින් මුහුද තරණය කොට දඹදිවට පැමිණියාහ.

8. ළමෝ ගල්කැටවලින් ගසා වඳුරන් පලවාපූහ.

9. සොරා රාත්‍රියේ වීදියෙහි හැසිරෙන්නේ ගෙයකට වැද එහි දැරියක ගේ අතෙන් වීණාව උදුරාගෙන පලාගියේ ය.

10. ධනවතා මැණික මිළයට ගෙණ ගෙට ගෙනවුත් පෙට්ටියේ තැබී ය.

* * *

## ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත, ස්ත්‍රීලිඞ්ගික ශබ්ද

මේ ඉකාරාන්තාදි ස්ත්‍රීලිඞ්ගිකයන් ගේ වරනැඟීම බොහෝ සෙයින් සමාන ය. සුළු වෙනසක් ඇත්තේ පඨමා, ආලපන, දුතියා යන තුනෙහි පමණි.

### ඉකාරාන්ත රත්ති

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | රත්ති(රාත්‍රිය) | රත්තී, රත්තියො(රාත්‍රීහු) |
| ආ: වි: | රත්ති(රාත්‍රිය) | රත්තී, රත්තියො(රාත්‍රීනි) |
| දු: වි: | රත්තිං(රාත්‍රිය) | රත්තී, රත්තියො(රාත්‍රීන්) |
| ත: වි: | රත්තියා(රාත්‍රියෙන්) | රත්තීහි(රාත්‍රී වලින්) |
| ච: වි: | රත්තියා(රාත්‍රියට) | රත්තීනං(රාත්‍රීනට) |
| පං: වි: | රත්තියා(රාත්‍රිය කෙරෙන්) | රත්තීහි(රාත්‍රීන් කෙරෙන්) |
| ඡ: වි: | රත්තියා(රාත්‍රිය ගේ) | රත්තීනං(රාත්‍රීන් ගේ) |
| ස: වි: | රත්තියා, රත්තියං(රාත්‍රියෙහි) | රත්තීසු(රාත්‍රීන්හි) |

### ඊකාරාන්ත නදී

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | නදී (නදිය) | නදී, නදියො(නදීහු) |
| ආ: වි: | නදි (නදිය) | නදී, නදියො(නදීනි) |
| දු: වි: | නදිං (නදිය) | නදී, නදියො(නදීන්) |
| ත: වි: | නදියා(නදියෙන්) | නදීහි(නදී වලින්) |
| ච: වි: | නදියා(නදියට) | නදීනං(නදීනට) |
| පං: වි: | නදියා(නදියෙන්) | නදීහි(නදීන් ගෙන්) |
| ඡ: වි: | නදියා(නදිය ගේ) | නදීනං(නදීන් ගේ) |
| ස: වි: | නදියා, නදියං(නදියෙහි) | නදීසු(නදීන්හි) |

## උකාරාන්ත රජ්ජු(රැහැන)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | රජ්ජු(රැහැන) | රජ්ජූ, රජ්ජුයො(රැහැන්) |
| ආ: වි: | රජ්ජු(රැහැන) | රජ්ජූ, රජ්ජුයො(රැහැන්) |
| දු: වි: | රජ්ජුං(රැහැන) | රජ්ජූ, රජ්ජුයො(රැහැන්) |
|ත: වි: | රජ්ජුයා(රැහැනින්) | රජ්ජූහි (රැහැන් වලින්) |
|ච: වි: | රජ්ජුයා(රැහැනට) | රජ්ජූනං(රැහැන්වලට) |
| පං: වි: | රජ්ජුයා(රැහැනෙන්) | රජ්ජූහි (රැහැන් කෙරෙන්) |
| ඡ: වි: | රජ්ජුයා(රැහැනේ) | රජ්ජූනං(රැහැන්වල) |
| ස: වි: | රජ්ජුයා, රජ්ජුයං (රැහැනෙහි) | රජ්ජූසු (රැහැන්හි) |

## ඌකාරාන්ත වධූ(ස්ත්‍රී)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | වධූ(ස්ත්‍රී) | වධූ, වධුයො(ස්ත්‍රීහු) |
| ආ: වි: | භොති වධු (පින්වත් ස්ත්‍රිය) | භොතියො වධූ, වධුයො (පින්වත් ස්ත්‍රීනි) |
| දු: වි: | වධුං(ස්ත්‍රිය) | වධූ, වධුයො(ස්ත්‍රීන්) |
| ත: වි: | වධුයා (ස්ත්‍රිය කාරණ කොට) | වධූහි (ස්ත්‍රීන් කාරණ කොට) |
| ච: වි: | වධුයා(ස්ත්‍රියට) | වධූනං(ස්ත්‍රීනට) |
| පං: වි: | වධුයා(ස්ත්‍රිය ගෙන්) | වධූහි(ස්ත්‍රීන් ගෙන්) |
| ඡ: වි: | වධුයා(ස්ත්‍රිය ගේ) | වධූනං(ස්ත්‍රීන් ගේ) |
| ස: වි: | වධුයං, වධුයා (ස්ත්‍රිය කෙරෙහි) | වධූසු (ස්ත්‍රීන් කෙරෙහි) |

## මාතු ශබ්දය

මෙය තුප්‍රත්‍යයාන්ත ස්ත්‍රීලිඞ්ගික ශබ්දයෙකි. මෙය මෙහි සවිසි-වන පාඩමෙහි දැක්වුණ පිතු ශබ්දයට බෙහෙවින් සමාන ය. එයට වෙනස් තැන් පහත දැක්වෙන වරනැඟිල්ල බලා සලකා ගත යුතු ය.

### මාතු(මව)

| | ඒකවචනය | බහුවචනය |
|---|---|---|
| ප: වි: | මාතා(මව) | මාතරො(මවුහු) |
| ආ: වි: | භොති මාත, මාතා (පින්වත් මව) | භොතියො මාතරො (පින්වත් මවුනි) |
| දු: වි: | මාතරං(මව) | මාතරො(මවුන්) |
| ත: වි: | මාතරා, මාතුයා (මව කරණ කොට) | මාතරෙහි, මාතූහි (මවුන් කරණ කොට) |
| ච: වි: | මාතු, මාතුයා (මවට) | මාතරානං, මාතූනං, මාතානං(මවුනට) |
| පං: වි: | මාතරා, මාතුයා (මව ගෙන්) | මාතරෙහි, මාතූහි (මවුන් ගෙන්) |
| ඡ: වි: | මාතු, මාතුයා (මව ගේ) | මාතරානං, මාතූනං (මවුන්ගේ) |
| ස: වි: | මාතරි (මව කෙරෙහි) | මාතරෙසු, මාතූසු (මවුන් කෙරෙහි) |

**විශෙෂණ ශබ්ද**

**57.** මෙයට කලින් පාඩමෙහි පුංලිඞ්ගික ශබ්දයන් සමඟ විශෙෂණ ශබ්දයන් යෙදෙන සැටි ඉගැන්විණ. දැන් ස්ත්‍රීලිඞ්ගික ශබ්ද හා විශෙෂණයන් යෙදෙන සැටි දැක්වෙයි. තුල්‍යාධිකරණ විශෙෂණය එය හා සම්බන්ධ නාමය හා ලිඞ්ග සඞ්ඛ්‍යා විභත්ති යන තුනින් සමාන විය යුතුයැ යි යට කියන ලදී. එබැවින් නාමය ස්ත්‍රීලිඞ්ගික එකක් වී නම් එහි විශෙෂණ ද ස්ත්‍රීලිඞ්ගික ම විය යුතු. විශෙෂණය අකාරාන්තයෙක් වී නම් එය ස්ත්‍රීලිඞ්ගයේ දී අකාරාන්ත වේ. උඩ දැක්වුණු වනිතා ශබ්දය මෙන් වරනැඟේ.

**නිදර්ශන**

බාලා වනිතා (මෝඩ ස්ත්‍රී)
බාලායො වනිතායො (මෝඩ ස්ත්‍රීහු)
බාලානං වනිතානං (මෝඩ ස්ත්‍රීනට)
දීඝා වනරාජි (දික් වනරොද)
දීඝායං වනරාජියං (දික් වනරොදෙහි)
පණ්ඩිතා වධූ (නුවණැති(ස්ත්‍රී)
පණ්ඩිතාසු වධූසු (නුවණැති(ස්ත්‍රීන් කෙරෙහි)

58. ඊකාරාන්ත විශෙෂණ ස්ත්‍රීලිඞ්ගික වීමේ දී ඒවායේ ඊකාරය වෙනුවට **ඉනී** යන්න සිටී. **ධනී** යන්නෙහි ස්ත්‍රීලිඞ්ගික රූපය **ධනිනී** වේ. ධනිනී වනිතා(ධනවත් ස්ත්‍රී), ධනිනියො වනිතායො (ධනවත් ස්ත්‍රීහු) ආදි වශයෙනි.

වන්තු - මන්තු ප්‍රත්‍යයයන් එක්වැ හැදුණු විශෙෂණයන් ගේ අග වන්තු මන්තු භාග **වන්තී, වතී, මන්තී, මතී** යි වේ. ගුණවන්තු යන්න ගුණවන්තී ගුණවතී යි ද සතිමන්තු යන්න සතිමන්තී සතිමතී කියා ද වෙයි.

ගුණවන්තී(ගුණවතී) වනිතා(ගුණවත් ස්ත්‍රී),
ගුණවන්තියො(ගුණවතියො) ඉත්ථියො(ගුණවත් ස්ත්‍රීහු)

යන ආදි වශයෙනි. මේ ඊකාරාන්තයෝ නදී ශබ්දය මෙන් වර නැඟෙත්.

59. අන්තප්‍රත්‍යයාන්ත වර්තමානකාලික කිතකාන්තයෝ ද ස්ත්‍රී-ලිඞ්ගික වීමේ දී ඊකාරාන්ත වෙති. ඒවායේ අග **න්ත** භාගය **න්තී** හෝ **තී** වේ. **ගච්ඡන්ත** යන්න **ගච්ඡන්තී** හෝ **ගච්ඡතී** යි වේ.

ගච්ඡන්තී වනිතා, ගච්ඡතී වනිතා (යන්නාවූ ස්ත්‍රී)
ගච්ඡන්තියො වනිතායො, ගච්ඡතියො වනිතායො(යන ස්ත්‍රීහු)

වනිතා ගච්ඡන්තී(ගච්ඡතී)(ස්ත්‍රී යන්නී)
වනිතායො ගච්ඡන්තියො(ගච්ඡතියො)(ස්ත්‍රීහු යන්නෝ)

මානප්‍රත්‍යයාන්ත කිතකාන්තය ස්ත්‍රීලිඞ්ගයෙහි දී ආකාරාන්ත වේ. වනිතා ශබ්දය මෙන් වරනැඟේ.

ගච්ඡමානා වනිතා(යන ස්ත්‍රී)
ගච්ඡමානායො වනිතායො(යන ස්ත්‍රීහු)
ඉත්ථී ගච්ඡමානා(ස්ත්‍රී යන්නී, යමින්)

60. **භාවසප්තමීයෝගයෙහි;**

වනිතායං ගච්ඡන්තියං(ස්ත්‍රීය යන කල්හි)
වනිතාසු ගච්ඡන්තීසු(ස්ත්‍රීන් යන කල්හි)

**අනාදරෙ ඡට්ඨී යොගය;**

දරිකාය රුදන්තියා
(දැරිය හඬද්දී එය නො තකා, දැරිය ගේ ඇඬුම නො තකා)

61. හත්ථි ආදි බොහෝ පුංලිඞ්ගික නාමයනට **ඉනී** යන්න එක්ව ඒවායේ ස්ත්‍රීලිඞ්ගික රූප සෑදේ.

හත්ථි(ඇතා) හත්ථිනී(ඇතින්න)

ගහපති ආදි සමහර ශබ්දයකට **ආනී** ප්‍රත්‍යය ද, භික්ඛු ආදි කිසි උකාරාන්ත පුංලිංගික ශබ්දයකට **නී** ප්‍රත්‍යය ද එක්ව ස්ත්‍රීලිඞ්ගික රූප සෑදේ.

ගහපති(ගෘහපතියා) ගහපතානී(ගෘහපති ස්ත්‍රී)
භික්ඛු(මහණ) භික්ඛුණී(මෙහෙණ)

පඨම, දුතිය, තතිය ආදි විශෙෂණයනට **ආකාරය** එක් වැ ස්ත්‍රීලිඞ්ගික රූප සෑදේ. **පඨමා, දුතියා, තතියා** ආදි වශයෙනි.

එහෙත් චතුත්ථ, පංචම, ඡට්ඨ ආදියට **ඊකාරය** එක්ව යි ස්ත්‍රීලිඞ්ගික රූප සෑදෙන්නේ. **චතුත්ථී, පඤ්චමී, ඡට්ඨී, සත්තමී** ආදි වශයෙනි.

## ශබ්ද මාලාව

### නාම හා විශේෂණ

### ස්ත්‍රීලිඞගික

සෙවිකා (මෙහෙකරු ස්ත්‍රී)
ධෙනු(එළදෙන)
නෙනතී(ගෙනයන)
වෙසාලී(විසාලා මහනුවර)
ධමමධරා(ධර්මධර වූ)
ථෙරී(සථවිරී)
පුණණමී(පිරුණු හඳ ඇති)
මානවී, මානවිකා(මෙනෙවිය)
වඩඪී(අභිවෘදධිය)
ධාතු(ධාතුව)
දෙවී(දේවිය, බිසොව)
කෙතුමතී(කේතුමතී නුවර)
පජාපතීගොතමී(ප්‍රජාපතී ගෞතමී දේවී)
කූටාගාරසාලා(කුළාරහල් වෙහෙර)

අය්‍යකා(මුත්තණියෝ)
සාකියානී(ශාක්‍ය ස්ත්‍රී)
භුසසමානා(බුරන)
සුනඛී(බැල්ල)
පතති(පාබල සෙනඟ)
යුදධභූමි(යුද බිම)
තාරා(තාරකාව)
අඞගුලි(ඇඟිල්ල)
භෙරී(බෙරය)
වුටඨි(වැස්ස)
චොරී(සෙර)
රාජධානි(රාජධානිය)

### පුංලිඞගික

අතථ(ප්‍රයෝජනය)
අමචච(ඇමැතියා)

### ක්‍රියා

නෙති(ගෙනයයි, පමුණුවයි)
නෙනත(ගෙනයන, පමුණුවන)
භුසසති (බුරයි)
දසෙසති(පෙන්වයි)
තජෙජති(තරවටු කරයි)
අභිගචඡති(ඉදිරියට යයි)
භාසති(බබළයි)
ජානිතවා, ඤතවා(දැන)

පගගණහාති(ඔසොවයි)
පගගයහ(ඔසොවාගෙන)
පඤඤපෙති(පණවයි)
උතතරති(ගොඩ එයි)
වාදෙති, වාදයති(වයයි)
වපති(වපුරයි)
ජානාති(දනී)
වඤෙචති(රවටයි)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. මාතා අතිපිනමත්ථාය ඔදනං පචිතුං දුහිතරං ආණාපෙසි.

2. ගුණවතී කඤ්ඤ දුග්ගතාය ඉත්ථියා ආහාරං අදාසි.

3. වධූ ධෙනුං නහාපෙතුං නදිං නෙනතී භුස්සමානං ආගච්ඡන්තිං සුනඛිං දිස්වා දණ්ඩං දසෙසත්වා තජ්ජෙසි.

4. ධම්මධරාය ථෙරියා පිණ්ඩාය චරන්තියා බහූ වධුයො අභිගනත්වා භික්ඛං උපනාමෙසුං.

5. තද පුණ්ණමියං රත්තියං තාරාසු ච ආකාසෙ භාසමානාසු සිද්ධත්ථො බොධිසත්තො පාසාදම්හා ඔරුහිත්වා කනථකං අස්සමභිරුහිත්වා ඡන්නෙන අමච්චෙන සද්ධිං නික්ඛමී.

6. දුග්ගතා ඉත්ථී ආහාරං යාචිතුං සකං ධීතරං ධනවතියා ඉත්ථියා ගෙහං පෙසෙසි.

7. සා බාහා පග්ගය්හ කන්දන්තී තත්ථ තත්ථ ධාවන්තී ජෙතවනාරාමං පාපුනී.

8. ගහපති ගහපතානියා ච ධීතරා ච සද්ධිං ධම්මං සොතුං සායං විහාරං උපසංකමී.

9. භගවා භික්ඛූනං භික්ඛුණීනං ච වඩ්ඪියා එව බහුවිධායො සික්ඛායො පඤ්ඤපෙසි.

10. භූපතිනො දෙවී ධීතුයා ච පුත්තෙහි ච සද්ධිං භික්ඛුණීනං උපස්සයං ගනත්වා තත්ථ තත්ථ විචරන්තී භගවතො ධාතුයො දිස්වා වන්දිත්වා පූජෙත්වා ධම්මං ච සුත්වා රත්තියං පච්චාගච්ඡි.

(ආ) පාලියට නඟන්න.

1. බොහෝ කන්‍යාවෝ නදියෙහි නා ගොඩ අවුත් සිනාසෙමින් ද ගයමින් ද සිය ගෙවලට පෙරළා ආහ.

2. ගමෙහි පිඬු පිණිස හැසිරෙන දුවිල වූ ගිලන් මෙහෙණ ගේ අතින් පාත්‍රය වැටුණේ ය.

3. සෙර මුත්තණියන් රවටා එළදෙන ලනුවෙන් බැඳගෙන ගෙයින් නික්මියා ය.

4. බොහෝ ශාක්‍ය ස්ත්‍රීහු පජාපතී ගොතමිය හා නික්ම විසාලා මහ නුවරට පැමිණ කූළාරහල් වෙහෙර කරා එළැඹියාහ.

5. සෙනෙවියා පාබල සෙනඟ සමඟ නික්මැ රණබිමට ඇතුල් විය.

6. මෙනෙවියෝ ඇඟිලිවලින් බෙර වයමින් අගමෙහෙසිය ගේ ගුණ වණමින් ගී ගයන්නෝ වීදියෙන් වීදියට ගියාහ.

7. අද වැසි වස්නේ නම් අනිද්ද කුඹුර සාන්නමු.

8. මතු මෙතේ බෝසතුන් දෙව් ලොවින් චුත වැ දඹදිව කෙතුමතී රාජධානියෙහි උපදනා කල්හි අපිදු දෙව් ලොවින් සැව එහි මැ උපදිමෝ වා.

9. සම්මාසම්බුදුවරු අසන්නවුන් ගේ අදහස් බලා ම දහම් දෙසන්නෝ වෙත්.

10. රාත්‍රියෙහි සොරු ගමේ ප්‍රධාන ගෘහපතියා ගේ ගෙට වදින්නට මඟක් සොයමින් ඒ ඒ තැන ඇවිදුනාහු එන්නාවූ රාජපුරුෂයන් දැක පලාගියාහ.

* * *

# පාඩම 31

## නපුංසක ලිඞගික ශබ්ද

### අකාරාන්ත ඵල(ගෙඩිය, විපාකය)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඃ විඃ | ඵලං(ගෙඩිය) | ඵලා, ඵලානි(ගෙඩි) |
| ආඃ විඃ | ඵලං(ගෙඩිය) | ඵලා, ඵලානි(ගෙඩි) |
| දුඃ විඃ | ඵලං(ගෙඩිය) | ඵලා, ඵලානි(ගෙඩි) |

සෙසු සියලු විභත්තීන්හි පුංලිඞගිකයන් ගේ මෙනි. 17 වැනි පාඩමේ පුරිස ශබ්දය බලන්න.

### ඉකාරාන්ත අට්ඨි(ඇටය)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඃ විඃ | අට්ඨි(ඇටය) | අට්ඨී, අට්ඨීනි(ඇට) |
| ආඃ විඃ | අට්ඨි(ඇටය) | අට්ඨී, අට්ඨීනි(ඇට) |
| දුඃ විඃ | අට්ඨි(ඇටය) | අට්ඨී, අට්ඨීනි(ඇට) |

සෙසු සියලු විභත්තීන්හි ඉකාරාන්ත පුංලිඞගික ශබ්දයන් ගේ මෙනි. 20 වැනි පාඩමේ **කපි ශබ්දය** බලන්න.

### ඊකාරාන්ත ධනී(ධනවත්)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඃ විඃ | ධනී | ධනී, ධනීනි |
| ආඃ විඃ | ධනි | ධනී, ධනීනි |
| දුඃ විඃ | ධනිං | ධනී, ධනීනි |

සෙසු විභත්හි පුංලිඞගික ඊකාරාන්තයන් ගේ මෙනි. 23 වැනි පාඩමේ **හත්ථී ශබ්දය** බලන්න.

## උකාරාන්ත චක්ඛු(ඇස)

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | චක්ඛු | චක්ඛූ, චක්ඛූනි |
| ආ: | වි: | චක්ඛු | චක්ඛූ, චක්ඛූනි |
| දු: | වි: | චක්ඛුං | චක්ඛූ, චක්ඛූනි |

සෙසු විභත්ති පුංලිඞ්ගික උකාරාන්තයන් ගේ මෙනි. 22 වැනි පාඩමේ **ගරු ශබ්දය** බලන්න.

## ඌකාරාන්ත ගොත්‍රභූ(ගෝත්‍රභූ සිත)

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | ගොත්‍රභූ | ගොත්‍රභූ, ගොත්‍රභූනි |
| ආ: | වි: | ගොත්‍රභූ | ගොත්‍රභූ, ගොත්‍රභූනි |
| දු: | වි: | ගොත්‍රභූං | ගොත්‍රභූ, ගොත්‍රභූනි |

සෙසු විභත්ති පුඩලිඞ්ගික ඌකාරාන්තයන් ගේ මෙනි. 23 වැනි පාඩමේ **විඤ්ඤූ ශබ්දය** බලන්න.

## වන්තු මන්තු ප්‍රත්‍යයාන්තයෝ

## ධනවන්තු(ධනවත්)

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | ධනවං | ධනවන්තා, ධනවන්තානි |
| ආ: | වි: | ධනවං, ධනව, ධනවා | ධනවන්තා, ධනවන්තානි |
| දු: | වි: | ධනවන්තං | ධනවන්තෙ, ධනවන්තානි |

සෙසු විභත්ති පුංලිඞ්ගික වන්තු මන්තු ප්‍රත්‍යයාන්තයන් ගේ මෙනි. 25 වන පාඩම බලන්න.

අන්ත ප්‍රත්‍යයාන්ත(වර්තමානකාලික කිතකාන්ත) ශබ්ද ද නපුංසක ලිඞ්ගික ශබ්දයන් ගේ සම්බන්ධය ඇති ව ඒවාට විශෙෂණ ව හෝ අර්ථ ක්‍රියා හෝ මිශ්‍ර ක්‍රියා වශයෙන් සිටින කල නපුංසක ලිඞ්ගික ශබ්ද ම වේ.

## නපුංසක ලිඞ්ගික අනත ප්‍රත්‍යයාන්තයන් ගේ වරනැඟීම

### ගච්ඡන්ත(යන)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | ගච්ඡං | ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| ආ: වි: | ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| දු: වි: | ගච්ඡන්තං | ගච්ඡන්තෙ, ගච්ඡන්තානි |

සෙසු හැම විභත්හි ම පුංලිඞ්ගික ගච්ඡන්ත ශබ්දයේ මෙනි. 26 වන පාඩම බලන්න.

### ශබ්ද මාලාව

### පුංලිඞ්ගික

කොප(කෝපය, තරහව)
සුප්පිය(එනමැන්ත්‍රා)
අවණ්ණ(අගුණ)
අන්තෙවාසී(ශිෂ්‍යයා)
මානව(තරුණයා)
වායාම(වෑයම)
මච්ඡ(මත්සයයා)
ඛග්ගවිසාණ(කඟවෙහෙණා)
භානුමන්තු(හිරු)
මාරුත(සුළඟ)
තරංග(රළ)

### සත්‍රීලිඞ්ගික

පජා(ප්‍රජාව, යටත් වැසියෝ)
පඨවි(පොළොව)
පුත්තවතී(පුතුන් ඇත්තී)
පොක්ඛරණී(පොකුණ)
භූමි(බිම)
ඛන්ති(ඉවසීම)

### නපුංසකලිඞ්ගික

රට්ඨ(රට)
සුඛ(සුව, සැප)
බාල්‍ය(බාලවයස)
වත්ථ(වස්ත්‍රය)
ඝර(ගෙය)
ද්වාර(දෙර)
පදුම(නෙලුම්)
ජල(දිය, වතුර)
දාන(දීම)
මුඛ(මුව)
අභිමුඛ (ඉදිරිය)
මධු(මීපැණි)
ඵාණිත (පැණිසකුරු)
තෙල(තෙල්)
පුප්ඵ(මල්)
තීර(ඉවුර)
අඞ්ගණ(මිදුල, තැන්න)

### විශෙෂණ

තාදිස(එබඳු)
එකාකී(හුදකලා, තනි)

### සන්ධි

අග්ගි + ඉව = අග්ගීව

### ක්‍රියා

පාලෙති(රකී, පාලනය කරයි)
සික්ඛති(උගනී)
පජ්ජලති(දිලිසෙයි)
ධරති(දරයි, ජීවත් වෙයි)
පරිබ්භමති(වටා යයි)
ආරාධෙති(සිත් ගනී)
භාසති(කියයි)
සච්ඡිකරොති(පසක් කෙරෙයි)
පාතෙති, පාතයති(හෙලයි, වට්ටයි)
ධරමාන(දරන, ජීවත් වන)
උදෙති(උදා වෙයි)
උබ්භවති(නැඟෙයි)
නන්දති(සතුටු වෙයි)
චින්තෙති(සිතයි)
විකසිත(පිපෙයි)
පතති(වැටෙයි)

### ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. භූපාලෙ රට්ඨං ධම්මෙන පාලෙන්තෙ පජා සුඛං වසෙය්‍යුං.
2. පඨවියං සූරියං පරිබ්භමන්තියං චන්දෙ පඨවිං පරිබ්භමති.
3. බුද්ධිමතී කඤ්ඤා සම්මා සික්ඛන්තී බාලෙ එව ආචරියෙ ආරාධෙති.
4. යාචකො වත්ථං යාචමානො ධනවතියා ගහපතානියා ඝරස්ස ද්වාරෙ අට්ඨාසි.
5. බලවන්තානං අරීනං පහාරෙහි භූපාලස්ස යොධෙසු පතන්තෙසු සෙනාපති මහතා කොපෙන අග්ගීව පජ්ජලි.

6. සුපපියෙ පරිබබාජකො භගවතො බුදධසස අවණණං භාසමානෙ අනෙතවාසී බ්‍රහමදතෙතා මානවො භගවතො බුදධසස වණණමෙව අභාසි.

7. මාතරි රුදමානාය ධීතා ච පුතෙතා ච ඝරමහා නිකඛමිංසු.

8. භගවති බුදෙධ ධරමානෙ එව නිබබානං සචඡිකාතුං තෙ මහනතං වායාමං අකංසු.

9. භානුමති උදෙනෙත පොකඛරණීසු පදුමානි විකසනති.

10. සමුදෙද චණෙඩන මාරුතෙන මහනෙතසු තරඞෙගසු උබභවනෙතසු බුදද නාවායො උදකෙ නිමුජජිංසු.

11. පිතුනො පසසනතසස එව රාජපුරිසා පුතතං රජජූහි බනධිතවා භූපතිනො අභිමුඛං නෙසුං.

12. ගුණවනතා පුතතා සද මාතරං ච පිතරං ච වෙයයාවචෙචන ආරාධෙනති.

13. සීලවතියො උපාසිකායො සායං විහාරං ගචඡනතියො මධුං ච ඵාණිතං ච තෙලං ච පුපඵානි ච ගහෙතවා ගචඡිංසු.

14. ආචරියා ගුණවනෙතසු සිකඛමානෙසු සිසෙසසු එව පසීදනති.

15. යනතූන අජජ මයං විහාරෙ සනනිපතිසසාම ධමමං ච සුණිසසාම.

## (ආ) පාලියට නඟන්න.

1. ගෙඩි ඇති ගස වැටෙන කල බොහෝ පක්ෂීහු එයින් ඉගුළුණාහ.

2. ගමේ නපුරු මිනිසුන් අවුත් වත්තේ ගස්වලැ ගෙඩි කඩාදමන කල්හි කෙළෙඹියා සේවකයන් කැටුව එහි පැමිණියේ ය.

3. ඇස් ඇති මිනිස්සු පොකුණේ ඉවුරේ සිට දියේ හැසිරෙන මසුන් ද කැසුබුවන් ද දුටුවාහ.

4. මිදුලේ සෙල්ලම් කරන ළමයා ගේ අතින් පන්දුව බිම වැටිණ.

5. අපි සිල්වතුන්නට දන් දී මහත් සැප ලබන්නමු.

6. පාසැලෙහි සිසුන් කලහ කරද්දී ඇදුරෝ එහි ආහ.

7. තෙපි බුද්ධිමත් නො වන්නහු නම් ධනවත් නො වන්නහුය.

8. පුතුන් ඇත්තී පුතුන් කාරණ කොට ගෙන සතුටු වෙයි.

9. සිල්වත් ගුණවත් මිතුරකු ලබන්නහු නම් ඔහු හා එක් වැ හැසිරෙවු. එවැන්නකු නො ලබන්නහු නම් කඟවෙහෙණකු මෙන් තනි වැ වසවු.

10. අපි අද සවස බණ අසන්නට වෙහෙරට යන්නමෝ නම් ඉතා යෙහෙක.

* * *

පාඩම 32

## මනොගණික ශබ්ද

### මන(සිත)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | මනො, මනං(සිත) | මනා, මනානි(සිත්) |
|ආ: වි: | මන(සිත) | මනා, මනානි(සිත්නි) |
| දු: වි: | මනො, මනං(සිත) | මනා, මනානි(සිත්) |
| ත: වි: | මනෙන, මනසා(සිතින්) | මනෙහි(සිත්වලින්) |
| ච: වි: | මනස්ස, මනසො(සිතට) | මනානං(සිත්නට, සිත්වලට) |
| පං: වි: | මනා, මනම්හා, මනස්මා මනසා(සිතෙන්) | මනෙහි(සිත් කෙරෙන්) |
| ඡ: වි: | මනස්ස, මනසො(සිතේ) | මනානං(සිත්වල, සිත්වලට අයත්) |
| ස: වි: | මනෙ, මනම්හි, මනස්මිං මනසි(සිතෙහි) | මනෙසු(සිත්හි,සිත්වලැ) |

62. මේ මන ශබ්දය පුංලිඞ්ග නපුංසක ලිඞ්ග දෙකට ම අයත් ය. මෙය මෙන් වරනැගෙන ශබ්ද ගණනාවෙක් ඇත. ඒ සියල්ල **මනොගණ** නමින් හැඳින්වේ. ඒ මනො ගණයට අයත් ශබ්ද කිහිපයෙක් පහත දැක්වෙත්.

| | |
|---|---|
| සිර (හිස) | ඔජ (ඕජස) |
| උර (ළය) | සර (විල) |
| තෙජ (තෙද) | අය (යකඩ) |
| තප (තපස) | වය (වයස) |
| තම (අඳුර) | පය (කිරි) |
| රජ (දූවිලි) | යස (කීර්තිය, පිරිවර) |
| චෙත (සිත) | වාස (වසතුය) |

## ශබද මාලාව

### පුංලිඞගික ශබද

| | |
|---|---|
| උළූක (මහමුහුණා) | වණණ (පැහැය, ගුණය) |
| වසල (සැඩොලා) | පපාත (පල්ලම) |
| ගීතසදද(ගීහඬ) | භිකඛුනූපසසය(මෙහෙණවර) |

### සත්‍රීලිඞගික ශබද

බුදධපටිමා(බුදුපිළිමය)
ඛනතී(ඉවැසීම)
අඤජලී(ඇඳිල්ල, දෙහොත)

### නපුංසකලිඞගික ශබද

| | |
|---|---|
| මරණ (මරණය) | මහතත (මහත් බව) |
| සමීප (ළඟ) | නගර (නුවර) |
| පුඤඤ (පින) | අකඛි (ඇස) |
| දුචචරිත(දුසිරිත) | අසසු (කඳුළු) |
| ඝර (ගෙය) | ආයු (ආයුෂ) |
| ඛෙතත (කෙත, කුඹුර) | මුඛ (මුහුණ, මුව) |
| අගාර (ගිහි ගෙය) | දරු (දර) |
| අනගාරිය(පැවිදි බව) | සතථ(ශසත්‍රය, අවිය, පිහිය) |

### ක්‍රියා

| | |
|---|---|
| පසාදෙති (පහදවයි) | අභිභවති (යටපත් කෙරෙයි) |
| නිබබතතති(උපදී) | අපකකමති(ඉවත් වෙයි) |
| නමසසති (වඳී) | අපකකමම (ඉවත් ව) |
| අජෙජති (උපයයි) | ආලිඞගති (වැලඳගනී) |
| නියයාදෙති (පාවාදෙයි) | චුමබති (සිඹී) |
| මොචෙති(මුදයි, වගුරුවයි) | කසති (සී සායි) |
| පජහති (අත්හරී) | උදධරති (අවුලයි) |
| පහාය (හැර දමා) | පබබජති (පැවිදි වෙයි) |

### නිපාත

නචිරසසං(නොබෝ කලෙකින්)
ඉතො චිතො(එහෙ මෙහෙ)

## විශෙෂණ

පසනන(පහන්, පැහැදුණු) තිබබ(දැඩි)
පරම(උතුම් ම) සදධ(සැදැහැවත්)
සමීප(ළං)

## පද කැටි

මරණා පරං(මරණින් මතු) කාලං කත්වා මැරී)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. බ්‍රාමහණසස පුතෙතා භගවති මනං පසාදෙත්වා මරණා පරං දෙවලොකෙ නිබබතති.
2. සො පසනෙනන මනසා පුඤ්ඤානි කමමානි කත්වා කාලං කත්වා සගගං ලොකං උපපජ්ජි.
3. තුමෙහ කායෙන වා වාචාය වා මනසා වා දුචචරිතානි මා චරිත්ථ.
4. මානවො සහායෙන විනා සයං එව ඝරෙ ච බෙතෙත ච කමමානි අකාසි.
5. සීලවා උපාසකො ච සීලවතී උපාසිකා ච විහාරං ගනත්වා බුදධපටිමං දිසවා සිරසා නමසසිංසු.
6. ගහපතිනො පුතෙතා භගවතො ඔවාදෙ ඨත්වා යොබබනෙ එව මහනතං ධනං අජෙජත්වා භාතුනො නියාාදෙත්වා මජඣිමෙ වයසි අගාරසමා අනගාරියං පබබජි.
7. බාලො එව මහතා වායාමෙන ධමමං ච සත්ථං ච උගගණහනතී දුගගතා දරිකා න චිරසසමෙව යසසා ච ධනෙන ච මහනතං පාපුනි.
8. හියෙයා රතතියං තිබෙබ තමසි උළුකො බුදදකෙ පාණකෙ ගණහනෙතා ඉතොචිතො උඩෙඩසි.
9. පරසුවෙ ධනවතියා ගහපතානියා පුතතා ච දුහිතරො ච ඡණං දටඨුං මහතා සොභනෙන රථෙන ගචඡිසසනති.
10. බහුනනං රථානං එකෙකසු පථවියං ඝටටනෙතසු පථවියා රජො උටඨහි.

**(ආ) පාලියට නඟන්න.**

1. සිල්වත් මෙහෙණි බොහෝ මෙහෙණියන් සමඟ මෙහෙණවරින් නික්ම නුවර වීථීන්හි පිඬු පිණිස හැසුරුණා ය.
2. යශෝධරා දේවී වීථිය දෙස බලන්නී පිඬු පිණිස හැසිරෙන බුදුරජුන් දැක ඇස්වලින් කඳුළු මිදුවා ය.
3. අකුසල් අත්හැර කුසල් කරන්නේ ආයුෂයෙන් ද වර්ණයෙන් ද සැපෙන් ද බලයෙන් ද ප්‍රඥායෙන් ද යශසින් ද තේජසින් ද වැඩෙන්නේ ය.
4. සැදැහැවත් උපාසකයෝ ද උපාසිකාවෝ ද රාහුල හෙරණුන් දැක මහද් භක්තියෙන් ඇඳිලි බැඳ වඳිමින් සිටියාහ.
5. දැරියෝ නැව නැඟ ගංගා නදිය තරණය කරන්නෝ ගී ගයන්නෝ ද සිනා සෙන්නෝ ද වූහ.
6. නුවණ ඇති මිනිස්සු සිතෙහි නැඟෙන කෝපය ඉවැසීමෙන් යටපත් කෙරෙත්.
7. වේගයෙන් යන්නාවූ රථය මාර්ගයෙන් ඉවත් වැ පල්ලමෙහි වැටුණේ ය.
8. මව අඬන දැරිය වැලඳගෙන මූණ සිඹ සැනැසුවා ය.
9. අනිද්දා අපි නඟුල් ගෙන කෙතට ගොස් සාන්නමු.
10. වත්තේ ගස්වලින් වැටෙන ගෙඩි වඳුරෝ කැහ.
11. ඉවැසීම උතුම් ම තපස ය.
12. තෙරුන් සමඟ යන සාමණේර තෙම ළඟ කැලැවෙක ගී ගයමින් දර අවුලන ස්ත්‍රියක ගේ ගී හඬ ඇසී ය.

* * *

# පාඩම 33

## විශේෂ ශබ්ද

### අත්ත(ආත්මය, තමා)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | අත්තා (ආත්මය තෙමේ) | අත්තානො (ආත්මයෝ, තුමූ) |
| ආ: වි: | අත්ත, අත්තා (ආත්මය) | අත්තානො (ආත්මයිනි) |
| දු: වි: | අත්තානං (ආත්මයා, තමා) | අත්තානො (ආත්මයන්, තමන්) |
| ත: වි: | අත්තනා(ආත්මය කරණකොට, තමා කරණකොට) | අත්තනෙහි(ආත්මයන් (කරණකොට, තමන් කරණකොට) |
| ච: වි: | අත්තනො (ආත්මයට, තමාට) | අත්තානං (ආත්මයනට, තමනට) |
| පං: වි: | අත්තනා (ආත්මයාගෙන්, තමාගෙන්) | අත්තනෙහි (ආත්මයන්ගෙන්, තමන්ගෙන්) |
| ඡ: වි: | අත්තනො (ආත්මයා ගේ, තමා ගේ) | අත්තානං (ආත්මයන් ගේ, තමන් ගේ) |
| ස: වි: | අත්තනි (ආත්මයෙහි, තමා කෙරෙහි) | අත්තනෙසු (ආත්මයන්හි, තමන් කෙරෙහි) |

## රාජ(රජ)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | රාජා(රජ) | රාජානො(රජ්ජුහු) |
| ආ: වි: | රාජ, රාජා(රජ) | රාජානො(රජ්ජුනි) |
| දු: වි: | රාජානං (රජු) | රාජානො(රජුන්) |
| ත: වි: | රඤ්ඤා, රාජේන<br>(රජු කරණකොට) | රාජූහි, රාජෙහි<br>(රජුන් කරණකොට) |
| ච: වි: | රඤ්ඤො, රාජිනො,<br>රාජස්ස(රජුට) | රඤ්ඤං, රාජූනං,<br>රාජානං(රජුනට) |
| පං: වි: | රඤ්ඤා, රාජම්හා,<br>රාජස්මා(රජු ගෙන්) | රාජූහි, රාජෙහි<br>(රජුන් ගෙන්) |
| ඡ: වි: | රඤ්ඤො, රාජිනො<br>(රජු ගේ ) | රඤ්ඤං, රාජූනං,<br>රාජානං(රජුන් ගේ) |
| ස: වි: | රඤ්ඤෙ, රාජිනි,<br>රාජම්හි, රාජස්මිං<br>(රජු කෙරෙහි) | රාජූසු, රාජෙසු<br>(රජු කෙරෙහි) |

## බ්‍රහ්ම(බ්‍රහ්මයා)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | බ්‍රහ්මා(බඹා) | බ්‍රහ්මානො(බඹහු) |
| ආ: වි: | බ්‍රහ්ම, බ්‍රහ්මෙ(බඹ) | බ්‍රහ්මානො(බඹුනි) |
| දු: වි: | බ්‍රහ්මාණං, බ්‍රහ්මං(බඹහු) | බ්‍රහ්මානො(බඹුන්) |
| ත: වි: | බ්‍රහ්මුනා<br>(බඹා කරණකොට) | බ්‍රහ්මෙහි<br>(බඹුන් කරණකොට) |
| ච: වි: | බ්‍රහ්මුනො(බඹාට) | බ්‍රහ්මානං(බඹුනට) |
| පං: වි: | බ්‍රහ්මුනා(බඹා ගෙන්) | බ්‍රහ්මෙහි(බඹුන් ගෙන්) |
| ඡ: වි: | බ්‍රහ්මුනො(බඹා ගේ) | බ්‍රහ්මානං(බඹුන් ගෙන්) |
| ස: වි: | බ්‍රහ්මනි(බඹා කෙරෙහි) | බ්‍රහ්මෙසු(බඹුන් කෙරෙහි) |

63. අත්ත ශබ්දයේ තතියා ඒකවචනය පඨමා ඒකවචනා-ර්ථයෙහි ද, ඡට්ඨී ඒකවචනය ඡට්ඨී බහුවචනාර්ථයෙහි ද බොහෝ තැන යෙදේ.

අත්තනා'ව(අත්තනා එව) අත්තානං සම්මන්නති
(තෙමේ ම තමා සම්මත කෙරෙයි)

නක්ඛත්තානි පන අත්තනො ගමනවීථිං න විජහන්ති
(නකත් තරුහු තමන් ගේ ගමන් මාර්ගය නො හරිත්)

**තො ප්‍රත්‍යය**

64. **ගෙන්, කෙරෙන්, වශයෙන්** යන අර්ථයන්හි **තො** ප්‍රත්‍යයය නාමයනටත් සර්වනාමයනටත් එක් වෙයි.

පුරිසතො(පුරුෂයා ගෙන්)

අත්තතො(තමා ගෙන්, ආත්ම වශයෙන්)

තතො(එයින්)

**සන්ධි**

65. සවර දෙකක් ඇති සමහර තැන පර වූ සිටි සවරය ලොප් වේ(නැති වේ). එය ලොප් වූ තැන **අවග්‍රහ ලකුණ**( ' ) යොදනු ලැබේ.

දෙවො අපි = දෙවො'පි
අත්තනා එව = අත්තනා'ව

**ශබ්ද මාලාව**

**පුංලිඞ්ග ශබ්ද**

| | |
|---|---|
| පුග්ගල(පුද්ගලයා, තැනැත්තා) | අළ(අඬුව) |
| ව්‍යාබාධ(විනාශය) | ඛත්තිය (ක්‍ෂත්‍රියයා) |
| ගාරව(ගෞරවය) | වෙස්ස(වෛශ්‍යයා) |
| පටිසන්ථාර(පිළිසඳර) | සුද්ද(ශුද්‍රයා) |
| නාථ(පිහිට) | පාද (පය) |
| විනාස(විනාශය) | කිලෙස(කෙලෙස්) |
| කක්කටක(කකුළුවා) | පුථුජ්ජන(පෘථග්ජනයා) |
| සංඛාර(සංස්කාර) | මුද්ධ(හිස)* |

---

* මුද්ධ ශබ්දය **අත්ත** ශබ්දය මෙන් වරනැඟේ.

## ස්ත්‍රීලිඞ්ගික නාම

උපසම්පදා(උපසම්පදාව)
අජ්ඣෙසනා(ආයාචනය)
ජනතා(ජනසමූහය)
ගති(ගමන, යන, තැන, පිහිට)
භත්ති(භක්තිය)
සුද්ධි(පිරිසිදු බව)
අසුද්ධි(අපිරිසිදු බව)
ඌරු(කලවය)
ආපදා(විපත)

## නපුංසකලිඞ්ගික නාම

දුස්සීල්‍ය (දුශ්ශීල බව)
පරිත්තාණ(ආරක්‍ෂාව)
බහුමාන(බුහුමන්)
භය(බිය, උවදුර)
කාරුඤ්ඤ(කරුණාව)

## ක්‍රියා

අනුස්සරති (සිහි කරයි)
උපවදති(දෙස් කියයි)
අපෙක්ඛති(පතයි, බලාපොරොත්තු වෙයි)
චොදයති(චෝදනා කරයි)
උක්ඛිපති(ඔසොවයි)
මුච්චති(මිදෙයි)
පච්චවෙක්ඛති(නුවණින් සලකයි)
උපනෙති(එළවයි, යොමු කරයි)
කිලිස්සති(කෙලෙසෙයි)
ජහාති, පජහති(අත්හරී)
රක්ඛති(රකී)
උක්කංසෙති(උසස් කොට සිතයි)
ලභති(ලබයි), ලද්ධුං(ලබන්නට)

## විශෙෂණ

අත්ථකාම(වැඩ කැමැති)
බාල, අන්ධබාල(මූඪ)
අප්පරජක්ඛ(මඳ කෙලෙස් ධූලි ඇති)
මහාරජක්ඛ(මහත් කෙලෙස් ධූලි ඇති)
දිබ්බ(දිව්‍ය)
පිය(ප්‍රිය)
තිබ්බ (දැඩි)

## නිපාත

එව(ම)
හි(ඒකාන්තයෙන්, වනාහි)
යථා(යම් සේ ද)
තථා(එසේ)
තථෙව = තථා එව(එසේම)
පටිච්ච(නිසා)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. දුස්සීලො පුග්ගලො අත්තනො දුස්සීල්‍යං අනුස්සරන්තො අත්තා'ව අත්තානං උපවදති.
2. අසප්පුරිසො අත්තනො ව්‍යාබාධාය චිනෙත්ති.
3. යථා බ්‍රහ්මනි බ්‍රාමහණානං ගාරවො හොති, තථෙව පුත්තානං ධීතූනම්පි මාතරි ච පිතරි ච මහන්තො තිබ්බො ගාරවො හොතු.
4. රාජානො අත්තනො පරිත්තාණං අපෙක්ඛමානා සූරෙ පණ්ඩිතෙ ව්‍යත්තෙ මන්තිනො ලද්ධුං ඉච්ඡන්ති.
5. භික්ඛු උපසම්පදං යාචමානං සාමණෙරං ඔවදිතුං අපෙක්ඛමානො අත්තනා'ව අත්තානං සම්මන්නති.
6. අන්ධබාලො සබ්බදා සබ්බත්ථ අත්තානං උක්ඛිපිතුං උස්සහති.
7. ඉධ අත්ථකාමො කුලපුත්තො සංසාරස්ස භයං පච්චවෙක්ඛන්තො අත්තනා'ව අත්තානං චොදයන්තො අත්තනො චිත්තං නිබ්බානං උපනෙය්‍ය.
8. බාලො අත්තානං උක්කංසෙති.
9. භගවා බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා සත්තෙසු ච කාරුඤ්ඤං පටිච්ච දිබ්බෙන චක්ඛුනා ලොකං ඔලොකෙන්තො සත්තෙ අද්දස අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ ච.
10. මයං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධං මහන්තියා භත්තියා මුද්ධනා අභිවන්දාම.

11. රාජා අත්තනො භාතරං දිස්වා පටිසන්ථාරං කත්වා අමච්චෙහි සද්ධිං අත්තනො පාසාදමෙව පච්චාගච්ඡි.

12. තදා පසෙනදිනො කොසලස්ස රඤ්ඤො අජාතසත්තුනා රඤ්ඤා සද්ධිං සඞ්ගාමො අහොසි.

13. රාජිනි ධම්මෙන රට්ඨං පාලෙන්තෙ ජනතා සුඛිනී භවති.

14. අත්තාහි අත්තනො නාථො අත්තා හි අත්තනො ගති.

15. ගිරිනො මුද්ධනි ඉසීනං සන්නිපාතො අහොසි.

(ආ) පාලියට නඟන්න.

1. තමා ගේ පාපයෙන් තෙමේ ම කෙලෙසෙන්නේ ය.

2. සිල්වත් ගුණවත් පුද්ගලයනට දෙවියෝ ද බ්‍රහමයෝ ද මිනිස්සු ද බුහුමන් කෙරෙත්.

3. සත්පුරුෂයෝ තමන් ගේ ජීවිතයා ගේ විනාශයේ දී ද යහළුවන් නො අත්හරිත්.

4. තමා ගේ පිනින් තෙමේ ම පිරිසිදු වන්නේ ය. තමා ගේ පාපයෙන් තෙමේ ම කිලිටි වන්නේ ය.

5. පිරිසිදු බව ද අපිරිසිදු බව ද තමා කෙරෙහි ම ය.

6. බඹහු ගේ මුඛයෙන් බමුණෝ ද ළයින් ක්‍ෂත්‍රියයෝ ද කලවාවලින් වෛශ්‍යයෝ ද පයින් ශුද්‍රයෝ ද උපන්හයි බමුණෝ කියත්.

7. කකුළුවා සිය යහළුවා රැකගන්නේ අඬුවලින් නයා ගේ බෙල්ල ඇල්ලී ය.

8. ශූර මන්ත්‍රී පැමිණෙන්නා වූ ආපදාවෙන් තමා ගේ රජු රැකගත්තේ ය.

9. අන්ධබාල පෘථග්ජනයෝ සංස්කාරයන් නිත්‍ය වශයෙන් හෝ සැප වශයෙන් ගනිත්.

10. තෙමේ තමහට ප්‍රිය යැ යි දන්නා තැනැත්තේ පාපය කෙරෙන් තමා රැකගන්නේ ය.

* * *

## සබ්බනාම(සර්වනාම)

66. **හේ, ඔහු, තෝ, තෙපි, මම්, අපි, යමෙක්, කවරෙක්** ආදි වශයෙන් මොන ම කෙනෙකු සඳහා වුව ද බැවහර කළ හැකි සියල්ලනට ම පොදු වූ නාම **සර්වනාම** ය. පාලියෙන් ඒවාට **සබ්බනාම** යැ යි බැවහර ය. සබ්බ, පුබ්බ, පර, අපර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, ය, ත, එත, ඉදං, අමු, කිං, තුම්හ, අම්හ, එක, උභය, උභ, දක්ඛිණ, උත්තර, අධර, ඉතර ආදිහු සර්වනාමයෝ ය. මොවුන් අතුරෙන් අම්හ, තුම්හ ශබ්දයන් ගේ වරනැඟීම මෙහි පළමුවෙන් දක්වනු ලැබේ.

### අම්හ(අප)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | අහං(මම) | මයං, අම්හෙ(අපි) |
| දු: වි: | මං(මා) අම්හෙ(අප) | |
| ත: වි: | මයා(මා කරණකොට) | අම්හෙහි(අප කරණකොට) |
|ච: වි: | මයා, මය්හං(මට) | අම්හාකං(අපට) |
| පං: වි: | මයා(මගෙන්) | අම්හෙහි(අප ගෙන්) |
| ඡ: වි: | මයා, මය්හං(මගේ) | අම්හාකං(අප ගේ) |
| ස: වි: | මයි(මා කෙරෙහි) | අම්හෙසු(අප කෙරෙහි) |

## තුම්හ(තොප)

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| **ප: වි:** | ත්වං(තෝ, නුඹ) | තුම්හෙ(තෙපි, ඔබ හැම) |
| **දු: වි:** | තුවං, ත්වං, තං (තා, නුඹ) | තුම්හෙ (තොප, ඔබ හැම) |
| **ත: වි:** | ත්වයා, තයා (තා කරණ කොට, නුඹකරණකොට) | තුම්හෙහි (තොප කරණකොට, ඔබ හැම කරණකොට) |
| **ච: වි:** | තව, තුය්හං (තට, නුඹට) | තුම්හාකං (තොපට, ඔබ හැමට) |
| **පං: වි:** | ත්වයා, තයා (තගෙන්, නුඹෙන්) | තුම්හෙහි(තොප ගෙන්, ඔබ හැමගෙන්) |
| **ඡ: වි:** | තව, තුය්හං (තගේ, නුඹේ) | තුම්හාකං(තොප ගේ, ඔබ හැම ගේ) |
| **ස: වි:** | ත්වයි, තයි (තා කෙරෙහි, නුඹ කෙරෙහි) | තුම්හෙසු(තොප කෙරෙහි, ඔබ හැම කෙරෙහි) |

**67. තෙ, මෙ, වො, නො** යන සතර, පදයකට පසුව ම යෙදෙත්.

තතියා, චතුත්ථී, ඡට්ඨී එක වචන:
තෙ(තා විසින්, තට, තගේ, නුඹ විසින්, නුඹට, නුඹේ).

තතියා, චතුත්ථී, ඡට්ඨී එක වචන:
මෙ(මා විසින්, මට, මගේ).

පඨමා, දුතියා, තතියා, චතුත්ථී, ඡට්ඨී බහුවචන:
වො(තෙපි, තොප, තොප විසින්, තොපට, තොප ගේ).

පඨමා, දුතියා, තතියා, චතුත්ථී, ඡට්ඨී බහුවචන:
නො(අපි, අප, අප විසින්, අපට, අප ගේ)

**නිදර්ශන**

කතං තෙ(තා විසින් කරන ලද) කතං මෙ(මා විසින් කරන ලද)

දදමි තෙ(තට දෙමි) දදහි මෙ(මට දෙව)

පුතෙතා තෙ(තගේ පුතා) පුතෙතා මෙ(මගේ පුතා)

ගචඡථ වො(තෙපි යවු) ගචඡාම නො(අපි යමු)

පසසාමි වො(තොප දකිමි) පසසාහි නො(අප දකිවු)

කතං වො(තොප විසින් කරන ලද) කතං නො(අප විසින් කරන ලද)

දදමි වො(තොපට දෙමි) දදහි නො(අපට දෙව)

පුතතා වො(තොපගේ පුත්තු) පුතතා නො(අපගේ පුත්තු)

**වා නිපාතය**

68. **පියා හෝ මව හෝ එන්නී ය.** මේ වාක්‍යය පාලියට නැඟූ විට **පිතා වා මාතා වා ආගමිසසති** යි සිටී. සිංහල වාක්‍යයේ **හෝ** යන්න පාලියට නැඟුණේ **වා** යන්නෙනි. එහි **වා** යන්න **පිතා වා මාතා වා** යි **පිතා මාතා** යන පද දෙක ම එක්ක යෙදී ඇත. එය එයින් එක පදයක් සමඟ වුවත් යොදත හැක්ක.

**පිතා මාතා වා ආගමිසසති.**
**පිතා වා මාතා ආගමිසසති.**

**සැ: යු:** මේ කර්තෲ අර්ථයෙහි තතියා විභත්තිය යි. මේ තාක් දෙන ලද්දේ කරණාර්ථයේ තතියා විභත්තිය ය. එහා පාඩමෙක තර්තෘර්ථයේ තතියාව ඉගැන්වේ.

**ච නිපාතය**

69. **පියාත් මවත්(පියා දමව ද) එන්නාහ.** මෙය පාලියට නැඟූ විට **පිතා ච මාතා ච ආගමිසසනති** යි සිටී. සිංහලයෙහි **ත්(ද)** යන්න පාලියට නැගුණේ **ච** ශබ්දයෙනි. එය එහි **පිතා මාතා** යන පද දෙක සමඟ යෙදී ඇත. ඒ දෙකින් එක් පදයක් එක්ක යෙදුවත් ඒ අර්ථය ම ලැබෙයි.

**පිතා මාතා ච ආගමිසසනති.**

**70. පියා එන්නේ යැ යි හෙ තෙම කියයි.** මේ වැකිය පාලියට නැඟූ විට **පිතා ආගමිස්සති ඉති සො වදති** යි සිටී. මෙහි සිංහලයෙහි **යි** යන්න වෙනුවට පාලි වැකියෙහි **ඉති** යන්න යෙදී ඇත.

එයට මුලින් ඇති **පිතා ආගමිස්සති** යන මුළු වාක්‍යය ම ඉති ශබ්දය යටතට පත් වැ ඉති ශබ්දය සහිත ඒ සියලු වැකිය **සො වදති(හේ කියයි)** යන ප්‍රධාන වාක්‍යයේ **වදති** යන්නට **කර්මය** වැ සිටී.

**71. ආගමිස්සති ඉති** යන පද දෙකින් **ආගමිස්සති** යන පදයේ අග සිටි **ති** කාරයේ වූ **ඉ** යන්නත් එයට පසු ව සිටි **ඉති** ශබ්දයේ මුල් **ඉ** යන්නත් එකතුව **ඊ** කාර බවට පැමිණේ. එවිට **ආගමිස්සතීති** යි* සන්ධිය වේ. මෙසේ සමාන සවර එක් වැ දීර්ඝ වීම **සමානසවර දීර්ඝ සන්ධිය** යි. සමහර තැන පූර්ව **අ** යන්න දීර්ඝ වේ. පර **ඉ** යන්නට ලොප් වේ.

කිලමෙය්‍ය + ඉති = කිලමෙය්‍යා'ති.

**72.** බින්දුවට හෝ සවරයකට පර වැ සිටි **එ** කාරයට මුලින් **ය්** කාරයෙක් අමුතුවෙන් එක් වැ බැඳේ.(මෙසේ අමුතුවෙන් අකුරක් අවුත් එක් වීම **ආගම** නමින් පාලි ව්‍යාකරණ ශාසත්‍රයෙහි සඳහන් වේ).

තං එව = තං ය් එව = තංයෙව.

සො එව = සො ය් එව = සො යෙව.

---

*මෙහි පූර්වසවරය ලොප් කොට පරසවරය දීර්ඝ කිරීම පැරැණි පාලි වියරණැදුරනට අභිමත විය. සකුවෙහි සමාන සවර දෙක ම එක්ව දීර්ඝ වන බව දක්වේ. සකුවේ ආ ක්‍රමය ලෙහෙසි බැවින් එය මෙතැනට ගතුමු. කොයි සැටියෙන් හෝ පද සිද්ධිය හරියට වතොත් ඒ ප්‍රමාණයි.

**73.** බින්දුවට පර ව සිටි **ය** යන්න **ඤ** යන්නක් බවට පත් වේ. ඒ සමඟ ම එයට මුලින් සිටි බින්දුව පර රූපය(තමාට පසු ව සිටින අකුරේ වේශය) ගනී.(බින්දුව ද **ඤ්** යන්නෙක් වේ.)

තංයෙව = තඤ්ඤෙව.

එක් අකුරක් වෙනුවට වෙන අකුරක් පැමිණීම **ආදෙශ** නම් වේ.

**74.** ආමන්ත්‍රණයෙහි බැවහර වන **භො, ආවුසො** ආදි පද කෙනෙක් ඇත. **භො** යන පදය එක වචන වුව ද එක වචන බහු වචන දෙක්හි ම යෙදුණු තැන් දක්නා ලැබේ. **ආවුසො (ඇවත, ඇවැත්නි)** යන්න ද එක වචන බහු වචන දෙක්හි ම බැවහර වේ.

**තාත** යනු පියා යි. එහෙත් එහි ආලපන එක වචනය වූ **තාත** යන්තේ බහු වචනය වූ **තාතා** යන්නත් බාල මහලු කාටත් ප්‍රිය ආමන්ත්‍රණයෙහි දී වැහැරුවේ. ස්ත්‍රීන් ඇමැතීමේ දී **භොති (පින්වතිය)** යනු එක වචනයෙහි ද **භොතියො(පින්වතියනි)** යනු බහු වචනයෙහි ද යෙදේ. **අම්ම** යන්න ද යෙදේ.

## ශබ්ද මාලාව

### පුල්ලිඞ්ගික

දහර(ළදරුවා)
තථාගත(තථාගතයන් වහන්සේ)
ඛත්තිය(ක්‍ෂත්‍රියයා)
පිරිහීණභාව(පිරිහුණුබව)
වස(වසඟය, යටත් බව)
ඤාතක(නෑයා)
පඤ්හ(ප්‍රශ්නය)
පරියන්ත(කෙළවර)
අක්ඛිරොග(ඇස් ලෙඩ)
සිනෙහ(ආදරය)
මාතුල(මයිලණුවෝ)
නිරය(නිරය, නරකය)

### ස්ත්‍රීලිඞ්ගික

පත්ථනා(ප්‍රාර්ථනාව)
පරිසා(පිරිස)
පබ්බජ්ජා(පැවිද්ද)
සමණධම්ම(මහණදම, භාවනාව)
උපසම්පදා(උපසම්පදාව)
නින්දා(නින්ද)
මහෙසී(බිසොව)

## නපුංසකලිඞ්ගික

බජ්ජ(කැවිලි)
පාන(බොන දෑ)
අක්ඛි(ඇස)
බුද්ධසාසන(බුදුසස්න)
චක්ඛු(ඇස)
අඵාසුක (අපහසුව)
ආගමන (ඊම)
වචන(කීම)
පච්චාගමන(පෙරළා ඊම)

## විශේෂණ

දහර (ළදරු)
සුඛුමාල(සියුමැලි)
උපකාරී(උපකාර කරන)
අනස්සව(නො වසඟ, වලංගු නැති)
අනොක්කමන්ත(නො බසින)
විරවන්ත(හඬන)
කණිට්ඨ(වයසින් බාල)
මහල්ලක(මහළු)
අධිමන්ත(ඉතා වැඩි)
සහගාමී(එක් වැ යන)
බහු(බොහෝ)
පසන්න(පැහැදුණු)

## නිපාත

පුනප්පුනං(නැවත නැවත)
කිමංග පන(කියනුම කවරේ ද?)
තාව(පළමුකොට, ඉතින්)
එව(ම)
උදහු(නොහොත්)
පුරතො(පළමුවෙන්)
වා(හෝ)

## විශේෂ පද

කදච්'පි(කිසි ම දක)

## ක්‍රියා

පක්කමති (නික්මයයි)
ඔලොකෙති(බලයි)
කිලමති(වෙහෙසෙයි)
ලභති(ලබයි)
ආරොචෙති(සැළ කරයි)
නස්සති(නැසේ)
රුච්චති(රිසියෙයි)
අස්සාසෙති (සනසයි)
ඔක්කමති(බසී)
අජ්ජෙති(උපයයි)
ධාරෙති(දරයි, සලකයි)
චින්තයති(සිතයි)
පරියෙසති(සොයයි)
උප්පජ්ජති(උපදී)
ආහ(කීය)
ආහංසු(කීහ)
පුච්ඡති(විචාරයි)
භිජ්ජති(බිඳෙයි)
පටිජග්ගති(පෝෂිත කරයි, රැකබලාගනී)
පච්චාසිංසති(පතයි, බලාපොරොත්තු වෙයි)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. කුටුම්බිකො "අහං පුත්තං වා ධීතරං වා ලභිත්වා තුම්හාකං මහන්තං සක්කාරං කරිස්සාමී"ති පත්ථනං කත්වා තතො පක්කාමි.
2. දහරා සාමණේරා භත්තෙ නො ඔලොකෙස්සන්තීති තෙ ඛජ්ජානි වා පානානි වා ගහෙත්වා'ව විහාරං ගච්ඡන්ති.
3. අනාථපිණ්ඩිකො ගහපති "තථාගතො මය්හං ධම්මං දෙසෙන්තො කිලමෙය්‍යා"ති සත්ථරි අධිමත්තෙන සිනෙහෙන න කදාචි පි පඤ්හං පුච්ඡති.
4. සො "අහම්පි ධම්මං සොතුං ගමිස්සාමී"ති ගන්ත්වා සත්ථාරං වන්දිත්වා පරිසාය පරියන්තෙ නිසීදි.
5. "තාත, මහල්ලකස්ස හි අත්තනො හත්ථා ච පාදා ච අනස්සවා, න වසෙ වත්තන්ති, කිමංග පන ඤාතකා"ති සො ආහ.
6. සො "අහං තව වචනං න කරොමි පබ්බජිස්සාමි යෙවා"ති වත්වා ගෙහා නික්ඛමි.
7. සො කණිට්ඨස්ස භාතිකස්ස විරවන්තස්සෙව ගෙහා නික්ඛමිත්වා භගවතො සන්තිකෙ පබ්බජි.
8. සො සත්ථාරං වන්දිත්වා තතො නික්ඛමිත්වා අත්තනා සහගාමිනො භික්ඛු පරියෙසන්තො බහූ භික්ඛූ ලභිත්වා තෙහි සද්ධිං සාවත්ථිතො නික්ඛමි.
9. ථෙරස්ස නිද්දං අනොක්කමන්තස්ස අක්ඛිරොගො උප්පජ්ජි.
10. වදෙහි තාව ආවුසො පාලිත.
    ත්වං කිං අක්ඛී ඔලොකෙස්සසි උදාහු බුද්ධසාසනං?
11. චක්ඛූනි මෙ නස්සන්තු වා භිජ්ජන්තු වා බුද්ධසාසනමෙව ධාරෙමි මා චක්ඛූනීති ථෙරො අත්තානං සයමෙව ඔවදිත්වා සමණධම්මං අකාසි.
12. තෙ භික්ඛූ "භන්තෙ මා චින්තයිත්ථ, මයං වො පටිජග්ගිස්සාමා"ති වදන්තා ථෙරං අස්සාසෙසුං.

13. "මයි තුම්හෙහි සද්ධිං ගච්ඡන්තෙ තුම්හෙ කිලමිස්සථ, තස්මා තුම්හෙ පුරතො ගච්ඡථා"ති ථෙරො තෙ ආහ.

14. "මා භන්තෙ එවං කරිත්ථ, මයං තුම්හෙහි සද්ධිඤ්ඤෙව ගච්ඡිස්සාමා"ති තෙ පුනප්පුනං යාචිංසු.

15. මා වො ආවුසො එවං රුච්චිත්ථ, එවං සන්තෙ මය්හං අඵාසුකං භවිස්සති, මය්හං කණිට්ඨො තුම්හෙ දිස්වා පුච්ඡිස්සති, අථස්ස මෙ චක්ඛූනං පරිහීණභාවං ආරොචෙය්‍යාථ.

16. "භන්තෙ මෙ මාතුලො කුටුම්බිකො තුම්හාකං ආගමනං පච්චාසිංසති එථ ගච්ඡාමා"ති සාමණෙරො ආහ.

**(ආ) පාලියට නඟන්න.**

1. අපි හෙට තොප ගේ පෙරළා ඊම බලාපොරොත්තු වන්නමු.
2. මගේ ඇස් පිරිහුණ බව තෙපි දන්නහු ද?
3. එහි යෑම තොපට නො රිසියේ වා.
4. ඔවුන් අප හා වසන කල අපි වෙහෙසෙන්නමු.
5. තෙපි ඔවුන් රැකබලා ගන්නට හැකිවහු දැ? යි දැන් ම කියවු.
6. රාජපුරුෂයෝ සොරුන් සොයන්නාහු නුවර ගෙයින් ගෙට ගියාය.
7. තෝ තගෙ මව හෝ පියා පෙළන්නෙහි නම් මෙහිදීත් පිරිහෙන්නෙහි ය, මරණින් පසු නිරයට ද යන්නෙහි ය.
8. ගිලන් වූ දුර්වල වූ මට දැන් මගේ අත් ද වලංගු නැත, පා ද වලංගු නැත.
9. මෙහෙණ රජු ගේ බිසව තමා කෙරෙහි පැහැදුණිය දැක මහත් සතුටට පැමිණියා ය.
10. අපේ වත්තේ ගස්වලින් වැටෙන ගෙඩි තොප ගේ සේවකයෝ අවුත් ගෙන යත්.

* * *

## සබ්බනාම(සර්වනාම)

75. ත එත ආදි ශබ්ද ලිඞ්ග තුනෙහි ම වර නැඟේ.

### ත(හේ) පුංලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඃ විඃ | සො(හේ) | තෙ, නෙ(ඔහු) |
| දුඃ විඃ | තං, නං (ඔහු) | තෙ, නෙ(ඔවුන්) |
| තඃ විඃ | තෙන, නෙන(ඔහු විසින්, ඔහු කරණකොට) | තෙහි, නෙහි(ඔවුන් විසින්, ඔවුන් කරණකොට) |
| චඃ විඃ | තස්ස, නස්ස (ඔහුට) | තෙසං, තෙසානං, නෙසං, නෙසානං(ඔවුනට) |
| පංඃ විඃ | තම්හා, තස්මා, නම්හා නස්මා(ඔහුගෙන්) | තෙහි, නෙහි (ඔවුන් ගෙන්) |
| ඡඃ විඃ | තස්ස, නස්ස (ඔහු ගේ) | තෙසං, තෙසානං, නෙසං, නෙසානං(ඔවුන් ගේ) |
| සඃ විඃ | තම්හි, තස්මිං, නම්හි නස්මිං(ඔහු කෙරෙහි) | තෙසු, නෙසු (ඔවුන් කෙරෙහි) |

### ත(එය) නපුංසකලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඃ විඃ | තං, නං(එය) | තෙ, තානි, නෙ, නානි(ඒවා) |
| දුඃ විඃ | තං, නං(එය) | තෙ, තානි, නෙ, නානි(ඒවා) |

සෙස්ස පුමලිඟුයෙහි මෙනි.

## ත(ඕ) ස්ත්‍රීලිංගික

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | සා<br>(ඕ) | තා, තායො, නා, නායො<br>(ඔහු, ඒ ස්ත්‍රීහු) |
| දු: වි: | තං, නං<br>(ඇය) | තා, තායො, නා, නායො<br>(ඔවුන්) |
| ත: වි: | තාය, නාය<br>(ඇය විසින්,<br>ඇය කරණකොට) | තාහි, නාහි(ඔවුන් විසින්,<br>ඒ ස්ත්‍රීන් විසින්, ඔවුන්<br>ඒ ස්ත්‍රීන් කරණකොට) |
| ච: වි: | තාය, නාය, තස්සා,<br>නස්සා, තිස්සා<br>(ඇයට) | තාසං, තාසානං, නාසං,<br>නාසානං<br>(ඔවුනට, ඒ ස්ත්‍රීනට) |
| පං: වි: | තාය, නාය<br>(ඇගෙන්) | තාහි, නාහි(ඔවුන් ගෙන්,<br>ඒ ස්ත්‍රීන් ගෙන්) |
| ඡ: වි: | තාය, නාය, තස්සා,<br>නස්සා, තිස්සා<br>(ඇගේ) | තාසං, තාසානං, නාසං,<br>නාසානං<br>(ඔවුන් ගේ, ඒ ස්ත්‍රීන් ගේ) |
| ස: වි: | තායං, නායං, තාය,<br>නාය, තස්සං, නස්සං<br>(ඇය කෙරෙහි) | තාසු, නාසු<br>(ඔවුන් කෙරෙහි,<br>ඒ ස්ත්‍රීන් කෙරෙහි) |

**76.** මේ සර්වනාමයෝ නාමපදවලට විශෙෂණව ද යෙදෙත්.

පුංලිඞ්ගයෙහි පඨමා විභත්තියෙහි:

සො පුරිසො(ඒ පුරුෂයා),
තෙ පුරිසා(ඒ පුරුෂයෝ).

දුතියා විභත්තියෙහි:

තං පුරිසං(ඒ පුරුෂයා),
තෙ පුරිසෙ(ඒ පුරුෂයන්).

චතුත්ථි විභත්තියෙහි:

තස්ස පුරිසස්ස(ඒ පුරුෂයාට),
තෙසං පුරිසානං(ඒ පුරුෂයනට).

නපුංසකලිඞ්ගයෙහි පඨමා විභත්තියෙහි:

තං නගරං(ඒ නුවර),
තානි නගරානි(ඒ නුවරවල්).

ස්ත්‍රීලිඞ්ගයෙහි පඨමා විභත්තියෙහි:

සා ඉත්ථි(ඒ ස්ත්‍රී),
තා ඉත්ථියො(ඒ ස්ත්‍රීහු).

දුතියා විභත්තියෙහි:

තං ඉත්ථිං(ඒ ස්ත්‍රිය),
තා ඉත්ථියො(ඒ ස්ත්‍රීන්).

චතුත්ථි විභත්තියෙහි:

තස්සා ඉත්ථියා(ඒ ස්ත්‍රියට),
තාසං ඉත්ථීනං(ඒ ස්ත්‍රීනට)

**එත** ශබ්දය - **ත** ශබ්දය මෙනි

**පුංලිඞ්ගයෙහි** එසො(මෙ තෙම), එතෙ(මොහු තුමූ) ආදි වශයෙන් ද,

**ස්ත්‍රීලිඞ්ගයෙහි** එසා(මෝ තොමෝ), එතා, එතායො(මොහු තුමූ, මේ ස්ත්‍රීහු තුමූ)

**නපුංසකලිඞ්ගයෙහි** එතං(මෙය), එතෙ, එතානි(මේවා)

යන ආදි වශයෙන් වරනඟන සැටි ද අර්ථ දෙන සැටි ද පුහුණු කළ යුතු.

එත(මේ) ශබ්දයෙන් ළඟින් ම ඉන්නා කෙනෙක් හෝ තිබෙන දැයෙක් පැවැසේ.

## ය(යම්) පුංලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඃ විඃ | යො(යමෙක්) | යෙ(යම් කෙනෙක්) |
| දුඃ විඃ | යං(යමකු) | යෙ(යම් කෙනකුන්) |
| තඃ විඃ | යෙන (යමකු කරණකොට) | යෙහි(යම් කෙනකුන් කරණකොට) |
| චඃ විඃ | යස්ස (යමකුට) | යෙසං, යෙසානං (යම්කෙනකුනට) |
| පංඃ විඃ | යම්හා, යස්මා (යමකුගෙන්) | යෙහි (යම්කෙනකුන් ගෙන්) |
| ඡඃ විඃ | යස්ස (යමකු ගේ) | යෙසං, යෙසානං (යම් කෙනකුන් ගේ) |
| සඃ විඃ | යම්හි, යස්මිං (යමකු කෙරෙහි) | යෙසු (යම් කෙනකුන් කෙරෙහි) |

## ය(යම්) ස්ත්‍රීලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඃ විඃ | යා(යම් ස්ත්‍රියක්) | යා, යායො(යම් ස්ත්‍රීහු) |
| දුඃ විඃ | යං(යම් ස්ත්‍රියක) | යා, යායො(යම් ස්ත්‍රීන්) |
| තඃ විඃ | යාය | යාහි |
| චඃ විඃ | යස්සා, යාය | යාසං, යාසානං |
| පංඃ විඃ | යාය | යාහි |
| ඡඃ විඃ | යාය | යාසං, යාසානං |
| සඃ විඃ | යායං, යාය, යස්ස | යාසු |

## ය(යම්) නපුංසකලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඃ විඃ | යං(යමක්) | යෙ, යානි(යම් දෑ) |
| දුඃ විඃ | යං | යෙ, යානි |

සෙසු හැම තැන පුංලිඞ්ගයෙහි මෙනි.

77. මේවා විශේෂණ වැ යෙදෙන සැටි :

යො පුරිසො(යම් පුරුෂයෙක්)

යෙ පුරිසා(යම් පුරුෂයෝ)

යස්ස පුරිසස්ස (යම් පුරුෂයකුට)

යෙසං පුරිසානං(යම් පුරුෂයනට)

යා ඉත්ථී(යම් ස්ත්‍රියක්)

යායො ඉත්ථියො(යම් ස්ත්‍රීහු)

යං නගරං(යම් නුවරක්)

යානි නගරානි(යම් නුවරවල්)

යස්මිං නගරෙ(යම් නුවරෙකැ)

යෙසු නගරෙසු (යම් නුවරවලැ)

මේවා වාක්‍යයෙහි යෙදෙන සැටි පහත දැක්වෙන නිදසුන්වලින් දතයුතු.

යො ආගච්ඡති සො ඉධ නිසීදතු.
(යමෙක් එයි ද හේ මෙහි හිඳගනී වා)

යෙ පුරිසා ඉදනි ආගච්ඡන්ති හියෝ'පි තෙ ඉධ ආගච්ඡිංසු.
(යම් පුරුෂ කෙනෙක් දැන් එත් ද ඊයේත් ඔහු මෙහි ආහ.)

යස්ස කිච්චස්ස ඉදනි කාලො තං කාරොථ.
(යම් කටයුත්තකට දැන් කාලය වේ ද එය කරවු.)

78. යෙන තෙන: යෙන - යම් තැනෙක ද තෙන - එතැනට

යත්ථ තත්ථ: යත්ථ - යම් තැනෙක ද තත්ථ - එ තැනැ

**කිං** ශබ්දය ද **ය** ශබ්දය මෙන් වරනැගෙයි. **කො, කෙ, කං. කෙ; කෙන, කෙහි** යන ආදි වශයෙනි.

## කිං ශබ්දය පුංලිඞගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | කො(කවරෙක් ද?) | කෙ(කවුරු ද?) |
| දු: වි: | කං(කවුරු/කවරහු ද?) | කෙ(කවුරුන් ද?) |
| ත: වි: | කෙන(කවුරු/කවරකු කරණකොට ගෙන ද?) | කෙහි(කවුරුන් කරණකොට ගෙන ද?) |
| ච: වි: | කස්ස (කාට ද? කවරකුට ද?) | කෙසං, කෙසානං (කවුරුනට ද?) |
| පං: වි: | කම්හා, කස්මා (කාගෙන් ද?, කවරකුගෙන් ද?) | කෙහි (කවුරුන් ගෙන් ද?) |
| ඡ: වි: | කස්ස(කාගේ ද? කවරකුගේ ද?) | කෙසං (කවුරුන් ගේ ද?) |
| ස: වි: | කම්හි, කස්මිං (කා කෙරෙහි ද?, කවරකු කෙරෙහි ද?) | කෙසු (කවුරුන් කෙරෙහි ද?) |

## කිං ශබ්දය නපුංසකලිඞගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | කං, කිං(කිමෙක් ද?) | කෙ, කානි(කවර දෑ ද? මොනොවා ද?) |
| දු: වි: | කං, කිං(කුමක් ද?) | කෙ, කානි(කවර දෑ ද? මොනොවා ද?) |

සෙසු විබත්හි පුංලිඞගයෙහි මෙනි.

## කා ශබ්දය ස්ත්‍රීලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | කා(කවරී ද?) | කා, කායො(කවුරු ද? කවර ස්ත්‍රීහු ද?)* |
| දු: වි: | කං(කවරියක ද?) | කා, කායො(කවුරුන් ද?) |
| ත: වි: | කාය(කවරියක විසින් ද?, කවරියක කරණකොට ගෙන ද?) | කාහි(කවුරුන් විසින් ද?, කවුරුන් කරණකොට ගෙන ද?) |
| ච: වි: | කස්සා, කාය, කිස්සා (කවරියකට ද?) | කාසං, කාසානං (කවුරුනට ද?) |
| පං: වි: | කාය(කවරියකගෙන් ද?) | කාහි(කවුරුන් ගෙන් ද?) |
| ඡ: වි: | කස්සා, කාය, කිස්සා කවරියක ගේ ද?) | කාසං, කාසානං (කවුරුන් ගේ ද?) |
| ස: වි: | කායං, කාය, කස්සං, කිස්සං (කවරියක කෙරෙහි ද?) | කාසු (කවුරුන් කෙරෙහි ද?) |

79. මොවුන් නාමයට විශෙෂණ වැ යෙදෙන සැටි :

කො පුරිසො (කවර පුරුෂයෙක් ද?)
කෙ පුරිසා (කවර පුරුෂයෝ ද?)
කං පුරිසං (කවර පුරුෂයකු ද?)
කෙ පුරිසෙ (කවර පුරුෂයන් ද?)
කස්ස පුරිසස්ස (කවර පුරුෂයකුට ද?)
කෙසං පුරිසානං (කවර පුරුෂයනට ද?)
කා ඉත්ථී (කවර ස්ත්‍රියක් ද?)
කායො ඉත්ථියො (කවර ස්ත්‍රීහු ද?)
කාය ඉත්ථියා (කවර ස්ත්‍රියකගේ ද?)
කාසං ඉත්ථීනං (කවර ස්ත්‍රීන්ගේ ද?)
කිං නගරං (කවර නුවරෙක් ද? කොයි නුවර ද?)
කානි නගරානි (කවර නුවරවල් ද?)
කස්මිං නගරෙ (කොයි නුවරෙහි ද?)
කෙසු නගරෙසු (කොයි නුවරවලැ ද?)

---

* කවර සස්ත්‍රීහු ද? යන ආදීන් තැනට සුදුසු පරිදි අර්ථ කියන්නට ඉගැන්විය යුතු.

**80.** මේ **කිං** ශබ්දයෙන් හැදුණු **කො, කෙ, කං, කෙ** ආදි පදවලට **චි, චන,(අ)පි** යන තුනින් එකක් එකතු කිරීමෙන් **කිසි, කිසියම්, එක්තරා, සමහර** යන අර්ථ ඇති පද සෑදේ.

කොචි, කොචන, කොපි(කිසිවෙක්)

කෙචි, කෙචන, කෙපි(කිසිකෙනෙක්, සමහරු)

කංචි, කඤ්චි, කඤ්චන, කම්පි(කිසිවකු)

කාචි, කාචන, කාපි(කිසි ස්ත්‍රියක්)

කිඤ්චි, කඤ්චි, කිඤ්චන, කඤ්චන(කිසිවක්)

කිම්පි, කිමපි, කම්පි කමපි(කිසිවක්)

මොවුන් නාමයනට විශෙෂණ ව සිටින සැටි :

කොචි පුරිසො, කොචන පුරිසො, කොපි පුරිසො -
(කිසි පුරුෂයෙක්)

කෙචි පුරිසා, කෙචන පුරිසා, කෙපි පුරිසා -
(කිසි, සමහර පුරුෂයෝ)

කාචි, කාචන, කාපි ඉත්ථි -(කිසි, එක්තරා ස්ත්‍රියක්)

කිඤ්චි, කිඤ්චන, කිම්පි, කිමපි නගරං -
(කිසි, එක්තරා නුවරක්)

කිස්මිචි, කිස්මිංචන, කිස්මිම්පි නගරෙ -(කිසි නුවරෙක)

**81. යම් කිසි** යන අර්ථය දීමට මේ පදවලට මුලින් **ය** ශබ්දයෙන් නිපන් පද ද එක්කරනු ලැබේ.

යො කොචි (යම් කිසිවෙක්)

යො කොචි පුරිසො (යම් කිසි පුරුෂයෙක්)

යෙ කෙචි පුරිසා (යම් කිසි පුරුෂ කෙනෙක්)

යා කාචි ඉත්ථි (යම් කිසි ස්ත්‍රියක්)

යං කිංචි විත්තං (යම් කිසි වස්තුවෙක්)

## ශබ්ද මාලාව

### පුංලිඞ්ගික නාම

ගබ්භපරිහාර(ගබ්පෙරහැර)
සෙට්ඨි(සිටුවරයා)
සමය(කාලය)
අනුපුබ්බ(පිළිවෙළ)
පරලොක (පරලොව)
භොග(වතුපිටි ආදි දේපොල)
ඝරාවාස(ගිහි ගෙයි විසීම)
භාර(බර)
පරිහීනභාව(පිරිහුණු බව)
මහල්ලක කාල(මහලු කාලය)
අරුණ(අරුණාලෝකය)
උපනිස්සය(හේතු සම්පත්)

අය්‍ය(සාමිදරුවා)
වාත(වාතය, සුළඟ)
පිණ්ඩපාත(භොජනය)
පටිසන්ථාර(පිළිසඳර)
පරිපන්ථ (උවදුර)
භාගිනෙය්‍ය(බෑනා)
පපංච(පරක්කුව)
බලිවද්ද(ගොනා)
පඤ්හ(ප්‍රශ්නය)
දෙස(දෙස, වරද)
සක්ක(ශක්‍රයා)
වස(වශය)

### නපුංසකලිඞ්ගික නාම

පමාණ(ප්‍රමාණය, තරම)
නාම(නම)
සරීර(ශරීරය)
පරියොසාන(කෙළවර)
ගන්ථධුර(ග්‍රන්ථධුරය)
විපස්සනාධුර(විදර්ශනාධුරය)
කම්මට්ඨාන(කමටහන)
අරුණුග්ගමන(අරුණු නැඟීම)
අක්ඛි(ඇස)
ආසන(ආසනය, පුටුව)

පාදමූල(පාමුල)
පුනදිවස(පසු දින)
ධුර(විය ගස)
චක්ක(චක්‍රය, රෝදය)
මූල(මුල)
ඉද්ධිබල (ඍද්ධිබලය)
අස්සු(කඳුළු)
කාරණ(කරුණ)
සාධු(යහපත)
ආගමන(පැමිණීම, ඊම)

## ස්ත්‍රීලිංගික නාම

අනුකම්පා(අනුකම්පාව, කරුණාව) කුච්ඡි(කුසය)
ජටා(හිස මුදුනැ කෙස් ගැටය) යාගු(කැඳ)
පවත්ති(පුවත, තොරතුර) ගීවා(බෙල්ල)
ආනුපුබ්බී කථා(පිළිවෙළ කථාව) වීථි(වීදිය)
භගිනී(සොහොයුරී)

## ක්‍රියා

ජානාති(දනී) වත්තති(පවතී)
පතිට්ඨාති(පිහිටයි) පූරෙති(පුරයි)
ඤත්වා(දැන) පගඝරති(වැගිරෙයි)
පතිට්ඨාපයති(පිහිටුවයි) විජ්ඣති(විදී)
කථෙති(කියයි) ආදියති(ගනී)
අනුගච්ඡති(අනුව යයි) ආදාය(ගෙන)
යාචති(ඉල්ලයි) පෙසෙති(යවයි)
සම්පටිච්ඡති(පිළිගනී) පුච්ඡති(විචාරයි)
පක්කොසති(කැඳවයි) පහිණාති(යවයි, එවයි)
හොති(වෙයි) වට්ටති(වටී)
ආරොචෙති(දන්වයි, කියයි) පාපෙති(පමුණුවයි)
පටිපජ්ජති(පිළිපදියි, පරිහරණය කරයි)

## විශේෂණ

දුබ්බිනීත(නො හික්මුණු) අච්චායික(ඉක්මන්)
එත්තක(මෙපමණ) දුක්ඛී (දුක් ඇති)
සච්ඡන්දකද(ණ)ක(සිත් ඇති) දුම්මන (නො සතුටු)
අච්ඡන්දකද(ණ)ක(සිත් නැති) නිද්දෙස (නිදෙස්)
ජෙට්ඨ(වැඩිමාලු) අයුත්ත (අයුතු)
සාධු(යහපත්, මනාප, හොඳ) නිබද්ධ (නිබඳ)

## නිපාත

තාව(තව ම) පන(වනාහි, නම්)
හි(ඒකාන්තයෙන්, වනාහි) සයං(තෙමේ, තුමූ)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. ආවුසො දුබ්බිනීත මහල්ලක, ත්වං අත්තනො පමාණං න ජානාසි එත්තකෙ ථෙරෙ ආගච්ඡන්තෙ දිස්වා'පි ආසනා න උට්ඨාසි.

2. තස්ස කුටුම්බිකස්ස භරියාය කුච්ඡියං ගබ්භො පතිට්ඨාසි සා තං ඤත්වා තස්ස ආරොචෙසි. සො තස්සා ගබ්භපරිහාරං අදාසි.

3. සෙට්ඨි අත්තනො පුත්තස්ස පාලො'ති නාමං අකාසි.

4. තස්මිං සමයෙ සත්ථා අනුපුබ්බෙනාගන්ත්වා ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ විහරති මහාජනං සග්ගස්ස මග්ගෙ ච මොක්ඛස්ස මග්ගෙ ච පතිට්ඨාපයමානො.

5. තස්මිං දිවසෙ සත්ථා තස්ස උපනිස්සයං ඔලොකෙත්වා ධම්මං දෙසෙන්තො ආනුපුබ්බීකථං කථෙසි.

6. තං සුත්වා මහාපාලො කුටුම්බිකො චින්තෙසි "පරලොකං ගච්ඡන්තං පුත්තා වා ධීතරො වා භොගා වා නානුගච්ඡන්ති. සරීරම්පි අත්තනා සද්ධිං න ගච්ඡති කිමංග පන ඤාතකා. කිමෙම ඝරාවාසෙන පබ්බජිස්සාමී"ති.

7. සො දෙසනාය පරියොසානෙ සත්ථාරං උපසංකමිත්වා පබ්බජ්ජං යාචි.

8. සො සාධූ'ති භගවතො වචනං සම්පටිච්ඡිත්වා සත්ථාරං වන්දිත්වා ගෙහං ගන්ත්වා කණිට්ඨං පක්කොසිත්වා "තාත, එතස්මිං කුලෙ යං කිඤ්චි සවිඤ්ඤාණකං වා අවිඤ්ඤාණකං වා ධනං අත්ථි තං තව භාරො. පටිපජ්ජාහි නං"ති ආහ.

9. කණිට්ඨො පුච්ඡි "තුම්හෙ පන කිං කරොථා?"ති. අහං සත්ථු සන්තිකෙ පබ්බජිස්සාමි තාතා'ති ජෙට්ඨො භාතා ආහ.

10. තාත, මහල්ලකස්ස හි අත්තනො හත්ථා'පි අනස්සවා හොන්ති, න වසෙ වත්තන්ති.

(ආ) පාලියට නඟන්න.

1. "වහන්ස, මම මහලු කාලයෙහි පැවිදි වීමි. ග්‍රන්ථධුරය පුරන්නට නො හැක්කෙමි. විපස්සනා ධුරය ම පුරන්නෙමි, මට කමටහනක් වදාළ මැනැවැ" යි ඒ භික්ෂු නම කීයේ ය.

2. භික්ෂූහු උන්වහන්සේ ගේ කඳුළු වැගිරෙන ඇස් දැක, "වහන්ස, මේ කිම් දැ?" යි කීහ.

3. "ඇවැත්නි, වාතයෝ මගේ ඇස් විදිති" යි සථවිර කීය.

4. මිනිස්සු තෙරහු නො දැක, "වහන්ස, අපේ සාමිදරුවෝ කොයි දැ?" යි ඇසූහ. භික්ෂූහු තෙරහු ගේ ඇස් පිරිහුණු බව කීහ. ඒ මිනිස්සු එපවත් අසා කැඳ යවා තුමූ පිණ්ඩපාතය ගෙන විහාරයට ගොස් තෙරහු දැක වැඳ

පාමුලැ පෙරැළෙමින් හඬා "වහන්ස, අපි ඔබ වහන්සේ රැකබලා ගන්නමු. නො සිතුව මැනවැ" යි සනසා නික්ම ගියහ.

5. "ඇවැත්නි, මගේ බාල සොහොයුරා තොප දැක විචාරන්නේ ය. එවිට මගේ ඇස් පිරිහුණු බව ඔහුට සැළ කරවු. හෙතෙම මා වෙතට කිසිවකු එවන්නේ ය. ඔහු හා මම් එන්නෙමි" යි ස්ථවිර තෙම කීය.

6. ඒ භික්ෂූහු ද පිළිවෙළින් ජේතවනයට ගොස් ශාස්තෘන් වහන්සේ ද මහ තෙරුන් ද දැක වැඳ, තෙරහු ගේ බාල සොහොයුරා යම් වීදියෙකැ වෙසේ ද, පසු දිනැ ඒ වීදියට පිඩුපිණිස වැඩියාහ. කෙළෙඹි තෙම ඔවුන් හැඳින පිළිසඳර කථා කොට "මගේ සොහොයුරු තෙරණුවෝ කොයි දැ" යි ඇසීය.

7. ඔහු තෙරහු ගේ ඇස් පිරිහුණු බව කියා "ස්ථවිර තෙම මෙහෙන් කිසිවකු ගේ පැමිණීම බලාපොරොත්තු වේ යැ" යි කීහ.

8. "වහන්ස, මෙ තෙම මගේ සොහොයුරිය ගේ පුතා ය. මගේ බෑනා ය. මම මොහු තෙරණුවන් වෙත යවන්නෙමි" යි කෙළෙඹි තෙම කී ය. "ඇවැත්නි, මාර්ගයෙහි උවදුරු ඇත. එහෙයින් මොහු පැවිදි කොට යවන්නමෝ නම් එය වටී" යැ යි භික්ෂූහු කීහ.

9. "උපාසකය, මේ ගම කිසි ආරණ්‍යයක විහාරයෙක් ඇත් දැ" යි හෙරණ ඇසී ය. "ඇතැ" යි උපාසකයා කී ය. "එහි කිසි ස්ථවිර නමක් වෙසේ ද?" යි හෙරණ ඇසී ය. "වහන්ස, ඔබ කවුරු දැ" යි උපාසකයා ඇසී ය. "මම් ඒ තෙරහු ගේ බෑනා වෙමි" යි හෙරණ කී ය.

10. “මට මාගීය කියන්නැ” යි හෙරණ කී ය. එවිට ඒ උපාසක තෙම හෙරණහු විහාරයට පැමිණැවී ය.

11. “මේ කවරෙක් දැ” යි තෙර ඇසී ය. “මම මගියෙක්මි” යි ශක්‍ර තෙම කී ය. “කොයි යෙහි දැ?” යි තෙර ඇසී.

12. “ඔබ යන්න, මා හා යන ඔබට පරක්කු වන්නේ යැ” යි සඵවිර කී ය. “මට ඉක්මනෙක් නැත. එකතුව ම යමු” යි ශක්‍ර තෙම කී ය.

* * *

# පාඨම 36

## සබ්බනාම

### සබ්බ(සියලු) පුංලිඞ්ගයෙහි

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | සබ්බෝ(සියල්ල) | සබ්බේ(සියල්ලෝ) |
| ආ: | වි: | හෙ සබ්බ | හෙ සබ්බේ |
| දු: | වි: | සබ්බං | සබ්බේ |
| ත: | වි: | සබ්බේන | සබ්බේහි |
| ච: | වි: | සබ්බස්ස | සබ්බේසං, සබ්බේසානං |
| පං: | වි: | සබ්බම්හා, සබ්බස්මා | සබ්බේහි |
| ඡ: | වි: | සබ්බස්ස | සබ්බේසං, සබ්බේසානං |
| ස: | වි: | සබ්බම්හි, සබ්බස්මිං | සබ්බේසු |

### සබ්බා(සියලු) ස්ත්‍රීලිඞ්ගයෙහි

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | සබ්බා | සබ්බා, සබ්බායො |
| ආ: | වි: | සබ්බ | සබ්බා, සබ්බායො |
| දු: | වි: | සබ්බං | සබ්බා, සබ්බායො |
| ත: | වි: | සබ්බාය | සබ්බාහි |
| ච: | වි: | සබ්බස්සා, සබ්බාය | සබ්බාසං, සබ්බාසානං |
| පං: | වි: | සබ්බාය | සබ්බාහි |
| ඡ: | වි: | සබ්බස්සා, සබ්බාය | සබ්බාසං, සබ්බාසානං |
| ස: | වි: | සබ්බස්සං, සබ්බායං සබ්බාය | සබ්බාසු |

### සබ්බ(සියලු) නපුංසකලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨ: විඃ | සබ්බං | සබ්බෙ, සබ්බානි |
| ආ: විඃ | සබ්බ | සබ්බෙ, සබ්බානි |
| දු: විඃ | සබ්බං | සබ්බෙ, සබ්බානි |

සෙසු සියලු විබත්හි රූප පුංලිඞ්ගයෙහි මෙනි.

මේවායේ අර්ථ කියන සැටි ගුරුවරයා විසින් ඉගැන්විය යුතු.

**සබ්බ ශබ්දය මෙන් වරනැගෙන සබ්බනාම(සර්වනාම):**

කතර (දෙදෙනාගෙන් කවරෙක් ද?)

කතම (බොහෝ දෙනාගෙන් කවරෙක් ද?)

උභය (දෙදෙනා)

ඉතර (අනෙකා)

අඤ්ඤ (අන්‍යයා)

අඤ්ඤතර (එක්තරා)

අඤ්ඤතම (වැඩිදෙනාගෙන් එකෙක්)

**විශෙෂයෙක්**

82. **අඤ්ඤ, අඤ්ඤතර, ඉතර** යන ශබ්දවල ස්ත්‍රීලිඞ්ගික චතුර්ථී ෂෂ්ඨී ඒකවචනයෙහි

**අඤ්ඤිස්සා, අඤ්ඤතරිස්සා, ඉතරිස්සා** යි ද,

සත්තමී ඒකවචනයෙහි

**අඤ්ඤිස්සං, අඤ්ඤතරිස්සං, ඉතරිස්සං** යි ද

විශෙෂ රූප ඇති බව සිතට ගත යුතු.

**පුබ්බ** ශබ්දයේ පුංලිඞ්ග නපුංසකලිඞ්ග දෙක්හි සත්තමී විභත්ති ඒකවචනයෙහි **පුබ්බෙ** යි අධික රූපයෙක් ඇත. සෙසු හැම තැන ම සබ්බ ශබ්දය මෙනි. **පර**(අන්), **අපර**(අන්, බටහිරට අයත්), **දක්ඛිණ**(දකුණු), **උත්තර**(උතුරු), **අධර**(යට) යන ශබ්ද පුබ්බ ශබ්දය මෙන් වර නැඟේ.

නිර්ධාරණය

83. **දෙපා ඇත්තන් අතුරෙන් කවරෙක් අග්‍ර ද? සම්බුදු රජ දෙපා ඇතියන් අතුරෙන් අග්‍ර ය.** මෙසේ බොහෝ දෙනකුගෙන් එකක්හු තෝරා ගැන්ම **නිර්ධාරණය** නම්. එ තැන ඒ බොහෝ දෙනා පවසන පදය ඡට්ඨී හෝ සත්තමී විභත්තිවල බහුවචන-යෙන් සිටී. උඩ දැක්වුණු වැකි දෙක පාලියට නැඟුවිට සිටිනුයේ මෙසේ ය:

දිපදෙසු කතමො අග්ගො? සම්බුද්ධො දිපදෙසු අග්ගො.
දිපදානං කතමො අග්ගො? සම්බුද්ධො දිපදානං අග්ගො.

මෙහි **දිපදෙසු** යි සත්තමී බහුවචනයෙන් ද, **දිපදානං** යි ඡට්ඨී බහුවචනයෙන් ද බොහෝ දෙනා අඟවන පදයෝ සිටිත්.

84. **ගිජ්ඣකූටයට වඩා වින්ධ්‍යාව උස් ය.** මෙය පාලියෙන් සිටිනුයේ **ගිජ්ඣකූටම්හා(ගිජ්ඣකූටතො) විඤ්ඣො උච්චතරා** කියා ය. මෙ තැන උස් බැවින් වැඩිවූයේ වින්ධ්‍යාව ය. එහි **වඩා උස්** යන්න පවසන එහි විශෙෂණ පදය **උච්චතරා** යැ යි උච්ච(උස්) යන්නට **තර** ප්‍රත්‍යයය එක් ව හැදී ඇත. උසින් වැඩි වූයේ යමකට ද එය **ගිජ්ඣකූටම්හා(ගිජ්ඣකූටතො)** යි පංචමී විභත්තියෙන් සිටී. මෙසේ ම **මහාවාලිකා නදී වළවාය නදියා දීඝතරා(මහවැලි නදිය වළවේ නදියට වඩා දික් ය.)** වඩා උස් වඩා දික් ආදි වශයෙන් **වඩා** යන අර්ථය දීමට විශෙෂණයට **තර** ප්‍රත්‍යය එක් වැ හැදුණු පද යෙදේ. **තර** ප්‍රත්‍යය නැතිව ද ඒ අර්ථය ම දෙන **ජෙය්‍ය**(වඩා මහලු), **කණිය**(වඩා බාල), **සෙය්‍ය** (වඩා ප්‍රශස්ත) යන ශබ්ද ද ඇත. එහෙත් ඒ ටික දෙනෙකි.

**හිමාලය සියලු පර්වත අතුරෙහි උස් ම එක ය.** මෙය පාලියට නැඟුණු විට:

**හිමාලයො සබ්බෙසු පබ්බතෙසු උච්චතමො.** යි සිටී.
**හිමාලයො සබ්බෙසං පබ්බතානං උච්චතමො.** යි ද
මෙය පාලියට නැඟිය හැක්ක.

මෙසේ බොහෝ දෙනකු ගෙන් එකකු **උසස් ම ය** නැතහොත් **පහත් ම ය** යන ආදීන් වෙන් කොට දැක්වීමේදී එහි විශේෂණ පදය **තම** ප්‍රත්‍යයය එක් වැ සෑදේ. එය එක් නොවී හැදෙන **ජෙට්ඨ, සෙට්ඨ, කණිට්ඨ** ආදි පද කිහිපයෙක් ද ඇත. එහෙත් මේ **ජෙට්ඨ** යනු **වඩා මහලු, මහලු ම** යන අර්‍ථ දෙක්හි ම වැටේ. **සෙට්ඨ(වඩා ප්‍රශස්ත, ප්‍රශස්ත ම), කණිට්ඨ(වඩා බාල, බාල ම)** යන දෙක ද එසේ ම ය.

බොහෝ දෙනකු ගෙන් මෙසේ එකකු තෝරා වෙන් කිරීමේ දී ඒ බොහෝ දෙනා පවසන පදය සත්තමී විභත්ති බහුවචනයෙන් හෝ ඡට්ඨී විභත්ති බහුවචනයෙන් සිටී. උඩ දැක්වුණු නිදර්‍ශන දෙකින් එය සිතා ගත යුතු.

85. **නොමිනිස්, නොගොස්, නොකරන** මේවා පාලියට නැඟුණ විට **අමනුස්ස, අගන්ත්වා, අකරොන්ත** යි සිටිත්. **නො** යන අදහස දීමට **මනුස්ස** යන නාමපදයට ද, **ගන්ත්වා** යන පූර්‍වක්‍රියා-පදයට ද, **කරොන්ත** යන වර්‍තමානකාලික කෘදන්ත පදයට ද මුලින් **අ** යන්න යෙදී ඇත. එහෙත් **අනාගමන** (නො ඊම), **අනාගන්ත්වා**(නො අවුත්), **අනාගච්ඡන්ත**(නො එන) යන තැන්වල ආගමන, ආගන්ත්වා, ආගච්ඡන්ත යන පදවලට මුලින් **අන්** යන්න එක්කාසු වී තිබෙනු පෙනේ. මනුස්ස, ගන්ත්වා, කරොන්ත යන වචනවල මුල අකුරු වූ **ම, ග, ක** යනු ව්‍යඤ්ජනාක්ෂරයෝ ය. ඒවාට මුලින් **නො** යන අදහස දීමට එකතු කර ඇත්තේ **අ** යන්න ය. ආගමන ආදි වචන පටන්ගැනී ඇත්තේ **ආ** යන්නෙනි. එය ස්වරයෙකි. එයට මුලින් **නො** යන අදහස දීමට එක් වූයේ **අන්** යන්න යි. මෙසේ මෙබඳු තැන්වල **නො** යන අර්‍ථය දීමට ව්‍යඤ්ජනයෙන් පටන් ගැනෙන වචනවලට මුලින් **අ** යන්න ද, ස්වරයෙකින් පටන් ගැනෙන වචනවලට මුලින් **අන්** යන්න ද එකතු වන බව සිතට ගත යුතුයි. එහෙත් ආඛ්‍යාත ක්‍රියාවලට මුලින් මේවා එක් නො වෙත්. **නො** යන අදහස දීමට ඒවාට එක් වන්නේ **න** යන නිපාතය ය. **න ගච්ඡති**(නො යයි), **න ආගච්ඡති**(නො එයි) යන ආදි වශයෙනි.

## 86. නාම නිපාතය

මහා සුමනො නාම කුටුම්බිකො
(මහා සුමන නම් කෙළෙඹියෙක්).
මෙහි **නම්** යන අර්ථයෙහි **නාම** යන නිපාතය යෙදෙයි.

### ශබ්දමාලාව

### පුංලිඞ්ගික

හත්ථිනාග (ඇත්රජ)
පච්චය(ප්‍රත්‍යය, උපකාරය)
මච්චු(මරණය)
හිමවන්ත(හිමාලය)
දණ්ඩ(ලීය, දඬුවම)
මජ්ඣ(මැද)
කුමාරකස්සප(කුමරකසුප්තෙර)
සාමි, සාමික(සැමියා)
උච්චාසද්ද(උස් හඬ)
පබ්බත(පර්වතය)
යූප(රංචුව)
පරලොක(පර ලොව)
සංඛාර(සංස්කාර)

### නපුංසකලිඞ්ගික

කිච්ච(වැඩ, කටයුතු)
පාරිලෙය්‍යක(එනම් වනය)
මූල(මුල)
සකට(ගැල)
සාපතෙය්‍ය(සම්පත, ධනය)
අන්තර (අතර)
අමත(නිවන)
වණ්ණ(පැහැය)
අඬ්ඩ(අන්)
ථඬ්ඩ(කිරි)
භණ්ඩ(බඩුව)
ඛෙත්ත(කුඹුර)

### ඉත්ථිලිඞ්ගික

කතිකා(කතිකාව)
දෙවතා(දෙවියා)
දිසා (දිශාව, පැත්ත)
ඔසධී(ඔසධී නම් තරුව)
මහාවාලිකා(මහවැලි ගඟ)
සාඛා(අත්ත)
තාරකා(තරුව)
උපමා(උපමාව)
යක්ඛිනී(යකින්න)
මෙත්තා(මෛත්‍රිය)
සොණ්ඩා(හොඬය)
පොක්ඛරණී(පොකුණ)

## ක්‍රියා

පජහති(හැරදමයි) පුච්ඡති (විචාරයි)
පහාය(හැර) ආදියති (ගනී)
අපක්කමති (ඉවත්ව යයි) ආදය(ගෙන)
අපක්කම්ම(ඉවත්ව ගොස්) මොචයති(මුදයි)
පක්ඛන්දති(පනී, පැනයයි) සම්මජ්ජති (හමදී)
නිබ්බින්දති(කලකිරෙයි) පායෙති (පොවයි)
සඤ්ජානාති (හඳුනයි) ඔභාසෙති(බබලවයි)
තසති(තැතිගනී, බියවෙයි) පහරති(පහරී, මඩී)
හනති(හිංසා කරයි, නසයි) ඝාතයති(මරවයි)
භාවෙති(වඩයි)
තජ්ජෙති(සඝී, සැස්සාක්, මෙන් කෙරෙයි)
අධිගච්ඡති(පැමිණෙයි, අවබෝධ කරයි)
පටිජග්ගති(රැකබලාගනී, පෝෂිත කරයි, පරිහරණය කරයි)

## නිපාත

නෙව = න + එව(නො ම)
එකතො(එකට, එකතු ව)
යදා(යම් කලෙක, යම් විටෙක)
අථ(එ කලැ, එ විට)
ඉතොචිතො(ඒ මේ අත, ඇත මැත)

## විශෙෂණ

අභික්කන්ත(අභිකාන්ත වූ, ඉතා මනාප)
මහානුභාව(මහ තෙදැති)
මනුස්සභූත(මිනිස් වූ)
චිත්තකථී(විසිතුරු කථා ඇති)
විචක්ඛණ(නුවණ ඇති, පණ්ඩිත)
අග්ග(අග්‍ර)
අනිච්ච(අනිත්‍ය)
පුබ්බඞ්ගම(පෙරටු, ප්‍රධාන)

## ඇබැසිය

(අ) සිංහලයට නඟන්න.

1. අථ බො සො හත්ථිනාගො යූථා අපක්කම්ම යෙන පාරිලෙය්‍යකං වනං යෙන භගවා තෙනුපසංකමි.

2. සො හත්ථී ඉතො චිතො ඔලොකෙන්තො අඤ්ඤං කඤ්චි අදිස්වා රුක්ඛස්ස මූලං පාදෙන පහරන්තො තචෙඡත්වා සොණ්ඩාය සාඛං ගහෙත්වා සම්මජ්ජි.

3. අඤ්ඤෙ භික්ඛූ තෙහි සද්ධිං නෙව එකතො නිසීදන්ති න එකතො තිට්ඨන්ති.

4. එකස්මිං සමයෙ තෙ සකටෙහි භණ්ඩානි ආදය සාවත්ථිං ගන්ත්වා තත්ථ සාවත්ථියා ච ජෙතවනස්ස ච අන්තරෙ සකටානි මොචෙසුං.

5. ජෙට්ඨො භාතා කණිට්ඨං පක්කොසිත්වා ආහ “තාත, එතං සබ්බං සාපතෙය්‍යං පටිජග්ගාහී”ති.

6. එකො පුරිසො ථෙරං උපසංකමිත්වා සෙව භන්තෙ සබ්බෙහෙව භික්ඛූහි සද්ධිං මය්හං ගෙහෙ භික්ඛං ගණ්හාථා’ති ආහ.

7. අම්හෙසු යො පඨමං අමතමධිගච්ඡති සො ඉතරස්ස ආරොචෙතූ’ති තෙ කතිකං අකංසු.

8. සබ්බෙ තසන්ති දණ්ඩස්ස - සබ්බෙ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ

9. න සො සබ්බෙසු ඨානෙසු - පුරිසො හොති පණ්ඩිතො
ඉත්ථී’පි පණ්ඩිතා හොති - තත්ථ තත්ථ විචක්ඛණා

(ආ) පාලියට නඟන්න.

1. හෙතෙම ගෙහි ද කුඹුරෙහි ද සියලු වැඩ තෙමේ ම කරනුයේ සිය මව රැකබලා ගත්තේ ය.

2. යකින්න ඒ ස්ත්‍රියගෙන් දරුවා රැගෙන ඇය බලාහින්දදී ම කා එතැනින් නික්ම ගියා ය.

3. ඒ ස්ත්‍රී සැමියා සමඟ ආරාමය මැද මඟින් යන්නී විහාරයට නොදුරෙහි වූ පොකුණින් නා සැමියා නාන කල්හි තොමෝ දරුවාට කිරි පොවමින් පොකුණෑ තෙරැ සිටියා ය.

4. ඕ එන්නාවූ යකින්න දැක හැඳිනගෙන "සැමිය, සැමිය, වේගයෙන් එන්න, තෙල යකින්න එතැ" යි කියන්නී ම දරුවා ගෙන දුවන්නී විහාරය ඇතුළට පැන්නා ය.

5. භාග්‍යවතුන් වහන්සේ තමන්වහන්සේ ගේ විසිතුරු කථා ඇති සව්වන් අතුරෙන් කුමරකසුප් තෙර අග්‍රයැ යි වදළ සේක.

6. සියලු කඳු අතුරෙහි හිමවත් කන්ද උස් ම එක යි.

7. ලක්දිව නදීන් අතුරෙහි මහවැලි ගඟ දික් ම එක ය.

8. සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය වඩන්නේ ය(වැඩිය යුතු).

9. සියලු සත්ත්වයෝ මරණයේ දී තමන් සතු සියලු සම්පත් හැර දමා ම පරලොව යන්නාහ.

10. සියලු සංස්කාරයෝ අනිත්‍යහ යි යම් විටෙක නුවණින් දක්නේ ද එ විට දුකෙහි කලකිරෙයි.

* * *

# පාඩම 37

## සබ්බනාම(සර්වනාම)

### ඉදං(මේ) පුංලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | අයං(මෙ තෙම) | ඉමෙ(මොහු තුමූ) |
| දු: වි: | ඉමං(මොහු) | ඉමෙ(මොවුන්) |
| ත: වි: | ඉමිනා, අනෙන | ඉමෙහි, එහි |
| ච: වි: | ඉමස්ස, අස්ස | ඉමෙසං, එසං,<br>ඉමෙසානං, එසානං |
| පං: වි: | ඉමම්හා, ඉමස්මා<br>අම්හා, අස්මා | ඉමෙහි, එහි |
| ඡ: වි: | ඉමස්ස, අස්ස | ඉමෙසං, එසං,<br>ඉමෙසානං, එසානං |
| ස: වි: | ඉමම්හි, ඉමස්මිං<br>අම්හි, අස්මිං | ඉමෙසු, එසු |

### ඉදං(මේ) ස්ත්‍රීලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | අයං(මෝ තොමෝ) | ඉමා, ඉමායො<br>(මොහු තුමූ, මේ ස්ත්‍රීහු) |
| දු: වි: | ඉමං(මෑ) | ඉමා, ඉමායො<br>(මොවුන්, මේ ස්ත්‍රීන්) |
| ත: වි: | ඉමාය | ඉමාහි |
| ච: වි: | ඉමාය, ඉමිස්සා, අස්සා | ඉමාසං, ඉමාසානං,<br>ආසං, ආසානං |
| පං: වි: | ඉමාය | ඉමාහි |
| ඡ: වි: | ඉමාය, ඉමිස්සා, අස්සා | ඉමාසං, ඉමාසානං,<br>ආසං, ආසානං |
| ස: වි: | ඉමායං ඉමාය,<br>ඉමිස්සං, අස්සං | ඉමාසු, ආසු, |

### ඉදං(මේ) නපුංසකලිංගයෙහි

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | ඉදං, ඉමං | ඉමානි, ඉමෙ |
| දු: | වි: | ඉදං, ඉමං | ඉමානි, ඉමෙ |

සෙසු විබත්හි පුංලිංගයෙහි මෙනි.

### අසු(අසෝ, අසුවල්) පුංලිඞගයෙහි

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | අසු(අසවලා) | අමූ(අසුවල්ලු) |
| දු: | වි: | අමුං | අමූ |
| ත: | වි: | අමුනා | අමූහි |
|ච: | වි: | අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| පං: | වි: | අමුම්හා, අමුස්මා | අමූහි |
| ඡ: | වි: | අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| ස: | වි: | අමුස්මිං, අමුම්හි | අමූසු |

### අසු(අසෝ, අසුවල්) ස්ත්‍රීලිඞගයෙහි

| | | ඒකවචන | බහුවචන |
|---|---|---|---|
| ප: | වි: | අසු | අමූ, අමුයො |
| දු: | වි: | අමුං | අමූ, අමුයො |
| ත: | වි: | අමුයා | අමූහි |
| ච: | වි: | අමුයා, අමුස්සා | අමූසං, අමූසානං |
| පං: | වි: | අමුයා | අමූහි |
| ඡ: | වි: | අමුයා, අමුස්සා | අමූසං, අමූසානං |
| ස: | වි: | අමුයං, අමුස්සං | අමූසු |

### අසු(අසෝ, අසුවල්) නපුංසකලිඞ්ගයෙහි

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප: වි: | අදුං | අමූ, අමූනි |
| දු: වි: | අමුං | අමූ, අමූනි |

සෙස්ස පුංලිඞ්ගයෙහි මෙනි.

### අර්ථ

අසු(අසෝ පුරුෂයා) අමූ(අසවල්ලු)

සෙසු තන්හි ද මේ නයින් ම අර්ථ ගත යුතු.

### උභ(දෙදෙනෙක්, දෙකක්)

උභ ශබ්දය වරනැගෙනුයේ බහු වචනයේ පමණි. ලිඞ්ග තුනෙහි එක් සමයි.

ප: වි: උභො, උභෙ(දෙදෙනා, දෙක)

ආ: වි: හෙ උභො, උභෙ(දෙදෙනෙක් ජනයෙනි)

දු: වි: උභො, උභෙ(දෙදෙනා, දෙක)

ත: වි: උභොහි, උභෙහි(දෙදෙනා කාරණ කොට, දෙකින්)

ච: වි: උභින්නං(දෙදෙනාට, දෙකට)

පං: වි: උභොහි (දෙදෙනා ගෙන්, දෙකෙන්)

ඡ: වි: උභිනනං(දෙදෙනා ගේ)

ස: වි: උභොසු(දෙදෙනා කෙරෙහි, දෙකෙහි)

**මොවුන් විශෙෂණ ව යෙදෙන සැටි:**

උභො පුරිසා (දෙදෙනෙක් පුරුෂයෝ)

උභො ඉත්ථියො (දෙදෙනෙක් ස්ත්‍රීහු)

උභො ඵලානි (ගෙඩි දෙක)

උභොසු පුරිසෙසු(පුරුෂයන් දෙදෙනා කෙරෙහි)

උභොසු ඉත්ථිසු (ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි)

උභොසු ඵලෙසු (ගෙඩි දෙකෙහි)

87. **යාව(තෙක්, දක්වා)** යන නිපාත පංචමීවිභත්තික පද හා යෙදේ. **යාව නිබ්බානා(නිවන තෙක්).**

# ශබ්දමාලාව

## පුංලිඞ්ගික

අත්ථ(ප්‍රයෝජනය, අභිවෘද්ධිය) සප්පාය(යෝග්‍ය ද)
සත්තසාර(ශ්‍රෙෂ්ඨ සත්ත්වයා) නරුත්තම(උතුම් මිනිසා)
භෙද(බිඳීම) නරපති(රජ)
විපල්ලාස(විපර්‍යාසය, පෙරැළිය) ආවාස(වාසස්ථානය)
සන්ත(සත්පුරුෂයා) මෙත්තෙය්‍ය(මෛත්‍රෙය)

## ස්ත්‍රීලිඞ්ගික

භූමි (බිම) වුද්ධි(දියුණුව)
බොධි(බුදුබව) බාහා(අත)
නිබ්බානපත්ති(නිවන් ලැබීම) කිරියා (ක්‍රියාව)
උතු (ඍතුව) සංබලිකා(මාංචුව, යදම)

## නපුංසකලිඞ්ගික

උදක(දිය) රට්ඨ(රට)
වට්ටදුක්ඛ(සසර දුක) බාල්‍ය(බාල වයස)
සිප්ප(ශිල්ප) චිත්තක(දර සෑය)
වත්ථ(වස්ත්‍ර)

## විශෙෂණ

තදුපිය(එයට සෑහෙන පමණ වූ) නිරාස(ආශාව දුරැලූ)
අනීඝ(පව් නැති) පච්චෙක (වෙන් වෙන් වූ)
විසල්ල(කෙලෙස් උල් නැති) දුග්ගත(දුගී, දිළිඳු)

## නිපාත

පච්ඡා(පසුව)
පට්ඨාය(පටන් කොට)
අථ(නැවත, ඉන්පසු, එ කලැ, ඉක්බිති)
කථං(කෙසේ ද?)
බහි(එළියට, පිටත)
තතො'ව (තතො එව) එතැනින් ම
අහොවත(ඉතා යෙහෙක, කොතරම් හොඳ ද!)

## ක්‍රියා

නිමුජ්ජති(ගිලෙයි)

මුච්චති(මිදෙයි)

පයාති(යයි)

පායාසි(ගියේ ය)

මොචෙති(මුදයි)

සංවත්තති(පවතී)

අධිගච්ඡති(ලබයි, අවබෝධ කරයි)

අජ්ඣගමී(ලැබී, අවබෝධ කෙළේ ය)

කිත්තයති(පවසයි, පසසයි)

විවරති(විවෘත කරයි, අරී)

අත්‍ථං චරති(වැඩ සිදුකරයි)

සක්කුනාති(හැකි වෙයි)

උම්මුජ්ජති(මතු වෙයි)

පක්කමති(නික්ම යයි)

සික්ඛති(උගනී)

නාදසිං - න අදසිං(නො දුන්නෙමි, අවසර නො දුනිමි)

පග්ගණ්හාති(ඔසොවා ගනී)

පග්ගයහ(ඔසොවා ගෙන)

බාහා පග්ගයහ(ඉසැ අත් බැඳගෙන)

පරියාදියති(සර්වප්‍රකාරයෙන් ඇදගනී,

පරියාදය - සර්වප්‍රකාරයෙන් ඇදගෙන)

## (අ) සිංහලයට නඟන්න.

1. හෙ පුරිස, සචෙ සක්කුණෙය්‍යාසි ත්වං ඉමිස්සං නදියං ඉමස්මිං ඨානෙ උදකෙ නිමුජ්ජිත්වා අඤ්ඤස්මිං ඨානෙ උම්මුජ්ජිත්වා තතො'ව පක්කමෙය්‍යාසි.

2. සචෙ නරපති ධම්මෙන රට්ඨං පාලෙය්‍ය තත්ථ උතූනං විපල්ලාසො න භවෙය්‍ය.

3. හෙ සූද, ත්වං ඉමිස්සා ධීතුයා සද්ධිං තත්‍ර ගන්ත්වා ඉමාසං කුමාරිකානං ච ඉමෙසං කුමාරානං ච අත්ථාය භත්තං ච තදුපියං ව්‍යංජනං ච පටියාදෙය්‍යාසි.

4. යදි ඉමෙ අස්මිඤ්ඤෙව බාල්‍යෙ සිප්පානි සික්ඛෙය්‍යුං අථ පච්ඡා මහන්තිං වුද්ධිං පාපුණෙය්‍යුං.

5. අහො වතාහං අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යාමි සමණධම්මං ච සම්මා පූරෙය්‍යාමි තෙන ඉමම්හා වට්ටදුක්ඛම්හා ච මුච්චෙය්‍යාමි.

6. භන්තෙ, යදි තුම්හෙ සප්පායං න කරෙය්‍යාථ අජ්ජ පට්ඨාය අසුකො වෙජ්ජො මය්හං තෙලං පචී'ති මා කස්සචි'පි වදිත්ථ.

7. භන්තෙ, ඉදං දිස්වා අහං තුම්හාකං පබ්බජිතුං නාදසින්ති කණිට්ඨො කුටුම්බිකො තස්ස පාදමූලෙ පතිත්වා රුදමානො ආහ.

8. සා "මය්හං උභො'පි පුත්තා කාලමකංසු, සාමිකො ච අන්තරාමග්ගෙ කාලමකාසි, ගෙහෙ ච මම පිතා මාතා භාතා ච එකස්මිඤ්ඤෙව චිතකෙ ඩය්හන්තී"ති බාහා පග්ගය්හ කන්දන්තී ඉතො චිතො ච ධාවන්තී ජෙතවනං පත්වා යෙන භගවා තෙනුපසංකමී.

9. සො ඉමස්ස කථං සුත්වා අමුත්‍ර ගන්ත්වා අමුස්ස භාසති අමුස්ස භෙදය, අමුස්ස ච කථායො සුත්වා ඉධාගන්ත්වා ඉමස්ස භාසති ඉමස්ස භෙදය.

10. සප්පුරිසො පන අත්තනො ච පරස්ස චෙති උභින්නමෙව අත්ථං චරති.

11. අමුස්මිං ආවාසෙ බහූ ථෙරා භික්ඛූ වසන්තී'ති සුත්වා ථෙරො කෙනචි අන්තෙවාසිකෙන භික්ඛුනා සද්ධිං තහිං අගමාසි.

12. අමුස්සා කුමාරියා මාතා අත්තනො සාමිකෙන සද්ධිං කලහං කත්වා ගෙහම්හා නික්ඛමන්තී රුදමානං අඞ්ගණෙ තිට්ඨන්තං ජෙට්ඨං ධීතරං දිස්වා අක්ඛීහි අස්සූනි මොචෙසීති අයං පුරිසො ආහ.

13. ඉමිස්සා දුග්ගතාය කඤ්ඤාය ච භූමියං තත්‍ර නිපජ්ජන්තස්ස ඉමිස්සා භාතුනො චාති උභින්නම්පි ඉමානි උභො වත්ථානි දෙථ.

14. ඉමිනා කුසලෙන කම්මෙන කදාචිපි මෙ බාලෙහි සමාගමො මා හොතු, සබ්බදා යාව නිබ්බානස්ස පත්තියා සතං සමාගමො යෙව හොතු.

15. යෙ සත්තසාරා අනීඝා නිරාසා
පච්චෙකමෙවජ්ඣගමිංසු බොධිං
තෙසං විසල්ලානං නරුත්තමානං
නාමානි මෙ කිත්තයතො සුණාථ.

## (ආ) පාලියට නඟන්න.

1. භවත, ඔබ තම ශරීරයට සාත්තු නො කරන්නාහු නම්, මම් කෙසේ නම් ඔබට පිළියම් කරන්නෙම් ද?

2. අපි දැහැමෙන් සෙමෙන් ජීවිකාව කරන්නමෝ නම් අපේ සතුරෝ ද අප හා මිතුරු වන්නාහ.

3. මේ දිනවල මගේ සොහොයුරා අසෝ නම් තැන ඉඳිතැයි කියන්නට දන්නා කිසිවෙක් මේ ගෙහි නැද්ද?

4. පෙරැ මෙ ගමට නො දුරු වනයේ ගුහාවෙක ඎද්ධි ඇති තවුසෙක් විසී යැයි ඇසිමි. තව ම එ තවුසා එහි වෙසෙයි ද?

5. මේ තුන් මසැ මේ විහාරයෙහි වස් එළැඹෙමි. මෙහි වස් එළැඹෙමි.

6. මේ ගෙහි වසන්නා වූ මගේ දරුවන් එක් යකින්නක් අවුත් කයි. එ බැවින් මෙ වර මෙහි නො වැස මගේ මවගේ ගෙට යන්නෙම් නම් ඉතා යෙහෙකැයි ඒ ස්ත්‍රී තමාගේ සැමියාට සැළකළාය.

7. මේ සමයෙහි යම් කෙනෙක් පවින් වැළැකැ පින් කරන්නාහු ද ඔහු මතු පහළ වන මෛත්‍රෙය බුදුරජාණන් වහන්සේ දකින්නට හැකි වන්නාහ යි සිතමි.

8. මේ මහණ කෙරෙහි අප සෙනෙවියා ගේ බිරිය බොහෝ සෙයින් පැහැදුණා ය.

9. මව ද පියා ද යන දෙදෙනා බලා හින්දැදී ම රාජපුරුෂයෝ අවුත් ඔවුන් ගේ දරුවන් දෙදෙනා ම යදමින් බැඳ රජු ඉදිරියට ගෙන ගියා හ.

10. මහණෙනි, මේ ස්ත්‍රී රූපය යම්සේ ද එසේ පුරුෂයා ගේ සිත සර්වප්‍රකාරයෙන් ඇදගෙන සිටින්නට සමත් අන් එක ද රූපයක් මම් නො දකිමි.

* * *

# පාඩම 38

## සඞ්ඛ්‍යාවාචී ශබ්ද

එක 1
ද්වි 2
ති 3
චතු 4
පඤ්ච 5
ඡ 6
සත්ත 7
අට්ඨ 8
නව 9
දස 10
එකාදස 11
ද්වාදස 12
තෙරස 13
චුද්දස 14
පණ්ණරස 15
සොළස 16
සත්තරස 17
අට්ඨාරස 18
එකූනවීසති 19
වීසා, වීසති 20
එකවීසති 21
ද්වාවීසති 22
තෙවීසති 23
චතුබ්බීසති 24
පඤ්චවීසති 25
ඡබ්බීසති 26
සත්තවීසති 27
අට්ඨවීසති 28
එකූනතිංසති 29
තිංසා, තිංසති 30
එකතිංසති 31
ද්වත්තිංසති 32
තෙත්තිංසති 33
චතුත්තිංසති 34
පඤ්චතිංසති 35
ඡත්තිංසති 36
සත්තතිංසති 37
අට්ඨතිංසති 38
එකූනචත්තාළීසති 39
චත්තාළීසා, චත්තාළීසති 40
එකචත්තාළීසති 41
ද්වාචත්තාළීසති 42
තිචත්තාළීසති 43
එකූනපණ්ණාසා 49
පණ්ණාසා 50
එකපණ්ණාසා 51
සට්ඨි 60
සත්තති 70
අසීති 80
නවුති 90
සත 100
සහස්ස 1,000
දසසහස්ස 10,000
ලක්ඛ, සතසහස්ස 100,000
කොටි 10,000,000
දසකොටි 100,000,000

**මේවා වරනැඟෙන සැටි දැක්වේ:**

88. **එක** ශබ්දය ලිඞ්ග තුනෙහි ම වරනැඟේ.

**එකො පුරිසො**(එක් පුරුෂයෙක්), **එකා ඉත්ථී**(එක් ස්ත්‍රියක්) **එකං වත්ථං**(එක් වස්ත්‍රයක්), **එකෙ පුරිසා**(සමහර පුරුෂයෝ) යන ආදීන් විශේෂණ ව යෙදේ.

89. **ද්වි** ශබ්දය පටන්කොට **අට්ඨාරස**(18) ශබ්දය තෙක් සියලු සඞ්ඛ්‍යාවාචක ශබ්ද බහු වචන ම ය. **ද්වි** ශබ්දය ලිඞ්ග තුනෙහි ම එක සමාන ව වරනැඟේ. **ති චතු** ශබ්ද දෙක ලිඞ්ග තුනෙහි එකෙක් අනෙකට මඳක් වෙනස් ව වරනැඟේ. එයින් එහා **ඡ සත්ත** ආදි සියලු ශබ්ද ලිඞ්ග තුනෙහි ම එක් සම ව නාමයට විශේෂණ වැ සිටිති.

| | **ද්වි(දෙ)** | | **ති(තුන්)** | |
|---|---|---|---|---|
| | **තුන්ලිඟුහි** | **පුං.** | **ස්ත්‍රී** | **නපුං.** |
| **ප./ආ./ද්‍ු.** | දෙව | තයො | තිස්සො | තීණි |
| **ත./ප.** | ද්වීහි | තීහි | තීහි | තීහි |
| **ච./ඡ.** | ද්වින්නං | තිණ්ණං | තිස්සන්නං | තිණ්ණං |
| **ස.** | ද්වීසු | තීසු | තීසු | තීසු |

**චතු(සිවු)**

| | **පුං.** | **ස්ත්‍රී** | **නපුං.** |
|---|---|---|---|
| **ප./ආ./ද්‍ු.** | චත්තාරො,චතුරො | චතස්සො | චත්තාරි |
| **ත./ප.** | චතූහි | චතූහි | චතූහි |
| **ච./ඡ.** | චතුන්නං | චතස්සන්නං | චතුන්නං |
| **ස.** | චතූසු | චතූසු | චතූසු |

**පඤ්චව(පහ)**

තුන් ලිඞ්ගයෙහි ම එක් සම ය.

| | |
|---|---|
| **ප./ආ./ද්‍ු.** | පඤ්චව |
| **ත./ප.** | පඤ්චවහි |
| **ච./ඡ.** | පඤ්චවන්නං |
| **ස.** | පඤ්චවසු |

**ඡ** ශබ්දයේ සිට **අට්ඨාරස** ශබ්දය තෙක් සියලු සඞ්ඛ්‍යා ශබ්ද **පඤ්චව** ශබ්දය මෙන් වරනැඟේ.

**90. වීසති** ශබ්දය පටන් කොට **නවුති** ශබ්දය තෙක් සියලු ශබ්ද සත්‍රීලිඞ්ගික ඒකවචන ව වරනැඟේ. වීසති ශබ්දය ඉකාරාන්ත සත්‍රීලිඞ්ගික ය. එ බැවින් ඒ වීසති, තිංසති ආදි ඉකාරාන්ත සඞ්ඛ්‍යාවාචී ශබ්ද යට 30 වැනි පාඩමේ දැක්වෙන රත්ති ශබ්දයේ ඒකවචන රූප මෙන් වරනැඟේ.

වීසා, තිංසා, චත්තාළීසා, පඤ්ඤාසා යන ආකාරාන්තයෝ යට 29 වන පාඩමේ දැක්වූ වනිතා ශබ්දයේ ඒකවචන රූප මෙන් වරනැඟෙත්. ඒකවචනයෙහි වරනැඟුණත් බහ්වර්ථයක් දෙන බැවින් බහුවචනයෙන් සිටින නාමයනට විශේෂණ වෙත්. මෙසේ ය :

> වීසති පුරිසා(විසිදෙනෙක් පුරුෂයෝ)
> වීසතිං මනුස්සෙ(විසිදෙනකු මිනිසුන්)
> වීසතියා පුරිසෙහි(විසිදෙනකුන් මිනිසුන් කරණකොට)
> වීසතියං මනුස්සෙසු(විසිදෙනෙකුන් මිනිසුන් කෙරෙහි)
> වීසා පුරිසා(විස්සක් පුරුෂයෝ)
> වීසායං පුරිසෙසු(විසිදෙනකුන් මිනිසුන් කෙරෙහි)

**91. සත, සහස්ස** යන ශබ්ද නපුංසකලිඞ්ගික යි. ඵල ශබ්දය සේ වරනැඟෙයි. මේවාට **ද්වි, ති** ආදි ශබ්ද මුලට එකතු කළ විට **ද්විසත**(දෙසියය), **තිසත**(තුන්සියය), **පඤ්චසහස්ස**(පන්දහස) යැ යි ඒකවචනයෙහි වරනැඟුණත් බහුවචනාන්ත නාමයනට විශේෂණ ව සිටී.

> සතං මනුස්සා(මිනිස්සු සියදෙනෙක්)
> සතස්ස මනුස්සානං(මිනිසුන් සියයකට)

සත ආදි මේ සඞ්ඛ්‍යාවාචක ශබ්ද බහුවචනයෙන් සිටි විට **සිය ගණන්, දහස් ගණන්** යන අර්ථ ලැබේ. සතානි පඤ්ච, සතානං පඤ්ච(සිය පසෙක්).

**92. විශේෂ රූප**

දියඩ්ඪ(එකහමාර) තියඩ්ඪ(දෙකහමාර)
අඩ්ඪතිය(දෙකහමාර) අඩ්ඪුඩ්ඪ(තුනහමාර)
දියඩ්ඪසතං(එකහමාර සියයෙක් හෙවත් එක්සිය පනසෙක්)
අඩ්ඪතියසහස්සං(දෙදහස් පන්සියයෙක්)
අඩ්ඪුඩ්ඪසහස්ස(තුන්දහස් පන්සියයෙක්)

## 93. සඞ්ඛ්‍යාපූරණ විශේෂණ:

| පුංලිඞ්ග නපුංසකලිඞ්ග දෙක්හි | සත්‍රීලිඞ්ගයෙහි |
|---|---|
| පඨම (පළමුවන) | පඨමා(පළමුවන) |
| දුතිය (දෙවෙනි) | දුතියා |
| තතිය (තෙවෙනි) | තතියා |
| චතුත්‍ථ (සතරවන) | චතුත්‍ථී |
| පඤ්චම(පස්වන) | පඤ්චමී |
| ඡට්ඨ (සවන) | ඡට්ඨී |
| සත්තම(සත්වන) | සත්තමී |
| අට්ඨම (අටවන) | අට්ඨමී |
| නවම (නවවන) | නවමී |
| දසම (දශවන) | දසමී |
| එකාදස, එකාදසම (එකොළොස්වන) | එකාදසී, එකාදසමී |
| ද්වාදස, ද්වාදසම (දෙළොස්වන) | ද්වාදසී, ද්වාදසමී |
| වීසතිම, වීසතිතම (විසිවන) | වීසතිමී, වීසතිතමී |
| සතම, සතතම (සියවන) | සතමී, සතතමී |

මෙහි පුංලිඞ්ගික පඨම දුතිය ආදි ශබ්ද පුරිස ශබ්දය මෙන් ද, නපුංසකලිඞ්ගික වූ එකී ශබ්ද ඵල ශබ්දය මෙන් ද සත්‍රීලිඞ්ගික පඨමා දුතියා ආදිහු වනිතා ශබ්දය මෙන් ද වරනැඟෙති.

## 94. සඞ්ඛ්‍යා ශබ්දවලින් හැදෙන ක්‍රියා විශේෂණ:

එකධා(එක පරිද්දෙන්)
ද්විධා(දෙපරිද්දෙන්)
තිධා(තුන් පරිද්දෙන්)
එකසො(එකින් එක)
පඤ්චසො(පසින් පස, පහ බැගින්)
එකක්ඛත්තුං(එක්වරක්)
ද්වික්ඛත්තුං(දෙවරක්)
තික්ඛත්තුං(තුන්වරක්)

# ශබ්දමාලාව

## පුංලිඞ්ගික

දසරථ(එනම් රජ)
රාම(එනම් රජ කුමරු)
උපාය(උපාය, මඟ, ක්‍රමය)
මුචලින්ද(එනම් නාරජ)
නාගරාජ(නා රජ)
පාඨ(පාඩම)
සෙස(ශේෂය)
පචචනත ගාම(පසල් ගම)
අචචය (ඇවෑම, ගතවීම)
උපදදව(උවදුර)
භොග(සජීකඥ, දරනය, ධනය, වසතු සමපත)

මහාසාවක(මහසවු)
සාරිපුතත(සැරියුත් තෙර)
මොගගලලාන(මුගලන් තෙර)
උපකාර(උදව්ව)
යකඛ(යකා
කපප(කල්පය)
භාග(කොටස)
සතථසදසද(ශාසතෘපදයා)
උපටඨාක(උපසථායකයා)
සර(හඬ)

## සත්‍රීලිඞ්ගික

කචඡා(පඞ්ක්තිය)
සූරතා(ශූර බව)
එණා(පෙණය)
ජාති(උපත)
කුටි(කුටිය, කිළිය)
ගාවී(එළදෙන)
කාලකිරියා(මරණය)

කදලී(කෙසෙල් ගස)
ආපද(විපත)
පතිටඨා(පිහිට)
කුවණණා(කුවේණි)
පුණණමී(පුණුපෝ ද)
මහෙසී(මෙහෙසී, බිසොව)

## නපුංසකලිඞ්ගික

රජජ(රජකම, රාජ්‍යය)
රටඨ(රට)
වසස(වර්ෂය)
සුමනකූට(සමනොළ)
වරං(වරය, විශේෂ අවසරය)
කමමං(කර්මාන්තය, වැඩ)

ථල(ගොඩබිම)
සාහය්‍ය(උදව්ව)
අමබ(අඹ)
කලියුග(කලියුගය)
වෙසාඛමාස(වෙසක් මස)
පාතුභාව(පහළ වීම)

## නිපාත හා ක්‍රියා විශෙෂණ

අනනමසො(අඩුම ගණනේ, යටත් පිරිසෙයින්)
උපරි(මත්තෙහි)
පුරෙතරං(කල්තබා මැ, බොහෝ කලින්)

## පූර්වක්‍රියා

නික්ඛමම(නික්මැ) ආදය(ගෙන)

## ක්‍රියාපද

පතිට්ඨාපෙති(පිහිටුවයි)
විභජති, භාජෙති(බෙදයි)
පබ්බාජෙති(නෙරපයි, පිටතට යවයි)
රොහති (වැඩෙයි, නැඟෙයි)
චින්තෙති(සිතයි)
පයොජයති(යොදයි)
ආරාධෙති(සිත්ගනී, සතුටු කරයි)
නිධාපෙති(නිදහස් කරයි)
වෙඨෙති(වෙළයි)
පාලෙති(පාලනය කරයි)
නිලීයති(සැඟෙවෙයි)
පහවති(හටගනී, ගලාබසී)
පඨති(පාඩම් කරයි, කියවයි)
ආහිණ්ඩති(හැවිදී)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. තසා ඉත්ථියා පුතෙතසු දුතියො අමහාකං පාඨසාලායං තතියායං කච්ඡායං සිකඛති.
2. රඤෙඤා ධීතුසු ජෙට්ඨා අගාරා නිකඛමම භිකඛුණීසු පබබජි.
3. තෙසු චතුසු චොරෙසු චතුත්ථො ගහපතානියා ආභරණානි ආදය පලායි, ඉතරෙ තයො අටවියං නිලීයිංසු.

4. දසරථසස රඤෙඤා දුතියා මහෙසී අතතනො පුතතං රජෙජ පතිටඨාපෙතුං පතෙථනතී අගගමහෙසියා පුතතං රාමකුමාරං රටඨමහා පබබාජෙතුං උපායං චිනෙතනතී මඤෙඤව සයී.

5. ඉමෙසු දවාදසසු සෙනාපතීසු ජෙටඨො අතතනො සූරතාය රඤෙඤා චිතතං ආරාධෙසි.

6. මුචලිනෙද නාගරාජා භගවතො කායං සතතකඛතතුං භොගෙහි වෙඨෙතවා උපරි මුදධනි ඵණං කතවා අටඨාසි.

7. ඉමසමිං කපෙප පඤච සමමාසමබුදධා හොනති, තෙසං චතුතෙථා අමහාකං සමමාසමබුදෙධා සිදධතෙථා ගොතමො, පඤචමො පන අනාගතෙ උපපජජමානො මෙතෙතයෙයා තථාගතො.

8. සිදධතෙථා රාජා ජාතියා එකූනතිංසෙ වසෙස සකලං රජජං පහාය අගාරමහා නිකඛමම අනගාරියං පබබජි.

9. සුමනකූටතො චතසෙසා නදියො පභවනති, යාසං මහාවාලිකා නදි දීඝතමා.

10. සෙටඨී න චිරසසං යෙව අතතනො කාලකිරියා භවිසසතීති ඤතවා සබබමෙව අතතනො සනතකං ධනං පඤචධා විභජිතවා පඤචනනං පුතතානං අදාසි.

11. ඉමෙ චතතාරො ජනා අරඤඤං ගනතවා තතථ වසනතානං චතුනනං භිකඛූනං චතසෙසා කුටියො කතවා අදංසු.

12. දසරථො රාජා අතතනො තීසු දෙවීසු දුතියාය එකං වරං අදාසි.

13. කදලියො පන ලඬකායං සබෙබසු'පි නවසු පදෙසෙසු රොහනති.

14. තුමෙහ අමූහි රජජූහි ඉමා තිසෙසා ගාවියො බනධිතවා මම වජං නෙථ.

15. භොගං චතුධා විභජෙයය එකං භාගං පරිභුඤෙජයය. දවීහි භාගෙහි කමමං පයොජෙයය. චතුතථං පන නිධාපෙයය සො ආපදාසු පතිටඨා භවිසසති.

16. ඉමිසසා පඨවියා තීසු භාගෙසු දෙව භාගා උදකං එකො භාගො ථලනති සතථඤඤුනො වදනති.

(ආ) පාලියට නඟන්න.

1. උපසථායකයන් අතුරෙන් අනඳ තෙරණුවෝ අග්‍රහ යි දවසෙක භාග්‍යවතුන් වහන්සේ වදළසේක.

2. විජය කුමරු සත් සියයක් යෝධයන් කැටුව මේ ලක්දිවට පැමිණ කුවේනිය ගේ උදව්වෙන් සියලු යක් රජුන් මරා රජ වූයේ ය.

3. භාග්‍යවතුන් වහන්සේ ගේ අසූවක් මහ සව්වන් අතුරෙන් සැරියුත් ද මුගලන් ද යන දෙ නම අගසවු වූහ.

4. මේ අඹ සතර කොටසකට බෙද එක් පංගුවක් මට දෙන්න, ඉතිරි භාග තුන ඔබ තුන්දෙනා අතුරෙහි බෙදගන්න.

5. අප ගමේ විදුහලේ සිසුන් අතුරෙන් අටසියයෙක් පිරිමි ළමෝ ය, දෙසියපනසෙක් ගැහැනු ළමෝ ය.

6. දරුවනි, තෙපි මේ පාඩම අඩු මැ ගණනේ දහවරක් කියවන්න.

7. කලියුග වර්ෂයෙන් 2503 වන වර්ෂයෙහි වෙසක් මසැ පුණු පොහෝ දිනයෙහි අප බෝසතාණෝ ශාක්‍ය දේශයේ කපිලවත්‍ථු පුරයට නොදුරු ලුම්බිණී වනයෙහි දී මව කුසින් උපන්හ.

8. මව තුන්වරක් ම "නො යව" යි කියද්දීත් හේ ගෙයින් නික්මැ යන්නේ එක් පසල් ගමකට පැමිණියේ ය.

9. රජහු අධර්මයෙන් රට පාලනය කරන කල්හි මැතිහු නොදැහැමි වෙත්, ඔවුන් නො දැහැමිවන කල්හි සෙසු ජනතාව ද නොදැහැමි වේ. මෙසේ හැම තැනම අධර්මය දීප්ත වන කල්හි ධර්මය පිරිහෙන කල්හි නන්වැදෑරුම් උවදුරු ඇති වන්නේ ය.

10. බුදුකෙනකු පහළවන්නට වර්ෂ දහසකට කලින් කිසි දෙවියෙක් "තව වසර දහසක් ඇවෑමෙන් බුදුවරයෙක් ලොවැ පහළ වන්නේ ය. උන්වහන්සේ දක්නට පින් කරවු පවින් වැළැකෙවු"යැ යි උස් හඬින් කියමින් ලොව හැම තැන ම හැවිදුනේ ය.

* * *

## ආඛ්‍යාතික ක්‍රියා

**95.** ආඛ්‍යාතික ක්‍රියා හැදීමට එක්කැරෙන විභක්ති ප්‍රත්‍යයයෝ වර්ගී දෙකකට අයත් හ. ඔහු පරස්සපද පච්චය(පරස්මෛපද ප්‍රත්‍යය) අත්තනොපද පච්චය(ආත්මනෙපද ප්‍රත්‍යය) නම් වෙත්. මෙතෙක් දුර උගන්වන ලද්දාහු පරස්සපද ප්‍රත්‍යයයන් එක් වැ හැදෙන ආඛ්‍යාතික ක්‍රියා රූපයෝ ය. පාලි පොත්හි වැඩිපුර දක්නට ලැබෙන්නෝත් ඔහු ය. වැඩිපුර පද්‍යයෙහි(ගාථාවන්හි) ද කිසි තැනෙක ගද්‍යයෙහි ද අත්තනොපද ප්‍රත්‍යයයන් එක් වැ හැදෙන ක්‍රියා රූප දක්නා ලැබේ. මේ පාඩමෙහි ඒ දෙවගේ ම දැක්වේ.

### වත්තමානා විභත්ති

| | පරස්සපද පච්චයා | | අත්තනොපද පච්චයා | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| පඃ පුඃ | ති | (අ)න්ති | තෙ | (අ)න්තෙ |
| මඃ පුඃ | සි | ථ | සෙ | ව්හෙ |
| උඃ පුඃ | මි | ම | එ | ම්හෙ |

### පඤ්චමී විභත්ති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| පඃ පුඃ | තු | (අ)න්තු | තං | (අ)න්තං |
| මඃ පුඃ | හි | ථ | ස්සු | ව්හො |
| උඃ පුඃ | මි | ම | එ | ආමසෙ |

### සත්තමී විභත්ති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| පඃ පුඃ | එ, එය්‍ය | එය්‍යුං | එථ | එරං |
| මඃ පුඃ | එය්‍යාසි | එය්‍යාථ | එථො | එය්‍යව්හො |
| උඃ පුඃ | එය්‍යාමි | එය්‍යාම | එය්‍යං | එය්‍යාම්හෙ |

## අජ්ජතනී විභත්ති

| | | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|---|
| | | එක | බහු | එක | බහු |
| ප: | පු: | ඊ | උං, ඉංසු | ආ | ඌ |
| ම: | පු: | ඔ, ඊ | (ඉ)ත්ථ | සෙ | වහං |
| උ: | පු: | ඉං | (ඉ)මහා | අං | මෙහ |

## හීයත්තනී විභත්ති

| | | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|---|
| | | එක | බහු | එක | බහු |
| ප: | පු: | ආ | ඌ | ත්ථ | ත්ථුං |
| ම: | පු: | ඔ | ත්ථ | සෙ | ව්හං |
| උ: | පු: | අ, අං | මහා | ඉං | මහසෙ |

## භවිස්සන්ති විභත්ති

| | | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|---|
| | | එක | බහු | එක | බහු |
| ප: | පු: | ස්සති | ස්සන්ති | ස්සතෙ | ස්සන්තෙ |
| ම: | පු: | ස්සසි | ස්සථ | ස්සසෙ | ස්සව්හෙ |
| උ: | පු: | ස්සාමි | ස්සාම | ස්සං | ස්සාමහෙ |

දැන් මේ ප්‍රත්‍යයයන් එක් වැ හැදුණු ක්‍රියා දැක්වේ.

96. අජ්ජතනී, හීයත්තනී විභත්තිවලදී ක්‍රියාවේ මුලට අකාර-යෙක් ද සමහර විට එක්වේ.

## ධාතුව පච්(පිසීමෙහි), අඞ්ගය පච
## වත්තමානා විභත්ති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | එක | බහු | එක | බහු |
| ප: පු: | පචති | පචන්ති | පචතෙ | පචන්තෙ |
| ම: පු: | පචසි | පචථ | පචසෙ | පචව්හෙ |
| උ: පු: | පචාමි | පචාම | පචෙ | පචාමහෙ |

## පඤ්චමී විභත්ති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | පචතු | පචන්තු | පචතං | පචන්තං |
| ම: පු: | පච, | පචාහි, පචථ | පචස්සු | පචව්හො |
| උ: පු: | පචාමි | පචාම | පචෙ | පචාමසෙ |

## සත්තමී විභත්ති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | පචෙ,පචෙය්‍ය | පචෙය්‍යුං | පචෙථ | පචෙරං |
| ම: පු: | පචෙය්‍යාසි | පචෙය්‍යාථ | පචෙථො | පචෙය්‍යව්හො |
| උ: පු: | පචෙය්‍යාමි | පචෙය්‍යාම | පචෙය්‍යං | පචෙය්‍යාම්හෙ |

## අජ්ජතනී විභත්ති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | අපචී, පචී | අපචුං, පචුං,<br>අපචිංසු, පචිංසු | අපචා, පචා | අපචූ, පචු |
| ම: පු: | අපචො, පචො<br>අපචි, පචී | අපචිත්ථ,<br>පචිත්ථ | අපචිසෙ,<br>පචිසෙ | අපචිව්හං,<br>පචිව්හං |
| උ: පු: | අපචිං, පචිං | අපචිම්හා,<br>පචිම්හා | අපචං,<br>පචං | අපචිම්හෙ,<br>පචිම්හෙ |

## හීයත්තනී විභත්ති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | අපචා,<br>පචා | අපචූ,<br>පචූ | අපචත්ථ,<br>පචත්ථ | අපචත්ථුං,<br>පචත්ථුං |
| ම: පු: | අපචො,<br>පචො | අපචත්ථ,<br>පචත්ථ | අපචසෙ,<br>පචසෙ | අපචව්හං,<br>පචව්හං |
| උ: පු: | අපච,<br>අපචං | අපචම්හා,<br>පචම්හා | අපචිං,<br>පචිං | අපචම්හසෙ,<br>පචම්හසෙ |

## භවිස්සන්තී විභත්ති

| | පරස්සපද | | අත්තනොපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | පචිස්සති | පචිස්සන්ති | පචිස්සතෙ | පචිස්සන්තෙ |
| ම: පු: | පචිස්සසි | පචිස්සථ | පචිස්සසෙ | පචිස්සව්හෙ |
| උ: පු: | පචිස්සාමි | පචිස්සාම | පචිස්සං | පචිස්සාමෙහ |

## අර්ථ

පරස්සපද, අත්තනොපද වශයෙන් පදරූප දෙවගයක් වුවත් අර්ථවල ව්‍යවහාරයේ දී වෙනසෙක් නැත.

**97.** ස්වරයෙකින් පටන් ගැනෙන ප්‍රත්‍යයකට මුලින් සිටි එකාරාන්ත අඞ්ගයේ එකාරය **අය්** බවට පෙරළේ.

පාලෙ + ඊ = පාලය් + ඊ = පාලයී

පාලෙ + ඉං = පාලය් + ඉං = පාලයිං

පාලෙ +(ඉ)ත්ථ = පාලය් + ඉත්ථ = පාලයිත්ථ

පාලෙ + උං = පාලය් + උං = පාලයුං

පාලෙ + ඉංසු = පාලය් + ඉංසු = පාලයිංසු

## ඇබෑසිය

1. හරති, කරොති, දෙසෙති, ජිනාති, කිණාති යන ක්‍රියාවල අඞ්ග සොයනු.
2. ඒවා උඩ දැක්වුණු ආඛ්‍යාත විභත්ති සයෙහි ම වරනඟනු. අර්ථ ද දෙනු.

* * *

පාඩම 40

## කර්මවාචක ක්‍රියා

98. **මම ගස කපමි.** මෙහි **කපමි** යන ක්‍රියාවෙන් ගස කපන තැනැත්තා(කර්තෘ) **මම** යැ යි හැඟැවේ. මෙසේ ක්‍රියාවෙන් හැඟැවුණු කර්තෘ **උක්ත කර්තෘ** නම්. එය පඨමාවිභත්ති-යෙන්(ප්‍රථමා විභක්තියෙන්) සිටී. **ගස** යනු **කර්මය** යි. එ දුතියා-විභත්තියෙන්(හෙවත් කම්මවිභත්තින්) සිටී. මෙය පාලියට නැඟූ විට **අහං රුක්ඛං ඡින්දාමි** යි සිටී.

මේ අදහස ම කියන තව සැටියෙක් ඇත.

**මා විසින් ගස කැපේ**(කපනු ලැබේ). මෙහි **කැපෙන්නේ**(කැපීම ලබන්නේ) ගස ය. එය **කැපේ** යන ක්‍රියාවට පුරුෂයෙන් සඞ්ඛ්‍යා-වෙන් සමාන ව සිටී. කැපේ යනු ප්‍රථම පුරුෂ ඒකවචන යි. ගස යනු ද ප්‍රථම පුරුෂ ඒකවචන යි. ඒ උක්ත කර්මය යි. මෙහි එය ප්‍රථමා විභක්තික වැ සිටී. එය ගස්හු යැ යි වී නම් ක්‍රියාව කැපෙත් යැ යි සිටිය යුතුය. මෙසේ යම් ක්‍රියාවෙකින් කර්මය හැඟැවේ නම්, කියැවේ නම් ඒ ක්‍රියාව **කර්මවාචක ක්‍රියා**(කර්මකාරක ක්‍රියා) නම්.

උඩ සඳහන් වැකිය පාලියට නැඟූ විට:

**මයා රුක්ඛො ඡිජ්ජතෙ(ඡින්දීයතෙ)** යි සිටී.

**ඡින්දති** යනු **කර්තෘවාචක ක්‍රියා** ය. **ඡිජ්ජතෙ(ඡින්දීයතෙ)** යනු **කර්මවාචක ක්‍රියා** යි.

99. කර්තෘ අර්ථයෙහි ද තතියා විභත්තිය යෙදේ.

| | |
|---|---|
| පුරිසෙන(පුරුෂයා විසින්) | පුරිසෙහි(පුරුෂයන් විසින්) |
| කඤ්ඤාය(කන්‍යාව විසින්) | කඤ්ඤාහි(කන්‍යාවන් විසින්) |
| මයා(මා විසින්) | අම්හෙහි(අප විසින්) |
| තයා(තා විසින්) | තුම්හෙහි(තොප විසින්) |
| තෙන(ඔහු විසින්) | තෙහි(ඔවුන් විසින්) |

යනාදි වශයෙන් අර්ථ දිය යුතුයි.

## **කම්මවාචක ක්‍රියා තනන සැටි**

100. ධාතුවට(හෝ අඞගයට)ත් ආඛ්‍යාතික විභක්ති ප්‍රත්‍යයටත් අතරැ **ය** විකරණය බහා ලනු. එවිට කම්මවාචක ක්‍රියාව සෑදේ. **ඡින්දති**(කපයි) යන ක්‍රියාවේ ධාතුව **ඡිද්** ය. එයටත් **ති** හෝ **තෙ** යන ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍යයයටත් අතරැ **ය** යන්න ඇතුල් කළ විට **ඡිද් + ය + ති, ඡිද් + ය + තෙ** යි සිටිත්. **ද්ය** දෙකට හැම තැන ම **ජ්ජ** යන ආදේශය වේ. එවිට **ඡිජ්ජති, ඡිජ්ජතෙ** යන රූප සෑදේ. **ඡින්ද** යනු අංගය යි. එයට එක්වනුයේ **ඊය** යන්න ය. එවිට **ඡින්ද + ඊ + ය + ති, ඡින්ද + ඊ + ය + තෙ = ඡින්දීයති, ඡින්දීයතෙ** යි ක්‍රියාව සෑදේ.

කම්මවාචක රූප සෑදීමට හැම ක්‍රියාවෙක ම ධාතුව දැන ගත යුතු ය. මෙයට පසු හැම ක්‍රියාවක් සමඟ ම ධාතුව ද දෙනු ලැබේ. වර්තමානකාලික ක්‍රියාවේ **ති** විබත ඉවත් කළ විට අඞගය හෙවත් **ධාතුවිකෘතිය** ලැබේ.

## 101. **සන්ධි**

**ච්ය** යන දෙකට **ච්ච** ආදේශය වේ.
**ජ්ය** යන දෙකට **ජ්ජ** ආදේශය වේ.
**ණ්ය** යන දෙකට **ඤ්ඤ** ආදේශය වේ.
**න්ය** යන දෙකට **ඤ්ඤ** ආදේශය වේ.
**ද්ය** යන දෙකට **ජ්ජ** ආදේශය වේ.
**ධ්ය** යන දෙකට **ජ්ඣ** ආදේශය වේ.
**ප්ය** යන දෙකට **ප්ප** ආදේශය වේ.
**භ්ය** යන දෙකට **බ්භ** ආදේශය වේ.
**ම්ය** යන දෙකට **ම්ම** ආදේශය වේ.
**ව්ය** යන දෙකට **බ්බ** ආදේශය වේ.
**ස්ය** යන දෙකට **ස්ස** ආදේශය වේ.
**හ්ය** යන දෙකට **ය්හ** ආදේශය වේ.

පච් + ය + තෙ = පච්චතෙ (පිසේ, පිසනු ලැබේ).
සජ් + ය + තෙ = සජ්ජතෙ (සරසනු ලැබේ).
හන් + ය + තෙ = හඤ්ඤතෙ(නසනු ලැබේ, නැසේ).
භිද් + ය + තෙ = භිජ්ජතෙ (බිඳිනු ලැබේ, බිඳේ).
බුධ් + ය + තෙ = බුජ්ඣතෙ (දැනගනු ලැබේ).
ඛිප් + ය + තෙ = ඛිප්පතෙ (බහාලනු ලැබේ, දැමේ).
ලභ් + ය + තෙ = ලබ්භතෙ (ලැබේ).
දම් + ය + තෙ = දම්මතෙ (මට්ටුකරනු ලැබේ).
සිව් + ය + තෙ = සිබ්බතෙ (මසනු ලැබේ).
දිස් + ය + තෙ = දිස්සතෙතෙ(දක්නා ලැබේ, පෙනේ).
ගහ් + ය + තෙ = ගය්හතෙ (ගනු ලැබේ, ගැනේ).

102. සමහර ධාතු ස්වරාන්ත ය. **ය**-විකරණය පර කල්හි එයට මුලින් සිටි ධාත්වන්ත **ඉ**කාරය හෝ **උ**කාරය දීර්ඝ වේ, නැතහොත් ද්විත්වයට පැමිණේ(දෙකෙක් වේ).

චි + ය + තෙ = චීයතෙ(රැස් කරනු ලැබේ).
ලු + ය + තෙ = ලූයතෙ(කපනු ලැබේ).

103. **ද** ආදි සමහර **ආ**කාරාන්ත ධාතුන් ගේ අන්ත **ආ**කාරය **ය**-විකරණය පර කල්හි **ඊ**කාර බවට පෙරළේ.

ද + ය + තෙ = දීයතෙ(දෙනු ලැබේ).
පා + ය + තෙ = පීයතෙ(බොනු ලැබේ).
මා + ය + තෙ = මීයතෙ(මනිනු ලැබේ).

104. චුරාදි ගණයට අයත් ධාතුවේ මුල ස්වරයට **ඊ**කාරයත් **ය**-විකරණයත් එක් වීමේදී ද ගුණ වේ.

දිස් + ඊය + තෙ - දෙස් + ඊය + තෙ - දෙසීයතෙ
(දෙසනු ලැබේ)

චුර් + ඊය + තෙ - චොර් + ඊය + තෙ - චොරීයතෙ
(සොරෙන් ගනු ලැබේ)

## පච් ධාතුවෙන් නිපන් කර්මකාරකරූප
## (වත්තමානාදි විභත්තීන්හි)

| | අත්තනොපද | | පරස්සපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | පච්චතෙ | පච්චන්තෙ | පච්චති | පච්චන්ති |
| ම: පු: | පච්චසෙ | පච්චව්හෙ | පච්චසි | පච්චථ |
| උ: පු: | පච්චෙ | පච්චාමහෙ | පච්චාමි | පච්චාම |

### පඤ්චමී විභත්ති

| | අත්තනොපද | | පරස්සපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | පච්චතං | පච්චන්තං | පච්චතු | පච්චන්තු |
| ම: පු: | පච්චස්සු | පච්චව්හො | පච්ච, පච්චාහි | පච්චථ |
| උ: පු: | පච්චෙ | පච්චාමහෙ | පච්චාමි | පච්චාම |

### සත්තමී විභත්ති

| | අත්තනොපද | | පරස්සපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | පච්චෙථ | පච්චෙරං | පච්චෙය්‍ය | පච්චෙය්‍යුං |
| ම: පු: | පච්චෙථො | පච්චෙය්‍යව්හො | පච්චෙය්‍යාසි | පච්චෙය්‍යාථ |
| උ: පු: | පච්චෙය්‍යං | පච්චෙය්‍යාමහෙ | පච්චෙය්‍යාමි | පච්චෙය්‍යාම |

### අජ්ජතනී විභත්ති

| | අත්තනොපද | | පරස්සපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | අපච්චා | අපච්චූ | අපච්චි | අපච්චුං, අපච්චිංසු |
| ම: පු: | අපච්චිසෙ | අපච්චිව්හං | අපච්චො, අපච්චි | අපච්චිත්ථ |
| උ: පු: | අපච්ච | අපච්චිම්හෙ | අපච්චිං | අපච්චිම්හා |

## හීයත්තනී විභත්ති

| | අත්තනොපද | | පරස්සපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | අපච්චත්ථ | අපච්චත්ථුං | අපච්චා | අපච්චූ |
| ම: පු: | අපච්චිසෙ | අපච්චව්හං | අපච්චො | අපච්චත්ථ |
| උ: පු: | අපච්චිං | අපච්චාම්හසෙ | අපච්ච | අපච්චම්හා |

## භවිස්සන්තී විභත්ති

| | අත්තනොපද | | පරස්සපද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | පච්චිස්සතෙ | පච්චිස්සන්තෙ | පච්චිස්සති | පච්චිස්සන්ති |
| ම: පු: | පච්චිස්සසෙ | පච්චිස්සව්හෙ | පච්චිස්සසි | පච්චිස්සථ |
| උ: පු: | පච්චිස්සං | පච්චිස්සාම්හෙ | පච්චිස්සාමි | පච්චිස්සාම |

## අර්ථ

**වත්තමානා විභත්ති** : පච්චතෙ(පිසනු ලැබේ, පිසේ, පැසේ)

**පඤ්චමී විභත්ති** : පච්චතං(පිසනු ලැබේවා, පිසේවා, පැසේවා)

**සත්තමී විභත්ති** : පච්චෙථ(පිසනු ලබන්නේ, පිසෙන්නේ, පැසෙන්නේ)

**අජ්ජතනී විභත්ති** : අපච්චා(පිසන ලද්දේය, පිසුණේය, පැසුණේය)

**හීයත්තනී විභත්ති** : අපච්චි(පිසන ලද්දේය, පිසුණේය, පැසුණේය)

**භවිස්සන්ති විභත්ති** : පච්චිස්සතං(පිසනු ලැබේවා, පිසේවා, පැසේවා)

මෙය පචීයති, පචීයන්ති ආදි වශයෙන් ද ධාතුවට **ඊ + ය** එක්ව සෑදේ.

**105.** කර්තෘකාරකයේ දී කර්තෘ පඨමා විභත්තියෙන් ද කර්මය දුතියා විභත්තියෙන් ද ක්‍රියාව කර්තෘවාචක ව ද සිටී.

කර්මකාරකයේ දී කර්මය පඨමා විභත්තියෙන් ද, කර්තෘ තතියා විභත්තියෙන් ද, ක්‍රියාව කර්මකාරක ව ද සිටී. පහත දැක්වෙන නිදසුන්වලින් මෙය තේරුම් ගත යුතු.

## කත්තුකාරකයෙහි

බුද්ධො ධම්මං දෙසෙති.
(බුදුරජ දම් දෙසයි.)

දාසො ගොනං ආනෙසි.
(දාසයා ගොනා ගෙනායේ ය.)

ත්වං පාපකෙ මිත්තෙ මා භජි.
(ඔබ පාප මිත්‍රයන් නො බජන්න.)

සො තුම්හෙ පහරි.
(හේ තොපට ගැසී.)

අහං තං රක්ඛිස්සාමි.
(මම් ඔහු රකින්නෙමි.)

අප්පෙව නාම සො මං පොසෙය්‍ය.
(හේ මා පෝෂිත කරන්නේ වී නම් යෙහෙකි.)

## කම්මකාරකයෙහි

බුද්ධෙන ධම්මො දෙසීයතෙ(දෙසීයති).
(බුදුරජුහු විසින් දම් දෙසනු ලැබේ[දෙසේ].)

දාසෙන ගොණො ආනීයි.
(දාසයා විසින් ගොනා ගෙනෙන ලද්දේ ය.)

ත්වයා පාපකා මිත්තා මා භජීයුං.
(ඔබ විසින් පාප මිත්‍රයෝ නො බජනු ලැබෙත් වා.)

තෙන තුම්හෙ පහරීයිත්ථ.
(ඔහු විසින් ඔබ පහරින ලදහ.)

මයා සො රක්ඛීයිස්සති.
(මා විසින් හේ රකිනු ලබන්නේ ය.)

අප්පෙවනාම තෙන අහං පොසීයෙය්‍යං.
(ඔහු විසින් මම් පෝෂිත කරනු ලබන්නෙම් වීම් නම් යෙහෙක.)

106. අනුන් ගේ මෙහෙයුමක් නැති වැ තමා ගෙන් ම තමාට යමක් කැරෙයි නම් එය ද කර්මවාචක ක්‍රියාරූපයෙන් සිටී.

සටො භිජ්ජතෙ(කළය බිඳේ)
ඔදනො පච්චතෙ(බත පිසේ, බත ඉදේ)

**ක්‍රියා විශෙෂණ**

107. "හේ සැපසේ වෙසෙයි." මේ වාක්‍යයේ **සැපසේ** යන්නෙන් ඔහු වසන සැටි දැක්වේ. "හේ දුකසේ ජීවත් වෙයි." මෙ තැන ද **දුකසේ** ඔහු ජීවත් වන සැටි දැක්වේ. මෙසේ ක්‍රියාවක් කරන සැටිය, කාලය හෝ තැන අඟවන පද **ක්‍රියාවිශෙෂණ** නමින් හැඳින්වේ. ආසු(වහා), භියේ‍යාසොමත්තාය(බොහෝ සෙයින්), තථා(එසේ) ආදි නිපාත ද ක්‍රියාවිශෙෂණ ව සිටී. නාමවිශෙෂණ ද නපුංසකලිඞ්ගික වැ දුතියාවිභත්ති ඒකවචනයෙන් සිට ක්‍රියාවට විශෙෂණ වේ. නපුංසකලිඞ්ගික නාම ද දුතියාවිභත්ති ඒක-වචනයෙන් සිට ක්‍රියාවිශෙෂණ වේ.

සො විසමං චරති(හේ විසම ලෙස හැසිරෙයි).
සො සුඛං වසති(හේ සුවසේ වෙසෙයි).
සො දුක්ඛං ජීවති(හේ දුකසේ ජීවත් වෙයි).

මේ වාක්‍යවල **විසමං, සුඛං, දුක්ඛං** යනු ක්‍රියාවිශෙෂණ යි. තතියා විභත්තියෙන් ද ක්‍රියාවිශෙෂණ ය සිටී.

සො දුක්ඛෙන ජීවති(හේ දුකින් ජීවත් වෙයි).
මෙහි **දුක්ඛෙන** යනු ක්‍රියාවිශෙෂණ යි.

**උපසර්ග**

108. ප්‍රාරම්භ පාඩමේ පදවිභාගයෙහි උපසර්ග විස්ස දක්වා ඇත. පදයෙක අර්ථය දැඩිකිරීමට ද පදලංකාරයට ද පදයේ අර්ථය වෙනස් කිරීමට ද පදයකට මුලින් උපසර්ග සිටී. පවත්තති මෙහි **වත්ත්** යනු ධාතුව ය. **ප** යනු උපසර්ගය ය. විහරති යන තැන **හර්** ධාතුව ය. වි යනු උපසර්ගය යැ. ආහරති යන තැන **හර්** යනු ධාතුව ය. ආ යනු උපසර්ගය ය.

## ශබ්ද මාලාව

### ස්ත්‍රීලිඞ්ගික නාම

භික්ඛා (භික්ෂාව)
ගහපතානී(ගෘහපති භාර්‍යාව)
පාරමී (පැරුම්)
සෙනා (සේනාව)
මාලා (මල්දම)
සාඛා (අත්ත)
බ්‍රාමහණී(බැමිණී)
ආණා (ආඥාව)
ගාථා (ගාථාව)

### පුංලිඞ්ගික නාම

කිඩ්ඩකර(මෙහෙකරුවා)
සර(ඊ ගස, හඬ)
ඔදන(බත)
බල(දුෂ්ටයා)
මනතී(මනත්‍රී)
ළුද්දක(වැද්දා)
ජන(ජනයා)
අපරාධ(වරද, අපරාධය)

### නපුංසකලිඞ්ගික නාම

ධන(වස්තුව)
අජ්ඣධන(ඉගැනීම)
ඝර(ගෙය)

### නිපාත හා ක්‍රියාවිශෙෂණ

අභිණ්හං(එක්වන්, නිතර)
සම්මා (මනා කොට)

### නාමවිශෙෂණ

උච්ච (උස්)
සද්ධ (සැදැහැති)
සුවච (කීකරු)

### කර්තෘවාචක ක්‍රියා

(වරහන් ඇතුළත ධාතුව දැක්වේ)

(දා) දෙති(දෙයි)
(ඡිද්) ඡින්දති(කපයි)
(සෙව්) සෙවති(සෙවී, සේවනය කරයි)
(ප + අත්ථ්) පත්‍ථෙති(පතයි)
(විධ්) විජ්ඣති(විදී)

(මර්*, මාරෙ) මාරෙති(මරයි)
(ආ + රභ්) ආරභති(පටන් ගනී)
(නී) නෙති(පමුණුවයි, ගෙනයයි)
(පූර්) පූරෙති(පුරයි)
(කර්) කරොති(කරයි, පිළිපදී)
(ධර්) ධාරෙති(දරයි, උසුලයි)
(අධි + ඉ) අජ්ඣෙති(හදාරයි)
(චර්) චරති(හැසිරෙයි, පිළිපදී)
(අති + කම්)අතික්කමති(ඉක්මෙයි)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. සද්ධම්මෙ උපාසකෙහි භික්ඛූනං ච භික්ඛුණීනං ච භික්ඛා දීයතෙ.
2. කිඩ්කාරෙහි රුක්ඛස්ස සාඛායො ඡිජ්ජිංසු.
3. රාජා අභිණ්හං මනතීහි සෙවියතෙ.
4. ගහපතානියා ධනං පත්‍ථීයතෙ.
5. ළුද්දකෙන සුනඛෙහි සහ ගච්ඡනෙතන බහූ මිගා සරෙහි විජ්ඣිත්වා හඤ්ඤිංසු.
6. බ්‍රාමහණියා බ්‍රාමහණස්ස දත්‍තං ඔදනො ච තද්දුපියං ව්‍යඤ්ජනං ච අපචියුං.
7. ධම්මස්ස අජ්ඣයනං අජ්ජ තුමෙහහි ආරභීයතං.
8. භික්ඛූහි භගවතො ධම්මො සම්මා අධීයතං.
9. අටවියං ගායමානාය දරුනි උද්ධරනතියා කස්සාචි'පි ඉත්‍ථියා සද්දෙ ඉදුනි මයා සූයිත්‍ථ.
10. තුමෙහහි ඉධ නිසීදිත්වා පොත්‍ථකං පඨීයතං.

---

* මර් ධාතුව අකර්මකයි. එයට කාරිත ප්‍රත්‍යයක් එක්කළවිට සකර්මක වෙ. මරති, මියති(මැරෙයි), මාරෙති(මරයි).

**(ආ) පාලියට නඟන්න.**

1. මෙහෙකරුවන් විසින් ගවයෝ ද දෙන්නු ද ගාලට ගෙනයන ලදුහ.
2. සත්පුරුෂයන් විසින් දුෂ්ටයන් ගේ අපරාධයෝ නිහඬ ව ඉවසනු ලැබෙත්.
3. දැරිය විසින් මල්දම ගෙලෙහි පලඳින(දරන) ලදී.
4. රජහු ගේ අණින් සෙනෙවියා විසින් සේනාව රණබිමට පමුණුවන ලදී.
5. හෙරණුන් විසින් උස් හඬින් ගාථාවෝ කියවන ලදුහ.
6. ගොවියන් විසින් ධාන්‍ය රාශිය කුඹුරෙන් ගෙට ගෙන එනු ලැබේ වා.
7. ධර්මය අසනු ලැබේ වා, සිතෙහි දරනු ලැබේ වා, පිළිපදිනු ලැබේ වා.
8. කීකරු දරුවන් විසින් මව ගේ අවවාදය නො ඉක්මෙනු ලැබේ.
9. මා විසින් මෙරමාට දහම් දෙසනු පිණිස ම පාරමීහු පුරන ලදහ.
10. භාග්‍යවතුන් වහන්සේ සැමදා ම ගැහැවියාට කිසියම් ධර්මයෙක් දෙසන ලද්දේ ම ය.

**(ඉ)**

1. උඩ දැක්වුණු අ, ආ කොටස් දෙකෙහි ම ඇති වාක්‍ය කර්තෘකාරකයට පෙරළනු. පාලි වාක්‍ය සිංහලයට ද සිංහල වාක්‍ය පාලියට ද නඟන්න.

* * *

## පාඩම 41

### කර්මවාචක වර්තමානකාලික කෘදන්ත(කිතකන්න)

**109.** ඉහත 25 වැනි පාඩමෙහි කර්තෘවාචක වර්තමානකාලික කෘදන්ත ඉගැන්විණ. මෙහි වර්තමානකාලික කර්මවාචක කෘදන්ත ඉගැන්වේ. කර්මවාචක වර්තමානක ආඛ්‍යාතික ක්‍රියාවේ අඞ්ගයට **මාන** ප්‍රත්‍යය එක් කිරීමෙන් වර්තමානකාලික කර්මවාචක කෘදන්තය සෑදේ.

**පච්චති**(පිසනු ලැබේ) යනු කර්මවාචක වර්තමාන ක්‍රියාවයි. පච්ච යනු මෙහි අඞ්ගය හෙවත් ධාතු විකෘතිය යි. එයට **මාන** ප්‍රත්‍යය එක් කළ විට පච්චමාන(පිසනු ලබන, පිසෙන) යන පදය තැනේ. මේ වර්තමානකාලික කර්ම කෘදන්තය යි. මෙය මෙයින් දැක්වෙන ක්‍රියාවේ කර්මය හඟවන පදයට ලිඞ්ග විභත්ති සඞ්ඛ්‍යා යන තුනින් සමාන වැ සිටී.

සූදෙන පච්චමානො ඔදනො
(අරක්කැමියා විසින් පිසනු ලබන බත)

සූදෙන පච්චමානස්මිං ඔදනස්මිං
(අරක්කැමියා විසින් පිසනු ලබන බතෙහි)

බුද්ධෙන දෙසීයමානස්ස ධම්මස්ස
(බුදුරජහු විසින් දෙසනු ලබන ධර්මයාගේ)

**110.** භාවසත්තමී යෝගය කර්මකාරකයෙහි ද යෙදේ. කර්මවාචක නාමයත් කර්මවාචක කිතකන්ත පදයත් සත්තමී විභත්තියෙන් තැබීමෙන් එය සෑදේ.

රුක්ඛෙසු ඡිජ්ජමානෙසු
(ගස් කපනු ලබන කල්හි)

චොරෙ ගය්හමානෙ
(සොරා අල්ලා ගනු ලබන කල්හි)

## ශබ්ද මාලාව

### නපුංසකලිඞ්ගික නාම

තුරිය(වාද්‍ය භාණ්ඩ)
වෙත්ත(වේවැල)
භය(බිය)
උස්සුක්ක(උත්සාහය, උද්‍යෝගය)

### පුංලිඞ්ගික නාම

මන්ත(මන්ත්‍රය)
හොතු(හෝම කරන්නා)
සංසාර(සසර)

### ස්ත්‍රීලිඞ්ගික නාම

රජ්ජු(කඹය)
ථෙරී(තෙරිණී)
සික්ඛා(ශික්ෂා)
භීති(බිය)

### විශෙෂණ

එකච්ච(සමහර)
මෙධාවී(නුවණැති)
දූර(ඈත්)
කිලන්ත(ක්ලාන්ත)

### නිපාත

භියෙයාසොමත්තාය(බොහෝ සෙයින්)
පුනප්පුනං(නැවත නැවත)

## ක්‍රියා

සච්ඡිකරොති(ප්‍රත්‍යක්‍ෂ කරයි)
(පීළ්) පීළෙති(පෙළයි)
(වච්) වුච්චති(කියනු ලැබේ)
ජාලෙති(දල්වයි)
(තිකිච්ඡ) තිකිච්ඡති(පිළියම් කරයි)
ජප්පති(දපයි, ජපකරයි)
මාපෙති(තනයි, මවයි)
ධාරෙති(දරයි)
දෙසෙති(දෙසයි)
ගලති(ගිලිහෙයි)
(අනු + බන්ධ්) අනුබන්ධති(ලුහුබඳී)
ගජ්ජති(ගොරවයි)
පලාපෙති(පලවා හරී)
උපනාමෙති(පිරිනමයි, එළවයි, පුදයි)
විද්ධංසෙති(පෙන්වයි, විලිස්සයි)
පටිගණ්හාති(පිළිගනී)
(ආ + ඡිද්) අච්ඡින්දති(උදුරාගනී)
යාචති(ඉල්ලයි)
(භිද්) භින්දති(බිඳී)
පෙසෙති(යවයි)
(ආ + කඩ්ඪ්) ආකඩ්ඪති(අදී)
උපසංකමති(එළැඹෙයි)
(පති + ධාව්) පටිධාවති(ආපසු දුවයි)
පඤ්ඤපෙති(පණවයි)
(ගී) ගායති(ගයයි)
තජ්ජෙති(තරවටු කරයි)
වාදෙති(හඬවයි, වාදනය කරයි)

තසති, භායති(තැතිගනී)
වණෙණති(වණයි, පසසයි)
කිලමති(ක්ලානත වෙයි)
(ප + හර්) පහරති(ගසයි, පහරියි)
කන්දති(හඬයි, වැලැපෙයි)
භුසසති(බුරයි)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. භගවතො සමමාසමබුදෙධන දෙසීයමානං ධමමං සුණනතා මෙධාවිනො දෙවා ච මනුසසා ච නිබබාණං සචඡීකරිංසු.

2. සප්පුරිසෙන වෙජජෙන තිකිචඡීයමානා බහවො ගිලානා මනුසසා රොගතො මුචචිංසු.

3. තචඡකෙහි පාසාදෙ මාපියමානෙ රාජා ච අමචචා ච තං ඨානං ආගචඡිංසු.

4. සුනඛෙහි අනුබජඣමානො චොරො පලායනෙතා රුකඛං දිසවා සීඝං තං අභිරුහි.

5. කෙහිචි'පි බාලකෙහි ගීතෙසු ගීයමානෙසු කෙහිචි පි තුරියෙසු වාදීයමානෙසු එකචෙච බාලකා නචචිංසු.

6. බහූහි මනුසෙසහි මගෙග සනනිපතිතවා කලහෙ කයිරමානෙ මයං තතථ අඨතවා සීඝං ඉධාගචඡිමහා.

7. දතාරො යාචකෙහි පුනපපුනං වණණීයමානා භියෙයාසොමතතාය දනානි දතුං උසසුකකමකංසු.

8. සෙටඨිනා කුජසඩ්ඨ්වා පහරීයමානො ව්‍යාධො මිගං මුඤ්චිත්වා තතො පලායිත්වා අටවියං නිලීයි.

9. චොරෙහි මහාමග්ගෙ තත්ථ තත්ථ නිලීයිත්වා පීළීයමානා මනුස්සා උච්චාසද්දෙන කන්දිංසු.

10. හොතාරෙහි ජාලීයමානං අග්ගිං මයං පස්සිම්හ, තෙහි ජප්පමානෙ මන්තෙ ච සුණිම්හ.

(ආ) පාලියට නඟන්න.

1. කුමරියන් විසින් ග්‍රීවාවන්හි දරනු ලබන මල්දම්වලින් සමහර මල් ගිලිහී බිමැ වැටිණ.

2. දක්‍ෂ කිවියා විසින් බොහෝ ගාථාවලින් බුදුගුණ වණනු ලබන කල්හි අපිත් එ තැනැ සිට ඒවා ඇසූමු.

3. නපුරු හූරා විසින් දළවලින් පහරිනු ලබන වලසා දුවගොස් ගසකට නැංගේ ය.

4. ළමයින් විසින් ගල්වලින් ගසා පලවනු ලබන වඳුරෝ ඈතට දිවගොස් දත් විලිස්සමින් ගෙරැවූහ.

5. සොරා විසින් දැරියගෙන් උදුරාගනු ලබන වීණාව බිමැ වැටී දෙකට කැඩුණේ ය.

6. කන්‍යාව විසින් නාවන්නට නදියට ගෙනයනු ලබන එළදෙන, බුරමින් එන බල්ලන් දැක තැති ගෙන කඹය ද ඇදගෙන ගාලට ම ආපසු දිව්වා ය.

7. ඒ සැදැහැවත් සත්‍රීන් විසින් දෙනු ලබන භික්‍ෂාව සිල්වත් තෙරණිය විසින් පාත්‍රයෙන් පිළිගන්නා ලදී.

8. දුප්පත් මව විසින් ආහාරයක් ඉල්ලන්නට යවනු ලබන ඇගේ දුව එසේ යන්නී කිසියම් ධනවත් සත්‍රියක ගේ ගෙයක් දැක එහි එළැඹියා ය.

9. භාග්‍යවතුන් වහන්සේ විසින් පණවනු ලබන ශික්‍ෂාවන් සසර බිය දක්නා භික්‍ෂූහු මැනැවින් රැක්කාහ.

10. ඇදුරහු විසින් වේවැලක් අතින් ගෙන තරවටු කරනු ලබන කුඩා ශිෂ්‍යයා බියෙන් ක්ලාන්ත වැ බිමැ වැටුණේ ය.

* * *

## කාරිත ක්‍රියා

111. **ස්වාමියා අරක්කැමියා ලවා බත පිසවයි.** මේ වාක්‍යයෙහි **පිසවයි** යනු අනෙකකු ලවා කැරැවෙන ක්‍රියාවක් පවසයි. මෙය පාලියට පෙරළූ විට **සාමිකො සූදෙන ඔදනං පාචෙති** යි සිටී. **පාචෙති** යන්නෙහි අර්ථය **පිසවයි** යනු යි. **සූදෙන** යනු **අරක්කැමියා ලවා** යන අර්ථය පවසයි. මේ අනුන් ලවා කරවන ක්‍රියා **ප්‍රයෝජ්‍යක්‍රියා** හෙවත් **කාරිතක්‍රියා** නමින් හැඳින්වෙයි.

කාරිතක්‍රියාඞගය සාදගෙන එයට **ති අනති** ආදි ආඛ්‍යාතික විභතිප්‍රත්‍යයයන් එකතු කිරීමෙන් කාරිතක්‍රියාපද සෑදේ. කාරිතක්‍රියාඞගය සෑදීමට එකතු කැරෙන ප්‍රත්‍යයයෝ නම් **එ, අය, ආපෙ, ආපය** යන සතර ය.

**(a) පච්** ආදි හල් අකුරක් අගට ඇති ධාතුනට **එකී** ප්‍රත්‍යය සතර ම එක් වේ. මේවා එක්වන විට ධාතුවේ මුල සිටි **අ** යන්න බොහෝ තැන **ආ** යන්න වේ. **ඉ** යන්න **එ** යන්න වේ. **උ** යන්න **ඔ** යන්න වේ. ධාතුවේ මුල ස්වරය **ඊ** හෝ **ඌ** වීනම් වෙනස් නො වේ.

පච් ධාතුවේ කාරිතරූපය **පාචෙති, පාචයති, පාචාපෙති, පාචාපයති** යි වේ. මේවායේ අර්ථය **පිසවයි** යනු යි.

**(b) ආ** කාරාන්ත ධාතුනට එක් වන්නේ **ආපෙ, ආපය** යන ප්‍රත්‍යය දෙක පමණ ය.

ද - ධාතුව - දපෙති, දපයති(දෙවයි)

ඤද - ධාතුව - ඤදපෙති, ඤදපයති(දන්වයි)

ඣා - ධාතුව - ඣාපෙති, ඣාපයති(දවයි)

(c) **ඉ** වර්ණාන්තධාතූනට ඒ ප්‍රත්‍යය සතරෙන් කවර එකක් වුව ද එක්වෙයි. ධාතුවේ අග **ඉ** වර්ණය **ආය්** වේ.

නී - ධාතුව - නායෙති, නායයති, නායාපෙති, නායාපයති (පමුණුවවයි)

සි - ධාතුව - සායෙති, සායයති, සායාපෙති, සායාපයති (වැදහොවයි)

(d) **උ** වර්ණාන්තධාතුවට එක්වනුයේ **එ, අය** දෙක පමණ ය. ධාතුවේ අග **උ** යන්න **ආව්** වේ.

සු - ධාතුව - සාවෙති, සාවයති(අස්වයි)

(e) චුරාදි ධාතු ගණයේ ධාතූනට එක් වන්නේ **ආපෙ, ආපය** යන දෙක පමණි. ධාතුවේ මුල සවරය **ඉ** වී නම් **ඒ** වෙයි. **උ** වී නම් **ඕ** වෙයි. **ඊ, ඌ** වී නම් නො වෙනස්ව සිටී.

චුර් - ධාතුව - චොරාපෙති, චොරාපයති (සොරකම් කරවයි)

දිස් ධාතුව - දෙසාපෙති, දෙසාපයති(දෙසවයි)

**112. ලවා** යන අර්ථය දීමට තතියා විභත්තිය හෝ දුතියා විභත්තිය යොදනු ලැබේ.

සාමිකො සූදෙන ඔදනං පාචෙති.
සාමිකො සූදං ඔදනං පාචෙති.
(සවාමියා අරක්කැමියා ලවා බත පිසවයි)

සාමිකො දසෙනං ගාමං ගමයති.
සාමිකො දසං ගාමං ගමයති.(සවාමියා දසයා ගමට යවයි [දසයා ලවා ගමට යෑම කරවයි])

**කම්වාචකරූප**

113. **සවාමියා විසින් අරක්කැමියා ලවා බත පිසවනු ලැබේ.** මෙය පාලියට නැඟුවිට **සාමිකෙන සූදෙන ඔදනො පාචීයතෙ.**

පාචෙති, පාචාපෙති යන දෙතැන **ති** යන්න කපා හළ විට **පාචෙ පාචාපෙ** යන අඞග දෙක ලැබේ. ඒවාට **ඊය** යන්න එක්කළ විට **පාචීය, පාචාපීය** යි කම්වාචකාඞග ලැබේ. ඒවාට **තෙ, අනෙත** ආදි විභකති ප්‍රත්‍යයයන් එක් කළ විට **පාචීයතෙ, පාචාපීයතෙ (පිසවනු ලැබේ)** යි පද සිද්ධිය වේ.

**අවශෙෂ ක්‍රියාරූප:**

පාචෙත්වා, පාචයිත්වා, පාචාපෙත්වා, පාචාපයිත්වා(පිසවා)

පාචෙතුං, පාචයිතුං, පාචාපෙතුං, පාචාපයිතුං (පිසවන්නට)

පාචෙනත, පාචයනත, පාචාපෙනත, පාචාපයනත, පාචයමාන, පාචාපයමාන(පිසවන, පිසවමින්)

පාචීයමාන, පාචාපීයමාන(පිසවනු ලබන)

**ශබ්ද මාලාව**

**පුංලිඞගික නාම**

කට(කළාලය, පැදුර)

අකබර(අකුර)

උපජඣාය(උපාධ්‍යායයා, ගුරුවරයා)

හත්ථාරොහ(ඇතරුවා)

චොරජෙට්ඨක(සොර දෙටුවා)

## ක්‍රියා

(භුජ්) භුඤ්ජති(වළඳයි, කයි)
(ගම්) ගච්ඡති(යයි)
ගමයති, ගච්ඡාපෙති(යවයි)
අජ්ඣාපෙති(උගන්නයි)
(ආ + නී) ආනෙති(ගෙනෙයි)
ආනාපෙති(ගෙන්වයි)
(හර්) හරති(ගෙන යයි)
(සි) සයති(වැදහෙයි)
සායයති, සයාපෙති, සයාපයති,
සායාපෙති, සායාපයති(වැදහොවයි)
(ලිඛ්) ලිඛති(ලියයි)
(නි + කඩ්ඪ්) නික්කඩ්ඪති(නෙරපයි)
(ඩා) ඩාපෙති(දවයි)
(දහ්) දහති(ගිනි ඇවිලෙයි, දයි)
(කස්) කසති(සායි)
(සුධ්) සොධෙති(ශුද්ධ කරයි)
(අලං + කර්) අලංකරොති(සරසයි)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. සාමිකො දසෙන කටං කාරෙති.
2. පිතා පුත්තං ඔදනං භොජයති.
3. සාමිකෙන දසෙන කටො කාරීයතෙ.
4. සාමිනා දසො ගාමං ගච්ඡාපීයතෙ.
5. ආචරියො සිස්සං ධම්මං බොධාපෙති.
6. ආචරියෙන සිස්සො ධම්මං බොධාපීයතෙ.
7. පිතා පුත්තං ඔදනං භොජාපෙති.

8. උපජ්ඣායො අන්තෙවාසිකං ධම්මං අජ්ඣාපෙති.

9. ආචරියෙන සිස්සා ධම්මං අජ්ඣාපීයන්ත.

10. සාමිනා දාසො ගාමං ගච්ඡාපීයතෙ.

11. සාමි දාසං(දාසෙන) කම්මං කාරාපෙති.

12. සාමිනා දාසො(දාසෙන) කම්මං කාරාපීයතෙ.

13. අසප්පුරිසා සයම්පි පාපානි කරොන්ති පරෙහි පි කාරාපයන්ති.

14. පණ්ඩිතෙන ථෙරෙන අන්තෙවාසිකො සම්මා ධම්මං බොධීයතෙ.

15. දළිද්දෙ පිතා ධීතුයා ගහපතානිං අන්නං යාචාපෙසි.

16. රාජා මග්ගෙන ගච්ඡන්තං සාමණෙරං දිස්වා තං අමච්චෙන අත්තනො පාසාදමානාපෙත්වා වන්දිත්වා පූජෙත්වා ච මහන්තං සක්කාරං අකාසි.

17. මාතා දුහිතුයා දළිද්දානං වත්ථානි දාපෙසි.

18. සාමිනා දාසො භාරං හරාපීයතෙ.

19. හත්ථාරොහෙන හත්ථී සයාපීයතෙ.

20. අමච්චෙන සූදජෙට්ඨෙන සූදෙන ඔදනො පාචාපීයතෙ.

**(ආ) පාලියට නඟන්න.**

1. ඇදුරු තෙම ශිෂ්‍යයා ලවා අකුරු ලියවයි.

2. මව විසින් දූන් ලවා පැදුරු වියවන(කරවන) ලදී.

3. සෙනෙවි තෙම තමා ගේ සේනාව ලවා සතුරු රජු ගේ සේනාව රටින් නෙරපැවීය.

4. රජ තෙම සෙනෙවියා මඟින්(ලවා) සේනාව ලවා සතුරන් මැරැවී ය.

5. සොරදෙටුවා විසින් සොරුන් ලවා සිටුහු ගේ ප්‍රාසාදය ගින්නෙන් දවවන ලද්දේ ය.

6. උපාසකයන් විසින් භික්ෂූහු බොජුන් වළඳවන ලදුහු.

7. සවාමිහු දසයන් ගමට යැවූහ.

8. ඉදින් අද සුබ මොහොතෙහි දරුවාට අකුරු කියවන්නෙහි නම් මේ දැන් ඔහු මෙහි කැඳවා ගෙනෙන්නෙමි.

9. ඇමතියා මිනිසා ලවා වැඩේ කැරැවී ය.

10. කිම තෙපි ඊයේ ගොවියන් ලවා අපේ කුඹුර සැවවූහු ද?

11. තොප විසින් සෙට මෙහෙකරුවන් ලවා අපේ වත්ත ශුද්ධ කරවනු ලැබේ වා.

12. රාජපුරුෂයන් විසින් රජුගේ මෙහි පැමිණීම පිණිස ගම්වැසියන් ලවා හෙට මෙහි මාර්ගය ශුද්ධකරවා දෙපස සරසවනු ලබන්නේ ය.

**(ඉ) මෙහි දැක්වෙන ධාතුවලිනුත් ආඛ්‍යාතාඞගවලිනුත් ඒවායේ කාරිතක්‍රියාරූප තනා තේරුම් ද සහිත කොට ලියන්න.**

| | |
|---|---|
| යාච් (ඉල්ලීමෙහි) | වන්ද් (වැඳීමෙහි) |
| වඩ්ඪ් (වැඩීමෙහි) | නින්ද් (ගැරැහීමෙහි) |
| මාන් (බුහුමන් කිරීමෙහි) | ලභ් (ලැබීමෙහි) |
| ලුප් (සිඳීමෙහි) | යුජ් (යෙදීමෙහි) |
| නිසීද් (ඉඳීමෙහි) | ඝඨාපෙ(දැවීමෙහි) |
| ධාරෙ (දැරීමෙහි) | |

* * *

# පාඩම 43

**අතීත කාලවාචී කිතකන්ත(කෘදන්ත)**

114. **බුදුරජුහු විසින් දහම දෙසිණ(දෙසන ලදී).** මේ වැකිය පාලියට නැඟූ විට **බුද්ධෙන ධම්මො අදෙසීයි** යි සිටී. මෙහි **අදෙසීයි** යනු ආඛ්‍යාතික කර්මවාචක අතීතකාලවාචී ක්‍රියා රූපයෙකි. මෙය වෙනුවට අතීතකාලවාචී කර්මවාචක කිතකනත ක්‍රියාපදයක් යොදන හැක්ක. ඒ මෙසේ යැ:

**බුද්ධෙන ධම්මො දෙසිතො.**

මෙහි **දෙසිතො** යනු අතීතකාලවාචී කර්මවාචක කිතකනත ක්‍රියාරූපය යි.

දැන් කර්මවාචක කිතකනත ක්‍රියා තනන හැටි මේ පාඩමෙන් ඉගැන්වේ.

අතීතකාලවාචී කිතකනත ක්‍රියා සෑදීමට ධාතුවට හෝ අඞගයට (ධාතුවිකෘතියට) **ත, තවනතු, තාවී** යන ප්‍රත්‍යයයෝ එක් කරනු ලැබෙත්. සකර්මක(කර්මයක් ගන්නා) ධාතුවට **ත** ප්‍රත්‍යයය එකතු කිරීමෙන් කර්මවාචක අතීත කිතකනතය තැනෙයි. සකර්මක ධාතුවට **තවනතු, තාවී** යන දෙකින් එකක් එකතු වීමෙන් කර්තෘ-වාචක අතීතකාලික කිතකනත සෑදේ. **බුද්ධො ධම්මං දෙසිතවා, බුද්ධො ධම්මං දෙසිතාවී(බුදුරජ දම් දෙසී).** මෙහි **දෙසිතවා, දෙසිතාවී** යනු අතීතකාලික කර්තෘවාචක කිතකනත ක්‍රියා යි.

115. අකර්මක(කර්මයක් නො ගන්නා) ධාතුවට **ත, තවනතු, තාවී** යන ප්‍රත්‍යය තුනින් කවර එකක් වුව ද එකතු වීමෙන් අතීතකාලික කර්තෘවාචක කෘදනත(කිතකනත) පද සෑදේ.

පත්(වැටීමෙහි) : පතිත, පතිතවනතු, පතිතාවී(වැටුණු)

පුරිසො රුක්ඛා පතිතො, පුරිසො රුක්ඛමහා පතිතවා,
පුරිසො රුක්ඛමහා පතිතාවී(මිනිසා ගහෙන් වැටුණේ ය).

මේ කිතකනත පද නාම කොටසට ගැනෙයි. නාමයනට විශෙෂණව ද උකතාර්ථ පූරක ව ද සිටී. එබැවින් විශෙෂණයන් මෙන් ලිඞග සඞඛ්‍යා විභතති යන තුනින් ම නාමයනට සමාන වැ සිටිත්. දෙසිත, පතිත ආදි අකාරානත කිතකක්‍රියාවෝ පුංලිඞගයෙහි පුරිස ශබදය මෙන් ද, සත්‍රීලිඞගයෙහි වනිතා ශබදය මෙන් ද, නපුංසකලිඞගයෙහි ඵල ශබදය මෙන් ද වරනැඟෙත්.

දෙසිතවනතු පතිතවනතු ආදිහු වනතුප්‍රත්‍යයානත ගුණවනතු ශබදය මෙන් පුං නපුංසකලිඞග දෙක්හි ද එහි සත්‍රීරූපය වූ ගුණවනතී, ගුණවතී ශබද මෙන් දෙසිතවනතී, දෙසිතවතී ආදි විසින් සත්‍රීලිඞගයෙහි ද වරනැඟෙත්.

දෙසිතාවී, පතිතාවී ආදීහු පුංලිඞගයේත් නපුංසකලිඞගයේත් ඊකාරානත පුංලිඞගික නපුංසකලිඞගික ශබද මෙන් ද වරනැඟෙත්. ඔවුන් ගේ සත්‍රීලිඞගික රූප **ඉනී** ප්‍රත්‍යයය එක් කොට දෙසිතාවිනී, පතිතාවිනී ආදීන් තැනෙයි. නදී ශබදය මෙන් වරනැඟේ.

116. ධාතුවට **ත, තවනතු, තාවී** යන ප්‍රත්‍යයයක් එක් වූ විට ධාතුවේ අග අකුරත් ප්‍රත්‍යයයේ මුලකුර වූ **ත** යන්නත් එකට බැඳීමේ දී වන වෙනස පහත දැක්වේ.

**(a)** සමහර ධාතුවල අගින් සිටි **න්, ම්, ර්** යන අකුරු **ත** ප්‍රත්‍යයයා පර කල්හි ලොප්(නැතිවී යයි) වේ.

බන් + ත - බත (සාරන ලද, සෑරුණු)

තන් + ත - තත (පතුරුවන ලද, පැතුරුණු)

නම් + ත - නත (නැමුණු)

රම් + ත - රත (ඇලුණු)

කර් + ත - කත (කරන ලද, කැරුණු)

හන් + ත - හත (නසන ලද, නැසුණු)

මන් + ත - මත (දන්නා ලද, දැනුණු)

ගම් + ත - ගත (ගිය)

*චර් + ත - චුත (වැසුණු, ඇවුරුණු)

*ච යන්නෙන් පටන් ගැණෙන **වච්** ආදි සමහර ධාතූන් ගේ මුල් **ච** යන්න කර්මවාචක ප්‍රත්‍යයයන් එක්වීමේ දී චු වේ. **වුච්චති, චුත්ත** ආදි වශයෙනි.

**(b)** සමහර ධාතුවෙක ධාත්වන්ත **ම්** කාරය **න්** වේ.

දම් + ත - දන්ත (දැමුණු)
වම් + ත - වන්ත (වමාරන ලද)
තිම් + ත - තින්ත (තෙමුණු, තෙත්)
භම් + ත - භන්ත (භ්‍රාන්ත)
සම් + ත - සන්ත (සංහුන්)

**(c) ධ්ත, භ්ත, හ්ත** යන මොවුනට **ද්ධ** ආදේශය වේ.

බුධ් + ත - බුද්ධ (දැනගත්, අවබෝධකරගත්)
සුධ් + ත - සුද්ධ (ශුද්ධ, ශෝධනය කැරුණු)
ලභ් + ත - ලද්ධ (ලත්, ලැබුණු)
නහ් + ත - නද්ධ (බඳනාලද, බැඳුණු)
සිධ් + ත - සිද්ධ (සිදු වූ)
විධ් + ත - විද්ධ (විදින ලද, විදුණු)
ආ + රභ් + ත - ආරද්ධ(පටන්ගන්නා ලද)
දුහ් + ත - දුද්ධ (දෙවිනා ලද)

**(d) ජ්ත, සත** දෙකට **ට්ඨ** ආදේශය වේ.

යජ් + ත - යිට්ඨ (යාග වශයෙන් දෙනලද)
(මෙහි **ය**කාරය **යි**කාර බවට පෙරැළිණ)

දිස් + ත - දිට්ඨ (දක්නාලද)
ඉස් + ත - ඉට්ඨ (කැමති වූ, රිසි කැරුණු)
දංස් + ත - දට්ඨ (සපන ලද)
තුස් + ත - තුට්ඨ (සතුටු වූ)
සාස් + ත - සිට්ඨ (අනුසස්නා ලද)
හංස්+ ත - හට්ඨ (සතුටු වූ)

(e) ධාතුවේ අගැ සිටි **ච්, ජ්, ද්, ජ්** යන අකුරු පර රූප ගනී.(හෙවත් **ත්** බවට පෙරළෙයි)

සිච් + ත - සිත්ත (ඉසිනා ලද)
මුච් + ත - මුත්ත (මුදන ලද, මිදුණු)
රජ් + ත - රත්ත (රඳනා ලද, ඇලුණු)
මද් + ත - මත්ත (මත් වූ)
වප් + ත - වුත්ත (වපුරන ලද)
වච් + ත - වුත්ත (කියන ලද)
චජ් + ත - චත්ත (අත්හරිනා ලද, ත්‍යකත)
දද් + ත - දත්ත (දෙන ලද)
තප් + ත - තත්ත (තවන ලද, තැවුණු)
ලුප් + ත - ලුත්ත (සිඳිනා ලද, ලොප් කැරුණු)

(f) සමහර ධාතුවක අනත **ර්** කාරයටත් **ත** කාරයටත් **ට** කාර වේ.

හර් + ත - හට(හැරගෙන යනන ලද)
වි + සර් + ත - විසට(විසුරුණු)
ප + හර් + ත - පහට(පහරින ලද)
උ + හර් + ත - උද්ධට(උදුරන ලද)
ප + ථර් + ත - පත්ථට(පැතුරුණු)
ථර් + ත - ථුට(පැතුරුණු)

(g) සමහර ධාතුවෙක අග වූ **ස්** කාරය හා **ත** කාරය බැඳී **ත්ථ** බවට පෙරළේ.

අස් + ත - අත්ථ(අසත වූ, ඉවතට හෙලන ලද)
වස් + ත - වුත්ථ(වුසූ)

(h) කිසි තැනෙක **හ්ත, ඩ්ස්ත** දෙකට **ඩ්ඪ** වේ.

දහ් + ත - දඩ්ඪ(දැවුණු)
වඩ්ස් + ත - වුඩ්ඪ(වැඩුණු)

**(i)** සමහර සවරානත ධාතූන් ගේ අගැ වූ **ආ, එ** අකුරු **ත** ප්‍රත්‍යයයා පර කල්හි **ඊ** කාර බවට පෙරළේ.

පා + ත - පීත (බොන ලද)
ගා + ත - ගීත (ගයන ලද)
වෙ + ත - වීත (වියන ලද)

**(j)** සමහර ධාත්වනත සවරයෙක් **ත** ප්‍රත්‍යයයා පර කල්හි නො වෙනස් වැ සිටී. සමහර ධාතුවෙක අග **ආ** කාරය **ඉ** කාර වේ.

මිලා(මිලා) + ත - මිලාත (මැලවුණු)
න්හා(නහා) + ත - නහාත (නෑ, ස්නානය කළ)
සි + ත - සිත (බැඳුණු)
ජි + ත - ජිත (දිනන ලද)
මි + ත - මිත (මනින ලද)
නී + ත - නීත (පමුණුවන ලද)
කී + ත - කීත (මිළදී ගන්නා ලද)
චු + ත - චුත (මැරුණු, පහ වූ)

**(k)** සමහර ධාතුවෙක අග වූ **අර්** භාගයටත් පර වූ **ත** කාරයටත් **ඉණ්ණ** ආදේශය වේ.

චර් + ත - චිණ්ණ (පුරුදු කරන ලද)
ජර් + ත - ජිණ්ණ (දිරාගිය)
තර් + ත - තිණ්ණ (තැරුණු, තරණය කරනලද, ඉක්මෙන ලද)
කිර් + ත - කිණ්ණ (විසුරුණු)

**(l)** **ද්ත** යන්නට **ඉනන** ආදේශ වේ.

දද් + ත - දිනන (දෙන ලද)

**(m)** **ද්ත** යන්නට **නන** ආදේශ වේ.

ඡද් + ත - ඡනන (වැසුණු)
ඡිද් + ත - ඡිනන (සිඳින ලද, සිඳුණු)
භිද් + ත - භිනන (බිඳින ලද, බිඳුණු)
ආ + පද් + ත - ආපනන(පැමිණි)
නි + සද් + ත - (නිසනන) නිසිනන(හුන්)

**(n)** **ජ්‍යා** ආදි සමහර ධාතුවෙක අගැ වූ **යා** භාගයට **ඊ** වේ. ප්‍රත්‍යයයෙහි වූ **ත** කාරය, **න** කාර වේ. **දී, ඛී** ආදි සමහර ධාතුවක් කෙරෙන් පර වූ **ත** ප්‍රත්‍යයය **න** වේ. **ඛී** ධාතුවෙන් පර වූ විට එයට **ණ** ආදේශ වේ.

ජ්‍යා + ත - ජීන (පිරිහුණු, පැරැදුණු)
දී + ත - දීන (පිරිහුණු)
ඛී + ත - ඛීණ (ගෙවුණු, ක්‍ෂයයට පත්)

**(o)** විශෙෂ රූප

සුස් + ත - සුක්ඛ (වියැලුණු)
පච් + ත - පක්ක (පිසුණු, පැසුණු)
මුහ් + ත - මූළ්හ (මුළා වූ)
ගාහ් + ත - ගාළ්හ (බැස ගත්)
සහ් + ත - සාළ්හ (ඉවැසූ)

**(p)** බොහෝ ධාතූන් කෙරෙන් ද ආඛ්‍යාතාඩගයෙන් ද පර වැ **ත** ප්‍රත්‍යයයට මුලින් **ඉ** කාරාගමය වේ.

පත් + ඉ + ත - පතිත (වැටුණු)
පච් + ඉ + ත - පචිත (පිසින ලද)
වද් + ඉ + ත - උදිත (කියන ලද)
පුච්ඡ + ඉ + ත - පුච්ඡිත(විචාරන ලද)
දෙසෙ + ඉ + ත - දෙසිත (දෙසන ලද)
භාවෙ + ඉ + ත - භාවිත (වඩන ලද)

**117.** කත්තෘවාචක කිතකානතයෝ ලිඞග විභත්ති සඞඛ්‍යා තුනින් ම එයින් පැවැසෙන ක්‍රියාව කරන කත්තෘහට සමාන වැ සිටිත්.

| | |
|---|---|
| පුරිසො ගතො<br>(පුරුෂයා ගියේය) | පුරිසා ගතා<br>(පුරුෂයෝ ගියාහ.) |
| ගතො පුරිසො<br>(ගිය පුරුෂයා) | ගතා පුරිසා<br>(ගිය පුරුෂයෝ) |
| ගතසස පුරිසසස<br>(ගිය පුරුෂයාට) | ගතානං පුරිසානං<br>(ගිය පුරුෂයනට) |
| ඉත්ථී ගතා<br>(ස්ත්‍රී ගියාය) | ඉත්ථියො ගතා, ගතායො<br>(ස්ත්‍රීහු ගියාහ) |
| ගතා ඉත්ථී<br>(ගිය ස්ත්‍රී) | ගතා(ගතායො) ඉත්ථියො<br>(ගිය ස්ත්‍රීහු) |
| ගතාය ඉත්ථියා<br>(ගිය ස්ත්‍රියට) | ගතානං ඉත්ථීනං<br>(ගිය ස්ත්‍රීනට) |
| ඵලං පතිතං<br>(ඵලය වැටුණේය) | ඵලානි පතිතානි<br>(ඵලයෝ වැටුණාහ) |
| පතිතං ඵලං<br>(වැටුණු ඵලය) | පතිතානි ඵලානි<br>(වැටුණු ඵල) |
| පතිතෙ ඵලෙ<br>(වැටුණු ඵලයෙහි) | පතිතෙසු ඵලෙසු<br>(වැටුණු ඵලයන්හි) |

දසො කමමං කතවා, කතාවී.(දසයා වැඩේ කෙළේ ය.)

දසා කමමං කතවනෙතා.(දසයෝ වැඩය කළාහ.)

කමමං කතවා, කතාවී දසො(වැඩේ කළ දසයා)

කමමං කතවනෙතා, කතාවිනො දසා(වැඩේ කළ දසයෝ)

කමමං කතවතො, කතාවිනො දසසස(වැඩේ කළ දසයාට)

කමමං කතවතං, කතාවීනං දසානං(වැඩේ කළ දසයනට)

118. කර්මවාචක කෘදන්තය(කිතකන්තය) ඒ කෘදන්තයෙන් පැවැසෙන ක්‍රියාවේ කර්මය හා ලිඞ්ග සඞ්ඛ්‍යා විභත්ති යන මෙයින් සමාන වැ සිටී.

බුද්ධෙන ධම්මො දෙසිතො
(බුදුරජු විසින් දහම දෙසිණි, දෙසන ලදී)

බුද්ධෙන දෙසිතො ධම්මො
(බුදුරජු විසින් දෙසන ලද ධර්මය)

බුද්ධෙන දෙසිතෙ ධම්මෙ
(බුදුරජු විසින් දෙසන ලද ධර්මයෙහි)

**භාවසත්තමී යෝගය**

119. කර්තෘ සාධනයෙහි:

ඵලෙ පතිතෙ
(ඵලය වැටුණු කල්හි)

ඵලෙසු පතිතෙසු
(ඵලයන් වැටුණ කල්හි)

පුරිසෙ කම්මං කතවති
(පුරුෂයා වැඩය කළ කල්හි)

පුරිසෙසු කම්මෙ කතවන්තෙසු
(පුරුෂයන් වැඩ කළ කල්හි)

කර්ම සාධනයෙහි:

පුරිසෙන කම්මෙ කතෙ
(පුරුෂයා විසින් වැඩය කරන ලද කල්හි)

පුරිසෙන කම්මෙසු කතෙසු
(පුරුෂයා විසින් වැඩ කරන ලද කල්හි)

**120.** **ගත**(ගිය), **අගත**(නො ගිය), **ආගත**(ආ), **අනාගත** (නො ආ). මෙසේ **නො** යන අර්ථය දිය යුතු කල්හි කෘදන්ත පදයන්ගේ ව්‍යඤ්ජනයට මුලින් **අ** කාරය ද, සවරයට මුලින් **අන්** යන්න ද එක් වේ. **අගත** යන තැන **ග** යන ව්‍යඤ්ජනයට මුලින් අකාරය එක් වේ. **අනාගත** යන තැන **ආ** යන සවරයට මුලින් **අන්** යන්න එක් වැ එහි **න්** කාරය පසුව සිටි **ආ** හා සන්ධි විය.

### විශේෂ ක්‍රියා පද

**121.** භූ ධාතුව(වීමෙහි)

වත්තමානා විභත්ති පඨමපුරිස ඒකවචනයෙහි: හොති(වෙයි)

පංචමී විභත්ති පඨමපුරිස ඒකවචනයෙහ: හොතු(වේවා)

සත්තමී විභත්ති පඨමපුරිස ඒකවචනයෙහි: භුවෙය්‍ය(වන්නේ ය)

භවිස්සන්ති විභත්ති පඨමපුරිස ඒකවචනයෙහි : හෙස්සති(වන්නේ ය)

අජ්ජතනී විභත්ති පඨමපුරිස ඒකවචනයෙහි: අහොසි(විය)

හීයත්තනී විභත්ති පඨමපුරිස ඒකවචනයෙහි: අභුවා(විය)

මේ අනුව ඉතිරි විභත්තීන්හි රූප ද සාදා ගත යුතු.

**122.** අතීතකාලික වූ හෝ වර්තමානකාලික වූ කෘදන්ත ක්‍රියා සමඟ **භූ** ධාතුවෙන් නිපන් පද යෙදේ.

සො ගතො හොති.(හේ ගියේ වෙයි.)

තෙ ගතා හොන්ති.(ඔහු ගියාහු වෙත්.)

සො ගතො අහොසි.(හේ ගියේ වී.)

තෙ ගතා අහෙසුං.(ඔහු ගියෝ වූහ.)

## ශබ්ද මාලාව

| වර්තමාන ආඛ්‍යාත එකවචනය | ධාතුව | පූර්වක්‍රියාව | අතීත කෘදන්තය |
|---|---|---|---|
| පරිමොචෙති (මුදයි) | පරි–මුච් | පරිමොචෙත්වා | පරිමුත්ත, පරිමොචිත |
| නිසීදති(ඉඳී) | නි–සද් | නිසීදිත්වා | නිසින්න |
| පුච්ඡති(විචාරයි) | පුච්ඡ් | පුච්ඡිත්වා | පුට්ඨ, පුච්ඡිත |
| රොචති(කැමති වෙයි) | රුච් | රොචිත්වා | රොචිත, රුචිත |
| පස්සති(දකී) | දිස් (පස්ස්) | දිස්වා, පස්සිත්වා | දිට්ඨ, පස්සිත |
| නිපජ්ජති(වැදහෙයි) | නි–පද් | නිපජ්ජිත්වා | නිපන්න |
| කරොති(කරයි) | කර් | කත්වා, කරිත්වා | කත |
| චින්තෙති(සිතයි) | චිත් | චින්තෙත්වා | චින්තිත |
| උට්ඨහති(නැඟිටී, නැඟෙයි) | උ–ඨා | උට්ඨහිත්වා, උට්ඨාය | උට්ඨිත |
| සම්පාපුණාති(සපැමිණේ) | සං–ප–අප් | සම්පත්වා, සම්පාපුණිත්වා | සම්පත්ත |
| නිමුජ්ජති(ගිලෙයි, කිඳබසී) | නි–මජ්ජ | නිමුජ්ජිත්වා | නිමුග්ග |

| | | | |
|---|---|---|---|
| උත්තරති(ගොඩ එයි) | උ-තර් | උත්තරිත්වා | උත්තිණ්ණ |
| පවිසති(පිවිසෙයි) | ප-විස් | පවිසිත්වා | පවිට්ඨ |
| කාලංකරොති(කලුරිය කරයි) | කාලං-කර් | කාලංකත්වා | කාලකත |
| විස්සජ්ජෙති(අත්හරී) | වි-සජ්ජ් | විස්සජ්ජෙත්වා | විස්සට්ඨ |
| පතිට්ඨාති(පිහිටයි) | පති-ඨා | පතිට්ඨාය, පතිට්ඨහිත්වා | පතිට්ඨිත |
| විජායති(වදයි) | වි-ජන් | විජායිත්වා | විජාත |
| නිමන්තෙති(නිමතයි, කැඳවයි) | නි-මන්ත් | නිමන්තෙත්වා | නිමන්තිත |
| පරික්ඛිපති(වට කරයි) | පරි-ඛිප් | පරික්ඛිපිත්වා | පරික්ඛිත්ත |
| ගවෙසති (සොයයි) | ගවෙස් | ගවෙසිත්වා | ගවෙසිත |
| අනුස්සරති(නැවත නැවත සිහිකරයි) | අනු-සර් | අනුස්සරිත්වා | අනුස්සරිත |
| සමතිවිජ්ඣති(විනිවිද යයි) | සං-අති-විධ් | සමතිවිජ්ඣිත්වා | සමතිවිද්ධ |
| අනුප්පාපෙති(වෙතට පැමිණෙයි) | අනු-ප-අප් | අනුප්පත්වා | අනුප්පත්ත |
| ආකිරති(විසුරුවයි) | ආ-කිර් | ආකිරිත්වා | ආකිණ්ණ |

| වර්තමාන ආඛ්‍යාත එකවචනය | ධාතුව | පූර්වක්‍රියාව | අතීත කෘදන්තය |
| --- | --- | --- | --- |
| විවිචචති(වෙන්වෙයි) | වි-විච් | විවිචච | විවිතත |
| නිලීයති(සැඟවෙයි) | නි-ලී | නිලීයිතවා | නිලීන |
| මිලායති(මැලවෙයි) | මිලා | මිලායිතවා | මිලාන |
| කිලමති(වෙහෙසෙයි, ක්ලාන්ත වෙයි) | කිලම් | කිලමිතවා | කිලනත |
| පරිවාරෙති(පිරිවරයි) | පරි-වර් | පරිවාරෙතවා | පරිවුත |
| පබබජති(පැවිදිවෙයි) | ප-වජ් | පබබජිතවා | පබබජිත |
| ගණහාති(ගනී) | ගහ් | ගණහිතවා-ගහෙතවා | ගහිත |
| කථෙති(කියයි) | කථ් | කථෙතවා | කථිත |
| ව්‍යාකරොති(හෙළිකෙරෙයි, විවරණ දෙයි) | වි-ආ-කර් | ව්‍යාකරිතවා | ව්‍යාකත |
| නිබබාති, නිබබායති (නිවෙයි) | නි-වා | නිබබායිතවා | නිබබුත |
| උපපජජති(උපදී, පහළ වෙයි) | උ-පද් | උපපජජිතවා, උපපජජ | උපපනන |
| නිකඛමති (නික්මෙයි) | නි-කම් | නිකඛමිතවා, නිකඛමම | නිකඛනත |

| | | | |
|---|---|---|---|
| අධිගච්ඡති (අවබෝධ කරයි) | අධි-ගම් | අධිගන්ත්වා, අධිගම්ම | අධිගත |
| ලභති(ලබයි) | ලභ් | ලභිත්වා, ලද්ධා | ලද්ධ |
| පත්ථෙති(පතයි) | ප-අත්ථ් | පත්ථෙත්වා | පත්ථිත |
| පවත්තෙති(පවත්වයි) | ප-වත්ත් | පවත්තෙත්වා | පවත්තිත |
| අභිරමති(ඇලෙයි) | අභි-රම් | අභිරමිත්වා | අභිරත |
| දුට්ඨු ඡාදෙති (නො මනාසේ වසයි හෝ සෙවිලි කරයි) | දු-ඡද් | දුට්ඨු ඡාදෙත්වා | දුච්ඡන්න |
| සුට්ඨු ඡාදෙති(මනාව සෙවිලි කරයි) | සු-ඡද් | සුට්ඨු ඡාදෙත්වා | සුච්ඡන්න |
| භාවෙති(වඩයි) | භූ | භාවෙත්වා | භාවිත |
| පක්ඛන්දති(පනී, පැනයයි) | ප+ඛද් | පක්ඛන්දිත්වා | පක්ඛන්න |
| ආරොචෙති(දන්වයි, කියයි) | ආ+රුච් | ආරොචෙත්වා | ආරොචිත |
| උපනිඝංසති(උළයි, හප්පයි) | උප+නි+ඝංස් | උපනිඝංසෙත්වා | උපනිඝංසිත |
| ඔගාහති (බසී) | අව+ගාහ් | ඔගාහිත්වා | ඔගාළ්හ |
| උපපබ්බජති (උපැවිදිවෙයි) | උ+ප+වජ් | උපපබ්බජිත්වා | උපපබ්බජිත |

## ශබ්ද මාලාව

### පුංලිඞ්ගික නාම

කුම්භකාර(කුඹලා)
ඒකමන්ත(එක් පැත්ත)
භාග(කොටස, පැත්ත)
සන්තාප(අව්ව)
ගබ්භ(දරුගබ)
සහායක(යහළුවා)
මුඛවණ්ණ(මුහුණෙ පැහැය)
අමතමග්ග-දෙසක(අමාමග දක්වන්නා)
මොක්ඛධම්ම(මොක්ෂධර්මය, නිවන)
රාග(රාගය, ඇල්ම)
හත්ථිපක(ඇත්පැටියා)
ගණ(රංචුව, සමූහය)
කද්දම(මඩ)
බ්‍රාහ්මණගාම(බමුණුගම)
වණ්ණ(වේශය)
අන්තොගබ්භ(ඇතුළුගබ)
හත්ථිකළභ(ඇත්පැටියා)

### ස්ත්‍රීලිඞ්ගික නාම

උපට්ඨානසාලා(උවටන්හල)
කුම්භකාරසාලා(කුඹල්හල)
රුචි(රිස්ස, කැමැත්ත)
ඉද්ධි(ඍද්ධිය)
පිය සහායිකා(ප්‍රිය යෙහෙළි)
යක්ඛිනී(යකින්න)
හත්ථිනී(ඇතින්න)
චාරිකා(ගමන)
සෙතව්‍යා(එනම් නුවර)
පජාපති(භාර්‍යාව)
ධම්මදෙසනා(දම්දෙසුම)
සම්පත්ති(සැපත)
කථා(කථාව)
වුට්ඨි(වැස්ස)

### නපුංසකලිඞ්ගික නාම

මජ්ඣ(මැද්ද)
පච්චුග්ගමන(පෙරගමන)
සෙනාසන(සෙනසුන)
මුහුත්ත(මොහොත)
අරහත්ත(රහත් බව)
සිංසපාවන(ඇට්ටේරිය වනය)
වාසන(වසත්‍රය)
අගාර(ගෙය, ගිහි ගෙය)
පාරුපන(පොරෝනාව)
පුනදිවස(පසුදින)
සුකාරණ(මනා කරුණ)
මත්ථක(මත්ත)
භත්තකිච්ච(බත් කිස)
බ්‍රහ්මචරිය(මහණදම)

## විශෙෂණ

වසිතුකාම(වෙසෙනු කැමැති) නිපඵාදක(නිපදවන)
සාරානීය(සිතැ රැඳැවිය යුතු) ඊදිස(මෙ බඳු)
භාරිය(බැරැරුම්, බරපතළ) අවිදූර(නො දුරු)
බුදධපපමුඛ(බුදුපාමොක්) අපර(අනිත්)
අචඡරිය(පුදුම, ආශචයර්‍ය) අනුතතර(නිරුතතර)
වූපකටඨ(හුදෙකළා වූ, තනි වූ)

## නිපාත

නො(නො)
තිරියං(ඝරස)
අදධා(ඒකානතයෙන්)
උදහු(නොහොත්)
වත(ඒකානතයෙන්, පුදුමයෙකි!)

## පදකැටි

චාරිකංචරති(සැරිසරයි)
පුනදිවසඣාය(පසුදිනට)
කථංකථෙති(කථාකරයි)
බ්‍රමහචරියං චරති(මහණදම් කරයි)

## ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. "කහං පන ඣවං නිසිනෙනා?" ති භගවතා පුටෙඨා "විහාරමජෙඣ උපටඨානසාලායං භනෙත" ති සො භිකඛු ආහ.
2. "ඉමෙ භිකඛූ ආගචඡනතා තෙ දිටඨා?" ති භගවතා පුටෙඨා "ආම, දිටඨා භනෙත" ති සො ආහ.
3. කිං තෙ ඉමෙ දිසවා උටඨාය පචචුගගමනං කතනති භගවතා පුටෙඨා "න කතං භනෙත" ති සො ආහ.

4. ඉමං නගරං සමපතතා පබබජිතා කත්ථ වසනතී? ති තාපසෙන පුටඨා තෙ දරකා “කුමභකාරසාලායං භනෙත” ති ආහංසු.

5. කුමභකාරො “පඨමමාගතො ඉමිනා සදධිං එකතො වසිතුකාමො භවෙය්‍ය වා නො වා අතතානං පරිමොචෙසසාමී”ති චිනෙතත්වා “සචෙ භනෙත පඨමමුපගතො රොචිසසති තසස රුචියා වසථා”ති ආහ.

6. තෙන “මහතී සාලා, පවිසිත්වා එකමනෙත වසා”ති වුතෙතා දුතියො තාපසො පුරෙතරං පවිටඨසස අපරසමිං භාගෙ එකමනතං නිසීදි.

7. දෙවලො තාපසො නිපජජමානො පඨමං අතතනො නිපනෙන ඨානෙ අනිපජජිත්වා දවාරසස මජෙඣ තිරියං නිපජජි.

8. ආචරිය, මයා ඉදධියා විසසටඨාය සූරියසස සනතාපෙ උටඨහනෙත උදකෙ නිමුජජිත්වා අඤෙඤන ඨානෙන උතතරිත්වා ගවෙෂය්‍යාසි.

9. එකො කුටුමබිකපුතෙතා පිතරි කාලකතෙ ඛෙතෙත ච ඝරෙ ච සබබානි කමමානි අතතනා’ව කරොනෙතා මාතරං පටිජගගි.

10. සා ඉත්ථී ගබ්භෙ පතිටඨිතෙ ඉතරාය ඉත්ථියා ආරොචෙසි.

11. යකඛිනී පියසහායිකාය වණණනාගනත්වා “කුහිං මෙ සහායිකා”ති පුචඡිත්වා, “අනෙතාගබෙභ විජාතා”ති වුතෙත “පුතතං නුඛො විජාතා උදාහු ධීතරනති පසසිසසාමී නං”ති පවිසිත්වා, පසසනතී විය දරකං ගහෙත්වා ඛාදිත්වා ගතා.

12. සා සාමිකෙ නහායනෙත පුතතං පායමානා ඨිතා යකඛිනිං ආගචඡනතිං දිසවා සඤජානිත්වා නමහා ඨානා පකඛනදි.

13. සො හත්ථී චින්තෙසි "අහං බො ආකිණ්ණො විහරාමි හත්ථීහි හත්ථිනීහි හත්ථිකලභෙහි, ඔගාහන්තස්ස ච මෙ උත්තිණ්ණස්ස ච හත්ථිනියො කායං උපනිඝංසන්තියො ගච්ඡන්ති, යන්නූනාහං ගණම්හා වූපකට්ඨො විහරෙය්‍යන්ති.

14. සාවත්ථිං අනුප්පත්තානං පන තෙසං භික්ඛූනං භගවා එකමන්තෙ විවිත්තං කාරාපෙත්වා සෙනාසනං දාපෙසි.

15. මාදිසස්ස බුද්ධස්ස සන්තිකෙ පබ්බජිත්වා මයි සාමග්ගිං කාරෙන්තෙ තුම්හෙහි මම වචනං අකරොන්තෙහි භාරියං වො භික්ඛවෙ කම්මං කතං.

16. සා එකමන්තෙ නිලීනා මජ්ඣිමෙ යාමෙ ථෙරං ආගච්ඡන්තං දිස්වා ගන්ත්වා වන්දිත්වා "අය්‍යො භන්තෙ ඉමස්මිං ඨානෙ විහරතී?"ති ආහ.

17. එකා කුමාරිකා තස්මිං මුහුත්තෙ යෙව උට්ඨිතෙන ව්‍යාධිනා සායං අමිලාතා අකිලන්තා කාලමකාසි.

18. තස්මිං භික්ඛුස්මිං අරහත්තං පත්තෙ සත්ථා භික්ඛුසඞ්ඝෙන පරිවුතො චාරිකං චරමානො සෙතව්‍යං ගන්ත්වා තත්ථ සිංසපාවනං පාවිසි.

## (ආ) පාලියට නඟන්න.

1. ඒ සත්‍රීහු ඔහු අල්ලාගෙන "යුෂ්මතා කාගෙන් විචාරා පැවිදි වුයෙහි ද කවරකු විසින් පැවිදි කරන ලද ද කුමට මෙහි ආයෙහි වෙහි ද?" යි කියා ඔහු ගේ හඳනය ද පොරෝනාව ද පැහැරගෙන සුදුරෙදි හඳවා "යව, ශාස්තෘන් වහන්සේ ගෙනෙව, අපි අඳුන් පණවන්නමු" යි කියා ඔහු යැවූහ.

2. බොහෝ කලක් භික්ෂුභාවයෙහි නොසිට උපැවිදි වූයේ ලජ්ජාපත් එකකු වන්නට නො දනී.

3. මේ සත්‍රීන් විසින් සිය සැමියා අල්ලා ගන්නා ලද්දේ ය. අපි ද අප සැමියා අල්ලා ගනිමු යි සිතා ඒ සත්‍රීහු දෙවෙනි දවස දනය පිණිස බුදුපාමොක් භිකෂු සංඝයාට නිමනත්‍රණය කළාහ.

4. භාග්‍යවතුන් වහන්සේ ඒ භිකෂූන් ගේ කථාව අසා වැඩසිටි සේක් ම "මහණෙනි, කුමක් කියවු දෑ" යි වදාළ සේක.

5. "වහන්ස, චුලලකාලයාට භාය්‍යාවෝ දෙදෙනෙක, මොහුට අට දෙනෙක, අට දෙනකු විසින් වට කැරැගන්නා ලද්දේ කුමක් නො කළහැක්කේ දෑ?" යි ඔහු කීහ.

6. "භවත්නි, ධම්දේශනාව පුදුම යි. මනා කරුණෙක් කියන ලද්දේ ය. මා විසින් මේ සම්පත් දෙක ම නිපදවන කාර්‍යයක් කරන්නට වටී" යැ යි හේ සිතී ය.

7. යමකුට මේ තෙමේ හෝ මෙබන්දෙක් පුත් වේ ද ඒ පියා ඒකානතයෙන් නිවුණේ වේ. ඒ මව ද ඒකානතයෙන් නිවුණී වේ.

8. දීපංකර බුදුරජු විසින් මඩ මත්තෙහි වැදහොත් සුමේධ තවුසා දැක අනාගතයෙහි මෙ තෙම ගෞතම නම් සමමාසමබුදුවරයෙක් වන්නේ යැ යි විවරණ දෙන ලද්දේ ය.

9. "දරුවනි, කිමෙක් ද? තොප විසින් අමාමඟ පෙන්වන්නෙක් ලබන ලද දෑ?" යි පිරිවැජියා සිය අතැවැසියන් විචාළේ ය.

10. බුදුරජු නොඋපන් කල්හි ම රජගහනුවරට නොදුරෙහි උපතිසස ගම ද කෝලිත ගම දෑ යි බමුණු ගම් දෙකෙක් වී ය.

* * *

## කිච්චපපච්චයන්ත පද

123. **තොප විසින් ගස කැපිය යුතු ය.** මෙය පාලියට නැඟූ විට **තුම්හෙහි රුක්ඛො ඡෙත්තබ්බො** යි සිටී. **ඡෙත්තබ්බො** යන්න වෙනුවට **ඡින්දිතබ්බො** කියා හෝ **ඡෙදනීයො** කියා හෝ **ඡෙජ්ජො** යි ද යොදත හැක්ක. මෙහි ඡෙත්තබ්බො යන්න හැදී ඇත්තේ **ඡිද්** ධාතුවට **තබ්බ** ප්‍රත්‍යය එක් වීමෙනි. ඡින්දිතබ්බො යන්න **ඡින්ද** යන ආඛ්‍යාත අඞගයට **තබ්බ** ප්‍රත්‍යයය එක් වී හැදී ඇත. ඡෙදනීයො යන්න ඒ ධාතුවට ම **අනීය** ප්‍රත්‍යය එක්වීමෙන් ද ඡෙජ්ජා යන්න ඒ ධාතුවට ම **ය** ප්‍රත්‍යයය එක් වී ද හැදී ඇත. මේ **තබ්බ** ආදි ප්‍රත්‍යයයන් තුන්දෙනා ම එක්ව හැදෙන පද කර්මවාචක ද භාවවාචක ද වේ. මෙ තැන්හි කර්මවාචක ය. එ බැවින් කර්මය වූ රුක්ඛ(ගස) යන්න ප්‍රථමා විභක්තියෙන් සිටී.

මේ **තබ්බ** ආදිය ධාතුවට එක් වූ විට ධාතුවේ මුල ස්වරයට වෘද්ධි වේ හෙවත් **අ** යන්න **ආ** කාර වේ. **ඉ** යන්න **එ** කාර වේ. **උ** යන්න **ඔ** කාර වේ. **තබ්බ** ප්‍රත්‍යයයයේ **ත** යන්නට මුලින් සිටි ධාතුවේ අග කුරට ඉහත **ත** ප්‍රත්‍යයය සම්බන්ධයෙන් කී වෙනස **ම** වේ. යට 43 වැනි පාඩම බලනු.

**ය** ප්‍රත්‍යයය එක්වීමේ දී ධාත්වන්තයට වන වෙනස යට 40 වැනි පාඩමේ දැක්වූ පරිදි ම දතයුතු.

ඡිද් + තබ්බ + ඡෙද් + තබ්බ - ඡෙත්තබ්බ
(සින්දූ යුතු, සින්දූ හැකි)

ඡිද් + අනීය - ඡෙදනීය (සින්දූ යුතු, සින්දූ හැකි)

ඡිද් + ය - ඡෙද් + ය - ඡෙජ්ජ (සින්දූ යුතු, සින්දූ හැකි)

**124.**

කර් + තබ්බ – කත්තබ්බ, කාතබ්බ(කළ යුතු, කළ හැකි)
කර් + අනීය – කරනීය – කරණීය*(කළ යුතු, කළ හැකි)
කර් + ය – කාර් + ඉ + ය – කාරිය (කළ යුතු, කළ හැකි)

**125.**

පච් + තබ්බ – පච් + ඉ + තබ්බ – පචිතබ්බ
(පිසියැ යුතු, පිසියැ හැකි)

පච් + අනීය – පචනීය (පිසියැ යුතු, පිසියැ හැකි)

පච් + ය – පච්ය – පච්ච (පිසියැ යුතු, පිසියැ හැකි)

**126.** **ය** ප්‍රත්‍යයා එක්වීමේදී **ද පා** ආදි සමහර **ආ**කාරාන්ත ධාතූන්ගේ අන්ත **ආ**කාරය **එ** කාර බවට පෙරළේ. **ය්** කාරයට ද්විත්ව(ය්ය්) වේ.

පා + ය – පෙය – පෙය්‍ය (පියැ යුතු, පියැ හැකි)
ද + ය – දෙය – දෙය්‍ය(දියැ යුතු, දියැ හැකි)

**127.**

නී + ය – නෙය – නෙය්‍ය(පැමිණැවියැ යුතු, පැමිණැවියැ හැකි)
කී + ය – කෙය – කෙය්‍ය(මිලයට ගත යුතු හෝ ගත හැකි)

**128.** ධාත්වන්ත **උ** වර්ණයට **අව්** වේ.

භූ + ය – භව් + ය – භව්‍ය(වියැ යුතු හෝ වියැ හැකි)
ලු + ය – ලව් + ය – ලව්‍ය(කැපියැ යුතු හෝ කැපියැ හැකි)

---

*ර කාරයෙන් පර වූ **න** යන්න **ණ** යන්න බවට පෙරළේ.

**129.** **ච්ය චච** වේ. **ජ්ය** යනු **ජජ** වේ. කිසි තැනෙක **ගග** වේ. **ම්ය** යනු **මම** වේ. **හ්ය** යනු **ය්හ** වේ.

වච් + ය - වච්ච (කියැ යුතු, කියැ හැකි)

වජ්ජ + ය - වජ්ජ (හළ යුතු, හළ හැකි)

භුජ් + ය - භොජ්ජ, භොග්ග(වැළඳියැ යුතු, වැළැඳිය හැකි)

යුජ් + ය - යොග්ග (යෙදියැ යුතු, යෙදියැ හැකි)

ගම් + ය - ගම්‍ය, ගම්ම (යැ යුතු, අවබෝධ කටයුතු, අවබෝධ කටහැකි)

ගරහ් + ය - ගාරය්හ (ගැරැහියැ යුතු, ගැරැහියැ හැකි)

**130.** වර්තමානකාලික ආඛ්‍යාතයේ අඩගයට ද තබ්බාදිය එක් වේ. **තබ්බ** ප්‍රත්‍යයයට මුලින් **ඉ** කාරයෙක් ආගම වේ. (අමුතුවෙන් පැමිණේ.)

දෙසය + තබ්බ - දෙසයිතබ්බ(දෙසියැ යුතු, දෙසියැ හැකි)

භාවය + තබ්බ - භාවයිතබ්බ(වැඩියැ යුතු, වැඩියැ හැකි)

ලුනා + තබ්බ - ලුනිතබ්බ(කැපියැ යුතු, කැපියැ හැකි)

**131.** අඩගය **එ**කාරාන්ත වී නම් **තබ්බ** ප්‍රත්‍යයයට මුලින් **ඉ** ආගමය නොවී ද පදය සෑදේ.

භාවෙ + තබ්බ - භාවෙතබ්බ(වැඩිය යුතු, වැඩිය හැකි)
දෙසෙ + තබ්බ - දෙසෙතබ්බ(දෙසියැ යුතු, දෙසියැ හැකි)

**132.** **අනීය** ප්‍රත්‍යයයා එක් වූ තැන අඩගයේ අග **එ**කාරයට ලොප් වේ.

භාවෙ + අනීය - භාව් + අනීය - භාවනීය
දෙසෙ + අනීය - දෙස් + අනීය - දෙසනීය
මානෙ + අනීය - මාන් + අනීය - මානනීය

කෙළින් ම **භූ, දිස්, මාන්** යන ධාතුනට **අනීය** ප්‍රත්‍යය එක් කිරීමෙන් ද මේ පද මෙසේ ම සෑදිය හැකියි.

**133.** මේ ප්‍රත්‍යයයන් එක් වැ හැදෙන කෘදන්තයන්ගෙන් කර්මය උක්ත වේ. එ තන්හි කර්මය ද කෘදන්තය ද ලිඞ්ග සඞ්ඛ්‍යා විභත්ති යන තුනින් ම සමාන ව සිටිත්.

රුක්ඛො ඡෙත්තබ්බො(ගස කැපිය යුතු)
රුක්ඛා ඡෙත්තබ්බා(ගස්හු කැපියැ යුතු හ)
ලතා ඡෙත්තබ්බා(වැල කැපියැ යුතු)
පුඤ්ඤං කත්තබ්බං(පින කළ යුතු)
පුඤ්ඤානි කත්තත්තබ්බානි(පින් කළ යුතු)

**134.** මෙසේ **තබ්බ** ආදි ප්‍රත්‍යයයන් එක් වැ හැදෙන පද ඒවායේ කර්මයට විශෙෂණ ව ද සිටී.

ඡෙත්තබ්බො රුක්ඛො(කැපිය යුතු ගස)
ඡෙත්තබ්බම්හි රුක්ඛම්හි(කැපිය යුතු ගසෙහි)
කත්තබ්බස්ස පුඤ්ඤස්ස ඵලං(කළ යුතු පිනේ විපාකය)

**135.** මේ කිච්චප්‍රත්‍යයාන්තයා ගේ කර්තෘ පදය තතියා විභත්තියෙන් සේ ම ඡට්ඨීවිභත්තියෙන් ද සිටී.

තෙන කත්තබ්බං, තස්ස කත්තබ්බං(ඔහු විසින් කළ යුතු)
භික්ඛුනා සරණීයං, භික්ඛුනො සරණීයං
(භික්‍ෂූහු විසින් සිහි කටයුතු)

## උක්තාර්ථ පූරක පදය

**136. හේ වෙයි** කී විට අර්ථය සම්පූර්ණ නැත. "හේ කවරෙක් හෝ කෙබඳු වෙයි ද?" යි ප්‍රශ්නය නැඟේ. **හේ අචාර්‍ය්‍යයෙක් වෙයි, පණ්ඩිතයෙක් වෙයි** කී විට **අචාර්‍ය්‍යයෙක්, පණ්ඩිතයෙක්** යන පද දෙකින් අර්ථය සම්පූර්ණ වෙයි. පාලියට නැඟුවිට **සො ආචරියො හොති, සො පණ්ඩිතො හොති** යි සිටී. මෙහි උක්ත පදයේ අර්ථය ආචරියො පණ්ඩිතො යන පද දෙකින් සම්පූර්ණ ව ඇත. මෙසේ සිටින පද උක්තාර්ථපූරක පද නම් වේ. උක්තාර්ථ-පූරකය ද සඞ්ඛ්‍යාවෙන් ද විභක්තියෙන් ද උක්තපදයට සමාන ව සිටී. **හේ ආචාර්‍ය්‍යයා වෙයි** යන්න පාලියෙන් **සො ආචරියො**

**භවති** යි සිටී. ඔහු **ආචාර්යයා විය යුතු** යි යන්න පාලියට පෙරළීමේ දී **තෙන ආචරියෙන භවිතබ්බං** යි තෙන යන්නට සංඛ්‍යා විභත්ති දෙකින්ම සමානව සිටී. සෙසු තැන්වල ද මේ අනුව අර්ථ ගන්නට සිතට ගත යුතු.

## සන්ධි

**137.** බින්දුවෙන් පරවූ සවරයට ලොප් වේ. ඒ ලොප් වූ තැන අවග්‍රාහ ලකුණ යෙදේ.

ඒවං අසි = ඒවං'සි.

**138. ය් ව් ම් ද් න් ත් ර් ල්** යන අකුරු සවරයකට මුලින් ආගම(අමුතුවෙන් එකතු) වේ.

න + ඉමස්ස - න + ය් + ඉමස්ස - නයිමස්ස

ති + අඞ්ගිකං - ති + ව් + අඞ්ගිකං - තිවඞ්ගිකං

ලහු + එස්සති - ලහු + ම් + එස්සති - ලහුමෙස්සති

අත්ත + අත්ථං - අත්ත + ද් + අත්ථං - අත්තදත්ථං

ඉතො + ආයති - ඉතො + න් + ආයති - ඉතොනායති

තස්මා + ඉහ - තස්මා + ත් + ඉහ - තස්මාතිහ

ඡ + අභිඤ්ඤා - ඡ + ළ් + අභිඤ්ඤා - ඡළභිඤ්ඤා

### ශබ්ද මාලාව

### පුංලිඞ්ගික නාම

ධම්ම(ස්වභාවය) වෙජ්ජ(වෙද)

සුවණ්ණකාර(රන්කරුවා) විවාද(විවාදය)

අය්‍ය(ආර්යයා, සාමිදරුවා) දයාද(උරුමක්කාරයා)

### ස්ත්‍රීලිඞ්ගික නාම

අනුසාසනී(අනුශාසනය)

මෙත්තා(මෛත්‍රිය)

භාවනා(භාවනාව)

## නපුංසකලිඞගික නාම

| | |
|---|---|
| චෙතන (චැටුප්) | අනගාරිය (පැවිද්ද) |
| සුසාන (සොහොන) | බ්‍රහ්මචරිය (බඹසර) |
| අගාර (ගිහිගෙය) | අමරණ (මරණය නැතිබව) |
| ආතපප (වීයර්‍ය) | |

## කිචචනත

| ධාතුව | කිචචනතය |
|---|---|
| කර්(කා) | කාතබබ(කළයුතු) |
| දා | දාතබබ(දියැ යුතු) |
| වි + ධා | විධෙය්‍ය(විධාන කට හැකි, වසඟ කට හැකි) |
| ප + අත්ථ් | පත්ථිය(පැතියැ යුතු) |
| භූ | භා◌ිතබබ(වියැ යුතු) |
| සිකඛ | සිකඛිතබබ(හික්මිය යුතු, උගත යුතු) |
| විද් | වෙදිතබබ(දත යුතු) |
| වත්ත් | වතතිතබබ(පැවැත්ත යුතු) |
| සර් | සරණීය(සිහි කට යුතු) |
| ආ + වර් | ආවරණීය(ඇවිරියැ යුතු) |
| සෙව් | සෙවිතබබ(සෙවනය කළ යුතු) |
| භජ් | භජිතබබ(භජනය කළ යුතු) |
| පරි + උප + ආස් | පරියුපාසිතබබ, පයිරුපාසිතබබ (පර්යුපාසනය කළ යුතු, ළඟින් ඉන්දෑ යුතු) |
| කර් | කරණීය(කළ යුතු) |
| චර් | චරිතබබ(හැසිරිය යුතු, කළ යුතු) |
| පති + අව + ඉක්ඛ් | පචචවෙකඛිතබබ(නුවණින් සලකා බැලිය යුතු) |
| ප + මද්(පමජජති) | පමජජිතබබ(පමා වියැ යුතු)<br>අපපමජජිතබබ(නො පමා වියැ යුතු) |

### ක්‍රියා

ආචික්ඛති(කියයි)
ආනෙති(ගෙනෙයි)
පසාදෙති(පහදවයි)
පත්‍ථයති(පතයි)
ගරුකරොති(ගරු කරයි)
අභිනිවජ්ජෙති(දුරු කරයි)
ඔභාරෙති(බායි)
පරිසොධෙති(පිරිසිදු කරයි)
සක්කරොති(සත්කාර කරයි)

### විශෙෂණ

කුසීත(අලස)
අමායාවී(මායා නැති)
අසඨ(නො සොර)

### පූර්වක්‍රියා

අභිඤ්ඤාය(වෙසෙසින් දැන)
සමාදය (සමාදන් ව ගෙන)

### ඇබෑසිය

**(අ) සිංහලයට නඟන්න.**

1. ඉදානි භන්තෙ කිං කාතබ්බං?
2. සචෙ සුවණ්ණකාරස්ස ආචික්ඛිස්සාමි වෙතනං දාතබ්බං භවිස්සති.
3. ඉදානි මෙ හත්‍ථා පි අවිධෙය්‍යා.
4. අඤ්ඤං මෙ කාතබ්බං නත්‍ථි තස්මා මනමෙව පසාදෙමි.
5. බාලො බො ත්‍වං'සි මාණව යො ත්‍වං අපත්‍ථියං පත්‍ථයසෙ.
6. අජ්ජ පබ්බජිතානං විචාදෙන භවිතබ්බන්ති රාජා පරිසංකමානො "කච්චි ඉමස්මිං නගරෙ පබ්බජිතා අත්‍ථී"ති පුච්ඡි.
7. භන්තෙ සුසානෙ වසන්තෙන නාම අඤ්ඤෙන කුසීතෙන න භවිතබ්බං අසඨෙන අමායාවිනා භවිතබ්බං.
8. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං.
9. එකංසෙන අකරණීයං අක්ඛාතං භගවතා කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං.

10. යෙහි තීහි ධම්මෙහි සමන්නාගතො බාලො වෙදිතබ්බො තෙ තයො ධම්මෙ අභිනිවජ්ජෙත්වා, යෙහි තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො වෙදිතබ්බො තෙ තයො ධම්මෙ සමාදය වත්තිතබ්බං.

(ආ) පාලියට නඟන්න.

1. මහණෙනි, යම් තැනෙක දී මහණතෙම හිසකේ ද රැවුලු ද බා ගිහිගෙන් නික්ම සස්නට වන්නේ ද ඒ තැන දිවි ඇතිතාක් සිහි කටයුතු ය.

2. මහණහු විසින් ඇවිරියැයුතු දහමුන් කෙරෙන් සිත පිරිසිදු කටයුතු ය.

3. මහණෙනි, සත්කාර කොට, ගරුකාර කොට සේවනය කළයුතු භජනය කළයුතු පර්‍යුපාසනය කළයුතු පුද්ගලයෙක් ඇත.

4. ලාමක වූ දහමුන් නොකිරීමට වෑයම් කළයුතු ය.

5. මහණෙනි, වෙසෙසින් දැනගෙන ම දහම් දෙසන මගේ අවවාදය කළයුතු ය, අනුශාසනය කළ යුතු ය(පිළිපැදිය යුතු ය).

6. කුසලය කළයුතු ය, බඹසර සැරියයුතු ය, උපන්නහුට නොමැරෙන බවෙක් නැත.

7. තොප විසින් දන් දියැ යුතු ය, සිල් රැක්ක යුතු ය, භාවනා වැඩියැ යුතු ය.

8. යම් කර්‍මයක් කරන්නෙම් ද එයට උරුමකරු වන්නෙම් යි පැවිද්ද විසින් නිතර නුවණින් සලකා බැලිය යුතු ය.

9. සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය වැඩියැ යුතු ය.

10. තමන් විසින් කළ යුතු කාර්‍යයන්හි තොප විසින් නොපමා වියැ යුතු.

* * *

## කාලාතිපත්ති විභත්තිය

139. කරන්නට තුබුණු හෝ වෙන්නට තුබුණු යමක් කිසියම් අඩුපාඩුවෙකින් වැළකී ගියේ නම් එය ඇඟැවීමෙහි කාලාති-පත්ති විභත්තිය යෙදේ. **හෙතෙම පළමු වයසෙහි පැවිදි වී නම් රහත් වන්නේ ය(රහත් වන්නට තුබුණි).** එහෙත් පැවිදි නො වූයේ ය. එ බැවින් රහත්වීම වැළැකුණි. මෙහි **හෙතෙම පළමු වයසෙහි පැවිදි වූයේ නම් රහත් වන්නේ ය(රහත් වන්නට තුබුණි)** යන වැකිය පාලියට නැඟූ විට **සචෙ සො පඨමවයෙ පබ්බජිස්සා අරහත්තං පාපුනිස්සා** යි සිටී. මෙහි පබ්බජිස්සා යනු ද පාපුනිස්සා යනු ද කාලාතිපත්ති විභත්ති වේ.

**කත්තුකාරකයෙහි**

**පරස්සපදයෙහි**

| | ඒක | බහු |
|---|---|---|
| **පඨම පුරිස** | අකරිස්සා | අකරිස්සංසු |
| **මජ්ඣිම පුරිස** | අකරිස්සෙ | අකරිස්සථ |
| **උත්තම පුරිස** | අකරිස්සං | අකරිස්සම්හා |

**කත්තුකාරකයෙහි**

**අත්තනොපදයෙහි**

| | ඒක | බහු |
|---|---|---|
| **පඨම පුරිස** | අකරිස්සථ | අකරිස්සංසු |
| **මජ්ඣිම පුරිස** | අකරිස්සසෙ | අකරිස්සව්හෙ |
| **උත්තම පුරිස** | අකරිස්සෙ | අකරිස්සාමහසෙ |

## මෙහි විභත්තිප්‍රත්‍යයයෝ

| | පරස්සපදයෙහි | | අත්තනොපදයෙහි | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | ස්සා | ස්සංසු | ස්සථ | ස්සංසු |
| ම: පු: | ස්සෙ | ස්සථ | ස්සසෙ | ස්සව්හෙ |
| උ: පු: | ස්සං | ස්සම්හා | ස්සෙ | ස්සාම්හසෙ |

**140.** මෙහි ද ධාතුවට මුලින් අකාරයෙක් එක් වේ. ඒ අකාරය එක් නොවී ද පදය සෑදේ. අකරිස්සා යන්න වෙනුවට කරිස්සා යි ද යොදත හැක්ක.

**අකරිස්සා** වැනි තන්හි අග **ස්සා** යන්න **ස්ස** යි ද සිටී. **අකරිස්ස.**

**141.** මෙය කම්කාරකයෙහි අකරීයිස්සා, කරීයිස්සා, අකරීයිස්සංසු, කරීයිස්සංසු යන ආදීන් වරනැඟේ.

**142.** අතීත අනාගත කාල දෙක්හි ම මෙය යෙදෙයි.

සො චෙ උපකරණානි අලභිස්සා භත්තං පචිස්සා.
(හේ උපකරණ ලැබී නම් බත පිසන්නේ ය.
– බත පිසන්නට තුබුණි).

මේ අතීතකාලාර්ථයෙහි යෙදෙන සැටි යි.

සචේ'හං න ගමිස්සාමි මහාජානිකො අභවිස්සං.
(මම් නොයන්නෙම් නම් මහා පිරිහීම් ඇත්තෙම්
වන්නෙම්. – විය හැක්කෙම්).

මේ අනාගතකාලාර්ථයෙහි යෙදෙන සැටි යි.

## ශබ්ද මාලාව

### පුංලිඞ්ගික නාම

සමමුඛීභාව(හමු වීම)

ඉතතරසතත(ලාමක සත්ත්වයා)

පචචය(ප්‍රත්‍යයය, උපකාරය)

ධමම(සවභාවය)

සමෙභද(මිශ්‍ර වීම)

අජෙළක(එළුබැටෙළු)

කුකකුට සූකර(කුකුළු ඌරු)

සොණ සිගාල(බලු සිවල්)

ධමමරාජ(ධාර්මික රජ)

චකකවතතී(සක්විති රජ)

ආයතිභව(මතු සසර)

මාතුකුචඡි(මවු කුස)

මාතුගාම(මාගම, ස්ත්‍රී)

ධමමවිනය(ශාසනය)

අතත(ආත්මය, තමා)

ආබාධ(ආබාධය)

කමමනත(කර්මාන්තය)

සෙටඨී(සිටු)

පරිබබය(වියදම)

### ස්ත්‍රීලිඞ්ගික නාම

උපමා(උපමාව)

හිරි(ලජජාව)

ලොහිතනදී(ලේගඟ)

පරිහානි(පිරිහීම)

### නපුංසකලිඞ්ගික නාම

නිසසරණ(නික්මීම)

ධමමචකඛු(දහම් ඇස)

විඤඤාණ(සිත)

නාමරූප(නාමරූප දෙක)

ඔතතපප(භය)

බ්‍රහමචරිය(බඹසර)

රූප(රූපය)

වය(වයස)

යාන(යානය)

බාල්‍ය(ළපටි වයස)

සිපප(ශිල්ප)

ධන(මුදල්)

## විශේෂණ

මාදිස(මාවැනි)

අජාත(නො උපන්)

අකත(ප්‍රත්‍යයයෙකින් නොකැරුණු)

එවරූප(මෙ බඳු)

අසංඛත(නො සැකැසුණු)

සුකක(සුදුපැහැති)

ධම්මික(දැහැමි)

භාරිය(බැරෑරුම්)

විරජ(කෙලෙස් ධූලි නැති)

ඊදිස(මෙබඳු)

තථාගතප්පවේදිත(බුදුරජුන් වදාළ)

ඔනද්ධ(වැසුණු)

වීතමල(කෙලෙස් මල පහ වූ)

අභූත(නො වූ, භවයට නොඅයත්)

කප්පට්ඨිතික(කල්පසථායී, කපක් පවත්නා)

## ආඛ්‍යාත

නිස්සරති(නික්මෙයි)

ආහරති(ගෙන හැර පායි)

ඔක්කමති(බසී)

සමුච්චීයති(එකට පහළ වෙයි, එක් රැස් වෙයි)

වොරොපෙති(තොර කරයි)

පඤ්ඤායති(පැණෙයි)

පාතුභවති(පහළ වෙයි)

පවත්තති(පවතී)

බෙපෙති(වියදම් කරයි)

පයොජෙති (යොදයි)

ලභති(ලබයි)

භවති(වේ, ඇති වේ)

උග්ගණ්හාති(උගනී)

වායමති(උත්සාහ කරයි)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. නො චෙ තං භිකඛවෙ ලොකමහා නිසසරණං අභවිසසා නයිමෙ සතතා ලොකමහා නිසසරෙයයුං.

2. සචෙ තුමෙහ මාදිසසස බුදධසස සමමුඛීභාවං නාගමිසසථ කපපටඨිතිකං වො වෙරං අභවිසස.

3. සචායං පුරිසො ඉතතරසතෙතා අභවිසස නාමහාකං ආචරියො එවරූපං උපමං ආහරිසසති.

4. විඤඤාණං හි ආනනද මාතුකුචඡිං න ඔකකමිසසථ අපිනුඛො නාමරූපං මාතුකුචඡිසමිං සමුචචිසසථ?

5. දෙව'මෙ භිකඛවෙ සුකකා ධමමා ලොකං පාලෙනති, කතමෙ දෙව? හිරි ච ඔතතපපං ච. ඉමෙ චෙ භිකඛවෙ දෙව ධමමා ලොකං න පාලෙයයුං......... සමෙභදං ලොකො අගමිසස යථා අජෙළකා කුකකුට සූකරා සොන සිගාලා.

6. සචායං රාජා පිතරං ධමමිකං ධමමරාජානං ජීවිතා න වොරොපෙසසථ ඉමසමිං යෙවාසනෙ තසස විරජං වීතමලං ධමමචකඛු උපපජජිසසථ.

7. නොචෙතං භිකඛවෙ අභවිසස අජාතං අභූතං අකතං අසංඛතං නයිධ ජාතසස භූතසස කතසස සංඛතසස නිසසරණං පඤඤායෙථ.

8. සචෙ හි දෙවදතෙතා න පබබජිසස ගිහී හුතවා කමමං ච භාරියං අකරිසස ආයතිභවසස පචචයං කාතුං නාසකඛිසස.

9. සචෙ ආනනද නාලභිසස මාතුගාමො තථාගතපපවෙදිතෙ ධමමවිනයෙ අගාරසමා අනගාරියං පබබජජං, චිරටඨිතිකං ආනනද බ්‍රහමචරියං අභවිසස.

10. කසමා මහාරාජානො එවරූපං කරොථ? මයි අසනෙත අජජ ලොහිතනදී පවතතිසසථ.

(ආ) පාලියට නඟන්න.

1. ඉදින් තෙපි මා හමුවට නාවහු නම් තොප ගේ වෛරය කල්පස්ථායී වන්නේ ය.

2. මහණෙනි, මේ රූපය ආත්මයෙක් වී නම් මෙය ආබාධ පිණිස නො පවත්නේ ය.

3. මෙ තෙම පළමු වයසෙහි භොගයන් වියදම් නොකොට කර්මාන්තයෙහි යෙදී නම් මේ නුවර අග්‍ර සිටු වන්නේ ය.

4. ඉදින් ශාස්තෘන් වහන්සේ ගිහිගෙහි වුසූ සේක් වී නම් සක්විති රජ වන සේක.

5. හෙතෙම ඊයේ යානය ලැබුයේ වී නම් එහි යන්නේ ය.

6. ළපැටි වියේ දී ශිල්ප ඉගෙන ගන්නට උත්සාහ කළෙම් වීම් නම් අද මෙ බඳු පිරිහීමෙක් නොවන්නේ ය.

7. ශාස්තෘන් වහන්සේ පහළ නොවූ සේක් වී නම් මෙලොව අඳුරෙන් වැසුණක් වන්නේ ය.

8. මා වෙත මුදල් තුබුණේ වී නම් ඒ ගෙය මිළයට ගන්නට තුබුණි.

9. ගමනට වියදම් ලැබීම් නම් මම් එන්නෙම්(මට එන්නට තුබුණි).

10. දුටඨගාමිනී රජ නො වී නම් සිංහල නම් වූ මනුෂ්‍ය ජාතියෙක් අද ඇති නොවන්නේ ය.

* * *

# පාඩම 46

**සමාස**

**143.** පද කැටි කිරීම සමාස නම්. පද කීපයක් එකට කැටි වූ විට එක් පදයෙක් වේ. මෙසේ සමාස වීමෙහි දී අකුරු සන්ධි වියැ යුතු තැනක් වුවොත් සන්ධි ද වේ.

| සමාස වන්නට පෙර | සමාස වූ පසු | අර්ථය |
|---|---|---|
| අ. සෙතං වත්ථං | සෙතවත්ථ | සුදු රෙද්ද |
| ආ. දුක්ඛං පත්තො | දුක්ඛප්පත්ත | දුකට පත් |
| අග්ගිනා දඩ්ඪං | අග්ගි දඩ්ඪ | ගින්නෙන් දැ |
| බ්‍රහ්මුනා දත්තො | බ්‍රහ්මදත්ත | බ්‍රහ්මයා විසින් දෙන ලද්දේ |
| චීවරාය වත්ථං | චීවරවත්ථ | සිවුරු පිණිස රෙද්ද |
| රුක්ඛම්හා පතිතො | රුක්ඛපතිත | ගසින් වැටුණු |
| රඤ්ඤො ධීතා | රාජධීතු | රජු ගේ දූ |
| ගාමෙ වාසො | ගාමවාස | ගමෙහි විසීම |
| ඉ. දෙවා ච මනුස්සා ච | දෙවමනුස්ස | දෙවියෝත් මිනිස්සුත් |
| ඊ. තීනි පිටකානි | තෙපිටක | තුන් පිටකය |
| උ. ආරද්ධං විරියං යෙන සො | ආරද්ධවිරිය | ආරම්භ කළ වීර්‍යය ඇති |
| ආචිණ්ණං චඞ්කමනං යෙන සො | ආචිණ්ණචඞ්කමන | පුරුදු කළ සක්මන් ඇති |
| ඌ. සුඛං යථා | යථාසුඛං | සුව සේ |

**144.(අ).** සෙතං වත්ථං(සුදු වස්ත්‍රය) යි කී තැන සෙතං(සුදු) යනු වත්ථං(වස්ත්‍රය) යන්නට විශේෂණයි. වත්ථං යනු විශේෂ්‍ය පද ය යි. මෙසේ විශේෂණ විශේෂ්‍ය පද දෙකක් එක් වීමෙන් ඇති වූ සමාසය **විශේෂණ සමාස** යි. මෙය පාලියෙහි **කම්මධාරය සමාස** නමින් ව්‍යවහාර යි.

**144.(ආ).** දුක්ඛං පත්තො(දුකට පැමිණියේ), අග්ගිනා දඩ්ඪං (ගින්නෙන් දැ), බ්‍රහ්මුනා දත්තො(බඹා විසින් දෙන ලද), චීවරාය වත්ථං(සිවුරු පිණිස වස්ත්‍ර), රඤ්ඤො ධීතා(රජු ගේ දූ), ගාමෙ වාසො(ගමේ විසීම) යන මේ තැන්හි පදයන් ගේ අගැ සිටි විභක්ති ප්‍රත්‍යයයන් ලොප් වැ සමාස වැ පිළිවෙළින් දුක්ඛ-පපත්ත, අග්ගිදඩ්ඪ, බ්‍රහ්මදත්ත, චීවරවත්ථ, රුක්ඛපතිත, රාජධීතු, ගාමවාස යන පද සෑදී ඇත. මේ **විභක්ති සමාස** යි. පාලියෙහි මෙයට **තප්පුරිස සමාස** යැ යි ව්‍යවහාර යි.

**144.(ඉ).** දෙවා ච මනුස්සා ච(දෙවියෝ ද මිනිස්සු ද) යන තැන **ච** ශබ්දයෙන් එකට ගෙන දක්වන ලද පද ඒ ඒ ශබ්දයත් ඒ නාමපදවල විභත්තිත් ඉවත් කොට දෙවමනුස්ස යි සෑදිණ. බොහෝ දෙනකු එක් ගොඩකට ගෙන දක්වන ලද මේ සමාස නයින් හැදුණු පද සමහරෙක් ඒකවචනයේ ද සමහරෙක් බහුවචනයේ ද වරනැඟෙත්. වෙන් වූ බොහෝ දෙනකු හැඟවීමේ දී බහුවචනාන්ත වෙත්. දෙවමනුස්සා(දෙවියෝත් මිනිස්සුත්), චන්දසුරියා(හිරුත් සඳුත්) යන ආදි තැන්හි මෙනි. කිහිපයක් එක් ගොඩකට ම ගෙන සැලැකූ තැන නපුංසක-ලිඞ්ගික ඒකවචනයෙහි වරනැඟෙත්. නච්චං ච ගීතං ච වාදිතං ච (නැටුම ද, ගැයුම ද, වැයුම ද) යන්න සමාස වැ නච්චගීත-වාදිතං යි ඒකවචනයෙහි වර නැඟේ. මේ සමාසය **දඅරුත් සමස්** යැ යි සිංහලයෙහි වැහැරැවේ. **චාත්ථ සමාස, ද්වන්ද සමාස** යි පාලියෙහි වැහැරැවේ.

**144.(ඊ).** සංඛ්‍යාවාචී(ගණන් පවසන) ශබ්ද මුලට සිට හැදෙන සමාස ද ඇත. තීනි පිටකානි(තුන් පිටකයෝ) යන්න සමාස වූ පසු තිපිටකං යි නපුංසකලිඞ්ගික ඒකවචනයෙහි වර නැඟේ (විභත්ති ප්‍රත්‍යයයන් ගනී). සමහර තැන බහුවචනාන්ත ව ද සිටිත්. තයො භවා(තුන් භවයෝ) යන්න සමාස වැ හැදුණු තිභව ශබ්දය වර නැඟෙන්නේ බහුවචනාන්ත ව ය. තිභවා, තිභවෙ ආදි වශයෙනි. මෙය **දිගුසමාස** නමින් බැවහර යි.

**144.(උ).** **කත** යනු **කරන ලද** යන අර්ථය දෙයි. **පුඤ්ඤ** යනු **පින්** ය. එහෙත් **කතපුඤ්ඤ** යන්න අන් පදයකට විශේෂණ වූ තැන **කළ පින් ඇති කෙනකු** පවසයි. මෙසේ පද එක් වැ අන්‍යාර්ථයක් හඟවනුයේ **අන්‍යාර්ථ සමාසයි**. මෙය පාලියෙහි **බහුබ්බීහි සමාස** නමින් හැඳින්වේ.

**144.(ඌ).** **සුඛං යථා**(සුවය යම් සේ වේ ද එසේ) යන්න සමාස වැ **යථාසුඛං** යී සිද්ධ වේ. **සුවසේ** යනු එහි අර්ථයි. අව්‍යය පදයේ(නිපාතයේ හෝ උපසර්ග පදයේ) අර්ථයට ප්‍රමුඛත්වය ලැබෙන සේ සැදෙන මේ වර්ගයේ සමාස **අව්‍යයීභාව සමාස** නමින් හැඳින්වේ. මේ වර්ගයේ සමාස පදයේ අග **අ** කාරය හෝ **ආ** කාරය වී නම් එය **අං** වේ. සුඛංයථා = යථාසුඛං(සුවසේ), ගඞ්ගාය පාරං = පාරගඞ්ගං(ගඟේ එගොඩ). සමාස පදය **ඉ** කාරාදි අකුරෙකින් අන්ත වී නම් වෙනස් නොවී සිටී. සත්ති යථා = යථාසත්ති(ශක්ති පරිදි).

**144.(එ).** කිසි සමාස පදයෙක මුල්පදයේ විභක්තිය නැති නොවී එසේ ම පවතී. **දෙවානං ඉන්ද** යන්න සමාස වී **දෙවින්ද** කියාත් **දෙවානමින්ද** කියාත් දෙ සැටියෙන් පදසිද්ධිය වේ. **දෙවානමින්ද** යන තැන **දෙවානං** යන පදයේ **නං** විභක්තිය නැති නොවී රැකී ඇත. **දෙවානං ඉන්ද** යනු සන්ධි ව **දෙවානමින්ද** යී වැ සිද්ධ වැ ඇත. **දෙවින්ද** යන තැන **දෙවානං** යන පදයේ ප්‍රකෘතිය වූ **දෙව** යන්නත් **ඉන්ද** යන්නත් සමාස වැ සන්ධි වැ **දෙවින්ද** යී සිද්ධ වේ.

මාතා ච පිතා ච යනු සමසන වැ මාතුපිතු යැ යි සිදුවිය යුතු නමුත් පඨමාවිභත්තික මාතා යන්න නො වෙනස් වැ මාතාපිතු යි සමාස පදය සිද්ධ වැ ඇත. මුල් පදයේ විභක්තිය ලොප් නො වී ඇති මෙ බඳු සමාසය **අලුත්ත සමාස** නමින් හැඳින්වේ.

## ශබ්ද මාලාව

**සමාස පද**

දසමාසච්චය(දස මාස අච්චය) - දස මස ඉක්මීම.

මාතාපිතු -(මා පිය දෙදෙනා).

වයප්පත්ත(වයං පත්ත) - තරුණ වයසට පැමිණි, වැඩුණු.

ඝරබන්ධන -(ගෙහි බැඳුම, සත්‍රියක ආවාහ කොට දීම).

තුච්ඡහත්ථ(හිස් අත් ඇති) තුච්ඡා හත්ථා යස්ස සො තුච්ඡහත්ථො

ජරාජජ්ජරිතා(ජරායෙන් දුදුරු වූ)
- ජරාය ජජ්ජරිතො = ජරාජජ්ජරිතො.

හත්ථපාද(අත් පා) - හත්ථා ච පාද ච - හත්ථපාද

අනස්සව(අවනත නො වන) - න අස්සවො - අනස්සවො,
අස්සව යන්නේ ධාතු ප්‍රත්‍යයනට අනුව අර්ථය: අසන, කන්යොමු කරන, කීකරු(ආ + සව)

විහතත්ථාම(නටුවාවූ කායශක්තිය ඇති) - විහතො ථාමො යස්ස සො = විහතත්ථාමො.

ලද්ධපබ්බජ්ජූපසම්පද(ලැබූ පැවිද්දත් උපසම්පදවත් ඇති), පබ්බජ්ජා ච උපසම්පද ච = පබ්බජ්ජූපසම්පද,
ලද්ධා පබ්බජ්ජූපසම්පද යෙන, සො ලද්ධපබ්බජ්ජූපසම්පදෙ.

ආචරියුපජ්ඣායාදි(ආචාර්‍ය්‍ය උපාධ්‍යාය ආදීහු)
ආචරියො ච උපජ්ඣායො ච = ආචරියුපජ්ඣායා,
ආචරියුපජ්ඣායා ආදි යෙසං, තෙ ආචරියුපජ්ඣායාදයො.

වුත්ථවස්ස(වැස නිමැ වූ වස් ඇති).
වුත්ථො වස්සො යෙන සො වුත්ථවස්සො.

ඡන්දානුරූප(නුවණට සුදුසු)
– ඡන්දස්ස අනුරූපං = ඡන්දානුරූපං.

බුද්ධවචන(බුදු වදන) – බුද්ධස්ස වචනං = බුද්ධවචනං.

සල්ලහුකවුත්ති(සැහැල්ලු දිවි පෙවෙත් ඇති)
– සල්ලහුකා වුත්ති යස්ස, සො සල්ලහුකවුත්ති.

පන්තසෙනාසනාභිරත(ගම් කෙළවරැ සෙනස්නෙහි ඇලුණු)
– පන්තෙ සෙනාසනෙ අභිරතො = පන්තසෙනාසනාභිරතො.

අරහත්තග්ගහණං(රහත්බව ගැන්ම)
– අරහත්තස්ස ගහණං = අරහත්තග්ගහණං.

යථාඵාසුකට්ඨානං(යම් පහසු තැනකට)
– ඵාසුකංඨානං අනතික්කම්ම = යථාඵාසුකට්ඨානං.

භවනිස්සරණ(භවයෙන් නික්මීම)
– භවම්හා නිස්සරණං = භවනිස්සරණං.

තෙමාස(තුන් මස) – තිණ්ණං මාසානං සමාහාරො = තෙමාසං.

භික්ඛාචාරවෙලා(පිඬු පිණිස වඩනා වේලාව) – භික්ඛාය චාරො
– භික්ඛාචාරො, භික්ඛාචාරස්ස වෙලා = භික්ඛාචාරවෙලා.

දට්ඨුකාම(දකිනු කැමති) – දට්ඨුං කාමෙතීති දට්ඨුකාමො.

අන්තරාමග්ග(අතරමඟ)
– මග්ගස්ස අන්තරා – අන්තරා මග්ගෙ.

අමනුස්සුපද්දව(අමනුෂ්‍ය උපද්‍රව ඇති)
– අමනුස්සානං උපද්දවා යස්මිං, සො අමනුස්සුපද්දවො.

චීවරගහණාදි(සිවුරු ගැනුම් ආදිය)
– චීවරානං ගහණං ආදි යෙසං තෙ චීවරගහණාදි, තානි.

## ශබ්ද මාලාව

### ක්‍රියා

විජායති(වදයි)
සික්ඛති(උගනී)
එරති(පැතිර ගනී)
චඞ්කමති(සක්මන් කරයි)
වීතිනාමෙති(ඉක්මවයි)
පක්ඛන්දයති(පැණෙයි)
ආචික්ඛති(කියාදෙයි)

### පුංලිඞ්ගික නාම

සමණපාප(ශ්‍රමණපාපය)
පණව(පණා බෙරය)
ඉරියාපථ(ඉරියව්ව)
පාණක(පණුවා)
අටවි(වනය)
පණ්ඩුරොග(පාණ්ඩුරෝගය)
සංඛ(සක් ගෙඩිය)
ආලින්ද(පිල)
ආකාර(ආකාරය)

### ඝත්‍රීලිඞ්ගික නාම

නාසා, නාසිකා(නාසය)
විපත්ති(විපත, විනාශය)

### නපුංසකලිඞ්ගික නාම

ඤාණ(නුවණ)
අන්තොගෙහ(ගෙයැතුළ)
සාපතෙය්‍ය(ධනය, වස්තුව)
ජාල(දැල)
පාරුපන(පෙරැවීම)
වත්තපටිවත්ත(වත් පිළිවෙත්)

### විශෙෂණ හා සමාස

හතචක්ඛු(නටුවාවූ ඇස් ඇති)
තදභිමුඛ(එය අතටලූ මුහුණු ඇති)
ගතපුබ්බ(ගියවිරූ)
සචක්ඛුක(ඇස් ඇති)
අදින්නපුබ්බ(නොදුන්විරූ)
චක්ඛුවිකල(විකල ඇස් ඇති, අන්ධ වූ)

### නිපාත

බහි(පිටත)
අන්තො(ඇතුළත)

### ක්‍රියා

චිරායති(කල් යවයි)
පෙසෙති(යවයි)

## ඇබෑසිය

### (අ) සිංහලයට නඟන්න.

1. සා දසමාසචචයෙන පුතතං විජායි.
2. මාතාපිතරො තෙ වයපපතෙත ඝරබන්ධනෙන බන්ධිංසු.
3. විහාරං ගචඡනතා ච තෙ තුචඡහත්ථා නාම න ගතපුබබා.
4. ජරාජජජරිතා හොනති හත්ථපාද අනසසවා.
5. විහතත්ථාමො සො කථං ධමමං චරිසසති?
6. සො ලදධපබබජජූපසමපදෙ ආචරියුපජඣායාදීනං සනතිකෙ පඤ්චවසසානි වසිත්වා වුත්ථවසෙසා සත්ථාරං උපසංකමිත්වා “භනෙත ඉමසමිං සාසනෙ කති ධුරානී?”ති පුචඡි.
7. අතතනො පඤ්ඤානුරූපෙන එකං වා දෙව වා නිකායෙ සකලං වා පන තෙපිටකං උගගහෙත්වා තසස ධාරණං කථනං වාචනනති ඉදං ගන්ථධුරං නාම.
8. සලලහුකවුතතිනො පන පනතසෙනාසනාභිරතසස විපසසනං වඩෙඪත්වා අරහතතගහණනති ඉදං විපසසනාධුරං නාම.
9. උපාසකා, මයං යථාඵාසුකං ඨානං ගචඡාම.
10. මයං ඉමානි කුලානි නිසසාය භවනිසසරණං කරිසසාම
11. ආවුසො ඉමං තෙමාසං කතීහි ඉරියාපථෙහි වීතිනාමෙසසථ?
12. භිකඛු ථෙරං උපසංකමිත්වා භිකඛාචාරවෙලා’යං භනෙත’ති ආහංසු.
13. වුත්ථවසසා ච පන තෙ සත්ථාරං දටඨුකාමා හුත්වා ථෙරං ආහංසු “භනෙත සත්ථාරං දටඨුකාමා’මහා” ති.
14. අනතරාමගෙග අමනුසසපදදවො අටවි අත්ථි.
15. තෙ තං පබබාජෙත්වා චීවරගහණාදීනි සිකඛාපෙත්වා මගගං ආචිකඛිත්වා පෙසෙසුං.

(ආ) පාලියට නඟන්න.

1. ස්ත්‍රීන් ගේ කටහඬ මෙන් පුරුෂයා ගේ සියලු සිරුර පැතිර ගෙන සිටින්නට සමත් අන් ශබ්දයෙක් නැත.

2. ඇවැත්නි, ශ්‍රමණපාපයාත් පාපයා ම ය, ගිහි පාපයාත් පාපයා ම ය.

3. දැන් මම නටුවාවූ ඇස් ඇත්තෙම් වෙමි, කාන්තාර මාර්ගයට ද පැමිණියෙමි.

4. සථවිර තෙම හුන්නේ ම නාසයට තෙල වත්කොට ඇතුළුගමට පිවිසියේ ය.

5. නොයෙක් දහස් ගණන් බුදුවරු ඉක්මුණාහ.

6. ඇස්හු නැසෙත් වා හෝ බිඳෙත් වා, බුදුසස්න ම සිතව.

7. ඔහු තෙරහට කළ යුතු වත්පිළිවෙත් කොට ගමට පිඬුපිණිස වැඩියාහ.

8. ඒ භික්ෂූහු ඔහු පැවිදි කොට අඩමසක් පමණ කල් සිවුරු පෙරවීම් ආදීන් උගන්වා මාර්ගය කියාදී යැවූහ.

9. "දැන් ගී හඬෙක් ඇසිණ. එය ද ස්ත්‍රියක ගේ ය. හෙරණ ද කල් යවයි. හේ ශීලවිපත්තියට පැමිණියේ වනැ" යි සථවිර තෙම සිතී ය.

10. හෙතෙම තෙරහු ගේ බාලසොහොයුරා විසින් කරවනලද පන්සලට තෙරහු පමුණුවා අස්නෙක හිඳුවා තෙමේ කෙළෙඹියා වෙතට ගියේ ය.

* * *

## පරොක්ඛා විභත්තිය

### විභක්ති ප්‍රත්‍යයෝ

| | පරස්සෙම පද | | ආත්මනෙ පද | |
|---|---|---|---|---|
| | ඒක | බහු | ඒක | බහු |
| ප: පු: | අ | උ | ත්ථ | රෙ |
| ම: පු: | එ | ත්ථ | ත්ථො | ව්හො |
| උ: පු: | අ | මහ | ඉ | මෙහ |

### ධාතුව පච්

### පරස්සෙමපදයෙහි

| | | |
|---|---|---|
| ප: පු: | සො පපච<br>(හේ පිසීලු) | තෙ පපචු<br>(ඔහු පිසූහුලු) |
| ම: පු: | ත්වං පපචෙ<br>(තෝ පිසූයෙහිලු) | තුම්හෙ පපචිත්ථ<br>(තෙපි පිසූහුලු) |
| උ: පු: | අහං පපච<br>(මම් පිසීම්ලු) | මයං පපචිම්හ<br>(අපි පිසූමෝලු) |

### ආත්මනෙපදයෙහි

| | | |
|---|---|---|
| ප: පු: | සො පපචිත්ථ | තෙ පපචිරෙ |
| ම: පු: | ත්වං පපචිත්ථො | තුම්හෙ පපචිව්හො |
| උ: පු: | අහං පපචි | මයං පපචිම්හෙ |

අර්ථ පරස්සෙමපදයේ මෙන් ම ය.

කර්මකාරකයෙහි ආත්මනෙපදයෙහි පපච්චිත්ථ, පපචීයිත්ථ(පිසනු ලැබීලු) ආදි විසිනි.

කර්මකාරකයෙහි පරස්සෙමපදයෙහි පපච්ච, පපචීය ආදි විසිනි.

2. තමා ගේ ඇස් කන් නාස් ආදි ඉන්ද්‍රියයනට හමු නො වූ අනුන්ගෙන් ඇසූ කථාවක් ආරංචියක් පැවැසීමෙහි පරොක්ඛා(පරොක්‍ෂා) විභත්තිය යෙදේ. ත්‍රිපිටකයේ කිසි තැනෙක **ආහ -ආහු** යන දෙක මේ පරොක්‍ෂා විභත්තියට අයත් ය. වෙන පරොක්‍ෂා විභක්තික ක්‍රියාවෙක් ත්‍රිපිටකයේ නැත. දථාවංස, හත්ථවනගලලවංස ආදි පසු කාලයෙහි රචිත ග්‍රන්ථවල - බෙහෙවින් පද්‍යවල මෙය දක්නා ලැබේ.

3. පරොක්‍ෂා විභක්තික පද රූප තැනීමේ දී ධාතුවේ මුලකුර දෙකෙක් වේ. පච යන්න පපච යැ යි සිද්ධ වූ සේ ය. ධනික(මහාප්‍රාණ) අකුරක් දෙකක් වීමේ දී මුලකුර සිථිල(අල්ප) වේ. ධාවි යන්න දධාව වූවාක් මෙනි. එක අකුරක් මෙසේ දෙකක් වූ කල එහි මුලකුර **අබ්භාස**(අභ්‍යාස) නම්.

ශිෂ්‍යයන් ගේ පහසුව පිණිස වැඩිපුර දක්නට ලැබෙන පරොක්‍ෂා විභක්තියට අයත් ප්‍රථමපුරුෂ ඒකවචන රූප කිහිපයෙක් පහත දැක්වෙති.

4.

| **ධාතුව** | **වත්තමානා විභත්තිය** | **පරොක්ඛා විභත්තිය** |
|---|---|---|
| අද | අදති, අත්ති | ආද |
| කෑමෙහි | කයි | කෑයේ ලු |
| කම්ප | කම්පති | චකම්ප |
| සැලීමෙහි | සැලෙයි | සැලුණේ ය |
| කුප | කුප්පති | චුකොප |
| කිපීමෙහි | කිපේ | කිපුණේ ලු |
| කර | කරොති | චකාර |
| කිරීමෙහි | කරයි | කෙළ් ලු |
| බුභ | බොභති | චුබොභ |
| කැලැඹීමෙහි | කැළැඹෙයි | කැලැඹුණේ ලු |

| ධාතුව | වතතමානා විභතතිය | පරොකඛා විභතතිය |
|---|---|---|
| ඛන<br>කැනීමෙහි | ඛනති<br>කනී | චඛාන<br>කැනී ලු |
| ඛාද<br>කෑමෙහි | ඛාදති<br>කයි | චඛාද<br>කෑයේ ලු |
| ගද<br>කීමෙහි | ගදති<br>කියයි | ජගාද<br>කී ලු |
| ගම්<br>යෑමෙහි | ගචඡති<br>යයි | ජගාම<br>ගියේ ලු |
| ගුප<br>රැක්මෙහි | ගොපෙති<br>රකී | ජුගොප<br>රැකී ලු |
| ගහ<br>ගැනීමෙහි | ගණහාති<br>ගනී | ජගාහ<br>ගත්තේ ලු |
| චර<br>යෑමෙහි | චරති<br>හැවිදී | චචාර<br>හැවිද්දේ ලු |
| චල<br>සැලීමෙහි | චලති<br>සැලෙයි | චචාල<br>සැලුණේ ලු |
| චුමබ<br>සිඹීමෙහි | චුමබති<br>සිඹී | චුචුමබ<br>සිම්බේ ලු |
| තන<br>පැතිරවීමෙහි | තනොති<br>පතුරුවයි | තතාන<br>පැතිරැවී ලු |
| තුද<br>ඇනීමෙහි | තුදති<br>ඇනී | තුතොද<br>ඇන්නේ ලු |
| තුස<br>සතුටු වීමෙහි | තුසසති<br>සතුටු වේ | තුතොස<br>සතුටු වී ලු |
| තර<br>එගොඩ යෑමෙහි | තරති<br>එගොඩ යයි | තතාර<br>එගොඩ ගියේ ලු |

| ධාතුව | වත්තමානා විභත්තිය | පරොක්ඛා විභත්තිය |
|---|---|---|
| ධාව<br>දිවීමෙහි | ධාවති<br>දුවයි | දධාව<br>දිවී ලු |
| නන්ද<br>සතුටු වීමෙහි | නන්දති<br>සතුටු වේ | නනන්ද<br>සතුටු වී ලු |
| නම<br>නැමීමෙහි | නමති<br>නැමේ | නනාම<br>නැමුණේ ලු |
| පත<br>වැටීමෙහි | පතති<br>වැටෙයි | පපාත<br>වැටුණේ ලු |
| පුස<br>පොෂණයෙහි | පොසෙති<br>පෝෂිත කරයි | පුපොස<br>පෝෂිත කෙළේ ලු |
| බන්ධ<br>බැඳීමෙහි | බන්ධති<br>බඳී | බබන්ධ<br>බැන්දේ ලු |
| බුධ<br>අවබෝධයෙහි | බොධෙති<br>අවබෝ කරයි | බුබොධ<br>අවබෝධ කෙළේ ලු |
| භාස<br>බැබැලීමෙහි | භාසති<br>බබලයි | බභාස<br>බැබලුණේ ලු |
| භිද<br>බිඳීමෙහි | භින්දති<br>බිඳී | බිභෙද<br>බින්දේ ලු |
| භී<br>බිය ගැන්මෙහි | භායති<br>බිය ගනී | බිභාය<br>බිය ගත්තේ ලු |
| භුජ<br>වැළඳීමෙහි | භුඤ්ජති<br>වළඳයි | බුභොජ, බුභුඤ්ජ<br>වැළැඳී ලු |
| භූ<br>වීමෙහි | භවති<br>වෙයි | බභූව<br>වී ලු |
| භර<br>දැරීමෙහි,<br>පෝෂණයෙහි | භරති<br>දරයි | බභාර<br>දැරී ලු,<br>පෝෂිත කෙළේ ලු |

| ධාතුව | වත්තමානා විභත්තිය | පරොක්ඛා විභත්තිය |
|---|---|---|
| මුච | මුඤ්චති | මුමොච |
| මිදීමෙහි | මුදයි | මිදුයේ ලු |
| මර | මරති, මීයති | මමාර |
| මරණයෙහි | මියෙයි | මිය ගියේ ලු |
| යජ | යජති | ඉයාජ |
| යාගයෙහි | යාග කෙරෙයි | යාග කෙළේ ලු |
| රාජ | රාජති | රරාජ |
| බැබැලීමෙහි | බබලයි | බැබැලුණේ ලු |
| රුද | රොදති | රුරොද |
| හැඬීමෙහි | හඬයි | හැඬී ලු |
| රුස | රුස්සති | රුරොස |
| කිපීමෙහි | කිපෙයි | කිපී ලු |
| රුහ | රොහති | රුරොහ |
| වැඩීමෙහි | වැඩෙයි | වැඩුණේ ලු |
| වි + ලප | විලපති | විලලාප |
| වැලපීමෙහි | වැලැපෙයි | වැලැපුණේ ලු |
| වප | වපති | උවාප |
| වැපිරීමෙහි | වපුරයි | වපුළේ ලු |
| විස | විසති | විවෙ |
| පිවිසීමෙහි | පිවිසෙයි | පිවිසී ලු |
| සු | සුණාති | සුසාව |
| ඇසීමෙහි | අසයි | ඇසී ලු |
| හර | හරති | ජහාර |
| ගෙනයෑමෙහි | ගෙන යයි | ගෙන ගියේ ලු |

අබ්භාස(අභ්‍යාස) **ක** කාරය **ච** කාර බවට ද **ග** කාර **හ** කාරයෝ **ජ** කාර බවට ද පෙරළෙති.

කර් - කකාර = චකාර
ගහ් - ගගාහ = ජගාහ
හර් - හහාර = ජහාර

## ධාතු ගණ සත

**5.** භූවාදි, රුධාදි, දිවාදි, සවාදි, කියාදි, තනාදි, චුරාදි යැ යි ධාතු සමූහ සතෙකි.

### භූවාදිගණය

**6.** භූවාදි ගණයේ ධාතුනට **අ** විකරණය එක් කිරීමෙන් වත්තමානා පඤ්චමී හීයත්තනී යන විභක්තීන්හි අඩගය සෑදේ. මෙය එක් වීමේ දී ධාතුවේ වූ **ඉවණ්ණ උවණ්ණ**යනට වෘද්ධි වේ(**ඉ** වණ්ණය **ඒ** කාර වේ. **උ** වණ්ණය **ඔ** කාර වේ).

පච්+ අ + ති - පචති (පිසයි)
න + අ + ති - නෙ + අ + ති
භූ + අ + ති - භො + අ + ති

සවරයා පර කල්හි **ඒ** යන්න **අය්** වේ. **ඔ** යන්න **අව්** වේ.

නෙ + අ + ති - නය් + අ + ති = නයති(පමුණුවයි)
භො + අ + ති - භව් + අ + ති = භවති(වෙයි)

ජි(දිනීමෙහි), සි(ශයනයෙහි) ආදි මේ ගණයට අයත් **ඉ** වණ්ණාන්ත ධාතු **නී** ධාතුව මෙන් වරනැඟේ.

ජු(දිවීමෙහි), දු(දිවීමෙහි), රු(ශබ්ද කිරීමෙහි), සු(වැගිරීමෙහි) ආදි මේ ගණයට අයත් **උ** වණ්ණාන්ත ධාතු **භූ** ධාතුව මෙන් වරනැඟේ.

ඉස්(සෙවීමෙහි), **අ** විකරණය පර කල්හි **ඉ** කාරයට **එ** වෙයි. **උ** කාරයට **ඔ** වෙයි.

ඉස් + අ + ති - එස් + අ + ති = එසති(සොයයි)

සුච්(ශොක කිරීමෙහි)
සුච් + අ + ති - සොච් + අ + ති = සොචති(ශෝක කරයි)

රුද්(ඇඬීමෙහි), බුභ්(කැළඹීමෙහි) ආදි ධාතු සුච් ධාතුව මෙන් වරනැඟේ. හර්(ගෙන යෑමෙහි), වස්(විසීමෙහි) ආදි ධාතූහු පච් ධාතුව මෙන් වරනැඟෙති.

පච් + අ + ති = පචති(පිසයි)

අජ්ජතනී ආදි අනිත් ආඛ්‍යාත විභත්තීන්හි විකරණ **අ** කාරය නැති ව කෙළින් ම ධාතුව ආඛ්‍යාත විභත්ති ප්‍රත්‍යයයන් හා එක් වේ.

**අජ්ජතනී**

නී + ඊ - නෙ + ස්(ආගමයෙන් පසු) ඊ - නෙසී.

නී + ඊ - නෙ
(සවරයට පූර්ව **එ** කාරය **අය්** වූ පසු) නය් + ඊ - නයී

භූ + ඊ - හො + ස් + ඊ - හොසී - අහොසී(වූයේ ය)

භූ + ඊ - හො(**ඔ** කාරය **අව්** වූ පසු)
භව් + ඊ - භවී, අභවී(වූයේ ය)

ඉස් + ඊ - එස් + ඊ - එසී(සෙවීය)

සුච් + ඊ - සොච්+ ඊ - සොචී, අසොචී(ශෝක කෙළේ ය)

පච් + ඊ - පචී(පිසීය)

**සත්තමී**

නී + එය්‍ය - නෙ + එය්‍ය - නය් + එය්‍ය - නයෙය්‍ය

සෙසු විබත්හි ද මේ ක්‍රමය අනුව පද සිද්ධි දතයුතු.

## රුධාදිගණය

7. මෙහි ද වත්තමානා ආදි විභත්තීන්හි දී ධාතුවට අ විකරණය එක්වන්නා හා ම ධාතුවේ අකුරු දෙක අතරට බින්දුවක් පැමිණේ. ඒ බින්දුව එයට පර ව සිටි අකුර අයත් වර්ගයේ අන්තිම(අනුනාසික) අකුර බවට පෙරළේ. වර්ගවලට නොඅයත් අකුරෙක් වී නම් ඒ බින්දුව නොවෙනස් ව සිටී.

රුධි + අ + ති – රුංධි + අ + ති – රුන්ධි + අ + ති – රුන්ධති (අවුරයි)

මුච් + අ + ති – මුංච් + අ + ති – මුඤ්ච් + අ + ති – මුඤ්චති (මුදයි)

විද් + අ + ති – විංද් + අ + ති – වින්ද් + අ + ති – වින්දති (විඳී)

ලිප් + අ + ති – ලිංප් + අ + ති – ලිම්ප් + අ + ති – ලිම්පති (ආලෙප කරයි)

පිස් + අ + ති – පිංස් + අ + ති – පිංසති (අඹරයි)

මේ ගණයට අයත්,

රිච්(විරේචනයෙහි, පහ කිරීමෙහි),
සිච්(ඉසීමෙහි, වැක්කිරීමෙහි),
යුජ්(යෙදීමෙහි),
භුජ්(වැළඳීමෙහි),
කත්(කැපීමෙහි),
ඡිද්(සිඳීමෙහි),
භිද්(බිඳීමෙහි),
ලුප්(සිඳීමෙහි),
හිස්(හිංසායෙහි)

යන ධාතුහු ද උඩ දුන් ධාතුන් අනුව වරනැඟිය යුතු.

## දිවාදිගණය

8. මෙහි ධාතුවට එක් වනුයේ **ය** විකරණය යි. මෙහි ච්ය, ජ්ය, ද්ය, ධ්ය, න්ය, ප්ය, භ්ය, ම්ය, ව්ය, ස්ය යන අකුරු යුග පිළිවෙලින් චච, ජජ, ජජ, ජඣ, ඤඤ, පප, බභ, මම, ලල, බබ, සස යැ යි වේ.

දිව් + ය + ති – දිබ්බති (ක්‍රීඩා කරයි)

රුච් + ය + ති – රුච්චති (රිසියෙයි)

යුජ් + ය + ති – යුජ්ජති (යෙදෙයි)

විද් + ය + ති – විජ්ජති (ඇත)

සිධ් + ය + ති – සිජ්ඣති (සිදු වෙයි)

මන් + ය + ති – මඤ්ඤති (සිතයි)

දිප් + ය + ති – දිප්පති (බබලයි)

ලුභ් + ය + ති – ලුබ්භති (ඇලෙයි)

සම් + ය + ති – සම්මති (සංසිඳෙයි)

සිව් + ය + ති – සිබ්බති (මහයි)

මේ ගණයට අයත් ස්වරාන්ත ධාතුහු ද ඇත. ඔවුනට පර වූ **ය** විකරණය එසේ ම සිටී.

ඛී + ය + ති – ඛීයති (ගෙවේ, ක්ෂයයට පැමිණේ)

ඝා + ය + ති – ඝායති (ආඝ්‍රාණය කෙරෙයි)

තා + ය + ති – තායති (ආරක්ෂා කරයි)

හා + ය + ති – හායති (පිරිහෙයි)

## සවාදි ගණය

9. මෙහි ධාතූහු ඉතා ටික දෙනෙකි. මේ ගණයේ ධාතූනට **ණු, ණා, උනා** යන විකරණයෝ එක් වෙති. **ණු** හට පරසෛමපද ප්‍රත්‍යයයා පර කල්හි වෘද්ධි වේ.(**ණු** කාරය **ණො** කාර වේ.)

සු + ණු + ති – සුණොති, [සු + ණු + තෙ – සුණුතෙ](අසයි)

ප + අප් + ණු + ති – ප + අප්ණො + ති – පපොති (පැමිණෙයි)

ප + අප් + උනා + ති – පාපුනාති(පැමිණෙයි)

සු + ණා + ති – සුණාති(අසයි)

## කියාදිධාතු ගණය

10. මෙහි ධාතුවට **නා** විකරණය එක් වේ.

කි + නා + ති – කිණාති (මිළ දී ගනී)

**න**යන්නට **ණ** කාරාදේශ වේ.

ජි + නා + ති – ජිනාති (දිනයි)

අස් + නා + ති – අස්නාති (කයි)

ගහ් + නා + ති – ගණ්හාති(ගනී)
(මෙහි **හ්නා** යන්න **න්හා** වැ **ණ්හා**වේ)

මේවායේ අජ්ජතනිය – අකෙසි, අජෙසි, ආසි, අගගහී යි වේ.

**තනාදි ගණය**

**11.** මෙහි විකරණය **ඔ** ය. මෙයට අයත් ධාතුහු ටික දෙනෙකි. කර ධාතුවට **ඔ, යිර** යන විකරණ දෙකෙන් එක් වේ. **යිර** පර කල්හි **කර** ධාතුවේ **ර** කාරය මැකෙයි.

තන් + ඔ + ති - තනොති (පතුරුවයි)

ජාගර් + ඔ + ති - ජාගරොති (නිදිවරයි)

කර් + ඔ + ති - කරොති(කරයි)

කර් + යිර + ති - ක + යිර + ති - කයිරති(කරයි)

**චුරාදි ගණය**

**12. එ, අය** යන විකරණ දෙක මේ ගණයේ ධාතුනට එක් වේ. ධාතු සවරය එයින් පර ව බැඳි අකුරු නැත්නම් වෘද්ධි වේ.

චුරි + එ + ති - චොරෙති(සොරාගනී)

චුර් + අය + ති - චොරයති(සොරාගනී)

යුජ් + එ + ති - යොජෙති(යොදයි)

යුජ් + අය + ති - යොජයති(යොදයි)

තිජ් + එ + ති - තෙජෙති(මුවහත් කරයි)

තිජ්+ අය + ති - තෙජයති(මුවහත් කරයි)

මේ ධාතු ගණ අතුරෙන් භූවාදි චුරාදි යන ගණ දෙකට අයත් ධාතුහු බොහෝ ය. ඊළඟට බොහෝ ධාතු ඇත්තේ දිවාදි ගණයට ය. රුධාදි ගණයේ ධාතු ගණන එයටත් අඩු ය. තනාදි ගණයේ එයටත් අඩු ය. ඉතා අඩු ධාතු ගණනක් ඇත්තේ සවාදිගණයට ය.

උඩ දැක්වුණු සියලු ගණවල ධාතුනට **ය** විකරණය එක් වීමෙන් කම්කාරක ආඛ්‍යාත රූප තැනේ.

නීයති(පැමිණැවේ), රුජ්ඣති(වැළැක්වේ), සූයති(අසනු ලැබේ, ඇසේ), කීයති(මිළයට ගනු ලැබේ), ඛානීයති(පතුරුවනු ලැබේ), චොරීයති(සොරකම් කරනු ලැබේ).

මේවායේ වැඩි විස්තර **සරල පාලි ශික්ෂකය** බලා දත යුතු. තද්ධිතනත කිතකනත විභාගයෝ එහි ම විස්තර වැ එති.

**නිමියේ ය.**

# ශබ්දාවලිය 48

## පාලි - සිංහල

සංකේත: පු-පුලලිඩගික, ඉ-ඉත්ථිලිඩගික, න-නපුංසකලිඩගික, නි-නිපාත)

### අ

අකත - නො කරන ලද
අකංසු - කළාහ
අකිලනත - ක්ලානත නො වූ
අකොකාධ, පු. - අක්‍රෝධය, තරහ නැති බව
අකඛාත - කියන ලද
අකඛි, න. - ඇස
අකඛිරොග, පු. - ඇසේ ලෙඩ
අගද, පු. - බෙහෙත
අගාර, න. - ගෙය, ගිහිගෙය
අගගි, පු. - ගින්න
අචචය, පු. - දෝෂය, වරද
අචඡ, පු. - වලසා
අචඡ - නො කැලැඹුණු, ප්‍රසනන, පැදුණු
අචඡිනදති - පැහැරගනී, කොල්ලකයි, උදුරාගනී
අජාත - නො උපන්
අජජ, නි. - අද
අජෙජති - උපයයි, හම්බ කරයි
අජඣාපයති - උගන්වයි
අජෙඣසති - අයදී
අජෙඣසනා, ඉ. - අයැදුම
අඨතවා - නො සිට
අතිථි - අමුත්තා, අගනතුකයා
අතීත - ඉකුත්, ගත වූ
අතත, පු. - ආත්මයා, තමා
අතථ, පු. - අර්ථය, ධනය, අභිවෘද්ධිය
අතථකාම - වැඩ කැමැති
අතථාය - පිණිස, සඳහා
අත්‍ර, නි. - මෙහි
අථ, නි. - ඉක්බිති, එකල්හි, නැවත
අදදස - දුටුයේ ය
අධිමතත, අධිමාත්‍ර - පමණට වැඩි, ඉතා
අනසසව - නො කීකරු, කන් නො දෙන
අනාගත - නො ආ, මතු (කාලයට අයත්)
අනුගචඡති - අනුව යයි, පිළිපදී
අනුබනධති - ලුහුබඳී, පස්සෙන් යයි
අනුපුබබ, පු. - පිළිවෙළ
අනොකකමනත - නො බසින
අනතර, න. - අතර
අනතරාමගග, පු. - මාර්ගයා ගේ අතුර, අතර මඟ
අනෙතාගබ්භ, පු. - කාමරය තුළ, ඇතුළු ගබ
අනධකාර, පු. - අඳුර
අනධබාල - අනුවණ
අපකකමම - ඉවත් වැ
අපි, නි. - ද, ද?
අපි නු, නි. - ද?
අපෙකඛති - බලාපොරොත්තු වෙයි, පතයි
අපෙති - පහ වෙයි
අපප, අපපක - ස්වල්ප, මඳ
අපපරජකඛ - මඳ කෙලෙස් රජස් ඇති
අපෙපවනාම, නි. - ඉතා යෙහෙකි!
අභිනිවතෙතති - වළක්වයි

අභිරත - ඇලුණු
අභිරූහති - වැඩෙයි, නැඟෙයි, නඟී
අභිවන්දති - ආදරයෙන් වඳී
අභිමුඛ, න. - ඉදිරිය
අභූත - නො වූ
අමච්ච, පු - ඇමැතියා
අමත, න. - අමෘතය, නිවන, නො මළ
අමනුස්ස, පු. - නො මිනියා, භූත ප්‍රේතාදි කිසිවෙක්
අමායාවී - මායා නැති, අවංක
අම්හෙ - අපි, අප
අරහත්ත, න. - රහත් බව
අරි, පු. - සතුරා
අලඞ්කරොති - සරසයි
අවණ්ණ - නො ගුණය, දෝෂය
අවිඤ්ඤතඤ්ඤණක - සිත් නැති
අවිදූර, න. - නො දුර, සමීපය
අසංඛත - සකස් නො වූ, ප්‍රත්‍යයයන් ගෙන් නො හටගත්
අසඨ - නො සොර, සොර ගති නැති
අසන්ත - 1. නැති, 2. ශාන්ත නො වූ
අස්ස, පු. - අශ්වයා
අස්සම, පු. - අසපුව, තවුස් නිවෙස
අසි, පු. - කඩුව
අහං - මම
අහි, පු. - සර්පයා
අහොසි - වී ය

## ආ

ආකාස, පු. - අහස
ආකිණ්ණ - ගැවැසුණු, පිරුණු
ආගන්තුක, පු. - අමුත්තා
ආගමන, න. - ඊම
ආචරිය, පු. - ඇදුරා
ආචික්ඛති - කියයි, දන්වයි
ආණාපෙති - අණ කරයි
ආදය - ගෙන
ආනුපුබ්බීකථා, ඉ. - පිළිවෙළ කතාව, දානාදි පිළිවෙළ අනුව කරන දම් දෙසුම
ආරභති - පටන් ගනී
ආරාධෙති - සිත් ගනී
ආරාම, පු. - අරම, වත්ත
ආරොචෙති - දන්වයි
ආවාට, පු. - වළ
ආසන, න. - අස්න, පුටුව
ආහරති - ගෙනෙයි
ආහාර, පු. - අහර, කෑම

## ඉ

ඉච්ඡති - කැමැති වෙයි
ඉණ, න. - ණය
ඉතර - අනිත්
ඉති, නි - මෙසේ "යි"
ඉත්තර - සුළුපටු, එසේ මෙසේ වූ, ලාමක
ඉතො, නි. - මෙයින්, මෙ තැනින්
ඉත්ථං, නි - මෙසේ
ඉදානි, නි. - දැන්
ඉද්ධි, ඉ. - ඍද්ධිය
ඉධ, නි. - මෙහි
ඉව, නි. - මෙන්
ඉසි, පු. - ඍෂිවරයා
ඉස්සා, ඉ. - ඊර්ෂ්‍යාව
ඉහ, නි. - මෙහි

## උ

උක්කංසෙති - නංවයි
උක්ඛිපති - ඔසොවයි
උග්ගච්ඡති - නඟී, උදා වෙයි
උග්ගණ්හාති - උගනී
උග්ගහෙත්වා - ඉගෙන
උග්ගහෙතුං - ඉගෙන ගන්නට
උච්ච - උස්, උසස්
උට්ඨහති, උට්ඨාති - නැඟී සිටී
උඩ්ඩෙති - ඉගිළෙයි
උතු, න. - ඍතුව
උත්තරති - ගොඩ එයි
උත්තිට්ඨති - නැඟී සිටී
උත්තිණ්ණ - ගොඩට නැඟුණු, ගොඩ ආ

උදක, න. - ජලය
උදඤ්ච, නි - හෙවත්
උදෙති - උදාවෙයි, ඉහළ නඟී
උද්ධරති - උදුරයි, අවුලයි,
ගොඩට ගනී
උපට්ඨාති - උවටැන් කරයි
උපට්ඨාක, උපට්ඨායක, පු. -
උපස්ථාන කරන්නා
උපනාමෙති - එළවයි, පිළිගන්වයි
උපනිසංසෙති - ගැටෙයි, හප්පයි
උපනිස්සය, පු. - හේතු සම්පත්,
ඇසුර
උපනෙති - සමීපයට පමුණුවයි
උපපජ්ජති - උත්පත්ති වශයෙන්
පැමිණේ
උපරි, නි. - මත්තෙහි
උපසඞ්කමති - එළඹෙයි, වෙතට යයි
උපස්සය, පු. - අසපුව, නවාතන
උපවදති - උපවාද කෙරෙයි,
දෙස් කියයි
උපාසක, පු. - උපාසකයා,
තෙරුවන් සරණගිය ගිහියා
උපමා, ඉ. - උපමාව
උපසම්පදා, ඉ. - උපසපුව,
උපසම්පත්තිය
උපහාර, පු. - තෑග්ග
උප්පජ්ජති - උපදී
උභො - දෙදෙනා
උබ්භවති - පැන නඟී, මතු වෙයි
උම්මුජ්ජති - (දියෙන්) මතු වෙයි
උස්සහති - උත්සාහ කරයි
උස්සාහ, පු. - උත්සාහය, වෑයම
උස්සුක - උත්සුක, උනන්දු වූ
උළූක, පු. - බකමූහුණා

## එ

එක - එක්
එකතො, නි. - එකතුව
එකංස, පු. - එක් අංශය, ඒකාන්තය
එති - එයි
එත්තාවතා, නි. - මෙ පමණින්
එත්තක - මෙ පමණ
එත්ථ, නි. - මෙහි
එව, නි. - ම
එවං, නි. - මෙසේ
එළක, පු. - එළුවා

## ඔ

ඔක්කමති - බසී
ඔගාහති - බසී
ඔතරති - බසී
ඔදන, පු. - බත
ඔභාස, පු. - එළිය
ඔරුහති - බසී
ඔලොකෙති - බලයි
ඔවදති - අවවාද කරයි
ඔසධ, පු. - බෙහෙත
ඔහීයති - (නො ගොස්)රැඳෙයි,
නවතී

## ක

කච්චි - කිමෙක් ද?
කච්ඡා, ඉ. - කිසිල්ල
කඤ්ඤා, ඉ. - කන්‍යාව
කට, පු. - කළාලය, පැදුර
කත - කරන ලද
කති - කීදෙනෙක් ද?
කතිකා, ඉ. - කතිකාව
කත්වා - කොට
කථන, න. - කීම
කථං, නි. - කෙසේ ද?
කථා, ඉ. - කථාව
කථෙති - කියයි
කදා - කවරදා ද?
කදාචි - කිසි කලෙක
කනත්තක, පු. - එනම් අශ්වයා
කන්දති - අඬයි
කප්ප, පු. - කල්පය
කප්පට්ඨිතික - කල්පයක් පවත්නා
කම්පති - සැලෙයි
කම්ම, න. - කර්මය
කරොති - කරයි

කලහ, පු. - කලහය, රංඩුව
කසසක පු. - ගොවියා
කලියුග, න. - කලියුගය, පව් අධික කාලපරිච්ඡේද
කහං, නි. - කොහි, කොහාට
කාය, පු. - ශරීරය
කාරාපෙති - කරවයි
කාරුඤ්ඤ, න. - කාරුණ්‍යාව
කාල, පු. - කාලය
කාලංකරොති - මැරෙයි
කාලමකාසි - මළේ ය
කාලකත - මැරුණු
කාලකිරියා, ඉ. - මරණය
කාලංකත්වා - මැරී
කාසාර, පු. - වැව
කිං - කිම?
කිඩකර, පු. - මෙහෙකරු
කිණාති - මිලයට ගනී
කිත්තයති - පවසයි, පතුරුවයි, හෙළිකෙරෙයි
කිනනු - කිමෙක් ද?
කිමංගපන, නි. - කියනුම කවරේ ද?
කිමපන - කිමෙක් ද?
කිලමති - ක්ලාන්ත වෙයි, වෙහෙසෙයි
කිස - කෙට්ටු
කීළති - සෙල්ලම් කරයි
කීළනත - ක්‍රීඩා කරන
කුකකුට, පු. - කුකුළා
කුකකුර, පු. - බල්ලා
කුචඡි, ඉ. පු. - මවු කුසය
කුටි, ඉ. - කුටිය, කුඩා ගෙය
කුටුමබික, පු. - කෙළෙඹියා
කුතො - කොයින්?
කුමාර, පු. - ළමයා, රජ කුමරු
කුමාරි, ඉ. - කුමරිය
කුමභකාර, පු. - කුඹලා, වළන් හදන්නා
කුල, න. - කුලය, පවුල
කුලපුතත, පු. - කුල පුත්‍රයා
කුලාවක - කැදැල්ල, කුරුලු කූඩුව
කුසීත - අලස
කෙතු, පු. - කොඩිය
කොධ, පු. - ක්‍රෝධය
කොප, පු - කෝපය, තරහව

## ඛ

ඛගග, පු. - කඩුව
ඛජජ, න. - ඛාද්‍යය, කැවිල්ල
ඛනධ, පු. - ස්කන්ධය, උරහිස
ඛුද්දක - කුඩා

## ග

ගඞගා, ඉ. - ගංගා නම් නදිය, ගඟ
ගචඡති - යයි
ගජ, පු. - ඇතා
ගණ, පු. - සමූහය
ගණහාති - ගනී, අල්ලාගනී
ගත - ගිය
ගතපුබබ - ගිය විරූ
ගති, ඉ. - ගතිය, මරණින් මතු ලබන තත්වය
ගනත්වා - ගොස්
ගබභ, පු. - කාමරය, දරු ගබ
ගබභපරිහාර, පු. - ගබ් පෙරහර, දරුගබ වැඩීමට කළයුතු සත්කාර
ගවෙසති - සොයයි
ගහණ, නි. - ග්‍රහණය, අල්ලා ගැන්ම
ගහපති, පු. - ගෘහපතියා, ගැහැවියා
ගහපතානී, ඉ. - ගැහැවිනි, ගෘහපතියා ගේ භාර්‍යාව
ගහෙත්වා - ගෙන
ගාථා, ඉ. - ගාථාව
ගායති - ගයයි, ගී කියයි
ගාමනී, පු. - ගම්දෙටුවා
ගාරව, පු. - ගෞරවය
ගාවී, ඉ. - එළදෙන
ගිජඣ, පු. - ගිජුලිහිණියා
ගිරි, පු. - පර්වතය
ගිලාන - ගිලන්, ලෙඩ වූ
ගීවා, ඉ. - බෙල්ල
ගුණ, පු. - ගුණය

ගුණවනතු, පු. - ගුණවතා
ගෙණ්ඩුක, න. - පන්දුව
ගෙහ, න. පු. - ගෙය
ගො, පු. - ගවයා
ගොණ, පු. - ගවයා

### ඝ

ඝට, පු. - කළය
ඝටටති - ගැටෙයි
ඝටෙටති - ගටයි, හප්පයි
ඝර, න. - ගෙය
ඝරබනධන, න. - ගෘහබනධනය,
දූරියක ආවාහ කොට දීම
ඝරාවාස, පු. - ගිහිගෙයි විසීම
ඝාණ, න. - නාසිකාව
ඝායති - ආඝ්‍රාණ කරයි,
ගඳ සුවඳ ඉව කරයි
ඝොස, පු. - ශබ්දය

### ච

චකක, න. - චක්‍රය, රෝදය
චකඛු, න. - ඇස
චකඛුමනතු, පු. - ඇස් ඇත්තා
චණඩ - නපුරු
චතු - සතර
චතුතථ - සතර වැනි
චනද, පු. - සඳ
චරති - ඇවිදී, හැසිරෙයි
චලති - සැලෙයි
චාග, පු. - ත්‍යාගය
චාගී, පු. - ත්‍යාගවතා
චිතත, න. - සිත
චිනෙතති - සිතයි
චිර - බොහෝ කල්
චිරසසං, නි. - බොහෝ කලකට පසු
චීවර, න. - සිවුර
චෙ, නි. - ඉදින්
චොදයති, චොදෙති - චෝදනා කරයි
චොර, පු. - සොරා

### ඡ

ඡටඨ - සවැනි
ඡඩෙඩති - විසිකරයි, ඉවත දමයි
ඡණ, පු. - උත්සවය
ඡතත, න. - ඡත්‍රය, කුඩය
ඡනද, පු. - කැමැත්ත
ඡනන - වැසුණු
ඡනන, පු. - එනම් ඇමැතියා
ඡායා, ඉ. - සෙවණැල්ල
ඡිනදති - සිඳියි, කපයි
ඡිනන - සිඳින ලද
ඡෙතවා - සිඳ, කපා
ඡෙතතු, පු. - කපන්නා, සිඳින්නා
ඡෙතතුං - සිඳින්නට, කපන්නට

### ජ

ජඞඝා, ඉ. - කෙංඩය
ජන, පු. - ජනයා, මිනිසා
ජනතා, ඉ. - ජන සමූහය
ජනතු, පු. - සත්ත්වයා
ජමබුදීප, පු. - දඹදිව
ජය, පු. - දිනීම
ජරා, ඉ. - මහළුබව, දිරීම
ජරාජජරිත - ජරායෙන් දුදුරු වූ
ජාත - උපන්
ජාති, ඉ. - ජාතිය, උත්පත්තිය
ජනාති - දනී
ජාලෙති - දල්වයි, ගිනි තියයි
ජිත - දිනන ලද
ජිනාති - දිනයි
ජිවහා, ඉ. - දිව
ජීවිත, න. - ජීවිතය
ජුති, ඉ. - බැබැලීම
ජුතිමනතු - බැබැලීම ඇති, බබලන
ජෙටඨ - වැඩිමහළු, දෙටු
ජෙතු - දිනන්නා
ජෙතවා - දිනා

### ඣ

ඣාන, න. - ධ්‍යානය
ඣාපෙති - දවයි
ඣායති - ධ්‍යාන වඩයි, (ගිනි) දැල්වෙයි

### ඤ

ඤත්වා - දැන
ඤාණ, න. - නුවණ
ඤාතක, පු. - නෑයා
ඤාති, පු. - නෑයා
ඤාපෙති - දන්වයි

### ඨ

ඨත්වා - සිට
ඨපෙති - තබයි
ඨාන, න. - තැන
ඨිත - සිටි

### ත

තක්ක, පු. - තර්කය
තච්ඡක, පු. - වඩුවා
තච්ඡෙති - සසී
තජ්ජෙති - තරවටු කරයි
තණ්හා, ඉ. - තෘෂ්ණාව
තතිය - තුන් වන
තතො, නි. - එ තැනින්, එහෙයින්
තත්‍ර, නි. - එහි
තදුපිය - එයට සෑහෙන තරම්
තප, පු. න. - තපස
තම, පු. න. - අඳුර
තරංග, පු. - (දියේ) රැළ
තරති - පීනයි, එගොඩ යයි, තරණය කරයි
තරු, පු. - ගස
තසති - තැති ගනී
තසමාතිහ (තසමා ඉහ) - එහෙයින් මෙහි
තහිං - එහි
තාපස, පු. - තවුසා
තාරා, තාරකා, ඉ. - තරුව
තිකිච්ඡති - පිළියම් කරයි, වෙදකම් කරයි
තිට්ඨති - සිටී
තිබ්බ - දැඩි, තීව්‍ර
තිරියං, නි. - සරසට
තුච්ඡ - හිස්
තුච්ඡ හත්ථ - හිස් අත් ඇති
තුදති - අනී
තුම්හෙ - තෙපි, තොප
තුරිය, න. - තූර්‍ය භාණ්ඩ
තෙපිටක, න. - තුන් පිටකය
තෙල, න. - තෙල්

### ථ

ථල, න. - ගොඩ බිම
ථාම, පු. - ශක්තිය
ථාමවන්තු - ශක්තිමත්
ථෙර, පු. - තෙරුන් වහන්සේ
ථුල්ල, ථූල - තරබාරු

### ද

දක්ඛ - දක්ෂ
දට්ඨුකාම - දකිනු කැමැති
දණ්ඩ, පු. - ලීය, දංඩ
දදාති - දෙයි
දන්ත, පු. - දත
දසමාසච්චය, පු. - දස මස ගත වීම
දස්සෙති - පෙන්වයි
දහර - ළදරු, ළපැටි, තරුණ
දාතු, පු. - දෙන තැනැත්තා
දාරක, පු. - දරුවා
දාරිකා, ඉ. - දැරිය
දාස, පු. - දාසයා
දාපෙති - දෙවයි
දිබ්බ - දිව්‍ය
දිස්වා - දැක
දීඝ - දික්
දීප, පු. - පහන, දූපත
දුග්ගත - දුගී, දුප්පත්
දුච්චරිත, න. - දුසිරිත, පව

දුතිය - දෙවෙනි
දුබබල - දුර්වල
දුබබිනීත - නො හික්මුණු
දුසසීල - දුසිල්, සිල්නැති
දුසසීල්‍ය, න. - දුසිල් බව
දුහිතු, ඉ. - දුව
දෙති - දෙයි
දෙවී, ඉ. - දේවි
දෙසනා, ඉ. - දෙසුම
දෙසෙති - දෙසයි
දෙස, පු. - ද්‍රෝෂය, ද්වේෂය

## ධ

ධන, න. - ධනය, වස්තු සම්පත්
ධනවනතු - ධනවත්
ධනී - ධනවත්
ධමම, පු. - දහම, ධර්මය
ධමමඤ්ඤූ - ධර්මය දන්නා
ධමමධර - ධර්මය සිතින් දරන
ධමමරාජ, පු. - ධර්මරාජ, බුදුරජ
ධරමාන - ජීවත් ව ඉන්නා
ධාතු, ඉ. - ධාතුව
ධාරණ, න. - දැරීම
ධාවති - දුවයි
ධිති, ඉ. - ධෛර්‍යය
ධිතිමනතු - ධෛර්‍යවත්
ධුර, න. - ධුරය
ධෙනු, ඉ. - ධේනුව, දෙන
ධොවති - සෝදයි

## න

න, නි. - නො
නබ, පු. - නිය
නචිරසසං, නි. - නොබෝ කලෙකින්
නචචති - නටයි
නදී, ඉ. - නදිය, ගඟ
නමසසති - නමදී
නර, පු. - මිනිසා, සත්ත්වයා
නරුතතම, පු. - බුදු රජ
නසසති - නසී
නහාපෙති - නාවයි
නහායති - නායි, ස්නානය කරයි
නාග, පු. - නයා
නාථ, පු. - පිහිට
නාම, න. - නම, චිතත චෛතසික
දෙවගය
නිකඛමති - නික්මෙයි
නිකඛමම - නික්ම
නිකාය, පු. - සමූහය
නිදදා, ඉ. - නින්ද
නිධාපෙති - නිදහන් කරයි
නිධි, පු. - නිධානය
නිපපජජති - වැදහෙයි, සැතපෙයි
නිපතති - වැටෙයි
නිබබතතති - උපදී
නිබබාන, න. - නිවන
නිමුජජති - ගිලෙයි
නියයාදෙති - පවරයි, පාවාදෙයි,
බාරදෙයි
නිරය - නිරය, දුකින් ම පිරුණු තැන
නිලීයති - සැඟෙවෙයි
නිවාස, පු. - නවාතන, ගෙය
නිසසරණ, න. - නික්මීම
නිසසරති - නික්මෙයි
නෙති - පමුණුවයි, ගෙන යයි
නෙතු - පමුණුවන්නා
නෙනත - පමුණුවන, ගෙන යන

## ප

පකක - පිසන ලද, පැසුණු
පකකනත - නික්ම ගිය
පකකමති - නික්ම යයි
පකකුථ - කැඳවන ලද
පකෙකාසති - කැඳවයි
පගගණහාති - ඔසොවයි
පගගයහ - ඔසොවා ගෙන
පඝරති - වැගිරෙයි, ගලයි
පචති - පිසයි
පචචනත, පු. - පිටිසර පළාත
පචචය, පු. - ප්‍රත්‍යයය, උපකාරය
පචචවෙකඛති - නුවණින් විමසා
බලයි

පච්චාගච්ඡති - පෙරලා එයි
පච්චාමිත්ත, පු. - සතුරා
පච්චාසිංසති - බලාපොරොත්තු වෙයි
පච්චුග්ගමන, න. - පෙර ගමන් කිරීම
පච්චුප්පන්න - දැන් ඇති පවත්නා, වර්තමාන
පච්චේක - තනි වූ, වෙන් වූ
පච්චේකබෝධි, ඉ. - පසේ බුදු බව
පච්ඡා, නි. - පසු ව
පජ්ජලති - (ගින්නෙන්) දිලිසෙයි, ඇවිලෙයි
පඤ්ඤත්ති, ඉ. - පැණවීම
පඤ්ඤා, ඉ. - ප්‍රඥාව, නුවණ
පඤ්ඤානුරූප - නුවණට ගැළපෙන
පඤ්ඤාපෙති - පණවයි
පඤ්ඤායති - පැණෙයි, ප්‍රකට වෙයි
පඤ්හ, පු. - ප්‍රශ්නය
පටිච්ච - ප්‍රත්‍ය කොට ගෙන, නිසා
පටිජග්ගති - පෝෂිත කෙරෙයි, රැකබලා ගනී
පටිපජ්ජති - පිළිපදී, (මඟට) බසී
පටියත්ත - පිළියෙල කරන ලද
පට්ඨාය - පටන් කොට
පඨති - කියයි, පාඩම් කරයි
පඨවි, ඉ. - පොළොව
පතති - වැටෙයි
පතිට්ඨාති - පිහිටයි
පතිට්ඨාපෙති - පිහිටුවයි
පතිට්ඨා, ඉ. - පිහිට
පතිට්ඨාය - පිහිටා
පත්ත - පැමිණි
පත්ත, පු. - පාත්‍රය
පත්ති, පු. - පැමිණීම, පාබල සෙනඟ
පත්ථනා, ඉ. - පැතුම
පත්ථේති - පතයි
පදුම, න. - නෙළුම, පියුම්
පදේස, පු. - පෙදෙස, පළාත
පන්ත - ප්‍රාන්ත, ගම්කෙළවර වූ
පපෝති - පැමිණෙයි
පබ්බත, පු. - කන්ද
පබ්බජිත, පු. - පැවිද්ද
පබ්බජ්ජා, ඉ. - පැවිද්ද
පභවති - හටගනී
පමජ්ජති - පමා වෙයි
පමත්ත - පමා වූ
පමාණ, න. - ප්‍රමාණය
පමාද, පු. - ප්‍රමාදය
පමුඤ්චති - මුදයි
පමුච්චති - මිදෙයි
පයුජ්ජති - යෙදෙයි
පයුඤ්ජති - යොදයි, ප්‍රශ්න කෙරෙයි
පයෝජෙති - යෙදෙයි
පරං - පසු ව, මත්තෙහි
(මරණා පරං - මරණින් මත්තෙහි)
පරසුවෙ, නි. - අනිද්ද
පරිත්තාණ, න. - ආරක්ෂාව
පරිබ්බාජක, පු. - පිරිවැජියා
පරිබ්භමති - වටා යෙයි
පරිභව, පු. - ගර්හා කිරීම, බැණවැදීම
පරිභුඤ්ජති - වළඳයි, පරිභෝග කරයි
පරිමොචෙති - මුදයි
පරියන්ත, පු. - කෙළවර
පරියෙසති - සොයයි
පරියොසාන, න. - කෙළවර අවසානය
පරිවාර, පු. - පිරිවර
පරිවාරෙති - පිරිවරයි
පරිසා, ඉ. - පිරිස
පරිහායති - පිරිහෙයි
පරිහීන - පිරිහුණු
පලාපෙති - පලවාහරී
පලායති - පලායයි
පවත්ත - පැවැතුණු
පවත්තති - පවතී
පවත්තිත - පවත්වන ලද
පවත්තෙති - පවත්වයි
පසන්න - පැහැදුණු

පසංසති - පසසයි
පසාදෙති - පහදවයි
පසීදති - පහදී
පස්ස, පු. - පාර්ශවය, පැත්ත
පස්සති - දකී
පහරති - ගසයි
පහාර, පු. - පහර
පහිනාති - යවයි
පාඨ, පු. - පාඨය, පාඩම
පාඨසාලා, ඉ. - පාසල
පාණක, පු. - පණුවා, ප්‍රාණියා
පාණි, පු. - අත
පාතරාස, පු. - හීල් කෑම, උදේ බොජුං
පාතුභවති - පහළ වෙයි
පාතෙති - හෙලයි, වට්ටයි
පාපුනාති - පැමිණෙයි
පාපෙති - පමුණුවයි
පාප, න. - පව
පාප, පු. - පාපියා, ලාමකයා
පාපිමන්තු - පවිටා
පාරමී, ඉ. - පැරුම්
පාලෙති - පාලනය කරයි, රකියි
පාවිසි - ඇතුල් විය
පාසාද, පු. - ප්‍රාසාදය, මාලිගාව
පිණ්ඩ, පු. - ආහාරය
පිහයති - ඇලෙයි
පුග්ගල, පු. - පුද්ගලයා, තැනැත්තා
පුච්ඡති - විචාරයි
පුඤ්ඤ, න. - පින
පුණ්ණ - පිරුණු
පුණ්ණමී, ඉ. - පුණුපොහෝද
පුත්ත, පු. - පුතා
පුන, නි. - නැවත, යළි
පුනප්පුනං, න. - යළි යළි
පුප්ඵ, න. - මල්
පුරතො, නි. - ඉදිරියෙන්
පුරෙතරං, නි. - කලින් ම, පළමුවෙන් ම

පූජා, ඉ. - පිදුම
පූජයති, පූජෙති - පුදයි
පෙසෙති - යවයි
පොත, පු. - නැව
පොතක, පු. - පැටියා

## ඵ

ඵණා, ඉ. - පෙණය
ඵරති - පැතිරෙයි
ඵරසු, පු. - පොරොව
ඵල, න. - ගෙඩිය
ඵාණිත, න. - (පැණි) සකුරු
ඵුට - පැතිර ගිය
ඵුසති - ස්පර්ශ කරයි

## බ

බන්ධති - බඳී
බලවන්තු - බලවත්
බහි, නි. - පිටත
බහු - බොහෝ වූ
බහුවිධ - බොහෝ වැදෑරුම්, බහු ප්‍රකාර
බාල - ළපැටි, මෝඩ
බාලක, පු. - ළමයා
බාල්‍ය, න. - ළපැටි වයස
බාහා, ඉ. - අත
බිළාල, පු. - බළලා
බුද්ධ, පු. - බුදුරජ
බුද්ධපටිමා, ඉ. - බුදුපිළිමය
බුද්ධි, ඉ. - නුවණ
බුද්ධිමන්තු - නුවණැති
බොධෙති - අවබෝධ කරවයි, උගන්වයි
බ්‍රහ්ම, පු. - බ්‍රහ්මයා
බ්‍රහ්මලොක, පු. - බඹලොව
බ්‍රාහ්මණ, පු. - බමුණු
බ්‍රාහ්මණී, ඉ. - බැමිණී

## භ

භගවන්තු, පු. - භාග්‍යවතුන් වහන්සේ
භණ්ඩ, න. - බඩු
භය, න. - බිය
භව, පු. - භවය
භත්ත, න. - බත්
භන්තෙ - වහන්ස
භය, න. - බිය
භරියා, ඉ. - බිරිය
භව, පු. - භවය, ලෝකය
භාතික, පු. - සොහොයුරා
භාතු, පු. - සොහොයුරා
භානු පු. - රශ්මිය
භානුමන්තු, පු. - හිරු
භායති - බිය ගනී
භාර, පු. - බර
භාරිය - බැරෑරුම්
භාවෙති - වඩයි
භාසති - කියයි, බබලයි
භාසමාන - බබලන
භිජ්ජති - බිඳෙයි
භික්ඛා, ඉ. - භික්ෂාව, පිඬු සිඟා ලත් ආහාර
භික්ඛාචාර, පු.- පිඬු පිණිස හැසිරීම
භුඤ්ජති - වළඳයි
භුත්ත - වළඳන ලද
භුස්සති - බුරයි
භූත - වූ
භූත, න. - අමනුෂ්‍යයා
භූත, න. - පඨවි ආදි මහාභූත රූප සතර
භූප, භූපති, භූපාල, පු. - රජ
භොග, පු. - වස්තු සම්පත්
භොජෙති - වළඳයි

## ම

මග්ග, පු. - මාර්ගය, පාර
මග්ගික, පු. - මගියා
මච්චු, පු. - මරණය
මජ්ජාර, පු. - බළලා
මජ්ජිම - මැදුම්
මණ්ඩව, පු. - ඇඳ
මණි, පු. - මැණික
මධු, න. - මී පැණි
මන, න. පු. - සිත
මනුස්ස, පු. - මිනිසා
මනුස්සජාති, ඉ. - මනුෂ්‍ය ජාතිය, මිනිස් උපත
මා, නි. - නො (එපා)
මනතී, පු. - ත්‍රී
මරණ, න. - මරණය
මරණා පරං - මරණින් මතු
මහද්ධන - මහත් ධනය ඇති
මහත්ත, න. - මහත් බව
මහන්ත - මහත්
මහල්ලක - මහලු
මහාජන, පු. - මහ ජනයා, ජනතාව
මහාරජක්ඛ - මහත් කෙලෙස් රජස් ඇති
මහාවාලිකා, ඉ. - මහවැලි (නදිය)
මහිස, පු. - මී හරකා
මහෙසී, ඉ. - මෙහෙසී
මාතු, ඉ. - මව
මාතුකුච්ඡි, ඉ. - මවු කුස
මාතුගාම, පු. - මාගම, ස්ත්‍රී
මාතුල, පු. - මයිලා, මාමා
මාදිස - මා වැනි
මානව, පු. - මිනිසා, තරුණයා
මාපෙති - මවයි, (ගෙයක්) තනයි
මාපෙතු, පු. - මවන්නා, තනන්නා
මාරුත, පු. - සුළඟ
මාරෙති - මරයි
මාලා, ඉ. - මල්දම
මිණාති - මණියි
මිත්ත, පු. න. - මිතුරා
මීයති - මැරෙයි
මුච්චති - මිදෙයි
මුඤ්චති - මුදයි
මුට්ඨි, පු. - මිට

මුදධ, න. - හිස
මුනි, පු. - මුනිවරයා, බුදුරජ
මුහුතත, න. - මොහොත
මූල, න. - මුල
මූසික, පු. - මීයා
මෙතතා, ඉ. - මෛත්‍රිය
මෙධාවී - නුවණැති
මොකඛ, පු. - මිදීම, නිවන
මොචෙති - මුදයි

## ය

යති, පු. - යතිවරයා, පැවිද්ද
යථා, නි. - යම් සේ
යථාඵාසුක - යම් පහසු ඇති
යදි, නි. - ඉදින්
යනනූන, නි. - ඉතා යෙහෙකි!
යස, න. පු. - යශස, කීර්තිය, පිරිවර
යසවනතු - යශස් ඇති
යාචක, පු. - සිඟන්නා
යාචති - සිඟයි, යදී
යූථ, පු. - රංචුව
යොධ, පු. - සෙබළා
යොබබන, න. - යෞවනය, තරුණ වයස

## ර

රකඛති - රකියි
රජ, න. පු. - රජස්, දූවිලි
රජජ, න. - රාජ්‍යය, රජකම
රජජු, ඉ. - රැහැන, කඹය, ලනුව
රටඨ, න - රට
රතති, ඉ. - රාත්‍රිය
රථ, පු. - රථය, රිය
රමති - ඇලෙයි , ක්‍රීඩා කරයි
රස, පු. - රසය
රාග, පු. - රාගය, ආශාව
රුඛක, පු. - රුක, ගස
රුචි, ඉ. - රුචිය, කැමැත්ත
රුචචති - රිසිසෙයි
රුජති - රිදෙයි
රුජා, ඉ. - රිදුම, කැක්කුම
රුදති - හඬයි, වැලපෙයි
රුදමාන - හඬන, වැලපෙන
රොග, පු. - ලෙඩ
රොගී, පු. - ලෙඩා
රොදති - හඬයි, වැලපෙයි

## ල

ලජජති - ලජජා ඇති වෙයි
ලජජී - ලජජා ඇති
ලතා, ඉ. - වැල
ලදධ - ලැබූ
ලදධුං - ලබන්නට
ලබ්භති - ලැබෙයි
ලභති - ලබයි
ලාමක - ලමා, අනුවණ
ලිඛිත - ලියයි
ලිඛාපෙති - ලියවයි
ලිතත - ගල්වන ලද, ලිප්ත
ලුප්ත - ලොප් කරන ලද, මකන ලද
ලුදදක (ළුදදක), පු. - වැද්ද
ලුදධ - ලොහොබී
ලෙඛා, ඉ. - රේඛාව
ලොක, පු. - ලෝකය
ලොභ, පු. - ලෝභය
ලොම, පු. - ලොම්
ලොහ, පු. - ලෝහය

## ව

වගග, පු. - වර්ගය
වඞක - වක් වූ, ඍජු නො වූ
වජ, පු. - ගාල
වටටදුකඛ, න. - සසර දුක
වඩ්ඪති - වැඩියි
වඩ්ඪී, ඉ. - වැඩීම, පොලිය
වඩ්ඪෙති - වඩයි
වණිජජා ඉ. - වෙළෙඳම
වණණ, පු. - පැහැය, ගුණය
වණෙණති - වණයි, විසතර කරයි, පසසයි
වතත, න. - වත
වතතති - පවතී

වත්තිතබ්බ - පැවැතිය යුතු
වත්තෙති - පවත්වයි
වත්තෙතබ්බ - පැවැත්විය යුතු
වත්ථ, න. - වස්ත්‍රය
වදති - කියයි
වධූ, ඉ. - ස්ත්‍රී
වනස්පති, පු. - වනස්පති වෘක්ෂය
වනිතා, ඉ. - ස්ත්‍රී
වන්දති - වඳී
වය, න. පු. - වයස
වයප්පත්ත - වැඩි වයසට පැමිණි
වර, පු. - වරය, විශෙෂ දීමනාව
වලය, න. - වලල්ල
වසති - වෙසෙයි
වහති - උසුලයි, උසුලා ගෙන යයි
වස්ස, න. - හවුරුද්ද
වාචනා, ඉ. - කියැවීම, ඉගැන්වීම
වාචා, ඉ. - වචනය
වාණිජ - වෙළෙන්ද
වාත, පු. - සුළඟ
වානර, පු. - වඳුරා
වායාම, පු. - වැයම
වාස, පු. - විසීම
විකසිත - පිපෙයි, පුබුදී
විගච්ඡති - පහවෙයි, ඉවත් වෙයි
විචක්ඛණ - විචක්ෂණ, දක්ෂ, නුවණැති
විචරති - ඇවිදී
විජාත - වැදූ
විජායති - වදයි
විජ්ජා, ඉ. - විද්‍යාව, දැනීම
විජ්ඣති - විදී
විදිත්වා - දැන
විදූ, පු - පණ්ඩිතයා
විනා, නි. - වෙන් ව, නැති ව
විනය, පු. - හික්මීම
විනාස, පු. - විනාශය
විපල්ලාස, පු. - විපර්‍යාසය, පෙරළිය
විපස්සනා, ඉ. - විදර්ශනාව

විභජති - බෙදයි
විභව, පු. - වස්තු සම්පත්
විභාති - බබලයි
විරජ - පහවූ කෙලෙස් දූලි ඇති
විරවති - අඬයි, කෑගායි
විවාද, පු. - කලහය
විවිත්ත - විවේකී වූ, වෙන් වූ
විසල්ල - උදුරන ලද (කෙලෙස්)උල් ඇති
විසට්ඨ - හරනා ලද
විහත - නසන ලද, නටුවා වූ
විහතත්ථාම - නටුවාවූ ශක්ති ඇති
විහරති - වෙසෙයි
විහාර, පු. - විහාරය, විසීම
වීණා, ඉ. - වීණාව
වීත - පහ වූ
වීතමල - පහ වූ කෙලෙස් මල ඇති
වීතිනාමෙති - ඉක්නවයි, කල්යවයි
වීහි, පු. - වී (ධාන්‍ය)
වුත්ථ - වුසූ
වුත්ථවස්ස - වුසූ වස් ඇති (වස් වුසූ)
වුද්ධ - වැඩුණු, මහලු
වුද්ධි, ඉ. - වැඩීම, දියුණුව
වූපකට්ඨ - එකලා වූ
වූපසම්මති - සංසිඳෙයි
වූපසන්ත - සංසිඳුණු
වූපසමෙති - සංසිඳුවයි
වෙජ්ජ, පු. - වෙද
වෙඨෙති - වෙළයි
වෙතන, න. - වැටුප්, කුලිය
වෙදිතබ්බ - දතයුතු
වෙය්‍යාවච්ච, න. - වතාවත්
වෙර, න. - වෛරය
වෙලා, ඉ. - වේලාව, වෙරළ
වොරොපෙති - තොර කරයි
ව්‍යඤ්ජන, න. - ව්‍යාංජනය
ව්‍යත්ත - ව්‍යක්ත වූ
ව්‍යාධ, පු. - වැද්ද
ව්‍යාධි, පු. - ලෙඩ
ව්‍යාබාධ, පු. - පීඩාව

## ස

සක - සවකීය, තමා සතු
සකට, පු. - ගැල කරත්තය
සකල - සියලු
සකුණ, පු. - පක්ෂියා
සකකාර - සත්කාරය
සකකුනාති - හැකි වෙයි
සකෙකාති - හැකි වෙයි
සගග, පු. - සවර්ගීය
සඞඛත - සකස් වූ
සඞගාම, පු. න. - යුද බිම, යුද්ධය
සචෙ, නි. - ඉදින්
සචඡිකරොති - ප්‍රත්‍යක්ෂ කරයි
සජඣායති - සජ්ඣායන කරයි
සතං(සනතානං) - සත් පුරුෂයන් ගේ
සතත, පු. - සත්ත්වයා
සතතකඛතතුං, නි. - සත් වරක්
සතතසාර, පු. - ශ්‍රෙෂ්ඨ සත්ත්වයා
සතථ, න. - ශාස්ත්‍රය
සතථ, පු. - ගැල් රංචුව
සතථඤඤ - ශාස්ත්‍රඥයා
සතථු, පු. - ශාස්තෲන් වහන්සේ
සදධ - සැදැහැවත්
සනතක - අයත්
සනතාප, පු. - තැවිල්ල, උෂ්ණය
සනතික, න. - සමීපය
සනනිපාත, පු. - රැස් වීම
සපපාය - සැප වූ දය, සාත්තුව
සබබ - සියලු
සබබඤඤ, පු. - සර්වඥයන් වහන්සේ
සබබතථ - හැම තැන ම
සබබද - හැම කල්හි
සමණ, පු. - ශ්‍රමණයා
සමණධමම, පු. - මහණ දම
සමනනාගත - සමන්විත, යුක්ත
සමාගම, පු - එක්රැස් වීම, හමු වීම
සමපටිචඡති - පිළිගනී
සමපතත - පැමිණි
සමපනන - යුක්ත, සම්පූර්ණ
සමමජජති - හමදියි
සමමනනති - සම්මත කරයි
සමාදය - සමාදන් ව ගෙන
සමුදද, පු. - මුහුද
සමෙභද, පු. - මිශ්‍රවීම
සමමා, නි. - මනා කොට
සමමුඛීභාව, පු. - හමු වීම
සයති - වැදහෙයි, සැතපෙයි
සයන, න. - යහන
සර, පු. - ගෙය
සලලහුක - හැල්ලු
සලලහුකවුතති - හැල්ලු පැවැතුම් ඇති
සවිඤඤාණක - සිත් ඇති
සහ, නි. - සමඟ, එක් ව
සංසාර, පු. - සසර
සාපතෙයය, න. - වස්තු සම්පත්
සාමණෙර, පු. - හෙරණ
සාමික, පු. - සවාමියා
සාමී, පු. - සවාමියා
සායණහ, පු. - සවස් කාලය
සායති - හොවයි, සපාප්වයි
සාවක, පු. - ශ්‍රාවකයා
සිකඛති - හික්මෙයි, උගනී
සිකඛා, ඉ. - හික්මීම, ඉගැන්ම, ශික්ෂාව
සිකඛාපෙති - හික්මවයි, උගන්වයි
සිගාල, පු. - සිවලා
සිඞග, න. - අඟ
සිඞඝාණිකා, ඉ. - සොටු
සිනෙහ, පු. - ස්නෙහය
සිපප, න. - ශිල්පය
සිර, න. පු. - හිස
සිසස, පු, - ශිෂ්‍යයා
සිංසපාවන, න. - ඇට්ටේරිය වනය
සීඝ - ඉක්මන්, වේගයෙන් යන
සීල, න. - සිල්
සීලවනතු, පු. - සිල්වත්
සුකර - ලෙහෙසියෙන් කළ හැකි
සුකක - සුදු
සුණාති - අසයි
සුත - අසන ලද

සුනඛ, පු. - බල්ලා
සුනඛී, ඉ. - බැල්ල
සුමනකූට, පු. - සමනොළ කන්ද
සුරිය, පු. - හිරු
සූකර, පු. - ඌරා
සූද, පු. - අරක්කැමියා
සූනු, පු. - පුතා
සූර - ශූර, දක්‍ෂ, හුරු
සෙට්ඨී - සිටු
සෙනා, ඉ. - සේනාව
සෙනානී, පු. - සේනාවට නායක
සෙනාපති, පු. - සෙනෙවියා
සුවණ්ණකාර, පු. - රන්කරුවා
සුවෙ, නි. - සෙට
සෙනාසන, න. - සෙනසුන
සෙමාන, සයමාන - වැදහෝනා
සෙවක, පු. - සේවකයා, මෙහෙකරු
සෙවති - ඇසුරු කරයි
සෙවිකා - සේවිකාව
සොතු, පු. - අසන්නා
සොතුං - අසන්නට

## හ

හත්ථිකලභ - ඇත් නාම්බා
හත්ථිනාග, පු. - ඇත්රජ, මහ ඇතා
හත්ථිනී, ඉ. - ඇතින්න
හත්ථි, පු. - ඇතා
හනති - නසයි
හනතු - නසා වා
හනතු, පු. (හනතා, හනතාරො) - නසන්නා
හසති - සිනාසෙයි
හාස, පු. - සිනහව, සතුට
හිමවන්තු, පු. - හිමවත
හිමාලය, පු. - හිමවත
හිය්‍යො, නි. - ඊයේ
හිරි, ඉ - ලජ්ජාව
හිංසති - හිංසා කරයි
හොතු - වේ වා
හොතු, පු. (හොතා, හොතාරො) - හෝම කරන්නා
හොම, පු. - හෝමය, දේව පූජාව